2017 වාර්ෂික වාර්තාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය, ශ්‍රී ලංකාව

UNIVERSITY OF PERADENIYA
75 years
1942 2017

වාර්ෂික වාර්තාව

2017

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වාර්ෂික වාර්තාව තුළින් විශ්වවිද්‍යාලය අදාළ වාර්ෂයේදී අත්කර ගත් ජයග්‍රහණයන්ගේ ආයතනික දළ විශ්ලේෂණයේ සාරාංශයක් ඉදිරිපත් කෙරේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශිත පිළිගත් ආකෘතියකට අනුව මෙම වාර්ෂික වාර්තාව සකස් කරනු ලබයි. අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මෙහි අන්තර්ගත වන අතර එම තොරතුරු කැටි කොට සංඛ්‍යාලේඛන හා තොරතුරු අංශය විසින් සම්පාදනය කරන ලදි.

සම්පාදක : *ඒ.ඒ.කේ.යූ. අතපත්තු මිය*
සංඛ්‍යාලේඛන නිළධාරී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඉංග්‍රීසි පිටපතෙහි සංස්කාරක : *ආචාර්ය වරුනදත්තා එදිරිසිංහ*
සම්භාව්‍ය භාෂා අංශය
ශාස්ත්‍ර පීඨය

ISSN: 2478-1088

දැක්ම

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කලාපයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැක්ම වනු ඇත.

මෙහෙවර

සමාජීය වශයෙන් සංවේදීවූත්, සදාචාරාත්මක හා සුසංවර බවින් පිරිපුන්වූත්, අධ්‍යාපනය හරහා ආර්ථිකමය වශයෙන් සෞභාග්‍යමත්වූත් සහ පර්යේෂණ, දැනුම ව්‍යාප්ත කිරීම, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය හා කාර්යක්ෂමව සැලසුම් කරනු ලැබූ සංවර්ධනය යන කර්තව්‍යයන් කෙරෙහි ක්‍රියාශීලි ලෙස සහභාගි විය හැකිවූත්, බුද්ධිමය වශයෙන් ප්‍රබෝධමත් හා වාදභේද රහිතවූත්, විශ්වවිද්‍යාල පරිසරයක් තුළින් දැනුම පාදක කරගත් සමාජ වටපිටාවක් ගොඩනැගීම සඳහා උරදීම විශ්වවිද්‍යාලයේ කාර්යභාරය වනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

උපකුලපතිතුමාගේ පණිවිඩය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 වසර සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සොම්නසක් දනවන්නකි. මෙම විශ්වවිද්‍යාල පීඨ නවයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලවල සාර්ථකත්වය මෙම වාර්තාව තුළින් ඉස්මතුකෙරේ එපමණක් නොව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන හා ඒකකයන්වල ජයග්‍රහණ සහ ඒවා වෙනත් විශ්වවිද්‍යාල හා බාහිර සංවිධාන සමඟ පවත්වන සහ සම්බන්ධතාවයන් ද මෙමඟින් ඉස්මතුකොට දැක්වේ.

ගෙවීගිය 2017 වසර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ජයග්‍රහණ රාශියක් අත්කර දුන් වසරක් ලෙස හැඳින්විය හැකිය. එවන් ජයග්‍රහණ බොහෝමයක් අතුරෙන් කිහිපයක් පමණක් සාරාංශගතකොට පහතින් දැක්වේ.

- රුපියල් මිලියන 113.11ක් වටිනාකමින් යුතු විශේෂ ප්‍රධාන 86ක් බාහිර
- පර්යේෂණ ආයතනවලින් ලබාගැනීම.
- විදෙස් රටවල සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් 37ක් අත්සන් කිරීම.
- ජාත්‍යයන්තර සමුළු 18ක් හා දේශීය සමුළු හතක (7) පැවැත්වීම.
- 2015 වසරේ දී ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන වැඩිම සංඛ්‍යාවක් දිනාගැනීම.
- විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 75% පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි මට්ටමේ නව නේවාසිකාගාර තුනක් ඉදිකිරීම.
- දශක කිහිපයක් තිස්සේ ඇණහිට තිබූ විශ්වවිද්‍යාල අධ්‍යයන නිල නිවාස සංඛ්‍යාවට නව නිවාස එකතු කිරීම.
- ශ්‍රාස්ත්‍ර පීඨයේ උරුමය ලෙස සැලකෙන පැරණි ගොඩනැගිලි වර්ෂ 30ක් තරම් කාලයකට පසුව ඒවායේ මුලින් පැවති ස්වභාවයට පත්කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීම.

අපගේ විද්වතුන් හා සිසුන් විසින් අත්කරගත් විශිෂ්ටතා හා සම්මාන පිළිබඳ වැඩිවිස්තර මෙම වාර්ෂික වාර්තාවේ අදාළ කොටස්වල ඇතුළත් කොට ඇත. අපගේ සුවිශේෂී ජයග්‍රහණයන් පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබා ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වාර්ෂික වාර්තාව අධ්‍යයන කරන ලෙස මා ඉමහත් ප්‍රීතියෙන් යුතුව ඔබට ආරාධනා කර සිටිමි.

අවසන් වශයෙන් 2017 ඵලදායී වසරක් කරගැනීම පිණිස මහත් කැපකිරීමෙන් හා වගකීමෙන් වෙහෙස වී කටයුතු කළ සියළු දෙනාට මාගේ කෘතඥතාවය ප්‍රකාශකර සිටින අතරම එක් එක් පීඨවල/ආයතනවල/මධ්‍යස්ථානවල වාර්තා සංගෘහිත කිරීම වෙනුවෙන් සංඛ්‍යාලේඛන නිළධාරිණි, ඒ.ඒ.කේ.යු. අතපත්තු මහත්මිය ඇගයීමට ලක්කිරීමටද අමතක නොකරමි.

මහාචාර්ය උපුල් බී. දිසානායක

පටුන

1. හැඳින්වීම

1.1 උපකුලපතිතුමාගේ සංක්ෂිප්ත හැඳින්වීම 1

1.2 පාලක සභාව 5

1.3 සනාතන සභාව 6

1.4 සමස්ත කාර්ය සාධනය 13

1.5 බාධක හා පිළියම් 40

1.6 අනාගත සැලසුම් 40

2. ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල කටයුතු

2.1 සිසුන් 42

2.1.1 සම්පත් සහ සිසුන් 42

2.1.2 දේශීය සිසුන් 43

2.1.3 විදෙස් සිසුන් 44

2.2 කාර්ය මණ්ඩලය 45

2.2.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය 45

2.2.2 අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල 48

2.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය 48

2.2.4 නව බඳවාගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය : 2009-2017 49

2.2.5 2017 වසර තුළ ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර 50

2.2.6 දේශීය උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාග ආයතන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම් 51

2.2.7 ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාග ආයතන අතර අවබෝධතා ගිවිසුම් 52

2.2.8 අ) 2017 වසරේදී අධ්‍යයන හා පරිපාලන කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය සඳහා ලද දේශීය සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන 54

ආ) 2017 වසරේදී අධ්‍යයන හා පරිපාලන කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය සඳහා ලද විදේශීය සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන 55

2.2.9 විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද දේශීය සමුළු හා වැඩමුළු 56

2.2.10 විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු 57

2.2.11 පවත්වන ලද වැඩමුළු/සම්මන්ත්‍රණ/පුහුණු වැඩසටහන් 59

2.2.12 ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන 69

2.2.13 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය මුදල් ලද) 70

2.2.14 ව්‍යාපෘති පිළිබඳ විස්තර (විදේස් මුදල් මත) 77

2.2.15 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දෙස් /විදෙස් මුදල් ලද) 78

3. පීඨ හා පශ්චාත් උපාධි ආයතන 83

3.1 කෘෂිවිද්‍යා පීඨය 83

3.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය 88

3.3 ශාස්ත්‍ර පීඨය 93

3.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය 98

	3.5	ඉංජිනේරු පීඨය	105
	3.6	කළමනාකරණ පීඨය	107
	3.7	වෛද්‍ය පීඨය	109
	3.8	විද්‍යා පීඨය	110
	3.9	පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය	112
	3.10	පශ්චාත් උපාධි ආයතන	114
		3.10.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	114
		3.10.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	119
		3.10.3 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	122
	3.11	පේරාදෙණිය විශ්වවිද්‍යාලීය පුස්තකාල ජාලය	124
4.	ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක		126
	4.1	තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය	126
	4.2	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය	127
	4.3	වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය	128
	4.4	දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය	131
	4.5	පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය	134
	4.6	මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය	136
	4.7	ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය	138
	4.8	හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය	140
	4.9	අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය	141
	4.10	ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය	144
	4.11	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	146
5.	සහායක සේවාවන්		149
	5.1	සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්	149
	5.2	උද්‍යාන අංශය	152
	5.3	විනයාරක්ෂක අංශය	154
	5.4	ශාරීරික අධ්‍යාපන අංශය	156
	5.5	ආරක්ෂක සේවාවන්	159
	5.6	ශිෂ්‍ය නේවාසික අංශය	161
	5.7	ශිෂ්‍ය සේවා අංශය	163
6.	පර්යේෂණ, ප්‍රකාශන හා සම්මාන		165
	6.1	විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිෂ්පාදන	165
	6.2	පේටන්ට් බලපත්‍ර	166
	6.3	සාමාන්‍ය ජනතාව වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්	167
	6.4	අදාල පුද්ගලයන් විසින් නිෂ්පාදනය, සමාලෝචනය හෝ ඇගයීමට ලක්කළ නිර්මාණශීලි කටයුතු හා සම්බන්ධ කාව්‍ය, ගීත, භාව ගීත, සංගීත, රචනය, නැටුම්, නාට්‍ය, චිත්‍රපට ආදිය	174
	6.5	ජාතික හා ජාත්‍යන්තර සම්මාන	175
7.	2017 වසරේ යටිතල පහසුකම් පිළිබඳ විස්තර		177
	7.1	2017 වසර සඳහා කෙරීගෙන යන සියලු මූලධන ව්‍යාපෘති	177
	7.2	2017 වසර සඳහා කෙරීගෙන යන සියලු පුනරුත්ථාපන ව්‍යාපෘති	179

	7.3	2017 වසර සඳහා නව පුනරුත්ථාපන ව්‍යාපෘති	185
	7.4	2017 වසර සඳහා මූලධන නව ව්‍යාපෘති	188
8.	මුදල් වාර්තාව		189
	8.1	මුදල් වාර්තාව 2017	189
	8.2	විගණන කමිටු වාර්තාව 2017	191
	8.3	2016 හා 2017 වසරවල මුළු අදායම	193
	8.4	2016 හා 2017 මූලධන වියදම	194
	8.5	2017 වසරේ පුනරාවර්තන වියදම	195
	8.6	මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)	197
	8.7	මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (සාමාන්‍ය ආදායම)	197
	8.8	2017 වසරේ මුදල් කාර්ය සාධන විශ්ලේෂණය	197
	8.9	මුදල් තත්ත්ව ප්‍රකාශන	198
	8.10	මුදල් කාර්ය සාධන ප්‍රකාශනය	200
	8.11	වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	201
	8.12	වර්ෂයේ විසර්ජන ගිණුම්	203
	8.13	සමාන අගය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශන	204
	8.14	ගිණුම් සටහන්	205
	8.15	විගණන වාර්තාව	209
	8.16	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	228

1. හැඳින්වීම

1.1 උපකුලපතිතුමාගේ සංක්ෂිප්ත හැඳින්වීම

(මහාචාර්ය උපුල් බී. දිසානායක)

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට පසුව 1942 වසරේ ජූලි මස පළමු වැනි දින කොළඹදී ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙරට අනිකුත් විශ්වවිද්‍යාල අතරින් පැරණිම හා විශාලතම විශ්වවිද්‍යාලයයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය 1952 වසරේ ඔක්තොම්බර් මස 6 වැනි දින පේරාදෙණියට ගෙන ඒමත් සමඟම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ස්ථාපිත කිරීම නියමාකාරයෙන් සනිටුහන් කරන ලදි. මධ්‍යම පළාතේ මහනුවර නගරයේ සිට කිලෝමීටර අටකට (08) පමණ ඈත ස්වභාවික සෞන්දර්යයෙන් හෙබි ප්‍රදේශයක පිහිටි විශ්වවිද්‍යාලය හෙක්ටයාර් 775 ක් පුරා පැතිර යන භූමි ප්‍රමාණයකින් යුතු, අධ්‍යාපන, නේවාසික පහසුකම්, ක්‍රීඩා, සංස්කෘතික හා ස්වාභාවිකත්වය යන කුමන කරුණකින් වුවත්, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලයන් අතරින් අද්විතීය අත්දැකීමක් දායාද කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි.

පසුගිය වසර 75 කාලය පුරාවට විශිෂ්ටගණයේ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ව්‍යාප්ත වී ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව පවතින අතරම, මෙරට එකම කීර්තිමත් විශ්වවිද්‍යාලය ද වෙයි. කෘෂිවිද්‍යා, සම සෞඛ්‍ය, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය විද්‍යා, පශු වෛද්‍ය විද්‍යා සහ කළමනාකරණ යන පීඨ ඒ අතර වේ. ආරම්භයේදී අධ්‍යයන අංශ 18කට සීමා වූ අතර, එම සංඛ්‍යාව වර්තමානය වන විට ක්ෂේත්‍ර රාශියකින් සමන්විත අධ්‍යයන අංශ 79ක් වේ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි හා විද්‍යා පශ්චාත් උපාධි ආයතන සහ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර උපාධි ආයතනය යන පශ්චාත් උපාධි ආයතන තුනකින්ද මෙම විශ්වවිද්‍යාලය සමන්විත වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයක් ආරම්භ කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයකටත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් නේවාසික පහසුකම් සපයන විශ්වවිද්‍යාලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සැලසුම් කරන ලදි. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 75%කට වැඩි පිරිසකට නේවාසික පහසුකම් සපයන නේවාසිකාගාර 21ක්,

වෛද්‍ය මධ්‍යස්ථානයක්, විශ්වවිද්‍යාලයේ විවිධ ජන කොටස්වල අභිරුචීන් පිරිමසාලන සිද්ධස්ථාන, සංගම් රාශියකින් ඉටු කෙරෙන ක්‍රීඩා හා සංස්කෘතික පහසුකම්වලින් යුතු ජාතියේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා වන වඩාත් ආකර්ෂණීය විශ්විද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 13,000ක් පමණ වන අතර, අධ්‍යාපන පරිපාලන හා සේවා අංශ හරහා පැතිර යන මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව ආසන්න වශයෙන් 3500කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කලා, නීතිය හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සිට භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ඉංජිනේරු හා පරිගණක විද්‍යාව, කෘෂිවිද්‍යාව, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය විද්‍යාව, පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩසටහන් 58ක් ප්‍රදානය කරනු ලබයි. සම සෞඛ්‍ය විද්‍යා පීඨයක්, දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයක් හා භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයක් පවතින මෙරට එකම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර උපාධි ආයතනවල ලියාපදිංචි සිසුන් ද ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 8500කි. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පැරණි හා මාර්ගගත (Online) යන ක්‍රමයන් භවිතා කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උපාධි සුදුසුකම් ලබා දෙන බාහිර පුහුණු අවස්ථාවන් සැලසුම් කොට පිරිනැමීමේ කාර්යභාරය උසුලයි. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කලා විෂයධාරාවෙන් බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 2500ක් පමණ වන අතර සිසුන් 500ක් පමණ වෙනත් අඛණ්ඩ පාඨමාලා හදාරති.

විශ්වවිද්‍යාල මධ්‍යම පරිපාලනය පරිපාලන අංශ නවයකින් (සාමාන්‍ය පරිපාලන පද්ධතිය) මුදල් අංශය අභ්‍යන්තර විගණන අංශය, සේවා අංශ නවයකින් (සාමාන්‍ය සේවා පද්ධතිය) හා මධ්‍යස්ථාන/ඒකක 22කින් යුක්ත වේ. මධ්‍යම පරිපාලන සැකැස්ම පිටු අංක 03හි දක්වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන අංශවල වැඩසටහන්වලට සහය වන වැදගත් ඉගෙනුම් සහයක සේවාවන් 04කි. ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශන සේවා ඒකක හා ඉංග්‍රීසි භාෂාව ඉගෙන්වීමේ ඒකකය ලෙස හැඳින්වේ. විශේෂිත පුහුණු හා සේවා කෘත්‍යයන් ඉටු කිරීම සඳහා වෙනත් මධ්‍යස්ථාන හා ඒකක කිහිපයක් ස්ථාපිත කොට ඇති අතර එම මධ්‍යස්ථාන හා ඒකක විසින් ඩිප්ලෝමා හා සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හා විවිධ තාක්ෂණික හා වෘත්තීය සේවාවන් මූලිකවම ගාස්තු අය කිරීමේ පදනම මත සැලසුම් කොට පිරිනමනු ලබයි. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක වල ජයග්‍රහණයන් හා සාමාන්‍ය විස්තර අංක 04හි විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

සංවිධාන ව්‍යුහය


විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
කුලපති
විශ්වවිද්‍යාලය
පාලක සභාව
සනාතන සභාව
උපකුලපති
නියෝජ්‍ය උපකුලපති
පශ්චාත් උපාධි ආයතනය
කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂවරුන්
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මධ්‍යම පරිපාලනය
ලේඛකාධිකාරී
මූල්‍යාධිකාරී
අභ්‍යන්තර විගණන අංශය
අධ්‍යයන ආයතන අංශය
මූලධන පුනරුත්ථාපන අංශය
සංයුක්ත කළමනාකරණ අංශය
පාලක සභා හා අධ්‍යයන අංශය
සාමාන්‍ය පරිපාලන අංශය
නීති හා ප්‍රලේඛන අංශය
අනධ්‍යයන ආයතන අංශය
ශිෂ්‍ය ලියාපදිංචි අංශය
ශිෂ්‍ය සේවා අංශය
වෛද්‍ය මධ්‍යස්ථානය
උද්‍යාන අංශය
විනාරක්ෂක අංශය
ශාරීරික අධ්‍යාපන අංශය
මහජන සම්බන්ධතා අංශය
ආරක්ෂක අංශය
සංඛ්‍යා ලේඛන හා තොරතුරු අංශය
ශිෂ්‍ය තේවාසික අංශය
වැඩ දෙපාර්තමේන්තුව
මූලධන ගෙවීම් හා මූලධන
අයවැය පාලන අංශය
පීඨ සහ මධ්‍යස්ථාන අංශය
අවසන් ගිණුම් අංශය
ස්ථාවර වත්කම් හා ගබඩා අංශය
කළමනාකරණ පීඨය
දේශීය හා විදෙස් සැපයුම් අංශය
අභ්‍යන්තර පද්ධති හා තත්ත්වාරක්ෂණ අංශය
ගෙවීම් සහ අයවැය පාලන අංශය
පර්යේෂණ වෙනත් මූදල් හා ව්‍යාපෘති අංශය
දේශීය ආදායම් බැලීම්කර විගණන විමසුම් හා මූදල් කළමනාකරණ අංශය
වැලුප් ණය හා විශ්‍රාම ප්‍රතිලාභ අංශය
ශිෂ්‍ය සේවා අංශය
ප්‍රධාන පුස්තකාලය
ප්‍රධාන පුස්තකාලයාධිපති
පීඨ පුස්තකාලය
කෘෂි විද්‍යා
සමසෞඛ්‍ය
දන්ත වෛද්‍ය
ඉංජිනේරු
වෛද්‍ය
විද්‍යා
පශු වෛද්‍ය
මධ්‍යස්ථාන හා ඒකක
අධ්‍යක්ෂවරුන්
කළමනාකරණ මණ්ඩලය
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය
පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
මානව හිමිකම් අධ්‍යක්ෂන මධ්‍යස්ථානය
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය
වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය
අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය
අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය
පීඨ
පීඨාධිපතින්
පීඨ මණ්ඩල
දෙපාර්තමේන්තු/මධ්‍යස්ථාන/ඒකක
අංශ ප්‍රධානීන්

1.2 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්ති ප්‍රකාරව 2017 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

උපකුලපති	මහාචාර්ය උපුල් බී. දිසානායක
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය ආර්.එල්. විජයවීර

පීඨාධිපතීන්

කෘෂිවිද්‍යා පීඨය	මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න
ශාස්ත්‍ර පීඨය	මහාචාර්ය ඕ.ජී. දයාරත්න බංඩා
දන්ත වෛද්‍ය පීඨය	මහාචාර්ය ඩම්.එම්. තිලකරත්න
ඉංජිනේරු පීඨය	මහාචාර්ය එල්. රාජපක්ෂ
කළමනාකරණ පීඨය	මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න (03.12.2017 සිට) ආචාර්ය එම්. ඇල්ෆඩ් (04.12.2017 සිට)
වෛද්‍ය පීඨය	මහාචාර්ය වී.එස්. වීරසිංහ
විද්‍යා පීඨය	මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු
පශු වෛද්‍ය පීඨය	මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න

පහත සඳහන් සාමාජිකයන් දෙදෙනා පාලක සභාව නියෝජනය කිරීම පිණිස සනාතන සභාව විසින් පත්කරන ලදි.

මහාචාර්ය ඒ. එස්. පී. අභයරත්න
මහාචාර්ය කේ. සමරසිංහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින්

කේ.ඩී. ගයාත්‍රි අබේගුණසේකර	ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
ආචාර්ය රනිල් අබේසිංහ	ලාල් විජේනායක මයා
මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස	ජී.එස්.ජේ. දිසානායක මයා
ඊ.එච්.එම්. පාලිත ඇල්කඩුව මයා	මහාචාර්ය වී. නන්දකුමාර්
උපුල් කුමාරපෙරුම මයා	බී.එම්.එන්. බාලසූරිය මයා
මහාචාර්ය පී.එස්. මීගස්කුඹුර	යූ.ඩබ්.බී. අත්තනායක මයා
වෛද්‍ය එම්.ටී. සියාඩ් මොහොමඩ්	

1.3 සනාතන සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත, 1985 අංක 07 දරණ පනතින් සංශෝධිත 46වැනි කොටසෙ වගන්ති ප්‍රකාරව සංයුක්ත වූ සනාතන සභාව විශ්විද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වේ.
එහි සමාජිකයින් පහත පරිදි වේ.

1.3.1 උපකුලපති — මහාචාර්ය උපුල් බී. දිසානායක

1.3.2 නියෝජ්‍ය උපකුලපති — මහාචාර්ය ආර්.එල්. විජයවීර

1.3.3 පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරුන්

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය එස්. සමිත මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	ආචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම

1.3.4 පීඨාධිපතීන්

කෘෂිවිද්‍යා පීඨය	මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න
ශාස්ත්‍ර පීඨය	මහාචාර්ය ඕ.ජී. දයාරත්න බංඩා
දන්ත වෛද්‍ය පීඨය	මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න
ඉංජිනේරු පීඨය	මහාචාර්ය එල්. රාජපක්ෂ
කළමනාකරණ පීඨය	මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න (03.12.2017 සිට) ආචාර්ය එම්. ඇල්ෆඩ් (04.12.2017 සිට)
වෛද්‍ය පීඨය	මහාචාර්ය වී.එස්. වීරසිංහ
විද්‍යා පීඨය	මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු
පශු වෛද්‍ය පීඨය	මහාචාර්ය එම්.බී.එස්. ආරියරත්න

1.3.5 වැඩබලන පුස්තකාලයාධිපති — ආර්. මහේෂ්වරන් මයා

1.3.6 අංශ ප්‍රධානීන්

කෘෂිවිද්‍යා පීඨය

කෘෂිජීව විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය එච්.එම්.ජී.ජී. හේරත්
කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය	මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු
කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශය	මහාචාර්ය එම්.අයි.එම්. මොව්ජුද්
කෘෂි ව්‍යාප්ති අධ්‍යයන අංශය	ආචාර්ය එම්.ඩබ්.ඒ.පී ජයතිලක
සත්ව විද්‍යා අධ්‍යයන අංශය	එම්.බී.පී. මහීපාල මහතා
බෝග විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය ටී. සිවානන්තවේල
ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය	ආචාර්ය ආර්.පී.එන්.පී. රාජපක්ෂ
පාංශු විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය ඩබ්.එස්. දන්දෙණිය

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශය	වෛද්‍ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර
හෙදවේද අධ්‍යයන අංශය	වෛද්‍ය ආර්.පී. ඉල්ලපෙරුම (23.07.2017 සිට වැ.බ) වෛද්‍ය ආර්.පී. ඉල්ලපෙරුම (24.07.2017 සිට)
භෞතවේද අධ්‍යයන අංශය	වෛද්‍ය යු.ජේ.එම්.ඒ.එල්. ජයසිංහ (30.11.2017 සිට වැ.බ) ඒ.එල්.අයි. ප්‍රසන්න මහතා (01.12.2017 සිට)
විකිරණ හා විකිරණ චිකිස්තක අධ්‍යයන අංශය	වෛද්‍ය එම්.ඒ.ජේ.සී. මාරසිංහ
ඖෂධවේද අධ්‍යයන අංශය	වෛද්‍ය එම්.එම්.ඩී.ආර්. හේරත්
මූලික විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය එච්.එම්.ටී.යු. හේරත්

ශාස්ත්‍ර පීඨය

අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අධ්‍යයන අංශය	ආචාර්ය එම්.එල්.එම්. හනීෆා
පුරාවිද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න
සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය	ආචාර්ය ඩබ්.එම්.ඩබ්.ජී.සී.එස්.එම්. වික්‍රමසිංහ
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය	එස්. විජේසන්දිරන් මයා
අධ්‍යාපන අධ්‍යයන අංශය	ආචාර්ය එස්. ඇම්බැක්ක (13.04.2017 සිට) මහාචාර්ය පී. සේතුංග (14.04.2017 සිට) ආචාර්ය පී.ආර්.කේ.ඒ. විතාරන (15.09.2017 සිට)
ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය	මහාචාර්ය ඒ. පරාක්‍රම (04.07.2017 සිට) මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ (05.07.2017 සිට)
ලලිත කලා අධ්‍යයන අංශය	ආචාර්ය එම්.ඒ.ජී.එම්.එස්.බී. අලවතුකොටුව
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය එච්.ඒ.එන්.එම්. හෙන්නායක(07.01.2017 සිට) එම්.ඒ.එස්. ජයකුමාර (08.01.2017 සිට)
ඉතිහාස අධ්‍යයන අංශය	මහාචාර්ය එම්. සෝමතිලක (09.02.2017 සිට) ආචාර්ය එන්.ඒ. විමලසේන (10.02.2017 සිට)
නීති අධ්‍යයන අංශය	ආචාර්ය එස්.එස්.කේ.බී.එම්. දොරබාවිල

දර්ශනය අධ්‍යයන අංශය	එච්.එම්.සී. හේරත්
මනෝවිද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය බී.ඩී.ඩී. පතිරණ
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය	එම්.ඩබ්.ඒ.ජී. විතානවසම් මයා
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය	ආචාර්ය බී. ශාන්තවිමල හිමි (10.07.2017 සිට)
	මහාචාර්ය ආර්.ජී.ඩී. ජයවර්ධන (11.07.2017 සිට)
සිංහල භාෂා අංශය	ආචාර්ය ඩබ්.ඩී.එස්.කේ. ප්‍රේමසිරි
සමාජ විද්‍යා අංශය	ආචාර්ය ආර්.එම්. අබේරත්න
දෙමළ භාෂා අංශය	මහාචාර්ය වී. මහේෂ්වරන් (30.09.2017 සිට)
	ආචාර්ය එස්.ආර්. තීවර් (01.10.2017 සිට)

දන්ත වෛද්‍ය පීඨය

මූලික විද්‍යා අංශය	වෛද්‍ය කේ.එස්.එන්. ආරියසිංහ
සමාජ දන්ත සෞඛ්‍ය අංශය	වෛද්‍ය ඊ.එම්.යූ.සී.කේ. හේරත්
මුඛ සෞඛ්‍ය හා පරිදත්ත වෛද්‍ය අංශය	මහාචාර්ය එච්.එන්.එස්. සොයිසා
මුඛ ව්‍යාධවේද අංශය	මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග
කෘතිම දන්ත වෛද්‍ය අංශය	වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ
දන්ත සංරක්ෂණ අංශය	වෛද්‍ය එම්.සී.එන්. ෆොන්සේකා (06.02.2017 සිට)
	මහාචාර්ය කේ.එම්. විජේරත්න (07.02.2017 සිට)
මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අංශය	වෛද්‍ය පී.එස්.කේ. නානායක්කාර (30.06.2017 සිට)
	වෛද්‍ය ඩබ්.එම්.පී.එස්.කේ. විජේකෝන් (01.07.2017 සිට)

ඉංජිනේරු පීඨය

රසායන හා සැකසුම් ඉංජිනේරු අංශය	ආචාර්ය සී.එස්. කල්පගේ
සිවිල් ඉංජිනේරු අංශය	මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
	ආචාර්ය ඒ.ජී.එච්.ජේ. එදිරිසිංහ (07.02.2017 සිට)
පරිගණක ඉංජිනේරු අංශය ආචාර්ය	කේ.ඩබ්.එච්.එම්.ආර්.ඩී.බී. ඇල්කඩුව
විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය	මහාචාර්ය එම්.ආර්.එම්. ප්‍රනාන්දු
ඉංජිනේරු ගණිත විද්‍යා අංශය	ආචාර්ය ඩබ්.ආර්.එම්.ආර්. පාලමකුඹුර
යාන්ත්‍රික ඉංජිනේරු අංශය	ආචාර්ය එස්.ඩී.පී.එස්.පී. ගුණවර්ධන
නිෂ්පාදනය ඉංජිනේරු අංශය	ආචාර්ය සී.ඩී. සේනානායක
ඉංජිනේරු කළමනාකරණ අංශය	ආචාර්ය පී.බී.බී. හේරත්

කළමනාකරණ පීඨය

ව්‍යාපාර මූල්‍ය අංශය	ආචාර්ය එම්. ඇල්ෆඩ්
මානව සම්පත් කළමනාකරණ අංශය	ඩබ්.පී.ආර්. වික්‍රමරත්න මයා
කළමනාකරණ අධ්‍යයන අංශය	වී. තර්මතාසන්
වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශය	ඩබ්.එම්.එච්.යූ. විජේතුංග
මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය	ආචාර්ය ඊ.එම්.ඒ.එස්.බී. ඒකනායක

වෛද්‍ය පීඨය

කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය	වෛද්‍ය එච්.එම්.ඒ. සොමිනන්ද (22.04.2017 සිට)
	වෛද්‍ය ජේ.කේ. දිසානායක (23.04.2017 සිට)
නිර්විත්දන වෛද්‍ය අධ්‍යයන අංශය	වෛද්‍ය එම්.වී.ජී. පින්ටො
ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ (30.03.2017 සිට)

	වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා (31.03.2017 සිට)
ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය ඩී.එස්. දිසානායක (01.08.2017 සිට)
	වෛද්‍ය ටී.එම්.යූ.එස්.බී. තෙන්නකෝන් (02.08.2017 සිට)
අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය ඒ. එන්. වෛද්‍යසිංහ (30.06.2017 සිට)
	මහාචාර්ය කේ.ඒ.එස්. කොඩිකාර (31.07.2017 සිට)
වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය අයි.බී. ගවරම්මන
ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය බී.එන්. දිසානායක
ප්‍රසව හා නාරීවේද අධ්‍යයන අංශය	වෛද්‍ය ඊ.ඩබ්. සමරකෝන් (16.01.2017 සිට)
	වෛද්‍ය ආර්.එම්.සී.ජේ. රත්නායක (17.01.2017 සිට)
ළමා රෝග අධ්‍යයන අංශය	වෛද්‍ය එස්.බී. කුඩාගම්මන
පරපෝෂ විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය ඩබ්.ඩී.එස්.ජේ. වික්‍රමසිංහ
ව්‍යාධවේද අධ්‍යයන අංශය	ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක (31.07.2017 සිට)
	වෛද්‍ය එස්. විජේතුංග (01.08.2017 සිට)
භිෂ්ග්වේද අධ්‍යයන අංශය	වෛද්‍ය යූ. දන්ගහදෙණිය (02.04.2017 සිට)
	වෛද්‍ය වයි.ඒ. ඉලංගසේකර (03.04.2017 සිට)
භෞතවේද අධ්‍යයන අංශය	වෛද්‍ය ඒ. ආරියසිංහ (03.04.2017 සිට)
	මහාචාර්ය එන්.එස්. කලුපහන (03.04.2017 සිට)
මනෝ වෛද්‍ය අධ්‍යයන අංශය	වෛද්‍ය ජී.එස්.එස්.එස්.ආර්. ඩයස්
ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය	වෛද්‍ය කේ.බී. ගල්කැටිය
විකිරණ විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය රොසායිරෝ

විද්‍යා පීඨය

උද්භිත විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල
රසායන විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය එම්.එම්.ඒ.එන්. නවරත්න
භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්
අණුක ජීව විද්‍යා හා ජෛව රසායන අධ්‍යයන අංශය	ආචාර්ය ඩී.එස්.ඩී.එස්.එස්. සූරියපතිරණ
ගණිත විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය ඩබ්.බී. ඩවුන්දසේකර (31.12.2016 සිට)
	මහාචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා (01.01.2017 සිට)
භෞතික විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර
සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය යූ.ඒ.ජේ. පිනිදියආරච්චි
සත්ව විද්‍යා අධ්‍යයන අංශය	ආචාර්ය එම්.ඩබ්.එස්.කේ. යටිගම්මන

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

පශු චිකිත්සක විද්‍යා අධ්‍යයන අංශය	මහාචාර්ය ඒ. දංගොල්ල (28.05.2017 සිට)
	වෛද්‍ය කේ.ඒ.එන්. විජයවර්ධන
පශු ව්‍යාධ ජීව විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය අරුල්කාන්තන්
	මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ (01.08.2017 සිට)
පශු මූලික විද්‍යා අධ්‍යයන අංශය	වෛද්‍ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය
ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශය	වෛද්‍ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර්
පශු මහජන සෞඛ්‍ය හා භෂග්වේද අධ්‍යයන අංශය	වෛද්‍ය ආර්.එස්. කලුපහන

1.3.7 අංශ ප්‍රධානීන් නොවන වෙනත් මහාචාර්යවරුන්

කෘෂිවිද්‍යා පීඨය

1. මහාචාර්ය ඩී.සී. බණ්ඩාර
2. මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක
3. මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. ද කොස්තා
4. මහාචාර්ය ඩී.එම්. ද කොස්තා
5. මහාචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන
6. මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන
7. මහාචාර්ය ඩී.සී.කේ. ඉල්ලපෙරුම
8. මහාචාර්ය ඩබ්.එම්.ටී. මදුපිත්
9. මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී. මාරඹේ
10. මහාචාර්ය කේ.ඒ. නන්දසේන
11. මහාචාර්ය එන්.ඒ.එස්.එස්.පී. නිශ්ශංක
12. මහාචාර්ය එස්. ප්‍රේමරත්න
13. මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ
14. මහාචාර්ය කේ. සමරසිංහ
15. මහාචාර්ය එස්. සමිත
16. මහාචාර්ය ජී.එල්.එල්.පී සිල්වා
17. මහාචාර්ය ඩබ්.පී.ආර්.පී.ඩී. ද සිල්වා
18. මහාචාර්ය වී.ඒ. සුමනසිංහ
19. මහචාර්ය ඩබ්.ඒ.පී. වනිගසුන්දර
20. මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා
21. මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
22. මහාචාර්ය එස්.වී.ආර්. වීරසූරිය
23. මහාචාර්ය එම්.පී.බී. විජේගුණවර්ධන

ශාස්ත්‍ර පීඨය

1. මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අභයරත්න
2. මහාචාර්ය ඒ.එස්.පී. අබේරත්න
3. මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර
4. මහාචාර්ය එම්. ඥානානන්ද හිමි
5. මහාචාර්ය ඩී.එන්.බී. ගුණවර්ධන
6. මහාචාර්ය එච්.එම්.එස්.කේ. හෙන්නායක
7. මහාචාර්ය ඒ.එල්.ටී. හේවාවසම්
8. මහාචාර්ය පී.එම්. ජමීර්
9. මහාචාර්ය ආර්.ජී.ඩී. ජයවර්ධන
10. මහාචාර්ය ජී.ජී.එස්. කුලරත්න
11. මහාචාර්ය ඩබ්.ඒ. ලියනගේ
12. මහාචාර්ය වී. මහේෂ්වරන්
13. මහාචාර්ය එස්.ඩබ්. පෙරේරා
14. මහාචාර්ය ඩබ්.එල්.ජී. පෙරේරා
15. මහාචාර්ය එම්.ආර්. පින්නවල
16. මහාචාර්ය කේ. රාහුල හිමි
17. මහාචාර්ය එස්. සිවමෝහන්
18. මහාචාර්ය එම්. සෝමතිලක
19. මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ

දන්ත වෛද්‍ය පීඨය

1. මාහාචාර්ය ඒ.කේ. අරඹවත්ත
2. මහාචාර්ය එස්.එල්. ඒකනායක
3. මහාචාර්ය එස්.පී.එන්.පී. නාගරත්න
4. මහාචාර්ය සී.ඩී. නානායක්කාර
5. මහාචාර්ය ජී.ජේ. පනාගොඩ
6. මහාචාර්ය පී.එස්. රාජපක්ෂ
7. මහාචාර්ය බී.එස්.එම්.එස්. සිරිවර්ධන
8. මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ
9. මහාචාර්ය පී.ආර්. ජයසූරිය
10. මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ
11. මහාචාර්ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක
12. මහාචාර්ය ජේ.ඒ.සී.කේ. ජයවර්ධන
13. මහාචාර්ය ඒ. තිලකරත්න
14. මහාචාර්ය එච්.ආර්.ඩී. පීරිස්

ඉංජිනේරු පීඨය

1. මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන්
2. මහාචාර්ය ආර්. ශාන්තිනි
3. මහාචාර්ය කේ.ඒ.එස්. සුසන්ත
4. මහාචාර්ය කේ.එස්. වල්ගම
5. මහාචාර්ය එස්.බී. වීරකෝන්
6. මහාචාර්ය ජේ.ජේ. විජේතුංග

7. මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
8. මහාචාර්ය එස්.ඩී. පතිරණ
9. මහාචාර්ය යූ. ද එස්. ජයවර්ධන
10. මහාචාර්ය ජේ.බී. ඒකනායක
11. මහාචාර්ය කේ.එම්. ලියනගේ
12. මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල්
13. මහාචාර්ය කේ.පී.පී. පතිරණ
14. මහාචාර්ය ඩී.එන්. උඩුවාවල
15. මහාචාර්ය කේ.ජී.එච්.සී.එන්. සෙනෙවිරත්න

වෛද්‍ය පීඨය

1. මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
2. මහාචාර්ය ආර්. වඩුගේ
3. මහාචාර්ය ඒ. අබේගුණවර්ධන
4. මහාචාර්ය පී.බී. හේවාවිතාරන
5. මහාචාර්ය එස්.බී. අධිකාරි
6. මහාචාර්ය එෆ්. නූර්ඩීන්
7. මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක
8. මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
9. මහාචාර්ය අයි.බී. ගවරම්මන
10. මහාචාර්ය එම්.ඩී. ළමාවංශ
11. මහාචාර්ය කේ. ගුණවර්ධන
12. මහාචාර්ය ආර්.එම්. මුදියන්සේ
13. මහාචාර්ය ඩබ්.ඩී.එම්.ටී.එල්. දසනායක
14. මහාචාර්ය එම්.ඩබ්.සී.ජේ. ජයසිංහ
15. මහචාර්ය කේ.බී. ගල්කැටිය
16. මහාචාර්ය ඒ. ජයසිංහ
17. මහාචාර්ය පී.පී.වී.ආර්. කුමාරසිරි
18. මහාචාර්ය කේ.එන්. මාරඹේ
19. මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ

විද්‍යා පීඨය

1. මහාචාර්ය බී.එම්.ආර්. බණ්ඩාර
2. මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා
3. මහාචාර්ය එච්.එම්.ඩී.ඩී.එන්. ප්‍රියන්ත
4. මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල
5. මහාචාර්ය ආර්.එස්. රාජකරුණා
6. මහාචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා
7. මහාචාර්ය එච්.ඒ. ධර්මගුණවර්ධන
8. මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
9. මහාචාර්ය එච්.ඒ.එච්. ජයසේන
10. මහාචාර්ය කේ.බී. රණවන
11. මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න
12. මහාචාර්ය පී. සමරසේකර
13. මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
14. මහාචාර්ය අතුල සේනාරත්න
15. මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න
16. මහාචාර්ය ඩබ්.ඒ.අයි.පී.කරුණාරත්න
17. මහාචාර්ය ඒ. වික්‍රමසිංහ
18. මහාචාර්ය එම්.වයි.යූ. ගනේහෙනගේ
19. මහාචාර්ය එච්.එම්.එස්.ජී. මඩවල
20. මහාචාර්ය එම්.පී.බී. මීගස්කුඹුර
21. මහාචාර්ය ආර්.ජී.එස්. රාජපක්ෂ
22. මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්. පී. විජේකෝන්

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

1. මහාචාර්ය ඒ. දංගොල්ල
2. මහාචාර්ය අයි.ඩී. සිල්වා

1.3.8. සනාතන සභාවේ පීඨ නියෝජිතයින්

කෘෂිවිද්‍යා පීඨය

ආචාර්ය ඩබ්.එම්.ටී.පී. ආරියරත්න
ආචාර්ය කේ.කේ.එස්.පී. කොඩිතුවක්කු

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

වෛද්‍ය එච්.එම්.ටී.යූ. හේරත් (2017-05-01 දක්වා)
වෛද්‍ය ඩී. බණ්ඩාරනායක (2017-07-21 දක්වා)

ශාස්ත්‍ර පීඨය

ආචාර්ය සුරේෂ් ද මෙල්
ආචාර්ය වී. එදිරිසිංහ

දන්ත වෛද්‍ය පීඨය

වෛද්‍ය ඒ.එම්. ආටිගල
වෛද්‍ය එම්.සී.එන්. ෆොන්සේකා

ඉංජිනේරු පීඨය

ආචාර්ය එස්.ඩී. දේවසුරේන්ද්‍ර
ආචාර්ය ඩී.එච්.එස්. මෛත්‍රීපාල

කළමනාකරණ පීඨය

ආචාර්ය එස්. කොඩිතුවක්කු මිය
එම්.ජී.පී.ඩී. මැණිකේ

වෛද්‍ය පීඨය

වෛද්‍ය කේ. මාරඹේ (2017-02-23 දක්වා)
වෛද්‍ය එස්. ඩී. ධර්මරත්න (2017-02-24 දක්වා)
වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා (2017-03-31 දක්වා)
වෛද්‍ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු (2017-07-19 දක්වා)

විද්‍යා පීඨය

එල්.ආර්.කේ. පෙරේරා (2017-02-21 දක්වා)
ආචාර්ය ඒ.ඒ.එස්. පෙරේරා
මහාචාර්ය ඩබ්.බී. දවුන්ඩසේකර (2017-02-02 සිට)

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

වෛද්‍ය පී.ජී.ඒ. පුෂ්පකුමාර (2017-09-21 සිට)
වෛද්‍ය කේ.එන්.ඒ. විජයවර්ධන
වෛද්‍ය එල්.ජී.එස්. ලොකුගලප්පත්ති (2017-08-16 දක්වා)

1.4 සමස්ත කාර්ය සාධනය

1.4.1. වජ්‍ර ජයන්ති සැමරුම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වජ්‍ර ජයන්ති (75වන වසර) උළෙල 2017 වසර පුරාම විවිධ ක්‍රියාකාරකම් සිදුකරමින් උත්කර්ෂවත් අයුරින් සමරන්නට විය. "A Diamond thus far and beyond" තේමාව යටතේ මෙම උළෙල සමරන ලදී.

1.4.1. (අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වජ්‍ර ජයන්ති සැමරුමේ සමාරම්භය

ඉහත සැමරුමේ සංකේතාත්මක සමාරම්භය ජනවාරි 10දින, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කුලපති, උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල හා සිසුන්ගේ සහභාගිත්වයෙන් විශ්වවිද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී පැවැත්විණ. උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක විසින් පිළිගැනීමේ කථාව පවත්වා වජ්‍ර ජයන්ති සැමරුම විවෘත කරන ලදී. මෙම උළෙලේ ප්‍රධාන දේශනය පුරෝගාමී විද්‍යාර්ථියෙකු හා ලෝක සම්මානලාභී රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වන ආචාර්ය ජයන්ත ධනපාල විසින් පවත්වන ලදී. 1978 විශ්වවිද්‍යාල පනත යටතේ එතෙක් ස්වාධීන වූ විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලය ලෙස නැවත නම් කිරීමෙන් අනතුරුව ප්‍රථම උපකුලපති වූ යාවජීව මහාචාර්ය බී.එල්. පණ්ඩිතරත්න සහ ප්‍රථම ලේඛකාධිකාරී එම්.බී. අධිකාරම් මහතා විසින් ඔවුන්ගේ අතීත අත්දැකීම් ගෙනහැර පාමින් දේශන පවත්වන ලදී. මහාචාර්ය මාධව මීගස්කුඹුර විසින් සකස්කළ විශ්වවිද්‍යාලයේ විශේෂ අවස්ථා ඉස්මතු කර දැක්වෙන වීඩියෝපට ඉදිරිපත් කිරීමක් ද, ප්‍රථම උපාධි සිසුන් විසින් ඉදිරිපත් කළ රංගනයකින් ද, ශාස්ත්‍ර පීඨයේ ආචාර්ය රෝහන සෙනවිරත්න විසින් ඉදිරිපත් කළ සංස්කෘතික දැක්මකින් ද මෙම සමාරම්භක උළෙල වර්ණවත් විය.

1.4.1 (ආ) 2017 වජ්‍ර ජයන්ති සැමරුමේ උපකුලපති තුමාගේ දේශන මාලාව

වජ්‍ර ජයන්ති උළෙල සමරනු පිණිස "උපකුලපති තුමාගේ සම්භාවනීය දේශන මාලාව" යන තේමාව යටතේ දේශන මාලාවක් සියලුම පීඨවලදී පවත්වන ලදී. එම දේශන පහත සඳහන් පරිදිය.

I. මෙම දේශන මාලාවේ ප්‍රථම දේශනය කෘෂි කාලගුණ විද්‍යාව, වර්ෂාපතනයේ විෂමතා හා ශ්‍රී ලාංකික කෘෂිකර්මාන්තය යන තේමාව යටතේ කෘෂිකර්ම දෙපර්තමේන්තුවේ, ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය රංජිත් පුනාවර්ධන විසින් පෙබරවාරි 22 දින ශාස්ත්‍ර පීඨ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

II. මෙහි දෙවැනි දෙසුම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය කමල් ජයසිංහ විසින් ශ්‍රී ලංකාවේ වෛද්‍ය ප්‍රතිපත්තියේ පරිණාමය පිළිබඳව පවත්වන ලදී. මෙම දෙසුම මාර්තු 30 දින විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

III. ශ්‍රී ලංකාවේ "සෞඛ්‍ය කම්කරු පිරිස" යන තේමාව යටතේ තෙවන දෙසුම දන්ත වෛද්‍ය පීඨය විසින් සංවිධානය කරන ලදුව වෛද්‍ය දීලීප් ද සිල්වා විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය කලාගාරයේ දී මැයි මස 16 දින පවත්වන ලදී. සෞඛ්‍ය අත්දැකීම්, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවන් හා වෛද්‍ය කම්කරු පිරිසේ සැලසුම්කරණය පිළිබඳ සහභාගි වුවන් දැනුම්වත් කිරීම මෙම දෙසුමේ ඉලක්කය විය.

IV. ඉංජිනේරු පීඨයේ වජ්‍ර ජයන්ති කමිටුව විසින් සංවිධානය කරන ලද සිව්වැනි දේශනය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු මහාචාර්ය ගිහාන් අමරතුංග විසින් ජූනි 16 දින ශාස්ත්‍ර පීඨ කලාගාරයේ දී පවත්වන ලදී.

V. කළමනාකරණ පීඨය විසින් සංවිධානය කරන ලද පස්වැනි දේශනය "උගත් යොවනයන්ගේ විරැකියාව හා පිළියම්" යන තේමාව යටතේ මහාචාර්ය ආනන්ද ජේ. පටබැඳි විසින් ජූලි 26 දින කළමනාකරණ පීඨ ශ්‍රවණාකාගරයේ දී පවත්වන ලදී.

VI. විද්‍යා පීඨය විසින් සංවිධානය කළ හයවැනි දෙසුම වන ජීව විද්‍යාව පිළිබඳ ප්‍රසිද්ධ පර්යේෂක යාවජීව මහාචාර්ය නිමල් ගුණතිලක 2017 සැප්තැම්බර් 11 දින රසායන විද්‍යා ඉහළ දේශන ශාලාවේ දී පවත්වන ලදී.

VII. පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද හත්වැනි දේශනය "අවධානම සහ ගැටලු අවම කරමින් ගෘහස්ථ හා වන ජීවීන්ගේ ප්‍රයෝජන උපරිමයෙන් සමාජයට ලබාදීම" යන තේමාව යටතේ මහාචාර්ය ඔස්වින් පෙරේරා විසින් ඔක්තෝම්බර් 26 දින සනාතන මන්දිර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.

1.4.1. (ඇ) වජ්‍ර ජයන්ති "විද්‍යාවේ ආශ්චර්යය" පිළිබඳ වැඩසටහන

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වජ්‍ර ජයන්ති සැමරුම් උළෙල කොටසක් ලෙස වයඹ පළාතේ අ.පොෙ.ස.(උ.පෙ.) විද්‍යා, විෂයධාරාව හදාරන සිසුන් 700කට පමණ විද්‍යාවේ ආශ්චාර්යය යන තේමාව යටතේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. ගිරිඋල්ල හා කුරුණෑගල අධ්‍යාපන කොට්ඨාශවලදී සිසුන් (මැයි 03 හා ජුනි 14) දිනවල මේ සඳහා සහභාගි වූ අතර රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය වජිර සෙනෙවිරත්න සහ ඔහුගේ ඉදිරිපත් කිරීම් කණ්ඩායම විසින් මෙම වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල ප්‍රධාන අමුත්තා ලෙස උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක සහභාගි වූ අතර ඔහු මෙම වැඩසටහන විද්‍යාවේ අරුම පුදුම දැක්මක් ලෙස ඇගයීමට ලක් කළේය. වජ්‍ර ජයන්ති සංවිධායක කමිටුවේ සභාපති මහාචාර්ය කේ.සමරසිංහ මෙම වැඩසටහන්වල විශේෂ ආරාධිතයා ලෙස සහභාගි වුවේය. රසායන විද්‍යා අධ්‍යයන අංශය හා විද්‍යා අධ්‍යාපන ඒකකය එක්ව ඉහත වැඩ සටහන් සංවිධානය කළේය. එම වැඩසටහන්වල අනුග්‍රහකයා ලෙස කටයුතු කළේ වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවයි.

1.4.1 (ඈ) රසායන විද්‍යාවේ ආශ්චාර්යය

වජ්‍ර ජයන්ති සැමරුමේ කොටසක් ලෙස විද්‍යා පීඨය විසින් ඉහත තේමාව යටතේ කෙටි ක්‍රියාකාරකමක් සංවිධානය කොට මාර්තු 01 දින රසායන විද්‍යා ශාලාවේ දී පවත්වන ලදී.

1.4.1 (ඉ) මධ්‍යම පළාතේ අ.පොෙ.ස. (උ. පෙ.) සිසුන් සඳහා පැවැත් වූ කථික තරගය

අධ්‍යාපන හා පර්යේෂණ සංසදයේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එක්ව ඉහත වැඩසටහන පවත්වන ලදී. ප්‍රථමයෙන් පළාත් අධ්‍යාපන නිළධාරීන් සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා වෙනස් වීම යන තේමාව යටතේ කළමනාකරණ පීඨ ශ්‍රවණාගාරයේ දී මාර්තු 23 දින පවත්වන්නට විය. උපකුලපති උපුල් බී දිසානායක මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.බී. ඒකනායක මධ්‍යම පළාත් අධ්‍යාපන සංවර්ධන අධ්‍යක්ෂ නිහාල් අලහකෝන් මයා, මධ්‍යම පළාතේ අධ්‍යාපන කොට්ඨාශ 15 ක කලාප අධ්‍යාපන නිළධාරීන් මේ සඳහා ආරාධනා ලැබුවෝ වුහ. භාෂා තුනෙන්ම පැවැත්වූ මෙහි දිස්ත්‍රික් වැඩසටහනට අධ්‍යාපන හා පර්යේෂණ සංසදයේ සාමාජිකයන් ද සහභාගි වූ අතර අවසන් පළාත් තරග උපකුලපති තුමාගේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ සහභාගිත්වයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී. මහාචාර්ය අශෝක දංගොල්ල අධ්‍යාපන හා පර්යේෂණ සංසදයේ කැඳවුම්කරු විය.

1.4.1. (ඒ) ශාස්ත්‍ර පීඨය විසින් සංවිධානය කළ කාර්යයන්

I. විශ්වවිද්‍යාල ඉතිහාසය කෙටියෙන් තල්පත්වල ලිවිමේ කාර්යය දියත් කිර්මේ උත්සවය මාර්තු 17 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨ කලාගාරයේ දී පවත්වන ලදී.

II. ගායකයන්, සංගීතඥයන් හා ගීත රචකයන්ට උපහාර දැක්වීම

විශ්වවිද්‍යාලයට ගීත රචනය තුළින් දායක වූ කලාකරුවන්හට උපහාර දැක්වීමක් වජ්‍ර ජයන්ති සැමරුම් උළෙල යටතේ සංවිධානය කොට විශ්ව විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී මාර්තු 22 වැනි දින පවත්වන ලදී.

1.4.1 (උ) වජ්‍ර ජයන්ති උළෙල සැමරීමේ ආගමික කටයුතු

විශ්වවිද්‍යාලයේ 75 වන වසර සැමරුම වෙනුවෙන් පහත සඳහන් ආගමික කටයුතු ජූලි 02 දින පවත්වන ලදී.
අ. විශ්වවිද්‍යාල පල්ලියේ විශේෂ ප්‍රජාව
ආ. විශ්වවිද්‍යාල හින්දු කෝවිලේ විශේෂ ප්‍රජාව
ඇ. විශ්වවිද්‍යාල මුස්ලිම් පල්ලියේ විශේෂ යාඥාව
ඈ. පිරිත් සජ්ජායනය හා දානය පිරිනැමීම-සනාතන මන්දිර පරිශ්‍රය ජූලි 2 දින

1.4.1 (ඌ) උත්කර්ෂවත් සංගීත සංදර්ශණය "හන්තාන සංවේද"

පේරාදෙණිය විශ්වවිද්‍යාල ඉංජිනේරු පීඨ විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් සංවිධානය කළ නාට්‍ය ගීත ඇතුළත් ඉහත සංගීත සංදර්ශනය ජූනි 29 දින විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී පැවැත්විය. කේ.බී. හේරත් විසින් මෙම සංගීත සංදර්ශනය මෙහෙයවන ලදී. ජයලත් මනෝරත්න, නිශ්ශංක දිද්දෙණිය, රොඩ්නි වර්ණකුල හා රත්නාලාලනි යන මහත්ම මහත්මීන් ඇතුළුව ප්‍රසිද්ධ කලාකරුවන් රාශියක් මේ සඳහා සහභාගි වුහ.

1.4.1 (ඒ) විද්‍යා අභියෝගතා තරගය

ඉහත තරගයට සහභාගිවීම පිණිස හොඳම පාසැල් 16 තෝරා ගැනීමේ මූලික තේරීම් පරීක්ෂණය ජූනි 16 වැනි දින විද්‍යා පීඨයේ රසායන විද්‍යා ඉහළ දේශන ශාලාවේ දී පවත්වන ලදී. අදාළ පාසල්වල විදුහල්පතිවරුන් විසින් එක් පාසලකින් සිසුන් සිව්දෙනෙකු (4) නම් කළ අතර අ.පොෂ. (උ.පෙළ.) විද්‍යා විෂය ධාරාවේ සිසුන් පාසල් 70ක් නියෝජනය කරමින් සිසුන් 280 ක් සහභාගි වුහ. මෙහි ප්‍රධාන අමුත්තා ලෙස උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක සහභාගි විය. විද්‍යා අභියෝගතා ප්‍රශ්න විචාරාත්මක තරගය 2017 ඔක්තෝම්බර් 11 දින පැවැත් වූ අතර එහි සම ශූරයන් බවටපත් වුයේ රත්නපුර සීවලි විද්‍යාලය හා කෑගල්ල ශාන්ත ජෝසප් විද්‍යාලයයි. ජයග්‍රහකයන්ගේ විස්තර පහත පරිදිය.
රත්නපුර සීවලි විද්‍යාලය, බී.ජී.යූ. ජනින්, යූ.ජී. වික්‍රමාරච්චි, එස්.ටී. රත්නායක, එච්. ලක්ෂිත, ශාන්ත ජෝසප් විද්‍යාලය කෑගල්ල, කේ.කේ.එච්.එන්.එන්. රත්නායක, ඩබ්.ආර්.එච්. බණ්ඩාර, කේ.ජී.එස්. කොඩ්බෑගල, එස්. ජයලත්

1.4.1 (ඒ) වජ්‍ර ජයන්ති-ප්‍රධාන සැමරුම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වජ්‍ර ජයන්ති ප්‍රධාන සැමරුම් උළෙල ජූලි 06 වැනි දින කලාගාරයේ දී පවත්වන්නට විය. විශ්වවිද්‍යාල ලාංඡනය ඇතුළත් සමරු සටහන වූ ඩයමන්ඩ් ජුබිලි 1942-2017 සනිටුහන් කළ සමරුඵලකය, කුලපති අතින් විවෘත වීමත් සමඟ උත්සවයේ කටයුතු ආරම්භ විය. උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතීන්, අනෙකුත් විද්වතුන්, අනධ්‍යයන කාර්යමණ්ඩලය හා සිසුන් මෙම අවස්ථාවට සහභාගි අනතුරුව විශ්වවිද්‍යාලයීය කුලපති සනාතන මන්දිර පරිශ්‍රයට කැඳවාගෙනවිත් විශ්වවිද්‍යාලයේ 75 වැනි සැමරුම සනිටුහන් කරමින් පැලයක් රෝපණය කරන ලදී.

ඉන් අනතරුව පැවති උත්සව සභාව වෙත කුලපති, උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතීන්, පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරුන් තිදෙනා ඇතුළත් පෙරහැර කලාගාරය වෙත ගමන් කරන්නට විය. උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායකගේ පිළිගැනීමේ කථාවෙන් අනතුරුව කුලපති විසින් ඔහුගේ කථාව

පැවැත්විය. ඉන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය මද්දුම බණ්ඩාර විසින් විශේෂ අමුත්තන්ගේ දේශනය පවත්වන ලදී.

මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භකයා වූ අයිවර් ජෙනිංග්ස් විසින් සිදුකළ වැදගත් කාර්යභාරයට ගෞරව දැක්වීමක් ලෙස උපකුලපතිතුමාගේ ඉල්ලීමකට අනුව කැනි වට්සන් විසින් එවන ලද පණිවිඩය මෙම අවස්ථාවේ දී විකාශනය කරන ලදී. මෙය රැස්ව සිටි පිරිසගේ ඇගයීමට ලක්විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඓතිහාසික අවස්ථාවන් සනිටුහන් කරමින් "A Birds Eye view of the University of Peradeniya" නමින් යුතු සාර සංග්‍රහයක් එළිදක්වන ලදී. විශ්වවිද්‍යාලය පිළිබඳ ක්ෂණික දැක්මක් පාඨකයාට ලබාදෙන මෙවැනි සාරසංග්‍රහයක් රචනා කළ ප්‍රථම අවස්ථාව මෙය වන අතර එහි ප්‍රධාන සංස්කාරක මහාචාර්ය ආර්.එල්. විජයවීර විසින් එහි පිටපතක් කුලපති වෙත පිළිගන්වන ලදී.
විශ්වවිද්‍යාලයේ වජ්‍ර ජයන්ති සැමරුම පාදක කොටගනිමින් මුද්දරයක් නිකුත් කිරීම ද මෙහිදී සිදු වූ සුවිශේෂී සිද්ධියකි.

මෙම අවස්ථාවේ දී පරිත්‍යාග දෙකක් උපකුලපති වෙත පිරිනමන ලදී. ඉන් එක් පරිත්‍යාගයක් වූ රුපියල් මිලියන 1.5ක මුදලක් සිංහ සමාජය විසින් බැක්හෝ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ද දෙවන පරිත්‍යාගය සිදුකරණ ලද්දේ දන්ත වෛද්‍ය පීඨයේ විද්‍යාර්ථයෙකු වන මහාචාර්ය ලක්ෂමන් සමරණායක විසිනි. විශ්වවිද්‍යාලයේ උසස් මට්ටමේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පර්යේෂණ විශිෂ්ටතාවය වෙනුවෙන් වාර්ෂික ත්‍යාගයක් ස්ථාපිත කිරීම සඳහා මෙම පරිත්‍යාගය පරිනමා ඇත.
මෙම සැමරුම් උළෙලේ කැපීපෙනෙන සිදුවීම වුයේ සෑම පීඨයකම වඩාත් කැපීපෙනෙන ශාස්ත්‍රීය ජයග්‍රහණ දායකත්වයන් ඇගයීමට ලක් කිරීමයි. වඩාත් ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා, වඩාත් ජ්‍යෙෂ්ඨ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයා හා අධ්‍යයන සහය කාර්ය මණ්ඩල සාමාජිකයා ද මෙහි දී ඇගයීමට ලක්විය.

1.4.1 (ඔ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රාරම්භක උපකුලපති අයිවර් ජෙනිංග්ස් ශ්‍රීමතානන්ගේ පිළිරුව විවෘත කිරීම

අයිවර් ජෙනිංග්ස් ශ්‍රී මතානන්ගේ මිනිබිරියක් වන රෙබේකා සේරා කේන් මහත්මිය අතින් දෙසැම්බර් 6 වැනි දින මෙම විවෘත කිරීම සිදුවූ අතර එම අවස්ථාවට කුලපති කේ.එම්.ද සිල්වා, උපකුලපති උපුල් බී. දිසානායක, වජ්‍ර ජයන්ති කමිටුවේ සම සභාපති හා නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ආර්.එල්.විජයවීර, රෙබේකා කේන් මහත්මියගේ ස්වාමිපුරුෂයා වන තිමොති විලියම් රිචඩ් මහතා හා වෙනත් සම්භාවනීය අමුත්තන් සහ පීඨාධිපතීන්, පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරුන් ද සහභාගි වුහ. මෙම කාර්යයෙන් අනතුරුව කෙටි වුවත් වර්ණවත් උත්සවයක් කලාගාරයේ දී පවත්වන ලදී.
මෙම උත්සවයේ පිළිගැනීමේ කථාව පවත්වමින් උපකුලපති මහාචාර්ය උපුල් බී දිසානායක අයිවර් ජෙනිංග්ස් ශ්‍රීමතානන් විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉටුකළ මහඟු දායකත්වය සිහිපත් කරදෙන්නට විය. අයිවර් ජෙනිංග්ස් ශ්‍රී මතානන්ගේ කාලයේ ශිෂ්‍යයෙකුව සිටි වත්මන් කුලපති කේ.එම්.ද සිල්වා එම අතීතය රැස්ව සිටි පිරිසට ගෙනහැර පෑවේය. යාවජීව මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රාරම්භකයාගෙන් සිදුවූ ඉමහත් සේවාව ඉස්මතු කරමින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. මෙහිදී ප්‍රධාන අමුත්තිය ලෙස ඇමතූ රොබකා කේන් මහත්මිය තම සීයා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට කළ කැපවීම හා ශ්‍රී ලංකාව කෙරෙහි දැක්වූ ආදරය සෙනෙහස පිළිබඳ ඇගේ අදහස් දැක්වුවාය.
ඒ සමගම එස්.ඒ.සී. මොහොමද් ෂුහයිලි මහතා හා ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක විසින් කතෘත්වය දරන කෘතියක් විශ්විවිද්‍යාලයේ 1966 ශිෂ්‍ය කණ්ඩායම වෙනුවෙන් ප්‍රධන අමුත්තියට හා කුලපතිවරයාට ප්‍රදානය කරන ලදී.

UNIVERSITY OF PERADENIYA

75 1942-2017 years

A diamond thus far and beyond

Diamond Jubilee celebration

වජ්‍ර ජයන්ති සැමරුම වෙනුවෙන් ආගමික කටයුතු සිදුකිරීම

පේරාදෙණිය වජ්‍ර ජයන්ති සැමරුමේ සමාරම්භය



වජ්‍ර ජයන්ති උළෙලේ ප්‍රධාන සැමරුම

1.4.2 2016 උපාධි ප්‍රදානෝත්සවය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉමහත් උත්කර්ෂමත් අවස්ථාවක් වන උපාධි ප්‍රදාන උත්සවයේ 79 වැනි උපාධි ප්‍රදානෝත්සවය මැයි මස 25 වැනි දින පවත්වන ලදී. පීඨ නවයෙන් හා පශ්චාත් උපාධි ආයතන දෙකෙන් මෙවර උපාධි ලබාගත් උපාධිලාභීන් සංඛ්‍යාව 3492 වූ අතර ඒ අතරින් ප්‍රථම උපාධි 2672 ක් හා පශ්චාත් උපාධි 820ක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කුලපති මහාචාර්ය කේ.එම්.ද සිල්වා විසින් ප්‍රදානය කරන්නට විය. උපාධිලාභීන් අතර දර්ශනශූරී උපාධි 37ක් හා පශ්චාත් උපාධි 783ක් පීඨවලින් හා පශ්චාත් උපාධි ආයතන තුනෙන් ප්‍රදානය කරන්නට විය. පෙර වසරේ දී මෙන්ම මෙවරද උපාධිලාභීන්ගේ සංඛ්‍යාව ඉහළගිය හෙයින් උපාධි ප්‍රදානෝත්සවය සැසි දෙකකට පවත්වන ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය 79 වැනි උපාධි ප්‍රදානෝත්සවය සංවිධානය කිරීමේ වගකීම වෛද්‍ය පීඨයට පැවරුණු අතර වෛද්‍ය පීඨාධිපති මහාචාර්ය වජිර වීරසිංහ උපාධි ප්‍රදානෝත්සව කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේය.
මෙවර උපාධි ප්‍රදානෝත්සවය ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් පිටත සිටි පිරිසට නැරඹීම සඳහා විකාශනය කෙරෙනු අතර එය අන්තර්ජාලය ඔස්සේ ලෝකය පුරා ද විකාශනය කරන්නට විය. මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ ප්‍රධාන් අනුග්‍රාහකයන් වූයේ මහජන බැංකුව හා ලංකා බැංකුවයි.

වගුව 1 උපාධිලාභීන්ගේ සාරාංශ වාර්තාව

පීඨය /ආයතනය	උපාධි	උපාධි අනුව මුළු ගණන	මුළු සංඛ්‍යාව
කෘ.වි.ප.උ.ආ.	දර්ශනශූරී	8	272
	දර්ශනපති	24	
	ව්‍යාපාර පරිපාලනපති	23	
	විද්‍යාපති	217	
වි.ප.උ.ආ	දර්ශනශූරී	15	251
	දර්ශනපති	26	
	විද්‍යාපති	210	
මා.ශා.හා ස.වි.ප.උ.ආ	දර්ශනශූරී	7	262
	දර්ශනපති	23	
	ශාස්ත්‍රපති	220	
	එම්.ඩී.පී.	12	
කෘ.වි. පීඨය	විද්‍යාවේදී (කෘ.කළ)	149	200
	විද්‍යාවේදී	39	
	විද්‍යාවේදී (ආ.වි.තා.)	12	
සම සෞඛ්‍ය වි.පීඨය	වෛද්‍ය රසායනාගාර විද්‍යා	24	129
	හෙදවේද	37	
	ඖෂධවේද	21	
	භෞත චිකිත්සාව	28	
	විකිරණවේද	19	

වගු අංක 1 හා සම්බන්ධ වේ.

පීඨය /ආයතනය	උපාධි	උපාධි අනුව මුළු ගණන	මුළු සංඛ්‍යාව
	නීතිවේදී	60	
	ශාස්ත්‍රවේදී (විශේෂ)	616	
	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	212	
ද.වෛද්‍ය පීඨය	දර්ශනශූරී	1	
	දන්ත වෛද්‍යවේදී	114	115
ඉංජිනේරු	දර්ශනශූරී	2	
	දර්ශනපති	4	
	විද්‍යාපති (ඉංජි.)	13	488
	විද්‍යාවේදී	469	
කළමනාකරණ	ව්‍යාපාර පරිපාලනවේදී	79	79
වෛද්‍ය	දර්ශනශූරී	3	
	දර්ශනපති	5	
	විද්‍යාපති	2	221
	වෛද්‍ය විද්‍යාවේදී	211	
විද්‍යා පීඨය	විද්‍යාවේදී (විශේෂ)	147	
	විද්‍යාවේදී (ව්‍යාපාර)	38	
	විද්‍යාවේදී (සාමාන්‍ය)	119	
	විද්‍යාවේදී (SOR)	43	413
	විද්‍යාවේදී (පරි.කළම.)	66	
පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා	දර්ශනශූරී	1	
	දර්ශනපති	1	
	පශු වෛද්‍ය විද්‍යාපති	3	78
	පශු වෛද්‍ය විද්‍යාවේදී	73	
එකතුව		**3450**	**3450**

1.4.3 බාහිර උපාධි ප්‍රදානෝත්සවය - 2016

බාහිර උපාධි ප්‍රදානෝත්සවය නොවැම්බර් 23 දින මහනුවර පොල්ගොල්ල මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ශාස්ත්‍රවේදී උපාධිය හා ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ උපාධිලාභීන් 1222 දෙනෙකු මෙහිදී උපාධි ලබාගත්හ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති එහි ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.

1.4.4 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2017

මෙම පර්යේෂණ සැසිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වඩාත් ගෞරවාන්විත සිදුවීම්වලින් එකකි. පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කරලීම අතිශය වැදගත් කටයුක්තක් වන අතර එම ඉලක්කය සාක්ෂාත් කරගැනීමට මෙම සැසිය තුළින් පහසුකම් සලසනු ලබයි. මෙම සමුළුව විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන දේශීය හා විදේශීය පර්යේෂකයන්ට ඔවුන්ගේ බහු ක්ෂේත්‍ර පර්යේෂණ හා යෙදුම්වල නවතම ඵලඹුම් පිළිබඳ දැනුම හා අත්දැකීම් හුවමාරු කරගන්නා සංසදයක් නිර්මාණය කරදෙනු ලබයි. මේ වසරට දසකය සම්පූර්ණ කරන සම සෞඛ්‍ය විද්‍යා පීඨයට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 75 වන වසර සැමරීමට සමගාමීව මෙම සැසියේ සත්කාරකත්වය දැරීමේ වගකීම පවරන ලදී.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති දේශබන්දු මහාචාර්ය ටියුලි ද සිල්වා ප්‍රධාන අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගි වුවේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපති කේ.එම්.ද සිල්වා, උපකුලපති උපුල් බී දිසානායක, නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ආර්.එල්. විජයවීර සම සෞඛ්‍ය විද්‍යා පීඨාධිපති, ඩී.බී.එම්. වික්‍රමරත්න, වෙනත් පීඨවල පීඨාධිපතීන්, ආරාධිත අමුත්තන් හා ඉදිරිපත් කිරීම් කරන්නන් මෙහි සමාරම්භක උත්සවයට සහභාගි වන්නට විය.

ඉහත වාර්ෂික පර්යේෂණ සැසිය 21 වැනි වරටත් මේ වසරේ නොවැම්බර් 24 දින පවත්වන ලදී. මෙම සැසියේ දී කාලගුණය, පරිසරය හා ජෘතුවි විද්‍යාවන්, ආර්ථික විද්‍යාව හා කළමනාකරණය, අධ්‍යාපනය, ඉංජිනේරු හා ගොඩනැගු පරිසරය, ආහාර පෝෂණය හා පශු සම්පත්, සෞඛ්‍ය විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය ගණිතය හා සංඛ්‍යානය, ස්වභාවික විද්‍යාවන් හා මානව ශාස්ත්‍ර යන තේමාවන් දහය (10) ආවරණය කරන්නට විය. එමෙන්ම මෙම සැසියේ දී වාචික ඉදිරිපත් කිරීම් 213ක් හා පෝස්ටර් ඉදිරිපත් කිරීම් 195ක් ඉදිරිපත් කරන ලදී.

1.4.5 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලද සම්මාන

1.4.5 අ) 2015 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන

2015 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වෙන්වූ සම්මාන 200ක් අතුරෙන් ජනාධිපති සම්මාන 62ක් තරම් ඉහළම සම්මාන ප්‍රමාණයක් දිනාගැනීම පිළිබඳ සලකා බලන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාත්මක ප්‍රකාශනවල ජයග්‍රහණය එහි අභිමානයට පාත්‍රවේ. එම සම්මාන අතුරෙන් තුනෙන් එකක්ම දිනාගැනීමට හැකිවීම අතිවිශිෂ්ට වන අතර ඊට සම්බන්ධ වූ විද්වතුන් ප්‍රශංසාවට ලක්කළ යුතුවේ. තේරීම් හා සම්මානලාභීන් සියලුම විශ්වවිද්‍යාලවලින් හා ශ්‍රී ලංකා පර්යේෂණ ආයතනවලින් තෝරාගනු ලැබූ අතර එවන් වැඩිම සම්මාන ප්‍රමාණයක් අත්කර ගැනීම සත්‍ය වශයෙන්ම විජයග්‍රහණයකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය දසක ගණනාවක් තිස්සේ පර්යේෂණ ප්‍රතිඵල හා නවනිපැයුම් සියගණනකට තෝතැන්නක් වී ඇති බව සටහන් කිරීම වැදගත් වේ.
විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීම නොවැම්බර් මස 06 වැනි දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේ දී ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. රාජ්‍ය

අමාත්‍ය හා එතුමාගේ අමාත්‍යාංශ ලේකම් පිළිවෙළින් ගුරු ලක්ෂමන් සෙනෙවිරත්න හා උදය ආර්.සෙනෙවිරත්න, ජාතික පර්යේෂණ සභාවේ සභාපති හා එහි විධායක ලේකම් මහාචාර්ය එච්. ජනක ද සිල්වා හා මනිෂා රාජපක්ෂ මහත්මිය, සහ තවත් කීර්තිමත් විද්‍යාඥයන් බොහෝ දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම ජාතික පර්යේෂණ සභාව මඟින් සංවිධානය කරන ලද අතර ජ්‍යාන්තර තත්ත්වයට පත් ශ්‍රී ලාංකික විද්‍යාඥයන්ට ගරුත්වයක් වශයෙන් එය 2001 වසරේ දී ආරම්භ කරන ලදී.
මේ වසරේ දී විද්‍යාඥයෝ 200දෙනෙක් ඔවුන්ගේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා සම්මාන ලබාගත්හ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්මාන ලාභීන් පහතින් දැක්වේ.

නම	අධ්‍යයන අංශය/ක්ෂේත්‍රය
ඒ. අභයගුණවර්ධන	ළමා රෝග
සී.ජී. අත්තනායක	පාරිසරික පාංශු රසායන විද්‍යාව
සී.සී.ජී. බණ්ඩාරණායක	අණුක ජීව විද්‍යාව, ජෛවරසායන විද්‍යාව හා ජාන විද්‍යාව
ජී.ජේ. බින්දුහේවා	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු
ආර්. චන්ද්‍රජිත්	භූගර්භ, භූ රසායන විද්‍යාව
යූ. චතුරංග	ඔසුවේද හා විෂවිද්‍යා
ටී.එල්. දසනායක	ස්නායු භෞතික විද්‍යාව හා කොග්නිටිව් ස්නායු විද්‍යාව
පී.ද. සිල්වා	වෙක්ටර් ජීව විද්‍යාව හා සත්ව චරියාව
ආර්.එස්. ධර්මකීර්ති	පාංශු විද්‍යාව
පී.එල්. ධර්මප්‍රිය	භූගර්භ විද්‍යාව
එස්.ඩී. ධර්මරත්න	ප්‍රජා සෞඛ්‍ය
ඩී.එම්.එස්.බී. දිසානායක	ශාක විද්‍යාව
එම්.ඒ.කේ.එල්. දිසානායක	පර්යේෂණාත්මක ඝන තත්ත්ව භෞතික විද්‍යාව
අයි. ගවරම්මන	වෛද්‍ය
සී.වී.එස්. ගුණතිලක	නිවර්තන වන පරිසර විද්‍යාව
අයි.ඒ.යූ.එන්. ගුණතිලක	ක්ෂුද්‍රජීව විද්‍යා හා වන ජීව විද්‍යාව
එන්. ගුණවර්ධන	රසායනික ද්‍රව්‍ය ඉංජිනේරු
ටී. හේවාවසම්	භූගර්භ, භූරසායන විද්‍යාව භූ රූප විද්‍යාව, භෞතික භූගෝලය
ආර්.පී. ඉලේපෙරුම	මුඛ ව්‍යාධිවේදය, මුඛ පිළිකා
ආර්. ජයසිංහ	මුඛ වෛද්‍ය හා විකිරණ විද්‍යාව
ඊ.එන්. ජයවීර	ඩයි සෙන්ටිසයිස්ඩ් සොල සෙල්ස්
ඩී.එන්. කරුණාරත්න	පොලිසැචරයිඩිස්, ප්‍රෝටීන්
වී. කරුණාරත්න	රසායන විද්‍යාව
එස්.පී. කොඩිතුවක්කු	ප්‍රජනන ජීවවිද්‍යාව හා අනුකජීව විද්‍යාව
කේ.එස්.කේ. කොට්ටාවත්ත	ක්ෂුද්‍රජීව විද්‍යා ආහාර ආරක්ෂණය
එස්.ඒ.එම්. කුලරත්න	නිවර්තන වෛද්‍ය
ජී.ආර්.ඒ. කුමාර	සුර්ය සෛල නැනෝ තාක්ෂණය
කේ. මාදුවගේ	වෛද්‍ය සායනික හිෂග්වේදය
ඩී.එච්.එස්. මෛත්‍රිපාල	පාලන පද්ධතිය
එස්.පී.කේ. මලවිආරච්චි	භූගර්භ පෘතුවි විද්‍යව
බී. මාරඹේ	පෑලෑටි විද්‍යාව හා කාලගුණික වෙනස
ඒ.බී. මැදගම	දියවැඩියාව සාමාන්‍ය ප්‍රතිකාර
එම්. මීගස්කුඹුර	පාරිසරික හා පරිණාමීය ජාන

නම	අධ්‍යයන අංශය/ක්ෂේත්‍රය
එස්. මීගස්කුඹුර	සත්ව විද්‍යාව
එෆ්. මොහොමද්	භිෂග්වේදය, විෂ විද්‍යාව, සායනික ඖෂධ
එන්. නානායක්කාර	සිවිල් ඉංජිනියරිං
ඒ. නවරත්න	විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව
එස්.පී. නිශ්ශංක	බෝග විද්‍යාව
සී. පලන්ගසිංහ	ඖෂධ කළමනාකරණය සායනික පර්යේෂණ
ආර්. පෙරේරා	කාලගුණික පරිණාම මොඩලිං
එච්.එම්.ටි.ජී.ඒ. පිටවල	භූරසායන විද්‍යාව හා පාෂණ විද්‍යාව
එන්. ප්‍රියන්ත	රසායන විද්‍යාව
අර්.එස්. රාජකරුණා	පරපෝෂ විද්‍යාව
ආර්.එම්.ජී. රාජපක්ෂ	රසායන විද්‍යාව
එස්. රාමචන්ද්‍ර	සත්ව විද්‍යාව
සී.එස්.කේ. රණසිංහ	ලේසර් ස්පෙක්ට්‍රස්කොපි
කේ.ජී.සී. සේනාරත්න	රසායන විද්‍යාව
ජී. සෙනෙවිරත්න	සත්ව විද්‍යාව
එස්. ශාමි	ජීව සංඛ්‍යාන සායනික පරියේෂණ භිෂග්වේදය
එෆ. සිහානා	සායනික විෂ විද්‍යාව
ආර්. ශිවකනේෂන්	ජීව රසායන විද්‍යාව
එච්.ඒ. සුරවීර	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු
එල්.ඩී.බී. සූරියගොඩ	ශෂ්‍ය විද්‍යාව හා බෝග මොඩලිං
එස්. තලගහගොඩ	ළමා රෝග
වී. තෙවනේසම්	වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව
ඩබ්.එම්. තිලකරත්න	මුඛ ව්‍යාධවේදය
එම්.වයි.උඩුගල ගනේහේනගේ	ඵෙන්ද්‍රීය රසායන විද්‍යාව
ජේ.කේ. විදානආරච්චි	ක්ෂුද්‍රජීව විද්‍යාව
ඩබ්.එම්.එන්.එම්.බී. වන්නිනායක	නැනෝ විද්‍යාව හා නැනෝ තාක්ෂණය
එල්.වි.වයි. විරරත්න	ශෂ්‍ය විද්‍යාව හා පරිසර භෞතික විද්‍යාව හා බෝග වැඩි දියුණුව
එල්.කේ. වීරසිංහ	ශාඛ විද්‍යාව පරිසර භෞතික විද්‍යාව වැවිලි කෘෂිකර්මාන්තය
ඒ. වික්‍රමසිංහ	වන පරිසර විද්‍යාව ස්වාභාවික සම්පත් කළමනාකරණය

1.4.5 (ආ) වඩාත් විශිෂ්ට ශ්‍රී ලාංකික සම්මානය - 2017

වෛද්‍ය පීඨයේ ප්‍රසව හා නාරීවේද අධ්‍යයන අංශයේ මහාචාර්ය ජී.කේ.එච්. කපිල ගුණවර්ධනයන්ට ඔහු විසින් ශ්‍රී ලාංකික සමාජයේ සෞඛ්‍ය සත්කාරයේ ප්‍රගමනයට හා යහපත උදෙසා ඔහු විසින් ඉටුකළ මෙහෙයට ගෞරවයක් වශයෙන් ඉහත සම්මානය පිරිනමන ලදී

1.4.5 (ඇ) විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන්ගේ ආයතනයේ කීර්තිමත් ජාත්‍යන්තර සම්මානය

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශයේ ආචාර්ය එස්.ඒ.එච්.ඒ. සුරවීර විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සන්නිවේදන සංගමයේ ලෙනාඩ් ජී.එබ්‍රිහිමි ත්‍යාගයේ සමලාභියා ලෙස නම් කොට ඇත. මෙම සම්මානය ඔහු වෙත ප්‍රදානය වන්නේ ඔහු විසින් සම කතෘත්වය දරණ පර්යේෂණ පත්‍රයක් වෙනුවෙනි. එම සම්මානය ප්‍රදානය කිරීමේ සාමාන්‍ය පදනම වනුයේ පසුගිය වසර තුනක කාලය තුළ ඉහත ආයතනය මගින් පලකරනු ලබන වාර සඟරාවේ පර්යේෂණ පත්‍ර අතුරින් හොඳම පර්යේෂණ පත්‍රයටයි. ඔහු

වර්තමාණය වනවිට IEEE ආයතනයේ සන්නිවේදනය සම්බන්ධ කර්යයන්වල කතුවරයෙක් ලෙස ද කටයුතු කරයි. එමෙන්ම ඔහු විසින් 2011 වසරේ "IEEE" සන්නිවේදන සංගමයේ ආසියා සම්මානය ද දිනාගෙන ඇත.

1.4.5. (ඈ) ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මානය

සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශයේ මහාචාර්ය ජේ.ජේ. විජේතුංග විසින් ඔහුගේ පර්යේෂණ කාර්යයක් වෙනුවෙන් ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන - 2017 දිනාගන්නා ලදී. ජාතික විද්‍යා පදනමේ 50 වැනි සංවත්සර සැමරුම් උළෙලේ සම්මාන ප්‍රදානය කිරීමේ අවස්ථාවේ දී ඔහු වෙත සමරු සටහනක් සහතික පත්‍රයක් සහ මුදල් තෑගයක් පිරිනමා ඇත.

1.4.5. (ඉ) මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ සම්මානය

අධ්‍යාපන අධ්‍යයන අංශයේ කථිකාචාරිණී ආචාර්ය සමන්තා නානායක්කාර ක්‍රීඩා අධ්‍යාපනයේ හා පර්යේෂණ කාර්යේ දී දැක්වූ විශිෂ්ටතාව වෙනුවෙන් ඉහත සම්මානය 2017 ලබාගෙන ඇත. ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුම් දිනයේ දි මධ්‍යම පළාත් කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කළසම්මාන ප්‍රදාන උත්සවයේ දී (මාර්තු 8 දින) මෙම ප්‍රදානය සිදුකරන ලදී. ඇයට මෙම සම්මානය ප්‍රදානය කරන ලද්දේ මහනුවර ඉන්දියා නියෝජ්‍ය මහා කොමසාරිස්වරයා ඉදිරියේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසිනි.

1.4.5 (ඊ) ඉන්දීය ASEAN ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය

"ශ්‍රී ලංකාවේ මහනුවර වැවේ හා මැද ඇලේ දූෂණය අවම කිරීම" යන තේමාව යටතේ පැවැත්වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියට ඉහත සම්මානය ASEAN ඉංජිනේරු සංගමය විසින් ප්‍රදානය කොට ඇත. මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයේ හා සිංගප්පුරුවේ නැන්යැං පරිසර හා ජල පර්යේෂණ ආයතනය අතර සහයෝගිතා ව්‍යාපෘතියකි.

1.4.5 (උ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා සභාව මගින් ප්‍රදානය කළ කෘෂිකර්ම පර්යේෂණ විශිෂ්ටතා ජාතික සම්මානය - 2017

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ විද්‍යාඥයන් කණ්ඩායමක් විසින් "පශු සම්පත් හා මත්ස්‍ය අංශය" යටතේ සිදුකළ පර්යේෂණයක් සඳහා ඉහත සම්මානය දිනාගන්නා ලදී. මහාචාර්ය පී. අබේනායක, ආර්.එස්. කළුපහන, වෛද්‍ය ඩී.එම්.එස්. මුනසිංහ, වෛද්‍ය බී.ආර්. ප්‍රනාන්දු, වෛද්‍ය එම්.එච්. හතුරුසිංහ, වෛද්‍ය කේ.එස්.ඒ. කොට්ටාවත්ත, වෛද්‍ය ඩබ්.එම්.ඒ.පී. වනිගසේකර, ඒ.ආර්.සී.ගුණසේන මහතා හා වෛද්‍ය එච්.එම්.ටී.කේ. කරුණාරත්න මෙම කණ්ඩායමට ඇතුළත් වූහ.

1.4.5 (ඌ) "නාදි කදන්ත කලාම්"

වැඩබලන පුස්තකාලයාධිපති ආර්. මහේෂ්වරන් මහතා විසින් ඉදිරිපත් කළ නාදි කදන්ත කලාම් කෘතිය වෙනුවෙන් නුවරඑළිය සිනේ සිටා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී ඔක්තෝබර් 08 දින පැවැත් වූ මධ්‍යම පළාත් දෙමළ සාහිත්‍ය සම්මාන උළෙලේදී සම්මානයක් පිරිනමන ලදී. 2015/2016 වසර සඳහා වූ පර්යේෂණ කටයුතු කාණ්ඩය යටතේ හොඳම කෘතිය වෙනුවෙන් මෙම සම්මානය ප්‍රදානය කරන්නට විය. මහේස්වරන් මහතා මීට පෙර අවස්ථා දෙකකදී මෙම සම්මානයෙන් පිදුම් ලබා ඇත.

1.4.5. (ඒ) ASEAN ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය

ලියන් පාරිසරික වාර්ෂික සහෘදත්ව පදනම යටතේ සිදුකළ මහනුවර වැවේ හා මැද ඇලේ දූෂණය අවම කිරීම පිළිබඳ ව්‍යාපෘතියට ASEAN ඉංජිනේරු සංවිධාන විසින් එහි 35 වැනි වාර්ෂික සමුළුවේ දී ඉහත සම්මානය පිරිනමා ඇත. මෙම සමුළුව 2017 නොවැම්බර් 18 දින තායිලන්තයේ බැංකොක් නුවරදී පවත්වන ලදී.
සිංගප්පුරුවේ නන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා ව්‍යාපෘතියකි. මෙහි ප්‍රධාන විමර්ශක ලෙස කටයුතු කළේ ආචාර්ය ශාමින් ජිනදාසයි. මීට පෙරද මෙම ව්‍යාපෘතියට 2017 වසරේ දී සිංගප්පුරුවේ ඉංජිනේරු ආයතනයෙන් මෙම කීර්තිමත් සම්මානය හිමිවී ඇත.
මෙම ASEAN ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය ප්‍රදානය කිරීමේ දී අදාළ ව්‍යාපෘතිය තුළින් පිළිබිඹු කෙරෙන විශිෂ්ට ඉංජිනේරු කුසලතාවන් හා ජන ජීවිතයේ ගුණාත්මක බව දියුණු කිරීමට එතුළින් ඇති කරන බලපෑම කෙරෙහි අවධානය යොමු කරයි.
මහනුවර ගිණිකොණ දිග ආසියාවට ඇතුළත් නොවුනත් මෙම සම්මාන ප්‍රදානය සඳහා එම ව්‍යාපෘතියේ පහත සඳහන් සුවිශේෂතා සැලකිල්ලට ගෙන ඇත.

- ජන ජීවිතයේ යහපත සඳහා ඉටුවන දායකත්වය
- පවතින ගැටළුවලට විසඳුම් සෙවීමේ දී සැලසුම් කිරීමේ සපිර බව හා සැලසුමේ අරමුණ
- අදාළ ද්‍රව්‍ය හා ක්‍රමවේද යොදා ගැනීමේ දක්ෂතාව
- සැලසුම් කිරීම, සැලසුම් නිර්මාණය හා ඉදිකිරීමේ නව නිර්මාණ ශීලිත්වය

1.4.6 සිසුන් විසින් ලබාගත් සම්මාන

1.4.6 (අ) ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා දක්ෂතා සම්මානය

ශ්‍රී ලංකා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම විසින් සංවිධානය කළ 6 වැනි තරුණ පර්යේෂණ සංසදයේ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයේ දී පරිසර විද්‍යා කාණ්ඩය යටතේ විද්‍යා පීඨයේ සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශයේ එම්.ඒ.එම්. අබ්‍රාජී මහතා විසින් ඉදිරිපත් කළ ප්‍රථම උපාධි අපේක්ෂක ව්‍යාපෘතියට දක්ෂතා සම්මානය හිමිවිය. මෙම සම්මන්ත්‍රණය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම ජෛවතාක්ෂණ මධ්‍යස්ථානයේ දී ජනවාරි 20 දින පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුලගේ වේගය හා දිශා දත්ත විශ්ලේෂණය යන තේමාව මෙම ඉදිරිපත් කිරීම සඳහා යොදා තිබුණ අතර මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කරන ලද්දේ එම අධ්‍යයන අංශයේ ම මහාචාර්ය පී. විජේකෝන් විසිනි.

1.4.6 (ආ) ලුසි ද ආබෘ රන් පදක්කම

දත්ත වෛද්‍යවේදී උපාධියේ ප්‍රථම පරීක්ෂණය දෙසැම්බර් මාසයේ දී පැවැත් වූ අතර එහි දී ඩබ්.එස්.කේ.චන්ද්‍රරත්න මිය (D/12/010) හොඳම ශිෂ්‍යාට හිමි ඉහත රන් පදක්කම දිනාගන්නා ලදී.

1.4.6 (ඇ) IDAHOT විසින් සංවිධානය කළ කෙටි චිත්‍රපට තරඟයේ හොඳම වීඩියෝව සඳහා ප්‍රථම ත්‍යාගය

සමලිංගික ප්‍රඥාව විසින් මුහුණපාන ගැටළු පිළිබඳව දැනුවත් භාවය මතුකරලීම සඳහා ඒ සම්බන්ධ ජාත්‍යන්තර දිනයක් පැවැත්වීම වැදගත්වේ. මෙම කෙටි චිත්‍රපට තරඟය "ශ්‍රී ලංකාවේ සම ලිංගිකයන් විසින් මුහුණපාන නොඉවසීම, බැහැර කිරීම හා ප්‍රචන්ඩත්වය යන තේමාව යටතේ මැයි මස 17 දින කොළඹ ජර්මානු සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. මේ තරඟය සඳහා සහභාගි වූ දිවයින පුරා විසිරී සිටින

තරඟකරුවන් අතරින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ මනෝ විද්‍යා අධ්‍යයන අංශයේ සිසු කණ්ඩායමක් විසින් එහි ප්‍රථම ත්‍යාගය දිනාගන්නා ලදි.

1.4.6 (ඈ) ඉංජිනේරු පීඨ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම

කොළඹ විශ්වවිද්‍යාලයේ ගණනය පිළිබඳ පාසල විසින් සංවිධානය කළ නැගී එන කලාප සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ වර්ධනයන් පිළිබඳ 17 වැනි ජාත්‍යන්තර සමුළුවේ දී ඉංජිනේරු පීඨයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශයේ ශිෂ්‍යයින් වූ එස්.එස්.පී.විතාන, ඒ.එම්.ආර්.අබයසේකර සහ ටී.එස්.ජේ. ඕර්ලෝෆ විසින් හොඳම පර්යේෂණ පත්‍රයට හිමි සම්මානය ලබා ගන්නා ලදී. ඉදිරිපත් වූ පර්යේෂණ පත්‍ර 50ක් අතුරෙන් ඉහත සිසුන් විසින් ඉදිරිපත් කළ “Hyperspectoral Irnaging Based Land Cover Mapping using Data obtained by the Hyperion sensor” තේමාවෙන් යුතු පර්යේෂණ මෙම සම්මානය ලබාදෙන ලද්දේ එහි අන්තර්ගත වී තිබූ උසස් තාක්ෂණික දායකත්වයටයි. විදුලි හා විද්‍යුත් අධ්‍යයන අංශයේ ආචාර්ය එම්.එම්.වී.ආර්. හේරත්, ආචාර්ය ජී.එම්.ආර්.සී.ගොඩලියද්ද සහ ආචාර්ය එම්.පී.බී.ඒකනායක විසින් මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කරන ලදී.

1.4.6 (ඉ) ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ හොඳම තාක්ෂණික පර්යේෂණ පත්‍රය

ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ මූලස්ථානය එක්සත් රාජධානියේ පිහිටා ඇති අතර ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ තිබෙන පුරෝගාමී වෘත්තීය ඉංජිනේරු සංවිධානයකි. ශ්‍රී ලංකා ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය ගෝලීය ජාලයේ වඩාත් ක්‍රියාශීලම ආයතනවලින් එකකි. එම ආයතනයේ තරුණ වෘත්තීය අංශය තරුණ වෘත්තීය ඉංජිනේරු වරුන්ගෙන් හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයන්ගෙන් යුක්ත වන අතර එම පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය කිරීමේ කටයුතු වල නිරතවේ.
මෙම ආයතනයේ 15 වැනි වාර්ෂික තාක්ෂණික සමුළුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ දී ජූලි මස 16 දින පවත්වන ලදී. මෙහිදී තරුණ පර්යේෂකයන්ට ඔවුන් සොයාගත් පර්යේෂණ දැනුම විද්වතුන්, කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තිකයන් හා තරුණ ඉංජිනේරුවරුන් සමඟ හුවමාරු කරගැනීමේ අවස්ථාව උදාවේ.
හොඳම තාක්ෂණික පර්යේෂණයට පාත්‍ර වූ සම්මානය දිනාගත් කණ්ඩායම

- සචිනි ඒකනායක
- නීලංග තේලසිංහ
- බවන්ත උඩුගම

අධීක්ෂණය කළේ

- ආචාර්ය රොෂාන් ගොඩලියද්ද
- ආචාර්ය පරාක්‍රම ඒකනායක
- ආචාර්ය ලිලන්ත සමරනායක
- ආචාරය ජනක විජයකුලසූරිය

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශයේ සචිනි ඒකනායක හොඳම ඉදිරිපත් කිරීමේ දෙවන ස්ථානය හිමිකර ගත්තාය.

1.4.6 (ඊ) ආසියා පැසිෆික් මයික්‍රොවේව් සමුළුවට සහභාගිවීම - 2017

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂක කසුන් වීරකෝන් නොවැම්බර් 13-16 දින දක්වා මැලේසියාවේ ක්වාලම්පුර් පැවැත්වූ ආසියා පැසිපික් මයික්‍රොවේව් සමුළුවට සහභාගි විය. මෙම සමුළුව ආසියා කලාපයේ පැවැත්වෙන ප්‍රධාන පෙලේ සමුළුවක් වන අතර එහිදී විදුලි හා විද්‍යුත් අංශයේ කටයුතු සම්බන්ධයෙන් විවිධ කාර්යයන් සිදුවේ. මෙවර මෙම සමුළුවට ටෙක්මාර්ක් රිකිසයිට් ටෙක්නොලොජීස්,

MPIකෝපරේෂන් හාNEDI ටෙක්නොලොජීස් වැනි ලෝකයේ පුරෝගාමී සමාගම්වල සම්භාවනීය හා කීර්තිමත් විද්වතුන් සහභාගි විය. මෙම සමුළුවේ දී වැදගත් මාතෘකා ඔස්සේ නිබන්ධන හා වැඩමුළු කිහිපයක් ද පවත්වන්නට විය. කසුන් වීරකෝන් විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන්ගේ ආයතනයේ පේරාදෙණිය විශ්වවිද්‍යාල පාර්ශවයේ සභාපති ද වෙයි.

1.4.6. (උ) IESL-UTE රසප් බෙරි Pi අභියේගතාව-2017

UTE හා IESLවිසින් සංවිධානය කළ ඉහත අභියෝගතාවට මුළු අයදුම්කරුවන් 46 දෙනෙකු වූ අතර ඉන් 32 ක් ප්‍රථම උපාධි අපේක්ෂක කාණ්ඩයේ හා 14 ක් පාසැල් කාණ්ඩය යටතේ ඉදිරිපත් කර තිබිණි. 2017 ජුනි මස මෙය ආරම්භ වීමෙන් පසු සියලුම කණ්ඩායම්වලට බහුවිධ ප්‍රගති තක්සේරු පරීක්ෂණවලට මුහුණ දීමට සිදුවිය. රසප්බෙරි උපකරණය ප්‍රධාන ඒකකය ලෙස භාවිතා කරන ඔවුන්ගෙ නව සොයාගැනීම්වල ඵලදායිතාවය හා වාසිය පිළිබඳව විනිසුරුවරුන් විසින් විමසා බලන ලදී.

1.4.6. (ඌ) IEEEXtreme 10.0 ශ්‍රී ලාංකික ජයග්‍රහනයන්

2016 වසර සඳහා IEEEXtreme 10.0 ගෝලීය සංකේත යෙදීමේ තරගය 2017 ඔක්තෝම්බර් 22 වැනි දින පෙ.ව. 5.30 සිට පසු දින උදෑසන දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශ පරිශ්‍රයේ දී පවත්වන ලදී. ලෝකයේ විශාලතම වෘත්තීය ආයතනය වන විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් සෑම වසරකම පවත්වන මෙම තරඟයට දහස් ගණනින් සහභාගි වේ.
මේ වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ IEEE ශිෂ්‍ය ශාඛාව නියෝජනය කළ කණ්ඩායම් සංඛ්‍යාව 30කට අධික විය. කෙසේ වෙතත් 24 පැය අවසානයේ දී බයිටිකෝඩ් කණ්ඩායම ලංකාවේ ප්‍රථම ස්ථානය හා ලෝකයේ 62 දෙවන ස්ථානයේ රැඳෙන්නට විය. ගිහාන් චානක, සමෘද්ධි කරුණාරත්න හා හර්ෂනණ සුමේධ බයිටිකෝඩ් කණ්ඩායම නියෝජනය කළහ.

1.4.6 (ඒ) 4 වැනි IEEE විද්‍යුත් සැලසුම්කරණ තරගය 2016-මුල් ස්ථාන තුන

අපේක්ෂක සිසුන් වෙනුවෙන් 4 වැනි විද්‍යුත් සැලසුම්කරණ තරගය ශ්‍රී ලංකා විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් සංවිධානය කොට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී හා මොරටුව විශ්වවිද්‍යාලයේ දී ජනවාරි 14 දින පවත්වන්නට විය. මේ තරඟය සඳහා විශ්වවිද්‍යාල පහෙන් (5) කන්ඩායම් 30 කට අධික සංඛ්‍යාවක් සහභාගි විය. එම කණ්ඩායම් අතුරෙන් පළමු දෙවන හා තෙවන ස්ථාන තුනම පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් දිනාගැනීම සුවිශේෂී ජයග්‍රහණයකි. තරගයේ ජයග්‍රාහකයන් පහතින් දැක්වේ.
ප්‍රථම ස්ථානය

- ශානක රමේෂ් ගුණසේකර
- මාලින්ද සුලෝචනා සිල්වා
- රුචිර තිලාන් මුනසිංහ

දෙවන ස්ථානය

- ටී. චානක හෙට්ටිගේ
- එස්.එම්. අකිල හේමාල්
- ජේ.එම්.ටී.ආර්. ජයවික්‍රම

තෙවන ස්ථානය

- මාලින්ද උරින් බණ්ඩාර ජයතිලක
- ජේ.ඩී. චතුස්ක චමිත් රත්නපාල
- ආර්.එම්.යු.කේ.එච්.එම්. කුමාර රත්නායක

1.4.7 ගෝලීය ශ්‍රේණිගත කිරීම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2017 වසරේ වෙබෝ මේට්‍රික් ශ්‍රේණිගත කිරීමේ අංක 01 ස්ථානයේ පසුවිය.

	2012 ජන	2012 ජූලි	2013 ජන	2013 ජූලි	2014 ජන	2014 ජූලි	2015 ජන	2015 ජූලි	2016 ජන	2016 ජූලි	2017 ජන	2017 ජූලි	2018 ජන
ශ්‍රේණිය	1909	2467	2711	2973	2810	2479	2466	2225	2349	2158	2349	2116	2044



1.4.8 අධ්‍යයන සංවර්ධනය හා සැලසුම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාතික හා ගෝලීය සන්දර්භය තුළ උසස් අධ්‍යාපනයේ වෙනස්වන ප්‍රවණතාවන් සමග නිරන්තරයෙන්ම ගමන් කොට ඇත. මතුව එන ප්‍රවණතාවන් හා අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වමින් අධ්‍යයන පුහුණු වැඩසටහන්වල හා ක්‍රියාමාර්ගවලට නව පියවර ගැනීමත් අධ්‍යයන සැලසුම් හා සංවර්ධනවල සංශෝධන සිදුකිරීමක් අනුගමනය කොට ඇත.

විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය, මුදල් පරිපාලනය, අධ්‍යයන පරිපාලනය, පුස්තකාලය, විවිධ අධ්‍යයන වැඩසටහන්වලට මෙන්ම එදිනෙදා අධ්‍යයන හා වෙනත් කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම්වලට තත්ත්වාරක්ෂණ ක්‍රියාවලි යාන්ත්‍රණය හඳුන්වා දී ඇත.

1.4.9 අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය ස්ථාපිත කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/4 හි සඳහන් මාර්ගෝපදේශයන්ට අනුකූලව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය 2016 පෙබරවාරි 15 දින ප්‍රතිස්ථාපනය කරන ලදී.

සැලසුම්කිරීම, සංවිධානය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය හා සියලුම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් වාර්තා කිරීම හරහා විශ්වවිද්‍යාලය තුළ තත්ත්වාරක්ෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කොට ආයතනගත කිරීම මෙම ඒකකයේ පරමාර්ථය වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල මට්ටමින් පීඨ තත්ත්වාරක්ෂණ සංසඳ ස්ථාපිත කොට ඇත.
සනාතන සභාව හා එහි අනුකමිටු අධ්‍යයන හා සැලසුම් කමිටුව මෙන්ම අභ්‍යන්තර තත්වාරක්ෂණ ඒකකය ද තත්ත්වාරක්ෂණ කටයුතුවල නිරන්තරයෙන් නිරත වේ. පීඨ මට්ටමින්, පීඨ මණ්ඩල හා ඒවායේ විෂයමාලා සංවර්ධනය අනු කමිටු පීඨයේ තත්ත්වාරක්ෂණ සංසඳය සමඟ එක්ව නිත්‍ය තත්ත්වාරක්ෂණ කටයුතු බාරගෙන කටයුතු කරයි.

1.4.10 විෂයමාලා හා වැඩසටහන් සංවර්ධනය

විශ්වවිද්‍යාලය එහි අධ්‍යයන වැඩසටහන් ක්‍රමවත්ව සමාලෝචනය හා සංශෝධනය කිරීම අඛණ්ඩව සිදුකිරීමේ හා විශ්වවිද්‍යාලයේ දැක්ම මෙහෙවර හා ඉලක්කයන්ට අනුගතවන ආකාරයෙන් එහි අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යෑමේ සංස්කෘතියක් විශ්වවිද්‍යාලය සතුව පවති. මෙම කරුණු සම්බන්ධයෙන් උපකුලපති, පීඨාධිපතීන් හා ආයතනවල අධ්‍යක්ෂකවරුන් සනාතන සභාවට වාර්තා කරයි. පාඨමාලා හා පාඨමාලා ඒකකවල සංශෝධන පීඨ විෂයමාලා සංවර්ධන කමිටු, පීඨ මණ්ඩල, සනාතන සභා අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටු හා සනාතන සභාව විසින් අනුමත කරනු ලබයි. මේ සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡා හා උපදේශන නිත්‍ය පදනම මත සිදුකෙරේ.

විශ්වවිද්‍යාලයීය පීඨ ඒවායේ අධ්‍යයන පාඨමාලාවල තත්ත්වය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා ප්‍රවණතාවන්ට සමානවන ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා ඉහලනැංවීම පිණිස ඒවායේ විෂයමාලා අඛන්ඩව සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීමේ කටයුතුවල නියැලි ඇත. විශ්වවිද්‍යාලයේ සියලු අධ්‍යයන වැඩසටහන්වල විෂයමාලාවන් වර්තමාන තත්ත්වයන්ට හා නිර්දේශිත ප්‍රතිපත්ති ලේඛනයේ සඳහන් සීමාවන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව පවතින බවට ප්‍රබල සාක්ෂි ඇත.

පහතින් සඳහන් වනුයේ සමාලෝචිත වර්ෂයේ දී සනාතන සභාව විසින් සිදුකරන ලද වැදගත් නිර්දේශ කිහිපයකි.

වැදගත් සනාතන සභා නිර්දේශ-2017

පීඨය ප.උ.ආයතන	වැඩසටහන	සනාතන සභාව නිර්දේශ කළ දිනය	පාලක සභාව අනුමත කළ දිනය
කෘ.වි.ප.ආයතනය	SLQF මාර්ගෝපදේශයන්ට අනුව මෙම ආයතනයේ පවතින වැඩසටහන්වල රෙගුලාසිවලට සුළු සංශෝධන සිදු කිරීම.	2016.11.16 දින පැවැත් වූ 416 වැනි රැස්වීම	2017.01.28 දින පැවැත් වූ 459 වැනි රැස්වීම
	ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඒකාබද්ධ උපාධි පාඨමාලාවෙන් නිකුත් කරන උපාධි සහතිකයේ නිවැරදි කිරීම්.	2016.03.20 දින පැවැත් වූ 420 වැනි රැස්වීම	2016.06.24 දින පැවැත් වූ 464 වැනි රැස්වීම
විද්‍යා ප.උ.ආයතනය	ජීව වෛද්‍ය විද්‍යාවන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය ස්ථාපිත කිරීම සඳහා යෝජනාව.	2016.01.20 දින පැවැත් වූ 415 වැනි රැස්වීම	2016.12.17 දින පැවැත් වූ 458 වැනි රැස්වීම
	දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ නව විද්‍යාපති වැඩසටහනේ පාඨමාලා අන්තර්ගතය.	2016.12.15 දින පැවැත් වූ 417 වැනි රැස්වීම	2017.02.25 දින පැවැත් වූ 460 වැනි රැස්වීම

පීඨය ප.උ.ආයතන	වැඩසටහන	සනාතන සභාව නිර්දේශ කළ දිනය	පාලක සභාව අනුමත කළ දිනය
මා.ශා.සහ ස.වි.ප.උ. ආයතනය	චිරස්ථායි සංචාරක ව්‍යාපාරය පිළිබඳ පශ්චාත් උපාධි වඩසටහන් හදුන්වාදීමේ යෝජනාව (ආ) චිරස්ථායි සංචාරක ව්‍යාපාරපති උපාධිය (ආ) චිරස්ථායි සංචාරක ව්‍යාපාරය පිළිබඳ විද්‍යාපති උපාධිය	2016.11.16 දින පැවැත් වූ 416 වැනි රැස්වීම	2017.01.28 දින පැවැත් වූ 459 වැනි රැස්වීම
	මනෝවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට නව පාඨමාලා හදුන්වා දීම	2016.12.15 දින පැවැත් වූ 417	2017.02.25 දින පැවැත් වූ 460 වැනි රැස්වීම
	ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි හදුන්වා දීමේ යෝජනාව	2017.07.22 දින පැවැත් වූ 420 වැනි රැස්වීම	2017.06.24 දින පැවැත් වූ 464 වැනි රැස්වීම
	ලලිතකලා ශාස්ත්‍රපති/දර්ශනපති උපාධිවල විෂය නිර්දේශය සංශෝධනය	2017.05.17 දින පැවැත් වූ 422 වැනි රැස්වීම	2017.08.05 දින පැවැත් වූ 465 වැනි රැස්වීම
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	නීති සහ රෙගුලාසි	2016.11.16 දින පැවැත් වූ 416 වැනි රැස්වීම	2017.01.28 දින පැවැත් වූ 459 වැනි රැස්වීම
	එම පීඨයේ උසස් උපාධි කමිටුවක් ස්ථාපිත කිරීම	2017.03.22 දින පැවැත් වූ420 වැනි රැස්වීම	2017.06.24 දින පැවැත් වූ 464 වැනි රැස්වීම
ශාස්ත්‍ර පීඨය	පවතින උපාධි වැඩසටහන්වලට නව පාඨමාලා හඳුන්වා දීමේ යෝජනාව	2017.03.17 දින පැවැත් වූ 422 වැනි රැස්වීම	2017.08.05 දින පැවැත් වූ 465 වැනි රැස්වීම
	ශාස්ත්‍රවේ දී උපාධියට ප්‍රංශ භාෂාව හා සංස්කෘතික අධ්‍යයනය හදුන්වාදීමේ යෝජනාව		
දන්ත වෛද්‍ය පීඨය	දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසලක් පිහිටුවීම	2017.02.15 දින පැවැත් වූ 419 වැනි රැස්වීම	2017.05.20 දින පැවැත් වූ 462 වැනි රැස්වීම
ඉංජිනේරු පීඨය	ඉංජිනේරු විද්‍යාවේ දී උපාධියේ සිවිල් ඉංජිනේරු විශේෂ උපාධියේ විෂයමාලාව සංශෝධනය	2016.11.16 දින පැවැත් වූ 416 වැනි රැස්වීම	2017.01.28 දින පැවැත් වූ 459 වැනි රැස්වීම
	ඉංජිනේරු පීඨයේ ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලාව හදුන්වා දීම, නැනෝ තාක්ෂණය හඳුන්වා දීම		
	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශයට තාක්ෂණික පාඨමාලා දෙකක් හඳුන්වා දීම	2017.05.17 දින පැවැත් වූ 422 වැනි රැස්වීම	2017.08.05 දින පැවැත් වූ 465 වැනි රැස්වීම
	එම අධ්‍යයන අංශයේ පශ්චාත් උපාධි ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලා හතරක සංශෝධන		
	නිෂ්පාදන හා කර්මාන්ත ඉංජිනේරු අධ්‍යයන අංශය ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලා –PR521 හදුන්වා දීම.		
	ආකලන නිෂ්පාදන හර පාඨමාලා දෙකක් සංශෝධනය කිරීම හා නව ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලා හදුන්වාදීම	2017.06.21 දින පැවැත් වූ 423 වැනි රැස්වීම	2017.08.26 දින පැවැත් වූ 466 වැනි රැස්වීම
	නව ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලාව CO515 හඳුන්වා දීම පරිගණක ජාලකරණයේ වර්ධනයන් තෝරාගත් මාතෘකා	2017.08.16 දින පැවැත් වූ 425 වැනි රැස්වීම	2017.10.28 දින පැවැත් වූ 469 වැනි රැස්වීම
	ටෙක්නිකල් ඉලෙක්ට්‍රිව් පාඨමාලාව - EE669 හඳුන්වා දීම විදුලි හා විද්‍යුත් අධ්‍යයන අංශයේ පශ්චාත් උපාධි වැඩසටහනේ සන්නිවේදන පද්ධතිය ප්‍රතිසංස්කරණය		
කළමනාකරණ පීඨය	ව්‍යාපාර පරිපාලනවේ දී උපාධි සහතිකයේ සැකැස්ම වෙනස් කිරීම	2016.10.20 දින පැවැත් වූ 415 වැනි රැස්වීම	2016.12.17 දින පැවැත් වූ 458 වැනි රැස්වීම
	කළමනාකරණ පීඨයේ ඩිප්ලෝමා යෝජනාව	2017.03.22 දින පැවැත් වූ 420 වැනි රැස්වීම	2017.06.24 දින පැවැත් වූ 464 වැනි රැස්වීම

1.4.11 ඉගැන්වීම හා ඉගෙනීම

විශ්වවිද්‍යාලය එහි අධ්‍යයන පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමය පිළිගෙන ඇත. කෙසේ වෙතත් විවිධ පීඨ මෙම ක්‍රමය විවිධාකාරයෙන් ක්‍රියාත්මක කරයි. විද්‍යා විෂයන් පදනම් කරගත් සියලුම පීඨ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමය ක්‍රියාත්මක කරන අතර කලා පීඨය හා කළමනාකරණ පීඨ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේදයක් බවට පත් කරමින් සිටින නමුත් මෙම පීඨවල සමහර විෂය ක්ෂේත්‍රයන් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමය ක්‍රියාත්මක කරයි.

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම්/ඉගැන්වීම් සම්පත් කළමනාකරණය කොට වෙන්කර දෙනු ලබන්නේ මධ්‍යම පරිපාලනයට වඩා පීඨ විසිනි. ඒ අනුව සෑම පීඨයක්ම එහි සම්පත් ආචාර්යවරුන් හා සිසුන් අතර සාධාරණව හා සමසේ බෙදාහැරීමේ වගකීම දරයි. බොහොමයක් පීඨ අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක මධ්‍යස්ථාන සිසුන්ගේ පරිහරණය සඳහා ස්ථාපිත කොට ඇත. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය සියලු පීඨවල සියලුම සිසුන්ට ඉංග්‍රිසි භාෂාව දියුණු කර ගැනීමේ අවස්ථාව උදාකර දී ඇත. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය අදාළ සියලුම කාර්ය මණ්ඩල නිත්‍යව හා කාර්යක්ෂමව පුහුණු කිරීමේ ප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම බාරව කටයුතු කරයි.

විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ ඉගැන්වීමේ සමාලෝචන සිසුන් ගෙන් ලබාගෙන ඒවා ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් වඩා වර්ධනය කරගැනීම සඳහා ලබාදෙයි.

1.4.12 පර්යේෂණ ප්‍රතිඵල

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාලගුණය, පරිසරය හා පෘථිවි විද්‍යාවන්, ආර්ථික විද්‍යාව හා කළමනාකරණය, අධ්‍යාපනය, ඉංජිනේරු හා ගොඩනැගු පරිසරය, ආහාර පෝෂණය හා පශු සම්පත් සෞඛ්‍ය විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ගණනය සහ සංඛ්‍යානය, ශාඛ විද්‍යාවන් හා වනජීවී සහ සමාජ විද්‍යාවන් හා මානව ශාස්ත්‍ර වැනි අංශ කිහිපයක පර්යේෂණ ප්‍රතිඵල ඉහළනංවා ගනිමින් පර්යේෂණ කාර්යයයේ ප්‍රමුඛතාවය අඛන්ඩව පවත්වා ගැනීමට සමත්විය.
විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබන පර්යේෂණවල ගුණාත්මක භාවය එහි අධ්‍යයන ස්ථාවරත්වය සඳහා දායකවේ. පර්යේෂණ සිදුකිරීම සඳහා විශේෂයෙන් විද්‍යා විෂයන් පදනම් කරගත් අධ්‍යයන අංශවලට අවශ්‍ය උපකරණ, භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය ආදී යටිතල පහසුකම් සියල්ල පවතී. බොහෝමයක් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා පර්යේෂණ හා පුළුල් රචනා, ව්‍යාපෘති වාර්තා, නිබන්දන බාරදීම අවශ්‍යවේ. විශාල පර්යේෂණ සංඛ්‍යාවක් සිදුකොට එම පර්යයේෂණ ප්‍රකාශනවල පළ කෙරේ. සමාලෝචන වාරසඟරා, දේශීය හා ජාත්‍යන්තර වාරසඟරා, උදෘත, උපාධි නිබන්දන ඉදිරිපත් කිරීම් හා සන්නිවේදනය ඊට ඇතුළත්ය. මේ පිළිබඳ වැඩි විස්තර පහත වගුවේ දැක්වේ.

1.4.13 ප්‍රදානය කළ පර්යේෂණ ප්‍රදාන (බාහිර ප්‍රදාන 2010-2017)

	2010	2011	2012	2013	2014	2015	2016	2017
බාහිර පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	131	133	156	155	123	128	102	86
වටිනාකම (රු. මිලියන)	28	24	52	60	105.18	112.392	92.799	113.111



ප්‍රදානය කළ විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන 2010-2017

	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017
විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන මුළු සංඛ්‍යාව	52	54	42	0	48	63	93	67	0	82	57
වටිනාකම (රු. මිලියන)	4	4	4	0	4	11	52.85	48.48	0	80.17	34.4

- කෘෂි විද්‍යා, කලා හා කළමනාකරණ පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් ලබාගත් පර්යේෂණ ප්‍රදාන අදාළ පශ්චාත් උපාධි ආයතන විසින් වෙනම ක්‍රියාත්මක කරනු ලබයි.



1.4.14 ප්‍රජා කටයුතුවල නියැලීම, උපදේශන හා සමාජ වැඩ

විශ්වවිද්‍යාලය කර්මාන්ත ක්ෂේත්‍රයට හා ජන සමාජයට සේවාවන් හා සමාජ සේවාවන් ප්‍රවර්ධනය කොට සැපයීම පිණිස මධ්‍යස්ථාන හා ඒකක විශාල සංඛ්‍යාවක් ස්ථාපිත කොට ඇති අතර ඒවා තුළින් අතිවිශාල පුහුණු වැඩසටහන් හා පාඨමාලා සංඛ්‍යාවක් වසරකට පවත්වනු ලබයි. ඊට අමතරව පීඨ හා අධ්‍යයන අංශ මඟින් ද සැලකිය යුතු කෙටි පාඨමාලා හා ප්‍රජා වැඩසටහන් ප්‍රමාණයක් පිරිනමනු ලබයි. විවිධ සේවාවන් හරහා ප්‍රජා සංවර්ධන කටයුතුවල ක්‍රියාශීලීව නියැලීමේ වැදගත්කම විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන ඇත.

ශාස්ත්‍ර පීඨයේ දේශපාලන අධ්‍යයන අංශය දැනුම ව්‍යාප්ත කිරීමේ සමුළුවක් නොවැම්බර් 29 දින මහනුවර ඔක්රේ රීජෙන්සි හෝටලයේදී පවත්වන ලදී. "පාලනයේ හා පුරවැසියන්ගේ තත්ත්වය" ශ්‍රී ලංකාවේ ජනතාව හා දේශපාලන ආයතන පිළිබඳ විශ්වාසය තබන්න යන්න මෙම සමුළුවේ තේමාව විය.

1.4.15 දුරස්ථ අධ්‍යාපනය

විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා පිරිනමනු ලබයි. ඒ සියලු වැඩසටහන් විශ්විද්‍යාලයේ දැක්මට හා මෙහෙවෙරට අනුකූල වේ. වර්තමානය වනවිට විශ්වවිද්‍යාලය ශාස්ත්‍රවේදී බාහිර උපාධිය හා ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) වශයෙන් උපාධි පාඨමාලා දෙකක් ද කළමනාකරණය හා සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමාවක් ද ප්‍රදානය කරනු ලබයි.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා විවෘත හා දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් පිරිනැමීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ, සනාතන සභාවේ, පාලක සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. එබැවින් එම වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා රජයේ උසස් අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල වේ. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට ISO 9001:2015 සහතිකය ලද ආයතනයක් බවට 2016 වසරේදී පත්විය. මෙරට දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනය වෙනුවෙන් ඉහත සහතිකය ලබාගත් මෙරට පවතින ආයතන කිහිපයෙන් එකක් වීම ගැන මෙම මධ්‍යස්ථානය අභිමානයට පත්වේ. ISO 9001:2015සහතිකය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක වෙත ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 දෙසැම්බර් 28 දින බාරදෙන ලදී.

1.4.16 සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පහසුකම්

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාවගෙන් සියලුම සිසුන්ට නේවාසික පහසුකම් සැපයීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය සතුව පැවතිය ද වර්තමානය වන විට එම පහසුකම සැපයෙන්නේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 75% කට පමණි. විශ්වවිද්‍යාලය තුළ නේවාසිකාගාර 21ක් පවතින අතර ඒ සෑම ශාලාවකටම අර්ධකාලීන අධ්‍යයන ශාලාධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපති, අධ්‍යයන උපශාලාධිපතිවරයෙක් හා පූර්ණකාලීන උපශාලාධිපතිවරයෙක් ද සිටින අතර ඔවුහු එදිනෙදා රාජකාරීමය කටයුතුවලට සහාය දක්වති.

අලුතින් ඉදිකළ සරසවි උයන හා සේනක බිබිලේ ශාලාවලට ළමුන් ඇතුළත් කිරීමට 2017 වසරේදී හැකිවිය. තවත් නේවාසික ශාලා ව්‍යාපෘති දෙකක් වන මහකන්ද (අංක 05) හා උඩපේරාදෙණිය ඇතුලත්මුදලි (අංක 06) යන නේවාසිකාගාරවල කටයුතු අවසන් කළ ද ඒවා මෙතෙක් අවශ්‍ය භාණ්ඩවලින් සමන්විත කොට නැත. 2018 වසරේදී සිසුන් 800ක් මෙම නේවාසිකාගාරවලට ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරයි.

තව ද විශ්වවිද්‍යාලයේ සේවක ප්‍රජාවට නිවාස පහසුකම් සපයන විශ්වවිද්‍යාල නිවාස 411ක් විශ්වවිද්‍යාලය විසින් කළමනාකරණය කරන අතර සැලකිය යුතු වාහන සංඛ්‍යාවක් ද නඩත්තු කරගෙන යයි. ශාරීරික අධ්‍යාපනය, විනෝදය හා තරගකාරී ක්‍රීඩා පැවැත්වීම සඳහා සියල්ලෙන් පරිපූර්ණ ගෘහස්ථ ක්‍රීඩාගාරයක්, විශාල පිහිනුම් තටාකයක් හා විශාල ක්‍රීඩාපිටි තුනක් ද ඇත.

සිසුන් සඳහා නේවාසික පහසුකම් -2017

	නේවාසිකාගාරයේ නම	කාමර සංඛ්‍යාව	නවාතැන් දිය හැකි සංඛ්‍යාව		
			පිරිමි	ගැහැණු	එකතුව
1	Akbar Hall	289	607		607
2	Arunachalam Hall	64	190		190
3	Hilda Obesekara Hall	164		492	492
4	Ivor Jennings Hall	130	528		528
5	James Peiris Hall	73	244		244
6	Jayathilake Hall	64	189		189
7	Sangaramaya & Kehelpannala Bikku Hall	57	89		89
9	Marrs Hall	80	237		237
10	New Akbar Hall	60	138		138
11	Ramanathan Hall	305		1244	1244
12	Sangamitta Hall	186		654	654
13	Sarasavi Uyana Hall	14	56		56
14	Wijewardane Hall	359		828	828
15	AQ 40 Hall	5	26		26
16	Maha ilupallama Boys Hදtel	28	200		200
17	Maha ilupallama Girls Hදtel	15		200	200
18	Hindagala Hall	15	60		60
19	Ediriweera Sarachchandra Hall	100		285	285
20	Gunapala Malalasekara Hall	100		282	282
21	Senaka Bibile Hall		300		300
		2090	**2810**	**3985**	**7095**

1.4.17 මධ්‍යම පරිපාලනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2000 වසරේ සිට උපක්‍රමික/සංයුක්ත කළමනාකරණ සැලසුම සංවර්ධනය කිරීම හා ක්‍රියාකාරී සැලසුම සමඟ පස් අවුරුදු සැලසුමක් සංවර්ධනය කිරීම ආරම්භ කළ අතර අවසානයේදී එය විශ්වවිද්‍යාල සංයුක්ත සැලසුමට ඇතුළත් කරන ලදී. විශ්වවිද්‍යාලයේ දැක්ම, ඉලක්ක මෙන්ම එහි

පරමාර්ථයන්ද සමාජයේ සිදුවන වෙනස්කම් සැලකිල්ලට ගනිමින් යාවත්කාලීන කිරීම හා සංශෝධනය කිරීම අඛණ්ඩව සිදුවේ.
විශ්වවිද්‍යාලයේ සියලුම සේවක කාණ්ඩවලට අදාළ ආචාර ධර්ම හා රාජකාරී ලැයිස්තු සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කොට ඇත.

1.4.18 මුදල් හා ගිණුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මුදල් අංශයේ ක්‍රියාපටිපාටි සංවිධිත කොට පවතින අඩුපාඩු නිවැරදි කිරීම තුළින් එම අංශයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස මුදල් අංශය ප්‍රතිසංවිධාන කිරීමට හා සංශෝධනය කිරීම සඳහා ප්‍රගතිශීලි පියවර කිහිපයක් ගෙන ඇත.

මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශ කළ පරිදි මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහාත් මනා පාලනයක් හඳුන්වාදීම සඳහාත් විගණන කමිටුව ස්ථාපිත කරන ලදී. යෝග්‍ය හා නිවැරදි ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම පිණිස විගණන කමිටුව විසින් අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා නිත්‍ය පදනමින් සමාලෝචනය කරන ලදී. වර්ෂ ගණනාවකට පසු 2014 වර්ෂය සඳහා වූමුදල් ප්‍රකාශනයට සුබවාදී විගණන මතයක් විගණකාධිපතිගෙන් ලබාගැනීමට විශ්වවිද්‍යාලයට හැකිවිය. අභ්‍යන්තර විගණන වාර්තා 25ක් විගණන කමිටුව විසින් සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම කරන ලදී.

2017 වර්ෂය සඳහා වන විගණන කමිටු වාර්තාව අංක 8.2හි ඉදිරිපත් කොට ඇත.

1.4.19 මූලධන ව්‍යාපෘති

2017 වසරේදී රුපියල් මිලියන 723ක මූල්‍යමය වියදමකින් යුතු නව ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් (04) ආරම්භ කොට ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලයට හැකි වූ අතර 2017 වසර සඳහා වෙන් වූ සමස්ත මුදලම උපයෝගි කරගැනීමට ද හැකි විය.

1.4.20 සහායක සේවාවන්

සහායක සේවාවන්ගේ විස්තර හා අත්කරගත් ජයග්‍රහණ අංක හතරෙහි (04) ඇතුළත් කෙරේ.

1.4.21 තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි භාෂා කුසලතා, පුස්තකාල සේවාවන්, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ පුළුල් දැනුමක් ලබාදෙනු ලබන පාඨමාලා ප්‍රදානය කරනු ලබයි. සියලු පීඨවල ප්‍රථම වසර සිසුන් සඳහා ඉහත විෂයයන් දෙක සම්බන්ධ දිසානුයෝජන වැඩසටහනක් හා පාඨමාලා මොඩියුල පවත්වනු ලබයි. සියලුම උපාධි අපේක්ෂක සිසුන් ඔවුන්ගේ අදාළ උපාධි ලබාගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා ශක්‍යතා පරීක්ෂණයෙන් “A” සාමාර්ථයක් ලබා ගත යුතුය. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සහ අනෙකුත් අධ්‍යයන සහායක සේවාවන්ගේ එනම් පුස්තකාල සේවය, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය යන අංශවල සේවාවන්ගේ අදාළ තොරතුරු අංක 03 යටතේ දැක්වේ.

1.4.22 ජාත්‍යන්තර සබඳතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහයෝගය/සහයෝගිතා වැඩසටහන් වැනි ක්‍රියාකාරකම් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා සංකීර්ණ පියවර මාලාවක් ගෙන ඇත. සියලුම ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගිතා, කාර්ය මණ්ඩල/ශිෂ්‍ය හුවමාරුව හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ට අදාළ වන උපදේශන කටයුතු සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සම්බන්ධීකාරක හස්තය ලෙස විශ්වවිද්‍යාලය විසින් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කොට ඇත. පර්යේෂණ සහයෝගිතාවන්, හා කාර්ය මණ්ඩල/ශිෂ්‍යය හුවමාරුව වෙනුවෙන් විදේස් විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් රාශියක් විශ්වවිද්‍යාලය විසින් අත්සන් කොට ඇත. එමෙන්ම ඒ ඒ පීඨයන් ද සැලකිය යුතු මට්ටමේ අවබෝධතා ගිවිසුම් ප්‍රමාණයකට අත්සන් තබා ඇත. තවද, විශ්වවිද්‍යාලය ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන් සඳහා වැඩිම සිසුන් සංඛ්‍යාවක් බඳවාගනු ලබන්නේ වෛද්‍ය පීඨය මගින් වන අතර අනෙකුත් පීඨයන් මේ සම්බන්ධයෙන් මෙතෙක් එතරම් ගැඹුරින් මැදිහත් වී නොමැත. සැලකිය යුතු විදෙස් සිසුන් සංඛ්‍යාවක් සියලුම පීඨවල පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කර ඇත.

2017 වසරේ වැදගත් සනාතන සහ නිර්දේශයන්

අවබෝධතා ගිවිසුම් සම්බන්ධිත වැඩසටහන් / ගිවිසුම්

(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජෝර්දාන් විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගිතා අවබෝධතා ගිවිසුම.

(ආ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා හර්යානාවේ මධ්‍ය විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා අවබෝධතා ගිවිසුම.

(ඇ) නෝර්වේ සවුත්ඊස්ට් විශ්වවිද්‍යාල පීඨය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

(අ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

i පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා තායිවානයේ ජාතික චුං සිං විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

ii පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජාතික චුං සිං විශ්විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමේ අතිරේකය (ශිෂ්‍ය හුවමාරු වැඩසටහන).

(ආ) කෘෂිකර්මය

i මධ්‍යම චීන නෝර්මල් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ගිවිසුම සහ අවබෝධතා ගිවිසුම.

ii තස්මානිය විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

iii වෙස්ටර්න් ඕස්ට්‍රේලියා විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

iv මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ සහයෝගිතා අවබෝධතා ගිවිසුම.

v පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ රොමේනියාවේ ට්‍රාන්සිල්වේනියා බ්‍රාසෝව් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

vi ලෝක ආහාර වැඩසටහන සමඟ සේවා ගිවිසුම –UNDP සහ "සහල් ආරක්ෂා කිරීමේ නියමු වැඩසටහන" - කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් බාරදෙන ලදී.

(ඇ) කලා

i ඇමෙරිකාවේ පෙන්සිල්වේනියා රාජ්‍ය විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම සහ ගිවිසුම.

ii චිකාගෝ පුස්තකාල විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

iii ෂුරිච් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

(ඈ) දන්ත වෛද්‍ය

ඇමෙරිකාවේ ටෙප්ල් විශ්වවිද්‍යාලය - උසස් අධ්‍යාපනයේ පොදු රාජ්‍ය මණ්ඩලීය පද්ධතිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හුවමාරු අවබෝධතා ගිවිසුමේ සංශෝධිත පිටපත.

(ඉ) ඉංජිනේරු

i පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජර්මනියේ බ්‍රේමෙන් විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ හා ඉගැන්වීම් සම්බන්ධ අවබෝධතා ගිවිසුම.

ii චීනයේ විද්‍යා අධ්‍යයන විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

iii පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා LTL හෝල්ඩිං (පුද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුම.

iv පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ චිරස්ථායි බලශක්ති අධිකාරිය අතර අවබෝධතා ගිවිසුම.

v පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් අතර අවබෝධතා ගිවිසුම.

vi කොරියාවේ, කොරියන් මෙරිටයිම් හා ඕෂන් විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

vii සියාම් සිටි සිමෙන්ට් (ලංකා) සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර සම්බන්ධතා ගිවිසුම.

viii පින්ලන්තයේ ඔයලු විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා ගිවිසුම.

(ඊ) කළමනාකරණ

i පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කළමනාකරණ පීඨය හා ෆොන්ටේරා බ්‍රැන්ඩස් ලංකා (පුද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුම.

ii ෆොන්ටේරා බ්‍රැන්ඩස් ලංකා (පුද්ගලික) සමාගම හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කළමනාකරණ පීඨය අතර අවබෝධතා ගිවිසුම. (තොරතුරු සඳහා)

(උ) විද්‍යා

i පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ටෙක්ස්චර්ඩ් ජර්සේ ලංකා පීපල්ස් ලීසිං සමාගම අතර අවබෝධතා ගිවිසුම.

ii ටෙක්ස්චර්ඩ් ජර්සේ ලංකා පීපල්ස් ලීසිං සමාගම හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අන්‍යෝන්‍ය ගිවිසුම.

iii ජපානයේ ටොයටා ටෙක්නොලොජිකල් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන හුවමාරු හා සහයෝගිතා ගිවිසුම.

iv ඉහත විශ්වවිද්‍යාල දෙක අතර අධ්‍යයන හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

v කෝඩ්ජෙන් ලංකා (පුද්ගලික) සමාගම හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

(උ෧) පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

i ශ්‍රී ලංකා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර පශු වෛද්‍ය පීඨයට කිරි හා පශු සම්පත් පුහුණු විශිෂ්ටතාව සඳහා සහාය ලබාදීමේ ගිවිසුම.

ii ශ්‍රී ලංකා ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

1.4.23 යාවජීව මහාචාර්ය පදවි ප්‍රදානය - 2017

මහාචාර්ය බී.සී.එන්. පීරිස්	- කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය එස්.ඊ. පීරිස්	- කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය ඊ.ආර්.කේ. පෙරේරා	- කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය එච්.එබ්. සිරිල්	- කෘෂි විද්‍යා පීඨය
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්	- කලා පීඨය
මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ	- කලා පීඨය
මහාචාර්ය එම්. අමරතුංග	- ඉංජිනේරු පීඨය
මහාචාර්ය යූ.එන්.බී. දිසානායක	- විද්‍යා පීඨය
මහාචාර්ය පී. අබේනායක	- පශු වෛද්‍ය පීඨය
මහාචාර්ය එච්. අබේගුණවර්ධන	- පශු වෛද්‍ය පීඨය

1.5 බාධක හා පිළියම්

2017 වසර සඳහා සැලසුම් කළ ව්‍යාපෘති බොහෝමයක් සාක්ෂාත් වුවද අපගේ පාලනයට පරිබාහිර වූහේතූන් නිසා මදක් ප්‍රමාද විය. සමහර සැලසුම් කළ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වූකාලය පිළිබඳ බාධක සහ මූල්‍යමය බාධක හේතුවෙන් ඉටුනොවීය. මේ සම්බන්ධයෙන් පක්ෂ සහ විපක්ෂ කරුණු ප්‍රවේශමෙන් අධ්‍යයනය කළ පසු එම ව්‍යාපෘති ප්‍රමාද කිරීමට හෝ නවතා දැමීමට මඟ සැලසී ඇත.

වෙබෝමෙට්‍රික් ශ්‍රේණිගත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකොට ඇති අතර මේ සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කෙරෙමින් පවතී.

1.6 අනාගත සැලසුම්

අදාළ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක බව දියුණු කිරීම සඳහා ගත හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත. විශ්වවිද්‍යාලයේ අලුතෙන් ස්ථාපිත කරන ලද තත්ත්වාරක්ෂණ ඒකකය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ හා පැවරුම් සභාව සමඟ සමීපව කටයුතු කරමින් හා එහි මාර්ගෝපදේශයන් හා උපදේශ අනුව කටයුතු කරමින් වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. ඊට අමතරව පීඨ මණ්ඩල රැස්වීම්වලට හා සනාතන සභා රැස්වීම්වල න්‍යාය පත්‍රවල මූලිකත්වය තත්ත්වාරක්ෂණය සඳහා වෙන් කෙරෙන අතර එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත.

සිව්වැනි පශ්චාත් උපාධි ආයතනය වන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීම සඳහා පියවර ගෙන ඇත. මේ සම්බන්ධ මූලික කටයුතු අවසන් කොට ඇති අතර මෙම ආයතනය නිල වශයෙන් ස්ථාපිත කිරීම ඉදිරි වසරේදී සිදුවනු ඇත. මේ අතර කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාඛාවක් කොළඹ

ස්ථාපිත කිරීමේ අරමුණින් කොළඹ ප්‍රදේශයෙන් ඉඩමක් අත්පත් කරගෙන ඇත. මේ නිසා දිවයිනේ සතර දික්භාගයෙන් පැමිණෙන සිසුන් විශාල සංඛ්‍යාවකට පහසුකම් සැලසෙනු ඇත.

සමස්ත විශ්වවිද්‍යාලයම සම්බන්ධ කෙරෙන පරිදි ඵලදායි ජාල පද්ධතියක් හඳුන්වාදීමට ද උත්සාහ ගෙන ඇත. තවද මේ වසරේ ඉදිකරන ලද අමතර නේවාසිකාගාර තුන ඉදිරි වසරේදී ශිෂ්‍ය පරිහරණයට ඉඩසලසන අතර ඒ තුළින් සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 85%ක ප්‍රමාණයකට නේවාසික පහසුකම් සැලසෙනු ඇත.

දරුණු වකුගඩු රෝගය කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කරමින් ජලය සම්බන්ධ පර්යේෂණ සඳහා සියලු උපකරණවලින් සමන්විත උසස් පර්යේෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. චීන විද්‍යා අධ්‍යාපන ආයතනය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස මේ සඳහා ඇ. ඩොලර් මිලියන 200ක ප්‍රදානයක් යොදවනු ඇත. මේ වසරේ අවසාන භාගයේදී මෙම ගොඩනැගිල්ල සඳහා මුල්ගල තබන ලදී. මෙහි කටයුතු නිමවීමෙන් පසු මෙවන් විද්‍යාගාරයක් පවතින ලෝකයේ එකම ස්ථානය මෙය වනු ඇත.

විජයවර්ධන, ජයතිලක හා අරුනාචලම් නේවාසිකාගාර සහ කලා පීඨයේ ප්‍රධාන ගොඩනැගිල්ල වැනි පැරණි ගොඩනැගිලි ඒවායේ මුල් ස්වභාවය දිස්වන පරිදි ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. දැනට පවතින පුස්තකාලයේ ගොඩනැගිලි දිගුවක් ලෙස ඉදිකෙරෙන තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. ලබන වසර අවසානයේදී එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ගොඩනැගිලිලේ පහත මාලයේ ජෝර්ජ් කීට් මහතාගේ වටිනා කලා නිර්මාණ තැන්පත් කෙරෙන කෞතුකාගාරයක් ස්ථාපනය කිරීමට ද සැලසුම් කර ඇත. සිසුන් සහ කාර්ය මණ්ඩල (අධ්‍යයන/අනධ්‍යයන) සඳහා වෘත්තීය උපදේශනය සංවර්ධනය කිරීම පිණිස වෙනම උපදේශන ඒකකයක් ස්ථාපිත කිරීමට ද සැලසුම් කර ඇත.

අවසන් වශයෙන්, විශ්වවිද්‍යාලය විසින් බිහිකරණු ලබන උපාධිධාරීන් රැකියාවන්හි නියුක්ත කරලීම ඉහළට එසවීම අපගේ ප්‍රධාන අරමුණ හා පුමුඛතාවයි. මෙම කාර්යය ඉෂ්ට සිද්ධ කරගැනීම පිණිස කළමනාකරණ තොරතුරු පද්ධතියක් විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කිරීම පිණිස ප්‍රමුඛතාව ලැබෙමින් පවතී.

ආසන්නම වෙබෝමෙට්‍රික් ශ්‍රේණිගත කිරීම්වලට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම ස්ථානයේ රැඳී සිටී. මෙම තත්ත්වය පවත්වාගෙන යෑමට වෙරදරන අතරම ලෝක විශ්වවිද්‍යාල අතර වඩාත් ඉහළ ස්ථානයක් කරා ළඟාවීමට ද වෑයම් කරමින් සිටී. මෙම අරමුණින් යුතුව විශ්වවිද්‍යාලය තුළ බහු ක්ෂේත්‍ර නව නිපැයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ද යෝජනාවක් සකස් කර ඇත.

දීර්ඝ කාලයක සිට දැනුණ අවශ්‍යතාවක් වන ව්‍යායාම සඳහා සෙමින් ඇවිද යෑමේ අඩිපාරක් විශ්වවිද්‍යාලය තුළ ඉදිකිරීම ක්‍රියාත්මක වන අතර මණ්ඩපයක් ඉදිකිරීම මේ වනවිටත් ආරම්භ කොට ඇත.

`

2. සිසුන් සහ කාර්ය මණ්ඩල කටයුතු

පේරාදෙණිය විශ්වවිද්‍යාලය අභ්‍යන්තර වැඩසටහන් හරහා ප්‍රථම උපාධි අපේක්ෂකයන් 12623කට වැඩි පිරිසකගේ අවශ්‍යතා සපුරාලයි. වාර්ෂිකව පීඨ නවයට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 2741කි. එමෙන්ම මෙම විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි සිසුන් 7963කගේ අවශ්‍යතා ද පිරිමසා ලනු ලබයි. අභ්‍යන්තර සිසුන්ට අමතරව පේරාදෙණිය විශ්වවිද්‍යාලය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා බාහිර උපාධි පිරිනැමීම සිදුකරනු ලබයි. මීට පෙර විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය ලෙස හැඳින් වූ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය බාහිර උපාධි හැදෑරීම සඳහා අපේක්ෂකයන් 15630ක් ලියාපදිංචි කොට ඇත.

අධ්‍යයනාංශ 79ක් පුරා පැතිර යන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල ශක්තිය 832ගෙන් සමන්විත වේ. අධ්‍යයන, පරිපාලන හා සේවා අංශවල සේවයේ නියුතු සහාය කාර්ය මණ්ඩලය 2105කි. ඉහත කරුණුවලට අමතරව අනියම් සේවකයන් 100ක් තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය 500ක් හා ආගන්තුක කාර්ය මණ්ඩලය 75ක් පමණ විශ්වවිද්‍යාලයීය කාර්යවල නියැලි සිටිති.

2.1 සිසුන්

2.1.1 සම්පත් සහ සිසුන්

පීඨය	පාඨමාලාව	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	සහාය කාර්ය මණ්ඩල සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව
කෘෂි විද්‍යා	කෘෂිකර්ම තාක්ෂණ කළමනාකරණ විද්‍යාවේදී	649	105	-	199
	සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යා උපාධිය	147			
	ආහාර විද්‍යා හා තාක්ෂණ උපාධිය	144			
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	ඖෂධවේදී උපාධිය වෛද්‍ය	117	57	-	48
	රසායනාගාර විද්‍යා, විද්‍යාවේදී උපාධිය	138			
	හෙදවේද විද්‍යාවේදී උපාධිය	199			
	භෞතචිකිත්සක විද්‍යාවේදී උපාධිය	154			
	විකිරණ චිකිත්සක විද්‍යාවේදී උපාධිය	176			
කලා දන්ත වෛද්‍ය	ශාස්ත්‍රවේදී උපාධිය (සාමාන්‍ය)	4138	168	-	84
	ශාස්ත්‍රවේදී උපාධිය (විශේෂ)				
	නීතිවේදී උපාධිය	258			
කලා	දන්ත වෛද්‍ය විද්‍යාවේදී	395	54	1	141
දන්ත වෛද්‍ය	ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	1661	123	7	188
කළමනාකරණ	ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	615	38	-	22
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාවේදී උපාධිය	1288	115	1	201
විද්‍යා කළමනාකරණ වෛද්‍ය විද්‍යා	විද්‍යාවේදී (විශේෂ)	728	113	3	120
	විද්‍යාවේදී (සාමාන්‍ය)				
	විද්‍යාවේදී (SOR)	247			
	විද්‍යාවේදී (CM)	276			
	විද්‍යාවේදී (ව්‍යාපාරික විද්‍යා)	906			
පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය	පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය	387	42	-	71
වෙනත්			22	26	991
එකතුව		**12623**	**837**	**38**	**2065**

2.1.2 දේශීය සිසුන්

පීඨය	පාඨමාලාව	නව බඳවා ගැනීම 16/17 කණ්ඩායම	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර	උපාධි ලැබූ සංඛ්‍යාව
කෘෂි විද්‍යා	කෘෂි තාක්ෂණය හා කළමනාකරණය	200	145	144	160	-	-	198
	ආහාර විද්‍යා හා තාක්ෂණය	51	37	37	19	-	-	
	සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යා	46	40	29	32	-	-	
සම සෞඛ්‍ය	වෛද්‍ය රසායන විද්‍යාව	27	20	26	29	14	-	156
		28	26	29	31	24	-	
	හෙදවේද	51	37	33	42	36	-	
	භෞතචිකිත්සාව	28	27	31	38	30	-	
	විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සක	43	38	31	31	31	-	
කලා	කලා	763	871	1009	911	583	-	828
	නීතිය	50	51	50	56	52	-	
දන්ත වෛද්‍ය	දන්ත වෛද්‍ය විද්‍යාව	77	78	80	81	79	-	82
ඉංජිනේරු	ඉංජිනේරු විද්‍යාව	415	414	416	416	-	-	396
කළමනාකරණ	ව්‍යාපාර පරිපාලනය	171	147	147	150	-	-	-
වෛද්‍ය	වෛද්‍ය විද්‍යාව	205	205	205	204	195	231	215
විද්‍යාව	ජීව විද්‍යාව	174	141	163	160	90	-	413
	භෞතික විද්‍යාව	231	196	215	143	121	-	
	ගණනය හා කළමනාකරණය	51	47	47	74	57	-	
	සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ	52	41	49	67	38	-	
පශු වෛද්‍ය	පශු වෛද්‍ය විද්‍යාව	78	75	89	67	77	-	73
එකතුව		**2741**	**2636**	**2830**	**2711**	**1427**	**231**	**2361**

2.1.3 විදෙස් සිසුන්ගේ විස්තර

පීඨය	පාඨමාලාව	බඳවා ගැනීම 16/17 කණ්ඩායම	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර
සම සෞඛ්‍ය විද්‍යා	ඖෂධවේදී විකිරණ විද්‍යාවේදී	-	-	2	1	-	-
කලා	නීතිවේදී	1	-	-	-	-	-
වෛද්‍ය	වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධිය	-	7	7	7	12	10
පශු වෛද්‍ය හා සත්ව විද්‍යා	පශු වෛද්‍ය විද්‍යාවේදී	-	-	1	-	-	-
එකතුව		**1**	**7**	**10**	**8**	**12**	**10**

සියලු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.



2.2 කාර්ය මණ්ඩලය

2.2.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය	අධ්‍යයන අංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	කථිකාචාර්ය	කථිකාචාර්ය (පරිවාස)
කෘෂිවිද්‍යා පීඨය	කෘෂි ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර කළමනාකරණය		3		1	2	1	3
	කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය					1		
	කෘෂි ජීව විද්‍යාව	1	2		3	2	2	1
	කෘෂි ඉංජිනේරු	3	2		3	1	1	
	කෘෂි ව්‍යාප්ති		1		3	1		3
	සත්ව විද්‍යාව	2	4		2	5	1	3
	බෝග විද්‍යාව	1	6	1	3	4		4
	ආහාර විද්‍යාව හා තාක්ෂණය		2	2	2	2		4
	මහ ඉලූප්පල්ලම				3	3		2
	පාංශු විද්‍යාව	1	2			4		2
සම සෞඛ්‍ය විද්‍යාව	මූලික විද්‍යාවන්						3	
	වෛද්‍ය රසායනාගාර විද්‍යාව				2	2	1	5
	හෙදවේදය							13
	ඖෂධවේදය		1			6	5	
	භෞත චිකිත්සාව					2	2	5
	විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සාව				1	3	1	5
කලා පීඨය	අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාරය				1	4		1
	පුරා විද්‍යාව		1		4	1		
	සම්භාව්‍ය භාෂා				1	3	1	1
	ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය		5		13	3	2	1
	අධ්‍යාපන			1	2	4		1
	ඉංග්‍රීසි භාෂාව	2	2		2			1
	ලලිත කලා				3	1	1	1
	භූගෝල විද්‍යාව		1		5	9	1	5
	ඉතිහාසය	1			2	7		3
	නීතිය				1	1	3	

වගු අංක 2.2.1 හා සම්බන්ධ වේ.

පීඨය	අධ්‍යයන අංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	කථිකාචාර්ය	කථිකාචාර්ය (පරිවාස)
කලා පීඨය	පාලි හා බෞද්ධ අධ්‍යාපනය		3			4	1	
	දර්ශනය				4	3	1	
	මනෝ විද්‍යාව				3	2		
	දේශපාලන විද්‍යාව		1			5	4	
	සිංහල		2		1	9		
	සමාජ විද්‍යාව		2		6	4	2	2
	දෙමළ		1		1	1	4	
දන්ත වෛද්‍ය පීඨය	මූලික විද්‍යාවන්	1	4		3	2	1	1
	ප්‍රජා දන්ත සෞඛ්‍ය	1	1		1	5	2	1
	මුඛ හනුක හා විකලාංග ශල්‍ය වෛද්‍ය				2	2	1	
	මුඛ වෛද්‍ය හා පරිදන්ත විද්‍යාව	2	4			1		5
	මුඛ ව්‍යාධවේදය	1	4					
	කෘතිම දන්ත වෛද්‍ය		1			2		1
	සංරක්ෂණ දන්ත වෛද්‍ය		2		1	1		1
ඉංජිනේරු පීඨය	රසායන හා සැකසුම් ඉංජිනේරු	1			1	5		
	සිවිල් ඉංජිනේරු	5	3		10	17	1	3
	පරිගණක ඉංජිනේරු							1
	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු				3	8		1
	ඉංජිනේරු කළමනාකරණය	1	3		6	11		2
	ඉංජිනේරු ගණිතය	1	1		1	9		
	කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය				1	1		3
	යාන්ත්‍රික ඉංජිනේරු		1			6		3
	නිෂ්පාදන ඉංජිනේරු		1			5		4
කළමනාකරණ පීඨය	ව්‍යාපාර හා මුදල්				1	4	2	4
	මානව සම්පත් කළමනාකරණය					1	1	4
	කළමනාකරණ අධ්‍යයනය				2			6
	වෙළඳ කළමනාකරණය					1	2	1
	මෙහෙයුම් කළමනාකරණය		1			1	1	6

වගු අංක 2.2.1 හා සම්බන්ධ වේ.

පීඨය	අධ්‍යයන අංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	කථිකාචාර්ය	කථිකාචාර්ය (පරිවාස)
වෛද්‍ය පීඨය	නිර්විඳ්දන විද්‍යාව		1					4
	කායව්‍යවච්ඡේදය		2			3	2	
	ජෛව තාක්ෂණය		1		2	3	1	2
	ප්‍රජා වෛද්‍ය		2	1	2	2	1	
	අධිකරණ වෛද්‍ය		1		2	2		
	ප්‍රසව හා නාරීවේදය		1		1	3	1	
	වෛද්‍ය අධ්‍යාපන ඒකකය		1					1
	වෛද්‍ය විද්‍යාව	1	4			2	1	3
	ක්ෂුද්‍ර ජීව විද්‍යාව		1			3	1	1
	න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකය				2			
	ළමා රෝග		2		1	3		
	පරපෝෂ විද්‍යාව					4		
	ව්‍යාධවේදය	1	1	1	3	1	1	1
	හිෂග්වේදය				2	2		
	භෞතික විද්‍යාව		3		3	1	1	2
	මනෝ වෛද්‍ය					4		1
	විකිරණ විද්‍යාව		1			2		1
	ශල්‍ය වෛද්‍ය		2		1	6	2	1
විද්‍යා පීඨය	උද්භිත විද්‍යාව	1	3		5	4		1
	රසායන විද්‍යාව	4	5		1	7	2	
	භූගර්භ විද්‍යාව	1	4		1	5		1
	ගණිතය		1	1	1	4		10
	අණුක විද්‍යාව		4				1	
	භෞතික විද්‍යාව		1		3	8		2
	විද්‍යා අධ්‍යාපන ඒකකය					**1**		**1**
	සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව		3		1	5	2	4
	සත්ව විද්‍යාව	1	3		4	1	2	4
පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව	මූලික පශු වෛද්‍ය විද්‍යාව		1		1	7		2
	ගොවිපල සත්ව		1		3	3		1
	පශු සායනික විද්‍යාව	1			2	3	1	3
	පශු මහජන සෞඛ්‍ය හා හිෂග්වේදය				1	3		1
	පශු ව්‍යාධ ජීවවිද්‍යාව	1			1	4	1	1
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය						1	6
එකතුව		**35**	**116**	**7**	**147**	**280**	**69**	**168**

සටහන - ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය පමණි.

2.2.2. අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය

ශාඛාව	කාර්ය මණ්ඩල සංඛ්‍යාව		
	පිරිමි	ගැහැණු	එකතුව
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය	3	2	5
පුස්තකාලය	3	-	3
ශාරීරික අධ්‍යාපන	2	3	5
වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය	-	2	2
දන්ත වෛද්‍ය විද්‍යාවන්	1	-	1
ඉංජිනේරු	5	2	7
වෛද්‍ය	1	-	1
විද්‍යා	2	1	3
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය	-	1	1
මුදල් පරිපාලනය	-	2	2
තො. තාක්ෂණ මධ්‍යස්ථානය	7	1	8
කෘ. වි. ප. උපා. ආ.	1	-	1
විද්‍යා ප. උ. ආ.	1	-	1
එකතුව	**26**	**14**	**40**



2.2.3. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ව්‍යාපෘතිය	ස්ථිර		
	පිරිමි	ගැහැණු	එකතුව
කෘෂිවිද්‍යා	162	37	199
සමසෞඛ්‍ය	28	20	48
කලා	51	33	84
දන්ත වෛද්‍ය	63	78	141
ඉංජිනේරු	163	25	188
කළමනාකරණ	12	10	22
වෛද්‍ය	127	74	201
විද්‍යා	85	35	120
පශු වෛද්‍ය	46	25	71
වෙනත්	729	262	991
එකතුව	**1466**	**599**	**2065**

2.2.4 නව බඳවා ගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය : 2009-2017

වර්ෂය	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව
2009	30	75
2010	24	90
2011	26	75
2013	35	56
2014	59	148
2015	52	77
2016	61	75
2017	43	53



2.2.5 2017 වසර තුළ ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර

පීඨය	ප්‍රථම උපාධි අපෙක්ෂක වැඩසටහන	විශේෂ/ සාමාන්‍ය	කාලය	මාධ්‍ය	වි.වි.ප්‍ර. කොා. ස. විසින් අනුමත කල (ඔව්/නැත)	අනුමත කලේ නම් කළ වර්ෂය
දන්ත වෛද්‍ය	අධිකරණ දන්ත විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය		අවුරුදු එකකි (01)	ඉංග්‍රීසි	ඔව්	2017
සහතික පත්‍ර පාඨමාලාව						
දන්ත වෛද්‍ය	ප්‍රතිසංස්කරණ ක්‍රම සහිත මුඛ පිළිකා ශල්‍යකර්ම කළමනාකරණය	සාමාන්‍ය	අවුරුදු එකකි (01)	ඉංග්‍රීසි	ඔව්	
වෛද්‍ය	ශල්‍යකර්ම සඳහා අවම ප්‍රවේශ සහාය		දින 03 යි			
	සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රේරණ වැඩසටහන			ඉංග්‍රීසි		
ඩිප්ලෝමා පාඨමාලාව (පශ්චාත් උපාධි නොවන)						
දන්ත වෛද්‍ය	දන්ත වෛද්‍ය සහායක ඩිප්ලෝමාව	සාමාන්‍ය	අවුරුදු 01 යි	ඉංග්‍රීසි	ඔව්	2016/04/02 දින පැවැත්වූ 451 රැස්වීමේදී
	දන්ත තාක්ෂණවේදය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	සාමාන්‍ය	අවුරුදු 2 යි	ඉංග්‍රීසි	ඔව්	2016/04/02 දින පැවැත්වූ 451 රැස්වීමේදී
වෛද්‍ය	ක්‍රීඩා විද්‍යාවන් පිළිබඳ ඩිප්ලෝමාව		අවුරුදු 01 යි	ඉංග්‍රීසි		
වෙනත් පාඨමාලා						
වෛද්‍ය	මූලික විද්‍යා පාඨමාලාව		දින 21 යි	ඉංග්‍රීසි	නැත	
	පුහුණුවන්නන් සඳහා නිපුණතා පූහුණු වැඩසටහන		දින 3 යි	ඉංග්‍රීසි	නැත	
පශ්චාත් උපාධි ඩිප්ලෝමා						
වෛද්‍ය	අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව (නීතිඥයින් හා විනිසුරුවරුන් සඳහා පැවැත්වූ) පස්වන කණ්ඩායම		අවුරුදු 1 යි	ඉංග්‍රීසි		
පශ්චාත් උපාධි (විද්‍යාපති/ ශාස්ත්‍රපති/ව්‍යාපාර පරිපාලනය/ දර්ශනපති)						
දන්ත වෛද්‍ය	ශල්‍යකර්ම පිළිබඳ දර්ශනපති උපාධිය		අවුරුදු 2 යි	ඉංග්‍රීසි	ඔව්	
	මාණ්ඩලික සහතික සහිත					
	මාණ්ඩලික සහතික රහිත					
වෛද්‍ය	කොළඹ වෛද්‍ය ප. උ. ආයතනය සඳහා					
දර්ශනශූරි උපාධිය						
දන්ත වෛද්‍ය	දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය		අවුරුදු 3 යි	ඉංග්‍රීසි	ඔව්	

2.2.6. දේශීය උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාග ආයතන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම්

අධ්‍යයන අංශය	**ක්‍රියාකාරකමේ කාර්යභාරය** (ශිෂ්‍ය හුවමාරුව/කාර්ය මණ්ඩල හුවමාරුව/පර්යේෂණ ව්‍යාපෘතිය/පුහුණුව/පහසුකම් ආදිය)	**ක්‍රියාකාරකමේ නම**	**අවබෝධතා ගිවිසුම් අත්සන් කළේද? (ඔව්/නැත)**	**සහයෝගිතා ආයතනය**
		දන්ත විද්‍යාවන්		
මුඛ වෛද්‍ය හා පරිදත්ත අධ්‍යයන අංශය (ශුද්ධ ජීවවිද්‍යා අංශය)	සිද්ධාලේප සමාගම හා දන්ත වෛද්‍ය පීඨය අතර ගිවිසුම	පර්යේෂණ ව්‍යාපෘතිය	ඔව් 2017-01-23	හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය දන්ත වෛද්‍ය පීඨය - පේරාදෙණිය
මුඛ ව්‍යාධවේද	පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ටෙප්පල් විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හා පීඨ හුවමාරු ගිවිසුම	ශිෂ්‍ය හා පීඨ හුවමාරු වැඩසටහන	ඔව් 2017-12-11	ඇමරිකාවේ ටෙප්පල් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මුඛ හා හනුක විකලාංග ශල්‍යකර්ම	නිර්විඳ්දන අධ්‍යයන අංශය හා මුඛ හනුක විකලාංග අධ්‍යයන අංශය අතර කෘත්‍යාත්මක ගිවිසුම	කෘත්‍යාත්මික සහයෝගිතාවය	ඔව් 2017-12-28	වෛද්‍ය පීඨයේ නිර්විඳ්දන හා දැඩිසත්කාර අධ්‍යයන අංශය අතර කෘත්‍යාත්මක සහයෝගිතාව
		විද්‍යාව		
SIIC	පහසුකම්	ඕපන් ආර්ක් සිස්ටම්ස් මැනේජ්මන්ට් (පුද්) සමාගම හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර තාක්ෂණ පර්යේෂණ හා මෙහෙයුම් සබඳතා අවබෝධතා ගිවිසුම	ඔව්	ඕපන් ආරක් සිස්ටම්ස් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
රසායන විද්‍යාව	පර්යේෂණ	හමාස් මැනුෆැක්චරිං (පුද්) සමාගම හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	ඔව්	
	පර්යේෂණ	ජීවවිද්‍යාත්මක සම්පත් වාණිජමය පර්යේෂණ සඳහා මාරුකිරීමේ ගිවිසුම	ඔව්	
SUC" DSCS" Dchem	සහයෝගිතා පර්යේෂණ හා වාණිජකරණය	සහයෝගිතා පර්යේෂණ හා වාණිජකරණ ව්‍යාපෘතිය	ඔව්	කෝඩ්ජෙන් ලංකා (පුද්ගලික) සමාගම
විද්‍යාව	කාර්ය මණ්ඩල, ශිෂ්‍ය හුවමාරුව හා පර්යේෂණ සහයෝගිතාව	අවබෝධතා ගිවිසුම	අපේක්ෂා කෙරේ	සදම් හොස්ටන් විශ්වවිද්‍යාලය
		කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය		
කෘ.වි.ප.උ.ආ.	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා දේශන කාමර 02ක්, පරිගණක විද්‍යාගාරය හා වෙනත් පහසුකම් පරිහරණය කිරීම	ගිවිසුම	ඔව්	රත්මලාන කොතලාවල ආරක්ෂක විද්‍යාලය

2.2.7 ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/පරිත්‍යාග ආයතන අතර අවබෝධතා ගිවිසුම්

අධ්‍යයන අංශය	**ක්‍රියාකාරකමේ කාර්යභාරය** (ශිෂ්‍ය හුවමාරුව/කාර්ය මණ්ඩල හුවමාරු/ පර්යේෂණ ව්‍යාපෘති/පුහුණු පහසුකම් ආදිය)	**ක්‍රියාකාරකමේ නම**	**රට**
උපකුලපති හා එරස්මස් ව්‍යාපෘති සම්බන්ධීකාරක (මහාචාර්ය අනෝමා අබේරත්න)	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල චලනතාව		සෙස් සමූහ ආණ්ඩුව
උපකුලපති	අධ්‍යයන හා තාක්ෂණ නිලධාරීන් හුවමාරුව හා ශිෂ්‍ය හුවමාරුව		ජපානය
උපකුලපති, (ප්‍රදානලාභීන්ගේ බලයලත් නියෝජිතයින්)	ගෝලීය ජ්‍රයේෂණ සඳහා ආසියා-පැසිෆික් ජාලය	මෙම වැඩසටහන දකුණු ආසියා මාධ්‍ය සහෘදත්ව වැඩසටහනට අරමුදල් සපයයි.	ජපානය
උපකුලපති, (ප්‍රදානලාභීන්ගේ බලයලත් නියෝජිත මහාචාර්ය අනෝමා අබේරත්න)	ගෝලීය ජ්‍රයේෂණ සඳහා ආසියා-පැසිෆික් ජාලය	දකුණු ආසියාවේ බෑවුම් සහිත ඉඩම්වල ගොවිතැන් සඳහා කාලගුණ ප්‍රසස්තීන් ගොඩනැගීම සඳහා මුදල් සපයයි.	ජපානය
මහාචාර්ය අනෝමා අබේරත්න	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩලය	ඉගැන්වීම හා පුහුණුව සඳහා ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල චලනතාවය	සෙස් සමූහ ආණ්ඩුව
උපකුලපති	අධ්‍යයන කාර්ය මණ්ඩලය, ආගන්තුක අධ්‍යයන කාර්ය මණ්ඩලය, පර්යේෂක කණ්ඩායම් හා පරිපාලන කාර්ය මණ්ඩල හුවමාරුව	අධ්‍යයන කාර්යමණ්ඩලය, ආගන්තුක කාර්ය මණ්ඩලය, පර්යේෂණ කණ්ඩායම් හා පරිපාලන කාර්ය මණ්ඩල හුවමාරුව	ඉතාලිය
උපකුලපති	ප්‍රථම උපාධි අපේක්ෂකයන්, උපාධිධාරීන් හා දර්ශනශූරී සිසුන් ආදිය	පර්යේෂණවල හා අධ්‍යයන කටයුතුවල නියැලී සිටින ප්‍රථම උපාධි සිසුන්, උපාධිධාරීන් හා දර්ශනශූරී සිසුන් ආදිසහාය හුවමාරුව	ස්විස්ටර්ලන්තය
උපකුලපති		පර්යේෂණ හා අධ්‍යයන සඳහා සිසුන් හුවමාරුව, පීඨ කාර්ය මණ්ඩලය හා පර්යේෂණ විද්වතුන් හුවමාරුව, ඒකාබද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම්, ද්විත්ව හා ඒකාබද්ධ උපාධි වැඩසටහන් සම්මන්ත්‍රණ පැවැත්වීම	චීනය
උපකුලපති, ව්‍යාපෘති නායක ආචාර්ය ඩී. කේ. දයාවංශ		බංගලිදේශය, ඉන්දියාව, නේපාලය හා ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ කාන්තාවන් 36 දෙනෙකුට සහෘදත්වයන් ප්‍රදානය කිරීම	කැනඩාව
කෘෂිකර්මය			
උපකුලපති/ කෘෂිවිද්‍යා පීඨාධිපති - පේරාදෙණිය	ශිෂ්‍ය හුවමාරුව	අන්‍යෝන්‍ය ශිෂ්‍ය හුවමාරුව (වසරකට සිසුන් තුන්දෙනෙකු) (අවබෝධතා ගිවිසුමේ දිගුවක්)	ජපානය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය		මධ්‍යස්ථානයේ මුදල් ලැබේ. ප්‍රදානලාභීන් විසින් ඒවා පරිපාලනය කරනු ලබයි.	ජපානය
කලා			
භූගෝල විද්‍යා	කාර්ය මණ්ඩල/ ශිෂ්‍ය හුවමාරුව	ෂූරිච් විශ්වවිද්‍යාලය අතර අතර අවබෝධතා ගිවිසුම	ස්විස්ටර්ලන්තය
නීති අංශය	කාර්ය මණ්ඩල/ ශිෂ්‍ය හුවමාරුව	පෙන්සිල්වේනියා රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ඩිකින්සන් නීති විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	ඇමරිකා එක්සත් ජනපදය

වගු අංක 2.2.7 හා සම්බන්ධ වේ.

අධ්‍යයන අංශය	**ක්‍රියාකාරකමේ කාර්යභාරය** (ශිෂ්‍ය හුවමාරුව/කාර්ය මණ්ඩල හුවමාරු/පර්යේෂණ ව්‍යාපෘති/පුහුණු පහසුකම් ආදිය)	**ක්‍රියාකාරකමේ නම**	**රට**
මුඛ ව්‍යාධවේද අංශය	ටෙම්පල් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හා පීඨ හුවමාරු ගිවිසුම (2017-12-11)	ශිෂ්‍ය සහ පීඨ හුවමාරු වැඩසටහන	ටෙම්පල් විශ්වවිද්‍යාලය - ඇමරිකාව
	ඉන්දියාවේ මනිපාල් විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගිතාව සඳහා සාමාන්‍ය ගිවිසුම	අධ්‍යයන සහයෝගිතාව	මනිපාල් විශ්වවිද්‍යාලය
ඉංජිනේරු			
විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය		ද්විත්ව උපාධි වැඩසටහන	පින්ලන්තය
යාන්ත්‍රික ඉංජිනේරු අංශය	පර්යේෂණ ව්‍යාපෘතිය/පුහුණුව	ග්‍රාමීය මට්ටමින් එකතු කළ කිරිවල නිෂ්පාදන හා ගුණාත්මක බව දියුණු කිරීම	කොරියාව
උපකුලපති/පීඨාධිපති/ ඉංජිනේරු පීඨය	පර්යේෂණ ව්‍යාපෘතිය	පරිසරය, විද්‍යාවන්, ඉංජිනේරු, අප ජලය පිරිපහදුව, ජලයේ ගුණාත්මකබව කළමනාකරණය, සෞඛ්‍ය හා සනීපාරක්ෂණක ගැටළු ආදිය සාකච්ඡා හා පර්යේෂණ සඳහා කාර්ය මණ්ඩලය හා සිසුන්ගේ පැමිණීම	සිංගප්පූරුව
විද්‍යා			
අණුක ජීවවිද්‍යාව හා ජෛව තාක්ෂණවේදය	පර්යේෂණ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකාවේ දරුණු වකුගඩු රෝගයට හේතුවන සාධක හඳුනාගැනීමට දායකවීම	ඇමෙරිකා එක්සත් ජනපදය
ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය			
ක්ලූප්-නැපෝකා තාක්ෂණික විශ්වවිද්‍යාලය	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන	ඉගෙනීම හා ඉගැන්වීම සඳහා ශිෂ්‍ය කාර්යමණ්ඩල වල්‍යතාවය	රොමේනියාව
ෆොජියා විශ්වවිද්‍යාලය	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන		ඉතාලිය
නැන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන		සිංගප්පූරුව
කනෙක්ටිකට් විශ්වවිද්‍යාලය	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන		ඇමෙරිකා එක්සත් ජනපදය
හුවාකියෝ විශ්වවිද්‍යාලය	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන		චීනය
කෘ. වි. ප. ඒ. ආයතනය	ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ තාක්ෂණික සහයෝගිතා සහ කෘෂිකර්මය හා සමවිෂයන්, දර්ශනශූරී උපාධි පිරිනැමීම සඳහා ශිෂ්‍ය හුවමාරුව, කාර්ය මණ්ඩල හුවමාරු, එකඟ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යමය සහාය, පුහුණු වැඩමුළු ආදිය	සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය	බංගලිදේශය
කෘ. වි. ප. ඒ. ආයතනය	ඉගැන්වීම, පර්යේෂණ හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ ආයතන දෙක අතර අධ්‍යයන හා සංස්කෘතික සබඳතා සංවර්ධනය කරගනිමින් සබඳතා ඉහළ නැංවීම	සිල්හෙට් කෘෂිකර්ම විශ්වවිද්‍යාලය	බංගලිදේශය
කෘ. වි. ප. ඒ. ආයතනය	අධ්‍යයන කාර්ය මණ්ඩලය, ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි කාර්ය මණ්ඩලය, හුවමාරු කරගැනීම මෙන්ම ප්‍රකාශන/පර්යේෂණ ද්‍රව්‍ය/ පුවත්පත් ලිපි/ ඒකාබද්ධ සහයෝගිතා උපාධි වැඩසටහන් ආදිය හුවමාරුව	නිව්ෆවුන්ලෑන්ඩ් අනුස්මරණ විශ්වවිද්‍යාලය	කැනඩාව
කෘ. වි. ප. ඒ. ආයතනය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	ඉහත කරුණුවලට අමතරව ජාත්‍යන්තර සමුළු සංවිධානය කිරීම ආදිය	එම	ජපානය
මා. ශා. හා ස. වි. ප. ඒ. ආයතනය	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරුව	NORPART ව්‍යාපෘතිය	නෝර්වේ

2.2.8 අ). 2017 වසරේදී අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය සඳහා ලද දේශීය සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන

ලාභියාගේ නම	තනතුර	වැඩසටහන් වර්ගය (දර්ශනශූරී/දර්ශනපති/පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ඩිප්ලෝමා/කෙටිකාලීන පුහුණුව)	වැඩසටහනේ කාල පරාසය	රට
ඉංජිනේරු				
ආචාර්ය පී. ගමගේ	ජ්‍යෙ. කථිකාචාර්ය	කෙටිකාලීන පුහුණුව	සති 1 යි	ශ්‍රී ලංකාව
ආචාර්ය ඒ. කුලතුංග	ජ්‍යෙ. කථිකාචාර්ය	කෙටිකාලීන පුහුණුව	දින 3 යි	ශ්‍රී ලංකාව
ආචාර්ය එස්. ඩී. ජී. ඒ. පී. ගුණවර්ධන	ජ්‍යෙ. කථිකාචාර්ය	චිරස්ථායි පරිභෝජනය හා නිෂ්පාදනය	දින 3 යි	ශ්‍රී ලංකාව
කේ. කේ. කේ. සිල්වා	ජ්‍යෙ. කථිකාචාර්ය	බාහිර පුහුණුව	දින 2 යි	ශ්‍රී ලංකාව
අයි.ඩබ්.එන්. බණ්ඩාරනායක	ජ්‍යෙ. කථිකාචාර්ය	බාහිර පුහුණුව	දින 2 යි	ශ්‍රී ලංකාව
ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය				
ආචාර්ය එස්. එම්. කේ. බී. සමරකෝන්	අධ්‍යයන කාර්ය මණ්ඩලය	කෙටිකාලීන පුහුණුව	සති 03 යි	ඉතාලිය
ආචාර්ය යූ. ඒ. ජේ. පිනිදියආරච්චි	-එම-	-එම-	සති 03 යි	ඉතාලිය
මහාචාර්ය පී. විජේකෝන්	-එම-	-එම-	සති 03 යි	ඉතාලිය
ආචාර්ය ආර්. නවරත්න	-එම-	-එම-	සති 03 යි	ඉතාලිය

2.2.8 ආ). 2017 වසරේදී අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය සඳහා ලද විදේශීය සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන

ලාභියාගේ නම	තනතුර	වැඩසටහන් වර්ගය (දර්ශනශූරී/දර්ශනපති/පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ඩිප්ලෝමා/කෙටිකාලීන පුහුණුව)	වැඩසටහනේ කාල පරාසය	රට
කෘෂිකර්ම				
ඩබ්. එච්. ජයසිංහ	කථිකාචාර්ය	දර්ශනශූරී	අවුරුදු 04 යි	ජපානය
දන්ත වෛද්‍ය				
වෛද්‍ය එන්. එස්. පියරත්න	කථිකාචාර්ය (පරිවාස)	දර්ශනශූරී	වසර 1 යි	එක්සත් රාජධානිය
ඉංජිනේරු				
ආචාර්ය කේ. සමරකෝන්	ජේෂ්ඨ කථිකාචාර්ය	කෙටිකාලීන පුහුණුව	සති 02 යි	ඉතාලිය
වෛද්‍ය				
වෛද්‍ය ඩබ්. ඩී. එස්. ජේ. වික්‍රමසිංහ	අංශ ප්‍රධාන/ ජේෂ්ඨ කථිකාචාර්ය	ජෛව ආරක්ෂණය, විද්‍යාගාර කළමනාකරණය හා පර්යේෂණ ශිල්පීය ක්‍රම	ඔක්. 18-29	ජපානය
මහාචාර්ය ආර්. එම්. මුදියන්සේ	ළමා රෝග මහාචාර්ය	සහෘදත්ව		ඇ. එ. ජ.
වෛද්‍ය ඒ. එච්. එච්. එම්. ජයවීර	ජේෂ්ඨ කථිකාචාර්ය	සහතික පත්‍ර - ප්‍රීටම් න්‍යුට්‍රිෂන් පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන - 2017		ඕස්ට්‍රේලියාව
වෛද්‍ය ඩී.වී. දිසානායක	ජේෂ්ඨ කථිකාචාර්ය	-එම-		ඕස්ට්‍රේලියාව
මහාචාර්ය කේ. බී. ගල්කැටිය	මහාචාර්ය	FMAS (සහෘදත්ව)	දින 03 යි	ඉන්දියාව
වෛද්‍ය ඒ. කේ. බී. බී. ටී. බී. සමරසිංහ	ජේෂ්ඨ කථිකාචාර්ය	FMAS (සහෘදත්ව)	දින 03 යි	ඉන්දියාව
වෛද්‍ය එස්. පී. එම්. පීරිස්	ජේෂ්ඨ කථිකාචාර්ය	-එම-	දින 03 යි	ඉන්දියාව
වෛද්‍ය බී. කේ. දසනායක	කථිකාචාර්ය	-එම-	දින 03 යි	ඉන්දියාව
වෛද්‍ය සී. අයි. ජී. ගලප්පත්ති	කථිකාචාර්ය (පරිවාස)	-එම-	දින 03 යි	ඉන්දියාව
විද්‍යාව				
පී. සමරසේකර	මහාචාර්ය	පශ්චාත් - දර්ශනශූරී සාමාජික	වර්ෂ 01 යි	ඇ. එ. ජ.
ශිවකුමාර් නවරත්නම්	කථිකාචාර්ය	ශිෂ්‍ය චලනතාවය	මාස 04 යි	නෝර්වේ
එස්. එම්. නමීම්	කථිකාචාර්ය	-එම-	මාස 04 යි	නෝර්වේ
වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය				
මහාචාර්ය ඩී. ඒ. එස්. ධර්මදාස	අධ්‍යක්ෂ	ඉන්දු -ශ්‍රී ලංකා පදනමේ සම්මානය	ඔක්. 26-27	ඉන්දියාව
එල්. එස්. පී. ලංකාතිලක	වෘත්තීය උපදේශක	-එම-	ඔක්. 26-27	ඉන්දියාව
හදිසි සෞඛ්‍ය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය				
දිනේෂ් ප්‍රනාන්දු (මහාචාර්ය එම්. ඩී. ළමාවංශ වෙනුවෙන්)	අධ්‍යක්ෂ	ආසියානු ආපදාවන්ට සූදානම්වීමේ මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ඉහත තේමාවන්ට අදාළ වැඩමුළුව	දින 02 යි	තායිලන්තය

2.2.9 විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද දේශීය සමුළු හා වැඩමුළු

පීඨය	වැඩසටහන/තේමාව	සංවිධානය කළේ (පීඨය/අංශය/මධ්‍යස්ථානය/ඒකකය)	දිනයන්	කාලය	ඉලක්කගත කණ්ඩායම	සහභාගි වූ සංඛ්‍යාව
කලා	ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව	පීඨය	නොවැ. 02	දින 01 යි	ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්	450
	ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව - 2017	පීඨය	නොවැ. 02	දින 01 යි	-එම-	
	අධ්‍යාපනපති පර්යේෂණ සම්මන්ත්‍රණය	අධ්‍යාපන අධ්‍යයන අංශය	නොවැ. 30	දින 01 යි	-එම-	
සමසෞඛ්‍ය	පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞතචිකිත්සක සම්මන්ත්‍රණය	භෞත චිකිත්සක අධ්‍යයන අංශය	ඔක්. 20-22	දින 03 යි	සිසුන් හා පර්යේෂකයින්	
කෘෂිවිද්‍යා	ප්‍රථම උපාධි අපේක්ෂක සම්මන්ත්‍රණය	පීඨය	ජන. 12	දින 01 යි	ප්‍රථම උපාධි සිසුන්	
ඉංජිනේරු	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු පර්යේෂණ හා ව්‍යාපෘති සම්මන්ත්‍රණය - 2017	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු	සැප්. 06	දින 01 යි	ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්	
කළමනාකරණ	ප්‍රථම උපාධි අපේක්ෂක හා පර්යේෂණ සම්මන්ත්‍රණය -2016	පීඨය	මාර්තු 14	දින 01 යි	ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්	
වෛද්‍ය	සාමාන්‍ය ළමාරෝග	ළමා රෝග අධ්‍යයන අංශය හා SLCP	මැයි 02	දින 02 යි	වෛද්‍යවරුන්	
පශු වෛද්‍ය	ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන අංශයේ හඳුනාගැනීම හා පශු ව්‍යාප්ති ලේඛනගතකරණය	පීඨය	අගෝ. 15-16	දින 02 යි	අධ්‍යයන කාර්ය මණ්ඩලය	

2.2.10 විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු

තේමාව	සංවිධානය කළේ (පීඨය/අ. අංශ/මධ්‍යස්ථාන/ඒකක)	පැවැත් වූ දිනයන්	කාලය	ඉලක්කගත කණ්ඩායම	සහභාගි වූ සංඛ්‍යාව
පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසිය	සම සෞඛ්‍ය විද්‍යා පීඨය	නොවැ. 24	දින 01 යි	සිසුන්, ප්‍රථම උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධිධාරීන් හා පර්යේෂකයන්	700
LJCR සමුළුව	ශ්‍රී ලංකා - ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය	සැප්. 23	දින 01 යි	ප්‍රථම උපාධි අපේක්ෂකයන්, උපාධිධාරීන්, විද්වතුන්	
කෘෂිකර්ම					
	වෛද්‍ය එච්.එම්.ටී.ඩබ්. සෙනෙවිරත්න - පර්යේෂණාත්මක අධ්‍යයනයක්	191,166.13	-	191,143.95	191,143.95	-
	වෛද්‍ය එෆ්. නූර්ධීන් - ඩෙංගු මර්ධනය සඳහා පැපොල් කොළයේ බලපෑම	3,000,000.00	-	154,501.55	154,501.55	-
	ඩෙංගු රෝගය සම්බන්ධ වෛද්‍ය ඩී.එම්.පී.යු.කේ. රළපනාවගේ පර්යේෂණ අධ්‍යයනයක්	488,350.00	-	480,000.00	480,000.00	-
	වෛද්‍ය ඩබ්.පී.ඩී.එම්.ටී.එල්. දසනායක - පර්යේෂණාත්මක අධ්‍යයනයක්	3,803,500.00	3,803,500.00	-	3,803,500.00	-
	වෛද්‍ය ඩී.ඩබ්.පී. දහනායක - ඉලෙක්ට්‍රෝ භෞතික විද්‍යාත්මක අධ්‍යයනය	3,480,000.00	-	480,000.00	480,000.00	-
	වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා - ඖෂධ පැලැටිවල සම සුදු කිරීමේ බලපෑම සොයා බැලීම	562,500.00	35,000.00	513,126.13	548,126.13	-
	වෛද්‍ය කේ.බී. ගල්කැටිය -පර්යේෂණ අධ්‍යයනය	416,000.00	-	402,270.00	402,270.00	-
	වෛද්‍ය චමින්ද කන්දඋඩ - HbAic අධ්‍යයනය	370,920.00	-	45,750.00	45,750.00	-

වගු අංක 2.2.15 හා සම්බන්ධ වේ.

පීඨය	නම හා විස්තර	TCE රු.	2016 වසරේ වියදම	2017 වසරේ වියදම	2017/12/31 දිනට ගණනය කළ වියදම	භෞතික ප්‍රගතිය %
වෛද්‍ය පීඨය	වෛද්‍ය එස්.ඒ. කරුනනන්ද - වකුගඩු රෝගය හා සම්බන්ධ පර්යේෂණය	400,000.00	1,800.00	217,849.83	219,649.83	-
	මහාචාර්ය එස්.බී. අධිකාරි - බෞද්ධ භික්ෂූන් හා මෙහෙණින්, සෞඛ්‍ය, ආහාර සහ ආධ්‍යාත්මික පුහුණුව	362,500.00	-	76,625.00	76,625.00	-
	වෛද්‍ය දේවිකා ඉද්දවෙල - මානසික ආබාධ පිළිබඳ අධ්‍යපනය	300,000.00	-	299,925.29	299,925.29	-
	වෛද්‍ය ඩී. ආරියසිංහ - ඉගෙනුම් පරීක්ෂණ පිළිබඳ අධ්‍යයනය	200,000.00	-	45,500.00	45,500.00	-
	වෛද්‍ය වී. ලියනපතිරන -නිරෝගි තරුණ වැඩිහිටියන් පිළිබඳ අධ්‍යයනය	518,000.00	-	103,131.95	103,131.95	-
	වෛද්‍ය එස්. තෙන්නකෝන් - අධ්‍යයනයක්	514,400.00	-	-	-	-
	වෛද්‍ය ඩී.ඒ.සී.එල්. දළුගම - ශ්‍රී ලංකාවේ තෘතීය සත්කාරක මධ්‍යස්ථාන පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක්	150,000.00	-	-	-	-
	මහාචාර්ය කේ.බී. ගල්කැටිය - අවම ප්‍රවේශ ඔහිසෝෆැජෙක්ටම්, ප්‍රතිඵල සමාලෝචනය	420,000.00	-	-	-	-
	මහාචාර්ය පී.වී.ආර්. කුමාරසිරි - වකුගඩු රෝගීන් පිළිබඳ පැතිකඩ අධ්‍යයනයක්	165,000.00	-	-	-	-
	වෛද්‍ය ඊ.එම්.යූ.ජේ.බී. ඒකනායක - කායව්‍යවච්ඡේදය පිළිබඳ අධ්‍යයනය පේරාදෙණිය ශික්ෂණ රෝහල	532,500.00	-	-	-	-
	වෛද්‍ය කේ.පී. මාදුවගේ - සර්ප විෂ සම්බන්ධ පර්යේෂණය	1,027,107.00	-	-	-	-
	මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න - මධ්‍යසාර සම්බන්ධ පර්යේෂණය	402,845.00	-	-	-	-
	වෛද්‍ය ටී.ඩී.පී. නන්දදේව - නිරෝගි වැඩිහිටියන් පිළිබඳ පර්යේෂණය	915,000.00	-	-	-	-
	මහාචාර්ය ආර්.එච්. මුදියන්සේ - පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ගැහැණු සිසුන් අතර පවතින උදරය මහත්වීම හා ආතතිය අතර සම්බන්ධතාවය	140,000.00	-	-	-	-
	වෛද්‍ය සුලෝචනා විජේතුංග - පර්යේෂණය	1,854,000.00	454,130.00	210,000.00	664,130.00	-
	වෛද්‍ය එරංග සිරිවීර -පියයුර පිළිකා පිළිබඳ පර්යේෂණය	4,000,000.00	-	1,612,963.65	1,612,963.65	-
	මදූජා දිවාරත්න ස්වශන පද්ධතිය ආශ්‍රිත ආසාධන	3,912,500.00	-	1,350,225.75	1,350,225.75	-
	වෛද්‍ය චතුර රත්නායක - ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ පිළිකා පිළිබඳ පර්යේෂණ	5,000,000.00	-	1,265,276.75	1,265,276.75	-
	වෛද්‍ය ඩබ්.අයි.ටී. ප්‍රනාන්දු - ශ්‍රී ලාංකික ඖෂධ පැලෑටි පිළිබඳ පර්යේෂණය	750,000.00	13,110.00	123,845.36	136,955.36	-
විද්‍යා පීඨය	මහාචාර්ය සරත්චන්ද්‍ර -කොඩිකාර වැඩමුළුව	1,600,617.82	-	225,454.70	225,454.70	-
	වෛද්‍ය සී.ඩී. ගමගේ -පර්යේෂණය	1,242,199.21	531,665.42	-	531,665.42	-
	වෛද්‍ය වී. ලියනපතිරණ - ශ්‍රී ලාංකික ළමුන් පිළිබඳ අධ්‍යයනය	6,000,000.00	-	-	-	-
	මහාචාර්ය එල්.ආර්.ආර්. චන්ද්‍රජීත් RG/AF/2013/71/S	2,620,500.00	999,788.03	219,539.22	2,400,460.78	91.60%
	ආචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා RG/AF/2013/72/S	2,086,000.00	561,576.35	292,649.96	1,927,092.67	92.38%
	මහාචාර්ය එච්.එම්.එස්.පී. මඩවල RG/AF/2013/73/S	858,000.00	38,873.00	299,068.04	558,931.96	65.14%
	මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම් RG/2014/37/S	966,000.00	933,852.54	31,606.84	965,459.38	99.94%
	මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල RG/2014/38/S	1,706,000.00	543,876.19	375,912.17	1,615,514.01	94.69%
	ආචාර්ය ජී.ඒ.එන්. සුරන්ජීත් RG/2014/39/S	431,310.00	18,650.50	-	329,397.39	76.37%
	මහාචාර්ය ආර්.එස්. රාජකරුණා RG/2014/40/S	1,964,000.00	385,250.80	-	1,964,000.00	100%
	ඩබ්.එම්.සී.එස්. විජේසුන්දර RG/2014/41/S	595,000.00	100,975.00	-	594,678.00	99.94%
	ආචාර්ය එස්.කේ. යටිගම්මන RG/2014/42/S	1,095,000.00	304,242.90	295,170.56	724,236.76	66.14%
	ආචාර්ය එම්.ඒ.සී.කේ. ආරියරත්න RG/2014/49/S	285,550.00	1,820.00	283,052.30	284,872.20	99.76%
	ඒ.ඩී.එස්.එන්.පී. අතුකෝරල URG/2016/50/S	301,250.00	-	88,427.00	88,427.00	29.35%
	ඩබ්.ජී.ඒ.පී.පී. ද සිල්වා URG/2016/51/S	943,000.00	38,503.00	579,407.84	617,910.84	65.52%

වගු අංක 2.2.15 හා සම්බන්ධ වේ.

පීඨය	නම හා විස්තර	TCE රු.	2016 වසරේ වියදම	2017 වසරේ වියදම	2017/12/31 දිනට ගණනය කළ වියදම	භෞතික ප්‍රගතිය %
විද්‍යා පීඨය	ජේ.එම්.එස්. ජයසිංහ මැණිකේ URG/2016/52/S	740,550.00	181,672.00	376,264.57	557,936.57	75.34%
	ටී.පී. රණවක URG/2016/53/S	480,000.00	-	-	-	0%
	බී.එස්. දසනායක URG/2016/54/S	360,000.00	-	-	145,062.05	40.29%
	ආර්.ජේ.කේ.යූ. රනතුංග URG/2016/55/S	317,700.00	-	-	-	0%
	එන්.පී.එස්. කුමුදේගම URG/2016/56/S	300,000.00	-	172,098.00	172,098.00	57.36%
	ඩබ්.එම්.සී.එස්. විජේසුන්දර URG/2016/57/S	685,000.00	34,812.00	417,442.00	452,254.00	66.02%
	කේ.එම්.ජී.ජී. ජයසුරිය URG/2016/58/S	366,420.00	-	12,180.00	12,180.00	3.324%
	එස්.සී.ඩී.එස්.එස්. සූරියපතිරණ URG/2016/59/S	1,437,000.00	-	784,806.50	784,806.50	54.61%
	ඩබ්.ඒ.එම්. දවුන්දසේකර URG/2016/60/S	638,014.00	5,053.00	317,076.50	322,129.50	50.48%
	එස්. මීගස්කුමුර URG/2016/61/S	2,277,120.00	-	353,373.35	353,373.35	15.51%
	ඩබ්.ඒ.අයි.පී. කරුණාරත්න URG/2016/62/S	890,700.00	13,780.00	303,525.07	317,305.07	35.62%
	එස්.සීකේ. රූබසිංහ URG/2016/63/S	367,100.00	126,828.07	188,050.00	314,878.07	85.77%
	ආර්.ඩී. නවරත්න URG/2016/82/S	455,000.00	-	245,000.00	245,000.00	53.84%
	මහාචාර්ය කේ.බී. රණවන URG/2016/87/S	327,750.00	-	199,454.00	199,454.00	60.85%
	මහාචාර්ය ආර්.එස්. රාජකරුණා URG/2016/88/S	335,766.00	-	13,253.50	13,253.50	3.947%
	ආචාර්ය එස්.කේ. යටිගම්මන URG/2016/89/S	335,000.00	-	-	-	-
	මහාචාර්ය එච්.එච්.එස්.පී. මඩවල URG/2016/90/S	335,000.00	-	156,766.00	156,766.00	46.79%
	ඩබ්.ඒ.පී.පී. ද සිල්වා RG/2016/EB/05	1,420,620.00	164,014.50	412,087.42	576,101.92	40.55%
	ඩබ්.ඒ.එම්. දවුන්සේකර RG/2016/AG/03	2,196,862.00	523,149.60	584,387.30	1,107,536.90	50.41%
	ආර්.එම්.ජී. රාජපක්ෂ TG/2014/Tech-D/04	7,201,000.00	3,346,366.11	1,021,058.50	6,612,346.32	91.82%
	ආර්.එම්.ජී. රාජපක්ෂ/ ටෙක්ස්චර්ඩ් ජර්සේ ලංකා	1,440,000.00	280,000.00	480,000.00	760,000.00	52.77%
	ජී.ඒ.එන්. සුරන්ජිත් NARP/16/UP/SC/01	2,417,500.00	785,694.00	969,106.00	1,754,800.00	72.58%
	එම්.ඒ.එස්.ජී.කේ. මාලවියාරච්චි MRT/TRD/AGR/3/1/04	3,402,858.53	1,684,422.22	67,011.46	3,402,858.53	
	එම්.ඒ.පී.කේ. මාලවියාරච්චි MRT/TRD/AGR/3/2/26	6,770,000.00	-	53,369.00	53,369.00	0.788%
පශු වෛද්‍ය	වෛද්‍ය එල්.ජේ.පී.ඒ.පී. ජයසුරිය RG/2017/AG/03	1,432,700.00	Nil	431,790.33	431,790.33	-
	වෛද්‍ය ඒ. අරුල්කාන්තන් RG/2016/BT/03	3,759,000.00	Nil	1,829,791.15	1,829,791.15	-
	වෛද්‍ය ආර්. එස්. කළුපහන - රාජකීය පශුවෛද්‍ය විද්‍යාලය සමඟ පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩ සටහන	2,881,693.00	Nil	615,673.94	615,673.94	-
	මහාචාර්ය ඒ. බී. ඩී. ඇලෙක්සැන්ඩර් - IAEA තාක්ෂණික සහයෝගිතා වැඩසටහන	2,500,000.00	1,570,547.50	752,586.20	2,323,133.70	-
එකතුව		**393,385,972.09**	**72,830,718.28**	**80,124,122.48**	**345,315,065.36**	

3. පීඨ හා පශ්චාත් උපාධි ආයතන

3.1 කෘෂිවිද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය එච්. ඩී .කේ. එන්. ජී. පුෂ්පකුමාර)

හැඳින්වීම

ආසියානු කලාපයේ කෘෂිවිද්‍යා උසස් අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් වන කෘෂිවිද්‍යා පීඨය වර්තමානය වනවිට සිව් අවුරුදු උපාධි පාඨමාලා තුනක් ප්‍රදානය කරනු ලබයි. මෙම උපාධි පාඨමාලා තුන, විද්‍යාවේදී කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, විද්‍යාවේදී ආහාර විද්‍යා හා තාක්ෂණවේදය සහ සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධි ලෙස හැඳින්වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වර්ෂිකව පීඨයට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව තුන්සියයකි. ඊට අමතරව විශේෂ ප්‍රතිපාදන යටතේ සීමිත විදෙස් සිසුන් ප්‍රමාණයක් හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සිසුන් පිරිසක් මෙම පීඨයට ඇතුළත් කරගනු ලබයි. පීඨයෙන් බිහිවන උපාධිධාරීන් හට වඩාත් ඵලදායී පුහුණුවක් ලබාදීම හා ඔවුන් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් උපාධිධාරීන් බවට පත්කිරීම පිණිස පීඨය මගින් පිරිනමනු ලබන සියලුම අධ්‍යයන වැසටහන් සමාසික පාඨමාලා ඒකක ක්‍රමය පදනම් කරගනිමින් සැලසුම් කොට ඉංග්‍රිසි මාධ්‍යයෙන් පවත්වනු ලබයි. පීඨය මගින් ලබාදෙනු ලබන පුහුණුවේ උසස් ගුණාත්මක භාවය තහවුරු කරණු පිණිස නවීන හා ඵලදායී ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ක්‍රම පීඨය විසින් භාවිත කරනු ලබයි. මෙම කාර්යයන් සාර්ථක කරගනු පිණිස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් තෝරාගත් අසමසම මානව සම්පත් ප්‍රමාණයක් පීඨය සතුව පවතින අතර ඊට ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 105 දෙනෙකු (ඔවුන්ගෙන් 75% ක් ලෝකයේ ප්‍රසිද්ධ විශ්වවිද්‍යාල වලින් ආචාර්ය උපාධි ලැබුවන් වන අතරම 38% ක් මහාචාර්යවරුන් වෙති) හා සහය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 270 කි. පීඨයේ අධ්‍යයන වැඩසටහන්වලට මෙරට සියලුම ප්‍රධාන කාලගුණික කලාපයන් ආවරණය වන පරිදි ක්ෂේත්‍ර පුහුණුවක් ද ඇතුළත් වේ. එනම් කුණ්ඩසාලේ දොඩංගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය (අතරමැදි කලාපය) මහවෙල පශු සම්පත් ගොවිපල, උඩපේරාදෙණිය, මී වතුර ගොවිපල (තෙත් කලාපය) හා මහඉලුප්පල්ලම උප මණ්ඩපය, මහඉලුප්පල්ලම (වියලි කලාපය) යන කලාප ඇතුළත් වේ. ඉහත කරුණුවලට අමතරව කෘෂිව්‍යාපාර මධ්‍යස්ථානය, කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යෂ්ථානය හා කෘෂිකර්ම පර්යේෂණ සහ සමාජ ක්‍රියාකාරකම් සවිබල ගනුවනු ලබයි.

ජයග්‍රහණ

අධ්‍යයන වැඩසටහන:

2016/2017 අධ්‍යයන වර්ෂ තුළදී සැලසුම් කළ පරිදී සියලුම අධ්‍යයන ක්‍රියාකාරකම් සාර්ථකව අවසන් කරන ලදී. සැලසුම් කළ අධ්‍යයන දින දර්ශනයට අනුව එම කාළය තුළ පිළිවෙලින් සිසුන්ගේ අධ්‍යයන දින දර්ශනයට අනුව එම කාලය තුළ පිළිවෙලින් සිසුන් 149, 141, සහ 41 දෙදෙනෙකු කෘෂිකර්ම තාක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය ද ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධිය සහ සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධිය ද අවසන් කරනු ඇත. එමෙන්ම මෙම පීඨය සෑම සමාසිකයක් අවසානයේම සිසුන් විසින් ආචාර්යවරුන් ඇගයීමේ කාර්යය ද නොනවත්වාම පවත්වාගෙන යනු ලබයි. 2017 වර්ෂයේ මැයි මස පැවැත් වූ උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වූ 2011/2012 සිසු කණ්ඩායමේ උපාධිධාරීන්ගෙන් 95ක්ම ඔවුන්ගේ උපාධි පාඨමාලා අවසන් කොට මාස පහක් වැනි කාලයක් තුළ රැකියාවන් හිමිකරගෙන ඇති බව පීඨය අභිමානයෙන් යුතුව වාර්තා කරනු ලබයි. මහපොළ හා ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලට අමතරව 2017 වර්ෂයේ කෘෂිවිද්‍යා පීඨය විසින් යෝග්‍ය සිසුන් වෙත ශිෂ්‍යත්ව 100කට වැඩි ප්‍රමාණයක් ප්‍රදානය කොට ඇත.

නවක ශිෂ්‍ය ප්‍රවේශය

2016/2017 අධ්‍යයන වර්ෂයේ 2015/2016 සහ 2016/2017 යන අධ්‍යයන වර්ෂවලට අයත් සිසු කණ්ඩායම් දෙකක් ලියාපදංචි කරණ ලදී. පීඨය මගින් ප්‍රදානය කරනු ලබන ඉහත සඳහන් කළ උපාධි

පාඨමාලා තුන අධ්‍යයනය කිරීම සඳහා 2015/2016 සිසු කණ්ඩායමට පිළිවෙළින් සිසුන් 145, 37 හා 40 දෙනෙකු ද 2016/2017 කණ්ඩායමට පිළිවෙළින් සිසුන් 200, 46 ක් හා 51 දෙනෙකු ඇතුළත් වූ අතර මෙම සිසු කණ්ඩායම් දෙකට වෙන වෙනම දිසානුයෝජන වැඩසටහන් පවත්වන ලදී. ඊට අමතරව එම වැඩසටහන් අතර නවක සිසුන් විශ්වවිද්‍යාල දිවියට හැඩගැන්වීම සඳහා විවිධ ක්‍රියාකාරකම් පවත්වන ලදී. නායකත්වය, කණ්ඩායම් හැගීම් සංවර්ධනය හා යහපත් ආකල්පයන් ගොඩනැගීම සඳහා මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ දී දින පහක පුහුණු වැඩ සටහනක් ද පවත්වන ලදී. එම කාර්යයන්වලට අමතරව පීඨය විසින් නවක සිසුන් ඔවුන්ගේ ආදාළ අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට ප්‍රථම ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණය, ගණිතය, මූලික භෞතික විද්‍යාව හා විද්‍යාගාර කුසලතාවයන් දියුණු කිරීම පිළිබඳ කඩිනම් පුහුණු වැඩසටහනක් ද අඛණ්ඩව ලබාදෙනු ලබයි.

කෘෂිවිද්‍යා පීඨයේ ප්‍රථම උපාධි පර්යේෂණ සැසිය 2017

කෘෂිවිද්‍යා පීඨය එහි අධ්‍යයන දින දර්ශනයට අනුව ඉහත පර්යේෂණ සැසිය අඛණ්ඩව සිව්වනවරටත් 2018 ජනවාරි මස 12 වැනි දින පවත්වනු ඇත. මෙම සැසියේ ප්‍රධාන අමුත්තා ලෙස ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ කැනේඩියානු මහ කොමසාරිස් ශ්‍රීමත් ඩේවිඩ් මැකිනන් මහතා සහභාගිවනු ඇත. මෙම සැසියේ අවසන් පරිච්ඡේදයේ දී ක්ෂේත්‍රයන් 4ක් යටතේ එනම් නව නිපැයුම් සහ සොයාගැනීම්, සියලුම භාෂාවලින් සකස් කළ පර්යේෂණ දැනුම්දීම පර්යේෂණ ව්‍යාපෘතිවලින් හා විද්‍යාත්මක කාර්යයන් තුළින් අත්කරගත් දැනුම ව්‍යාප්ත කරලීම සඳහා සිසුන් විසින් සකස්කල මිනිත්තු 2-3 ක වීඩියෝ දර්ශන ශිෂ්‍ය ව්‍යාපෘති මත පදනම් වූ පර්යේෂණාත්මක ඡායාරූපකරණය යන අංශවලට අදාළව හොඳම වාචික ඉදිරිපත් කිරීම් හා හොඳම පෝස්ටර ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක්කොට සම්මාන ප්‍රදානය කරනු ඇත. මෙම පර්යේෂණ සැසියේ තාක්ෂණික සැසි හතරේ සමස්ත හොඳම ඉදිරිපත් කිරීම් කරන්නා තෝරා ඇල්ප්‍රඩ් බ්‍රවර්ස් අනුස්මරණ රන් පදක්කම ප්‍රදානය කරනු ඇත.

උසස්වීම් / සම්මාන ප්‍රදාන

උසස්වීම් ලබාදීමේ සැලසුම ප්‍රමාද වූවත් මහාචාර්ය බී. මාරඹේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදී. බෝග විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය බී. මාරඹේ, මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී. නිස්සංක, ආචාර්ය එල්.ඩී.බී. සුරියගොඩ, ආචාර්ය කේ.ඩබ්.එල්.කේ.වීරසිංහ, ඩී.එම්.එස්.බී. දිසානායක මහතා සහ එල්.වී.වයි. වීරරත්න, පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ජේ.කේ. විදානආරච්චි හා ආචාර්ය කේ.කේ.එස්.පී. කොඩිතුවක්කු සහ කෘෂිකර්ම ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ ආචාර්ය පී.එම්.පී.සී.ජී. බණ්ඩාරණායක යන පීඨ සාමාජිකයෝ එකොලොස් දෙනා 2015 වසර සඳහා වන ඉහළ ශ්‍රේණිගත විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මාන ලබාගත්හ. එමෙන්ම පීඨයේ මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා සහ ආචාර්ය බී.ඩී.ආර්. ප්‍රසන්ත ජාතික පර්යේෂණ සභාවේ දක්ෂතා සම්මාන දිනාගත්හ.

පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ඩබ්.එස්. දන්දෙණිය මධ්‍යම හා දකුණු ආසියා කලාපයේ තරුණ විද්‍යා විද්වත් පර්ෂදයට වර්ෂ පහක කාලයක් සඳහා තෝරාගෙන ඇති අතර සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය කේ.කේ.එස්.පී. කොඩිතුවක්කු මහතාට 2017 වසර සඳහා වන ට්‍රැවුලර් සහෘදත්වය පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය විසින් ප්‍රදානය කොට ඇත. බෝග විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය බී.මාරඹේ හා කෘෂි ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශයේ මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා ලෝක බැංකුව විසින් ආධාර කොට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ උපදේශකවරුන් ලෙස පත්කොට ඇත. කෘෂි ව්‍යාපෘති අධ්‍යයන අංශයේ ඩී.එම්.යූ.අයි. දිසානායක මිය කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධිය සාර්ථකව අවසන් කොට ඇත. මහාචාර්ය ඩි.එම්.ද කොස්තා වෙත පර්යේෂණ ව්‍යාපෘතියක් වෙනුවෙන් වර්ෂ තුනක කාලයක් සඳහා ජාතික පර්යේෂණ සභාවේ රුපියල් 4,977,908/ ක පර්යේෂණ ප්‍රදානයක් හිමිවී ඇත.

Pro-food, pro-pack & Ag-Biz ප්‍රදර්ශනයට සහභාගි වූ කෘෂිවිද්‍යා පීඨය එහි ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී. මෙහිදී ආහාර විද්‍යාව හා තාක්ෂණ අධ්‍යයන අංශයේ සිසුන් විසින් සංවර්ධනය කළ“Edible coffee cup” නව නිපැයුම සඳහා ද ප්‍රථම ස්ථානය හිමි වූ අතර හොඳම ආයතනික වෙළඳ කුටියට සහ ඒ.ජේ.ආර්.පී. පසන් සහ

එස්.එල්.ආර්. ජයනායක යන මහත්වරුන් විසින් සංවර්ධනය කරන ලද ගෘහස්ථ හිරමණය හා පොල්කිරි මිරිකන යන්ත්‍රය වෙනුවෙන් හොඳම නිෂ්පාදනය හේතු කොටගෙන ප්‍රථම ස්ථානය පිරිනමන්නට විය.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කොට සැප්තැම්බර් 26-28 යන දිනවල පැවැත් වූ ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයට ද කෘෂිවිද්‍යා පීඨය සහභාගි විය. 2012/2013 අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති මඟින් සංවර්ධනය කළ නිෂ්පාදන හා ක්‍රියාවලින් මත පදනම් වූ නව සොයාගැනීම් මෙහිදී ප්‍රදර්ශනය කරන්නට විය. කෘෂිවිද්‍යා පීඨ 2016 ප්‍රථම උපාධි පර්යේෂණ ප්‍රදර්ශනයේ දී තෝරාගත් නව නිපැයුම් දහයකට විශ්වවිද්‍යාල කණ්ඩය හා තෘතීය අධ්‍යාපන ආයතන කාණ්ඩය යටතේ ජාතික නව නිපැයුම් කාර්යයට සහභාගිවීම සඳහා ආරාධනා ලැබී ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

i. කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයන අංශයේ ආර්.එම්.ආර්.ඩී. අබේරත්න මහතා, මහාචාර්ය එම්.අයි.එම්. මවුසුද්, ඩබ්.එම්.සී.එස්. රත්නපාල හා ආචාර්ය කේ.එස්.පී. අමරතුංග විසින් වාරිමාර්ග පද්ධතිය පිළිබඳව සංවර්ධනය කළ නව නිපැයුම.
ii. කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයන අංශයේ එම්.කේ.පී.එස්. සුමනසේන හා ආචාර්ය ඒ.කේ. කරුණාරත්න විසින් සංවර්ධනය කළ නව නිපැයුම
iii. ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශයේ ජී.ඒ.ඩී.ඩී.ද සිල්වා මිය, පී.සී. අරම්පත් මහතා සහ එල්.ජී.ඒ.එන්. වදසිංහ විසින් සංවර්ධනය කළ කුකුල් මස් හා මාළු ව්‍යාංජන සඳහා කුළුබඩු සහක නිපැයුම.
iv. ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශයේ ඒ.ජේ.ආර්.පී. පසන් මයා සහ එස්.එල්.ආර්. ජයනායක විසින් සංවර්ධනය කළ ගෘහස්ථ හිරමණය හා පොල්කිරි මිරිකන යන්ත්‍රය නිපැයුම.

මේ අතුරින් හිරමණය හා පොල් මිරිකන යන්ත්‍රය මධ්‍යම පළාතේ පළාත් තරඟයකින් තෝරාගත් අතර අනෙක් නිපැයුම් තුන 2016 කෘෂිවිද්‍යා පීඨ ප්‍රථම උපාධි පර්යේෂණ සැසියේ දී තෝරාගන්නා ලදී.

යටිතල සංවර්ධනය

පීඨයේ ප්‍රධාන සැලසුමේ පළමු අදියර යටතේ නව සත්ව විද්‍යා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් මෙන්ම පරිපාලන ගොඩනැගිල්ලේ දිගුව ඉදිකිරීම අවසන් කොට පීඨයට භාරදෙන ලදී. ප්‍රධාන සැලසුමේ දෙවන අදියර (බෝග විද්‍යාව, කෘෂි ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශවල ගොඩනැගිලි දිගු, දේශන ශාලා /පොදු කාමර/ ශ්‍රවණාගාර සංකීර්ණය) කටයුතු ද මනා ලෙස ක්‍රියාත්මක වන අතර 2018 වසරේ අප්‍රේල් වනවිට එය නිම කෙරෙනු ඇත. මහ ඉලුප්පල්ලම උප මණ්ඩපයේ ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය හා මාර්ග පද්ධතිය ඉදිකිරීම මෙන්ම ප්‍රධාන සැලසුමේ තෙවන අදියර වන පීඨ පරිශ්‍රය ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශ පරිශ්‍රයේ උද්‍යාන අලංකරණ කටයුතු 2017 වසරේ අවසාන භාගයේ දී ආරම්භ කරන ලදී.

ප්‍රකාශන

මෙම වසරේදී ද පුරුදු පරිද්දෙන්ම පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සැලකිය යුතු ප්‍රකාශන සංඛ්‍යාවක් එළි දක්වන ලද අතර ජාතික හා ජාත්‍යන්තර වාර සඟරාවල පළකළ පර්යේෂණ ප්‍රකාශන ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ ක්‍රියා කාරකම්, ග්‍රන්ථ හා ග්‍රන්ථ පරිච්ඡේද, ශාස්ත්‍රීය නිබන්ධන හා උපුටන ආදිය ඊට ඇතුළත් විය. එමෙන්ම කෘෂිවිද්‍යා පීඨය තරඟයක් සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ සංක්ෂිතයන් එකතුකොට සංගෘහිත කරන ලද "හාන්තාන පිබිදීම" හෙවත් Hantana Biossoma" එළි දක්වන ලදී.

උපහාර පිදීමේ උත්සවය

වර්ෂ ගණනාවක් පුරාවට හා සමස්ත ජාතියටම මහඟු සේවාවක් ඉෂ්ට සිද්ධ කොට 2016 හා 2017 වසරවල පීඨයෙන් සමුගත් විද්වතුන් හත්දෙනෙකුට (එච්.ඩබ්. සිරිල්, ඊ.ආර්.කේ. පෙරේරා, අයි.පී. වික්‍රමසිංහ, එස්.පී. ඉන්දරත්න, ආචාර්ය ජේ.පී. කීර්තිසිංහ හා දිවියෙන් සමුගත් ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ) යන ආචාර්ය, මහාචාර්යවරුන්ට උපහාර පිදීමේ උත්සවයක් ජූලි 28 වැනි දින ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලයේ දී පීඨය විසින් පවත්වන ලදී.

මධ්‍යස්ථාන හා ඒකක, පීඨ ගොවිපලවල් හා පර්යේෂණ මධ්‍යස්ථාන

පීඨයේ සමාජ කටයුතු පිළිබඳ හස්තයන් වන කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය හා කෘෂිවිද්‍යා අධ්‍යයන ඒකකය ඒවාට අදාළ ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරී කාර්යයභාරයක් ඉටුකර ඇත. මහ ඉලුප්පල්ලම උප මණ්ඩපය, දොඩංගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය, මාරවිල පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය හා මී වතුර ගොවිපල යන අංශ ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු කටයුතුවලට පහසුකම් සැපයීමේ මූලික කර්තව්‍යයට අමතරව සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සහය දක්වන ලදී. පෙර පරිදිම මාවෙල පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය, පීඨ කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය හා විශ්වවිද්‍යාල කිරිහල හරහා විශ්වවිද්‍යාල ප්‍රජාවට සේවාවන් සලසන්නට විය.

ජාතික හා ජාත්‍යන්තර සබඳතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨය වෙනුවෙන් 2017 වසරේ දී විදෙස් විශ්වවිද්‍යාල එනම් රොමේනියාවේ ට්‍රාන්සිල්වේනියා බ්‍රාසෝව' විශ්ව විද්‍යාලය, ජපානයේ ඔසාකා ප්‍රිපෙක්චර් විශ්වවිද්‍යාලය හා ඕස්ට්‍රේලියාවේ වෙස්ටර්න් ඕස්ට්‍රේලියා විශ්වවිද්‍යාලය සහ මධ්‍යම චීන නෝමල් විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කොට ඇත. එමෙන්ම කෘෂිවිද්‍යා පීඨය ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සහ ලෝක ආහාර වැඩසටහන සමග පර්යේෂණ ගිවිසුම් ද අත්සන් කොට ඇත. එපමණක් නොව මෙම පීඨය මැලේසියානු පුට්‍රා විශ්වවිද්‍යාලය, පිලිපීන විශ්වවිද්‍යාලය, තායිලන්තයේ ලොස් බානෝස් කසෙට්සාන් විශ්වවිද්‍යාලය, කැනඩාවේ නිව් පවුන්ඩඩ් විශ්වවිද්‍යාලය, තායිවානයේ ජාතික තායිවාන් විශ්ව විද්‍යාලය, ඉන්දියාවේ මහාචාර්ය ජයසංකර් තෙලන්ගන රාජ්‍ය කෘෂිකර්ම විශ්වවිද්‍යාලයේ සහ ඉන්දියාවේ මදුරෙහි ත්‍යාගරාජ කළමනාකරණ විද්‍යාලය සමග ද ඒ සම්බන්ධ සාකච්ඡා ආරම්භ කොට ඇත.

පහත සුවිශේෂී කොට දැක්වෙන පරිදි පීඨයේ උපාධි පාඨමාලා ජාත්‍යන්තරීකරණය කිරීමේ අංගයක් වශයෙන් සිසුන් 40 දෙනෙකුට වැඩි පිරිසක් ශ්‍රී ලංකාවෙන් පිටත පැවැත් වූ විවිධ ක්‍රියාකාරකම්වලට සහභාගි වුහ. එම අවස්ථා නම්,

i. කාබනික කෘෂිකර්ම ව්‍යාපාරයේ ජාත්‍යන්තර සංගමය විසින් සංවිධානය කොට ඉන්දියාවේ පැවැත් වූ කාබනික ලෝක සමුළුව 1.
ii. බෙල්ජියමේ පැවැත් වූ තරුණ කෘෂිකර්ම සමුළුව-2017.
iii. ජපානයේ සගා විශ්වවිද්‍යාලයේ පැවැත් වූ චිරස්ථායි නිෂ්පාදන හා පරිභෝජනය පිළිබඳ ප්‍රථම උපාධි අපේක්ෂක ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය.
iv. ඉන්දියාවේ ත්‍යාගරාජා කළමනාකරණ විද්‍යාලයේ පැවැත්වූ වැඩසටහන.
v. තායිවානයේ පැවැත්වූ ජාත්‍යන්තර ශිෂ්‍ය සමුළුව.

තවද, පීඨයේ උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව හා පසු අස්වනු තාක්ෂණ ආයතනය හා කෘෂි ව්‍යාපෘති අංශය ජාත්‍යයන්තර උද්‍යාන විද්‍යා සංගමය සමඟ සහයෝගිතාවයෙන් යුතුව පසු අස්වනු හා උද්‍යාන නිෂ්පාදනයන්හි තත්ත්ව කළමනාකරණය පිළිබඳ 4 වැනි සමුළුව ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. මහනුවර අමායා හෝටලයේ දී අප්‍රේල් 6-8 යන දිනවල පැවැත් වූ මෙම සමුළුවට විදේශිකයන් 38 දෙනෙකු හා ශ්‍රී ලාංකිකයන් 103 දෙනෙකු සහභාගි වුහ.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයේ හා ජපානයේ උටිසොනෝමියා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි අපේක්ෂකයෝ සමාසිකයක කාලයක් සඳහා මෙම පීඨයට පැමිණ සිටියහ.
මීට අමතරව ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලය, කැනඩාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස්, රුමේනියාවේ ට්‍රාන්සිල්වේනියා බ්‍රාසොව් විශ්වවිද්‍යාලයේ දූත පිරිසක් සහ ඉන්දියාවේ මදුරෙයි ත්‍යාගරාජ කළමනාකරණ විද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ ද පීඨයට පැමිණියහ.

කෘෂිවිද්‍යා පීඨය සංස්ථා අංශය සමඟ කර්මාන්ත සබඳතා ලෙස පර්යේෂණ හා පුහුණුවට සම්බන්ධ සහයෝගිතාවන් සඳහා හේලීස් සමාගම, ඩීසල් හා මෝටර් ඉංජිනියරින් සමාගම හා ඒ බවර් සහ සමාගම යන සමාගම් සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී.

සමාජ ක්‍රියාකාරකම්

පීඨයේ වාර්ෂික සිද්ධීන් ලෙස පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

i. අලුත් අවුරුදු පිරිත් දේශනාව හා වෙනත් ආගම්වල ආගමික කටයුතු ජනවාරි 1-2 දිනවල පවත්වන ලදී.

ii. කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව තුළින් සිසුන් විසින් අත්කරගත් කුසලතා එළිදැක්වීමට තෝතැන්නක් නිර්මාණය කරමින් Elysium"-2017 වැඩ සටහන පවත්වන ලදී.

iii. සිංහල/දමිල නව අවුරුදු උදාව සැමරීමේ බක්මහ උළෙල අප්‍රේල් 8 දින පවත්වන ලදී.

iv. පීඨයේ කලා කවය විසින් සිසුන්ගේ හැකියාවන් ගවේෂණය කරමින් පවත්වන වැඩසටහන නොවැම්බර් 29 දින පවත්වන ලදී.

v. කාර්ය මණ්ඩලයේ වාර්ෂික සුහද හමුව නොවැම්බර් 30 දින පවත්වන ලදී.

ඉහත කරුණුවලට අමතරව පීඨයේ සිසුන් විසින් අ.පොෙ.ස. (සා.පෙළ) විභාගයට පෙනීසිටීමට නියමිත විභාග අපේක්ෂයන් වෙනුවෙන් දිස්ත්‍රික්ක කිහිපයක දී සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. සත්ව විද්‍යා, බෝග විද්‍යා, පාංශු විද්‍යා හා කෘෂිකර්ම ජීව විද්‍යා අධ්‍යයන අංශ විසින් අ.පොෙ.ස (උ.පෙළ) විභාගයට කෘෂිකර්මය විෂයක් ලෙස හදාරන සිසුන් වෙනුවෙන් එක්දින පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන්නට විය. මේ සඳහා ප්‍රායෝගික වැඩසටහන් මාවෙල පශු සම්පත් ක්ෂේත්‍ර මධ්‍යස්ථානයේ දී හා ටිෂු කල්චර් පාංශු විද්‍යා සහ කෘෂි ජීව විද්‍යා විද්‍යාගාරවලදී පවත්වන ලදී.

බාධක සහ පිළියම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විනයපාලක, නියෝජ්‍ය විනය පාලකවරුන් විසින් දියත් කළ නවක වදය වැළැක්වීමේ වැඩසටහන් හේතුකොට ගෙන අවස්ථා දෙකකදී සිසුන් විසින් විරෝධතා දැක්වූ අතර සමහර සිසුන් ශිෂ්‍ය කටයුතුවලින් බැහැරව සිටියහ. නියෝජ්‍ය විනය පාලක ශිෂ්‍ය උපදේශකවරුන් හා පරිපාලනය මෙම ගැටළු පිළිබඳව දෙමාපියන්, සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් සමග සාකච්ඡා කිරීම සඳහා වැඩි කාලයක් කැප කරන්නට විය. එතුළින් තවදුරටත් ඇතිවීමට තිබූ අර්බුදකාරී තත්ත්වයන් වළක්වා ගැනීමට හැකිවිය. සිසුන් තේරීමේ ප්‍රමාදය හේතුවෙන් 2015/2016 සිසු කණ්ඩායම ලියාපදිංචි කිරීම 2016 වසර තුළදීම සිදු කිරීමට නොහැකි වීම නිසා අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2017 වසරේන් ඔබ්බට දීර්ඝ විය. එසේවුවත් පීඨය මහත් වෙහෙසක් දරා අදාළ උපාධි පාඨමාලා නියමිත කාලවකවානුව තුළම අවසන් කරන්නට සමත්විය. නිවාඩු කාලය තුළ අමතර දේශන පැවැත්වීම නිසා එම කාර්ය සාර්ථක කරගැනීමට හැකිවිය. මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නව ගොඩනැගිල්ලේ අලංකාර පංතිකාමර හා විද්‍යාගාර සැකසීම කළ නොහැකි විය. ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් සඳහා විද්‍යාගාර පහසුකම් සංවර්ධනය කිරීම පිණිස කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ කටයුතු සුදානම් කොට ඇත.

අනාගත සැලසුම්

කෘෂිවිද්‍යා පීඨය විසින් ප්‍රදානය කරනු ලබන උපාධි ත්‍රිත්වයේ ම විෂයමාලා සංශෝධනය 2018 වසරේ දී සිදුකිරීමට ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත. කෘෂිකර්ම විෂය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දී වර්ෂ 70ක් සපිරීමත් මහ ඉලුප්පල්ලම උප මණ්ඩපය ස්ථාපිත කොට වසර 50ක් සපිරීමත් සමගාමීව සැමරීමට කටයුතු යොදා ඇත. මෙම සැමරුම් අතරට මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ දී ප්‍රදර්ශනයක් පැවැත්වීම, සමස්ත ලංකා ප්‍රශ්න විචාරාත්මක තරගයක් මෙන්ම ප්‍රචාරක ව්‍යාපාරයක් පැවැත්වීමත් ඇතුළත් වේ. පීඨයේ උද්‍යාන අලංකරණ කටයුතු සිදුකිරීමත් සමග පීඨයේ ප්‍රධාන සැලසුම 2018 වසරේ දී අවසන් කිරීමට ද මෙම පීඨය අපේක්ෂා කරයි. එසේම විදෙස් විශ්වවිද්‍යාල සහ වෙනත් දේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ ශිෂ්‍ය හුවමාරුව හා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ශක්තිමත් කරගැනීමට ද කෘෂිවිද්‍යා පීඨය අපේක්ෂා කරයි.

3.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ඩී.බී.එම්.වික්‍රමරත්න)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අටවැනි පීඨය ලෙස සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2007 වසරේ දී ස්ථාපිත කරන ලදී. මෙම පීඨය මුලිකවම හෙදවේදය හා සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳව සිව් අවුරුදු ප්‍රථම උපාධි විශේෂ උපාධි වැඩසටහන් ප්‍රදානය කරනු ලබන අතර එතුළින් විද්‍යාවේදී හෙදවේදය, විද්‍යාවේදී භෞත චිකිත්සක විද්‍යාව, වෛද්‍ය රසායනාගාර විද්‍යාව, ඔසු වේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, විකිරණ විද්‍යා හා විකිරණ චිකිත්සක විද්‍යාවේදී උපාධි හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. එසේ වුවත් 2010 වසරේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම මත මෙම උපාධි වැඩසටහන්වල ව්‍යුහය 3+1 (සාමාන්‍ය හා විශේෂ) ලෙස වෙනස් කරන ලදී. ඉන් අනතුරුව 2014 වසරේදී සිසුන් විසින් දක්වන ලද විරෝධතාවන් පදනම් කොටගෙන පීඨය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ජාත්‍යන්තරව පිළිගත් සම්මාන 120 ගෞරව උපාධි වැඩසටහන් බවට මෙම උපාධි ප්‍රතිව්‍යුහගත කරන ලදී. මෙලෙස සම සෞඛ්‍ය විද්‍යා පීඨය සතුව අධ්‍යයන දෙපාර්තමේන්තු හයක් පවතින අතර එහි අධ්‍යයන කාර්ය මණ්ඩලය 57 දෙනෙකුගෙන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 48 දෙනෙකුගෙන් යුක්ත වේ. මේ වනවිට සිසුන් 946 දෙනෙකු උපාධි පාඨමාලාවන් හදාරන අතර 594 දෙනෙකු උපාධිධාරීන් බවට පත්ව ඇත.

සිසුන්ට සායනික පුහුණුව හා විද්‍යාගාර පුහුණුව ලබාදීම සඳහා ජාතික හා පුද්ගලික රෝහල්වල බලධාරීන් සමඟ සාර්ථක සහයෝගිතාවන් ගොඩනගා ගැනීමට පීඨයට හැකිවිය. පීඨයේ ස්ථාපිත කොට ඇති භෞත චිකිත්සක හා විකිරණ විද්‍යා සේවා අංශවලින් බාහිර රෝගීන් සඳහා ගුණාත්මක සේවාවන් ලබාදෙනු ලබන අතර මෙම අංශවලින් සිසුන්ගේ සායනික පුහුණුව සඳහා ද මහඟු සේවාවක් ඉටුකරනු ලබයි.

ජයග්‍රහණ

විශ්වවිද්‍යාලයේ වජ්‍ර ජයන්ති සැමරුමට සමාන්තරව මෙම පීඨයේ දසවැනි සංවත්සරය අප්‍රේල් 10 වැනි දින සමරන්නට විය. එදිනම වජ්‍ර ජයන්ති සැමරුම් ගොඩනැගිල්ල ලෙස නම් කළ නව පරිපාලන ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් අතින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. සිව් මහල් නව ගොඩනැගිල්ලට පරිපාලන මහල හා විභාග හා ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා පවතින විවෘත කලාපයට අමතරව විද්‍යාගාර දෙකකින් හා විශාල සම්මන්ත්‍රණ ශාලාවකින් යුක්ත වේ.
පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරණායක විශේෂ ළමා රෝහලේ මෙන්ම මහනුවර ශීක්ෂණ රෝහල හා පේරාදෙණිය ශීක්ෂණ රෝහලේ සීමිත ප්‍රමාණයකින් හෝ සායනික පුහුණුව සඳහා අවස්ථාව උදාවීම මෙම වර්ෂයේ ලද සුවිශාල වූ ජයග්‍රහණවලින් එකක් ලෙස සැලකිය හැකිය.

පේරාදෙණිය ලංකා බැංකුවට යාබදව පිහිටි තෙමහල් ගොඩනැගිල්ල තුළ ඔසුහලක් විකිරණ විද්‍යා සේවා මධ්‍යස්ථානයක්, තුවාල සුවකාරක මධ්‍යස්ථානයක්, හා රෝග හඳුනාගැනීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා පීඨයට පවරාදෙනු ලැබූ අතර මෙම කටයුතු 2018 වසරේදී දියත් කරනු ඇත.

ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනමනු ලබන පහසු ණය ක්‍රමය යටතේ උපකරණයක් මිළදී ගැනීම සඳහා කටයුතු යොදා ඇති අතර ඒ සඳහා අදාළ ගිවිසුම දෙසැම්බර් 28 දින උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී අත්සන් කරන ලදී. 2018 වසරේ අප්‍රේල් මාසයේ දී මෙම උපකරණය ක්‍රියාවේ යොදවනු ඇත. සම සෞඛ්‍ය විද්‍යා විෂයන් සම්බන්ධ උසස් උපාධි කමිටුවක් නොවැම්බර් මාසයේ දී ස්ථාපිත කරන ලද අතර එතුළින් පීඨය මගින් එම විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාපති, දර්ශනපති හා දර්ශනශූරී උපාධි පරිනමනු ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් පස්දෙනෙකු 2017 වසරේ දී බඳවාගන්නා ලදී.

විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය

- මෙම අධ්‍යයන අංශයේ පවතින ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවේ දෙවන අදියර අනුමත කරන ලද අතර එහි ඉදිකිරීම් ආරම්භ කරනු ඇත.

- විකිරණ විද්‍යා සේවා මධ්‍යස්ථානය සඳහා පේරාදෙණිය ශික්ෂණ රෝහලට ආසන්නයෙන් නව ස්ථානයක් අත්කර ගන්නා ලද අතර එහි කටයුතු 2018 වසරේ දී ඇරඹීමට නියමිතයි.

වෛද්‍ය රසායන විද්‍යා අධ්‍යයන අංශය

- වෛද්‍ය ආර්.පී. ඉලේපෙරුම 2015 වසරේ දී විද්‍යාත්මත පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මානය හිමිකර ගන්නට විය.
- ප්‍රකාශන
  දර්ශක වාර සඟරා - 01
  උපුටන / සම්මන්ත්‍රණ ප්‍රකාශන - 09
  ජාත්‍යන්තර පර්යේෂණවලට සමුළුවලට සහභාගිවීම් - 01
- 2016/2017 නවක සිසු කණ්ඩායම බඳවා ගැනීම - සිසුන් 27 යි.

භෞත චිකිත්සක අධ්‍යයන අංශය

- කාර්ය මණ්ඩල සංවර්ධනය
  ඊ. ලියනගේ මිය ඇගේ දර්ශනශූරී උපාධිය සඳහා 2017 අප්‍රේල් 25 දින සිට මැලේසියාවේ සෞඛ්‍ය විද්‍යා සයින්ස් මැලේසියා විශ්වවිද්‍යාල පීඨයේ ඇගේ දර්ශනශූරී උපාධිය හදාරමින් සිටී.
- ඉසන්ක වීරසේකර විසින් සිදු කරන සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති
  මුස්කුලෝස්කෙලෙටල් පර්යේෂණ කණ්ඩායම - සිඩ්නි විශ්වවිද්‍යාලය
  ස්ට්‍රෙක් පර්යේෂණ කණ්ඩායම - එච්.එම්.ආර්.

හෙදවේද අධ්‍යයන අංශය

- වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය පී.ඉලේපෙරුම පෙබරවාරි පළමුවැනි දින සිට බලපැවැත්වෙන පරිදි හෙදවේද අධ්‍යයන අංශයේ නව අංශ ප්‍රධානී ලෙස පත්කරන ලදී.
- කාර්ය මණ්ඩල සාමාජිකයන් අතරින් එක් අයෙක් දර්ශනපති උපාධිය හැදෑරීම ආරම්භ කළ අතර මේ වනවිට තවත් අයෙක් එම උපාධි හදාරමින් සිටී. එක් සාමාජිකයෙකු දර්ශනශූරී උපාධිය අවසන් කළ අතර තවත් එක් සාමාජිකයෙකු එම උපාධිය හදාරමින් සිටී.

සායනික පුහුණු වැඩසටහන

අදාළ බලධාරීන් සමඟ අඛණ්ඩව පවත්වන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරණායක විශේෂඥ ළමා රෝහලේ සායනික පුහුණුව ලැබීමට අවසර හිමිවිය. එම අවසරයත් සමඟ 2013/2014 හෙදසිසු කණ්ඩායම 2017.11.20 දින සිට එම පුහුණුව ආරම්භ කරන ලදී. හෙද සිසුන්ගේ එම පුහුණුව සඳහා මහනුවර හා පේරාදෙණිය ශික්ෂණ රෝහල්වලින් ද අවසර ලබා ගැනීම පිණිස තවදුරටත් සාකච්ඡා කෙරෙමින් පවතී.

විදෙස් සහයෝගිතාවන්

- හෙදවේද අධ්‍යයන අංශය හා ඇමෙරිකාවේ ජෝන් හොප්කින්ස් විශ්ව විද්‍යාලයීය සම සෞඛ්‍ය විද්‍යා පීඨය හා හෙදවේද පාසල අතර යෝජිත අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම අත්කරගත් සුවිශේෂ ජයග්‍රහණයක් සනිටුහන් කරයි.
- ජපානයේ නිගාමා විශ්වවිද්‍යාලයේ සම්බන්ධිත වැඩසටහනක් යටතේ 2012/2013 සිසු කණ්ඩායමේ සිසුන් දෙදෙනෙකුට ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ සෞඛ්‍ය විද්‍යා පාසැලේ දී

ඔවුන්ගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීම පිණිස පර්යේෂණ ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබිණ.

පහන් දැල්වීමේ උත්සවය

හෙදවේද අධ්‍යයන අංශයේ නවවැනි පහන් දැල්වීමේ උත්සවය ජුනි 14 දින පවත්වන ලදී. 2014/2015 අධ්‍යයන වර්ෂයේ හෙද සිසු කැළ හිස් පලඳනා පැළඳ පහන් අතෙහි දරාගෙන ඔවුන්ට නියමිත හෙඳ ප්‍රතිඥාව ලබාදෙන ලදී.

වැඩමුළුව/ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන්

- ප්‍රථම උපාධි අපේක්ෂක හෙද සිසුවියන් සඳහා වේදනාව කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් පෙබරවාරි තෙවැනි දින පවත්වන ලදී.
- 2011/2012 සිසු කණ්ඩායම විසින් ප්‍රජා සෞඛ්‍ය ව්‍යාපාර දෙකක් ඔක්තෝම්බර් 4 හා 6 යන දිනවල හන්තාන පෙදෙස හන්තාන වතුයායේ දී පවත්වන ලදී.
- පූර්ණ පරීක්ෂණයකට මුහුණ දුන් අවසන් වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් 2017 නොවැම්බර් නවවැනි (9) දින පවත්වන ලදී.
- කැනඩාවට ගොස් සිටින සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 2006/2007 සිසු කණ්ඩායමේ උපාධිලාභී හෙදියන් තිදෙනෙකු සමඟ, හෙදියන් සඳහා එරට පවතින වෘත්තීමය අවස්ථා පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් අන්තර්ජාලය හරහා හුවමාරු කරගන්නා ලදී.
- 2013/2014 සිසු කණ්ඩායමේ සිසුන් විසින් පිළිමතලාව ධීරානන්ද මධ්‍යමහා විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක් සංවිධානය කරන්නට විය.

ඔසුවේද අධ්‍යයන අංශය

- 2011/2012 සිසු කණ්ඩායමේ සියලුම සිසුහු ඔවුන්ගේ ඖෂධවේදී උපාධිය සාර්ථකව අවසන් කළෝය.
- මහනුවර මහ රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල හා සිරිමාවෝ බණ්ඩාරණායක ළමා රෝහල් වෙතින් රෝහල් පුහුණුව ලබාගන්නා ලදී.
- කර්මාන්ත පුහුණුව, කර්මාන්ත නැරඹීම හා ඖෂධ සම්බන්ධ සමුළුවලට සිසුහු සහභාගි වූහ.
- එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දර්ශනපති උපාධිය හැදෑරීම ආරම්භ කළේය.
- එමෙන්ම කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනෙකු දර්ශනපති උපාධියේ හැදෑරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යති.
- එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දර්ශනපති උපාධිය අවසන් කළේය.
- තව එක් සාමාජිකයෙකු දර්ශනශූරී උපාධිය හදාරමින් සිටියි.
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව සමඟ එක්ව විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුසලක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මූලික විද්‍යා අධ්‍යයන අංශය

- විද්‍යාගාර පහසුකම්
  අලුතින් ඉදිකරණ ලද ගොඩනැගිල්ලේ දෙවන මහලේ කොටසක් මූලික විද්‍යා අංශයට වෙන්කර දෙන ලදී.
- පරිපාලනය
  වසරක කාලයක් තිස්සේ වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශයට අනුයුක්ත ඒකකයක් ලෙස ක්‍රියාත්මක වීමෙන් පසු 2016 වසරේ දී මෙම අධ්‍යයන අංශය ස්ථාපිත කරන ලදී.
- වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් මෙම අධ්‍යයන අංශයට පත්කරන ලදී.

බාධක සහ පිළියම්

හෙදවේද අධ්‍යයන අංශය

සිසුන් විසින් දියත් කරන්නට යෙදුන සංකේත වර්ජන කිහිපයක් හේතුවෙන් 2011/2012 ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ අධ්‍යයන වැඩසටහන අවසන් කිරීම ප්‍රමාද විය. එසේ වුවත් ඔක්තෝම්බර් අවසානයේ දී ඔවුන්ගේ අදාළ සියලුම අධ්‍යයන වැඩසටහන් අවසන් කොට නොවැම්බර් නවවැනි (9) දින අවසන් විභාගයට පෙනී සිටි අතර 2018 වසරේ උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලැබීමට නියමිතය.

මූලික විද්‍යා අධ්‍යයන අංශය

- මෙම අධ්‍යයන අංශයට විද්‍යාගාර පරිශ්‍රයක් හිමිවුවත් යටිතල පහසුකම්, උපකරණ, පාරිභෝගික භාණ්ඩ හා අවශ්‍ය මිනිස් බලය මේ වනවිටත් නොලැබීම හේතුවෙන් මානව භෞතික විද්‍යාව හා ජෛව රසායන විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

අනාගත සැලසුම්

භෞතික චිකිත්සක අධ්‍යයන අංශය

- දෙස් විදෙස් විශේෂඥයන් සමඟ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම
- දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම

වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයන අංශය

- රෝග හඳුනාගැනීමේ විද්‍යාගාරයක් දිවිනැගුම ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම
- වෛද්‍ය රසායනාගාර විද්‍යා විද්‍යාඥයන් වෙනුවෙන් වැඩමුළු පැවැත්වීම
- අවසන් වසර ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් වැඩමුළු පැවැත්වීම

විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය

- දෙස් විදෙස් විශේෂඥයන් සමඟ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම
- දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම

ඔසුවේද අධ්‍යයන අංශය

- ඖෂධවේද විද්‍යා උපාධි වැඩසටහනේ විෂයමාලාවට සංශෝධනයක් සිදුකිරීම
- ප්‍රජා සේවාවන් හා සිසුන්ට පුහුණුව ලබාදීම සඳහා විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුහලක් විවෘත කිරීම
- උපාධි පාඨමාලාවන්හි ප්‍රායෝගික පුහුණු කටයුතු ඉහළ නංවීම සඳහා නව ඖෂධ විද්‍යාගාරවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම

මූලික විද්‍යා අධ්‍යයන අංශය

- නව උපකරණ මිලදී ගැනීමෙන් හා හැකියාවන්ගෙන් හෙබි විද්‍යාගාර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම තුළින් මූලික විද්‍යා විද්‍යාගාරය පූර්ණ ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට මෙම අධ්‍යයන අංශය බලාපොරොත්තු වෙයි. ඊට අමතරව මානව කාය ව්‍යවච්ඡේද දේශන පැවැත්වීමට මෙන්ම සියලුම උපාධි පාඨමාලා සඳහා සංඛ්‍යානය වැනි පොදු විෂයන් සම්බන්ධීකරණය කිරීමටත් සැලසුම් සකස් කරමින් පවතී.
- තවද මෙම අධ්‍යයන අංශය පැරණි පීඨාධිපති කාර්යාල පරිශ්‍රයේ ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත.
- මූලික විද්‍යා අධ්‍යයන අංශය එහි උපාධි පාඨමාලා පහටම අදාළ උපාධි අපේක්ෂකයන් උදෙසා සේවාවන් සලසන හෙයින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් වැඩි පිරිසක් බඳවා ගැනීමට ද සැලසුම් කරමින් සිටී.

හෙදවේද අධ්‍යයන අංශය

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය හා ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයීය හෙද පාසල අතර යෝජිත අවබෝධතා ගිවිසුම 2018 මාර්තු මාසයේ දී අත්සන් කිරීමට නියමිතය.
- නොවැම්බර් 15 දින එඩිම්බරෝ විශ්වවිද්‍යාලයේ නියෝජිත මණ්ඩලය සමඟ පැවති සාකච්ඡා හරහා ඉන්දියාවේ මුම්බායි නුවර පිහිටි එඩිම්බරෝ විශ්වවිද්‍යාලයීය කලාප කාර්යාලයේ සහයෝගයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට කටයුතු සිදුකෙරෙමින් පවතී.
- විවිධ හෙද සිසු කණ්ඩායම් සඳහා පුහුණු සැසි පහසුවෙන් පැවැත්වීමේ පරමාර්ථයෙන් හා හෙද අධ්‍යයන අංශයේ මානව සම්පත් හා යටිතල සම්පත් කාර්යක්ෂමව භාවිතා කරගැනීමේ අරමුණින් යුතුව පැරණි නිපුණතා විද්‍යාගාරය, ආදර්ශ දැඩි සත්කාර ඒකකයක් හා හදිසි ප්‍රතිකාර ඒකකයක් බවට පරිවර්තනය කොට වැඩි දියුණු කිරීමට මෙම අධ්‍යයන අංශය යෝජනා කොට ඇත.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙඳ අධ්‍යයන අංශයේ අධීක්ෂණය හා බල අධිකාරීත්වය යටතේ තුවාල සුවකාරක මධ්‍යස්ථානයක් ගැටඹේ දිවිනැගුම ගොඩනැගිල්ලේ බිම් මහලේ ස්ථාපිත කිරීමට සැලසුම් කොට ඇත.
- හෙදවේද අධ්‍යයන අංශය පීඨ මණ්ඩලයේ අනුමැතිය යටතේ වාර්ෂික හෙද සමුළුවක් පැවැත්වීමට කටයුතු සැලසුම් කොට ඇති අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලීය ප්‍රථම හෙද සමුළුව සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ දී 2018 මාර්තු මාසයේ දී පැවැත්වෙනු ඇත.
- හෙද අධ්‍යාපනයේ පුරෝගාමී උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස හෙදවේද අධ්‍යයන අංශය මෙරට හෙදවේද උපාධිලාභීන් සඳහා විද්‍යාපති උපාධි හඳුන්වාදීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කොට ඇත.

3.3 ශාස්ත්‍ර පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ඕ.ජී.දයාරත්න බංඩා)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ හා පර්යේෂණ කාර්යයෙහි නියැලි සිටින පුරෝගාමී මධ්‍යස්ථානයකි. මෙම පීඨය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් පිළිබඳ ක්ෂේත්‍ර 19ක් ඔස්සේ ශාස්ත්‍රවේදී උපාධිය පිරිනමන අතරම වාණිජවේදී හා නීතිවේදී උපාධියද ප්‍රදානය කරනු ලබයි. එමෙන්ම අධ්‍යාපනවේදී උපාධි 2017 වසරේ සිට ප්‍රධානය කිරීමට ද පියවර ගෙන ඇත. ශාස්ත්‍ර පීඨය 2017 වසරේදී ප්‍රථම උපාධි අපේක්ෂකයන් 3280 ක් සඳහා පහසුකම් සපයා ඇත. (ඒ අතර ශාස්ත්‍රවේදී උපාධි 3202ක්, නීතිවේදී උපාධි 207 ක් හා අධ්‍යාපනවේදී උපාධි 88 ක් විය.) වත්මන් අධ්‍යාපන වර්ෂය සඳහා මෙම පීඨය සිසුන් 921 දෙනෙකු ඇතුළත් කරගත් අතර ඉන් 871 දෙනෙකු ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ද 50 දෙනෙකු නීතිවේදී උපාධිය සඳහා ද ඇතුළත් වුහ.

ජයග්‍රහණ

ශාස්ත්‍ර පීඨය 2017 වසරේදී පහත දැක්වෙන පරිදි උපාධිධාරීන් 942 දෙනෙකු බිහිකළේය.

ශාස්ත්‍රවේදී (ගෞරව)	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)	නීතිවේදී	වාණිජවේදී
616	212	60	54

ප්‍රදානය කළ ප්‍රථම වර්ගීකරණය පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකිය.

ප්‍රථම පංති සාමාර්ථ	දෙවන පෙළ සාමාර්ථ		සමත්
	ඉහළ	පහළ	
27	421	304	190

ඉහත ජයග්‍රහණයන්ට අමතරව ශාස්ත්‍ර පීඨය ගෙවීගිය වසර තුළදී මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් පිළිබඳ තෙවැනි ජාත්‍යන්තර සමුළුව 2017 සංවිධානය කොට පැවැත්වූ අතර එම ක්ෂේත්‍රයට අදාළ පුළුල් පරාසයක පර්යේෂණ නුවමාරු කරගැනීමට එය පිටුවහලක් විය. තවද, අතිවිශාල ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍ර ප්‍රමාණයකින් සමන්විත වූ මෙම සමුළුව ශාස්ත්‍ර පීඨය පර්යේෂණ ක්ෂේත්‍රයෙහි ඉදිරියෙන්ම පසුවන පීඨය බවට නිසැකවම සනාථ කරන සාධකයක් විය. එපමණක් නොව ශාස්ත්‍ර පීඨ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, තෙවැනි ජාත්‍යන්තර පාලි භාෂා සමුළුව පවත්වන්නට විය. විද්වතුන්ට පාලි භාෂාවේ විවිධ විෂය පථයන් පිළිබඳව සාකච්ඡා කිරීමට ඉඩහසර ලබාදීම මෙහි ඉලක්කය වූ අතර එය තරුණ හා ජ්‍යෙෂ්ඨ විද්වත් දෙපිරිසටම ඔවුන්ගේ දැනුම බෙදා හදාගැනීමට මහෝපකාරී විය. ඊට අමතරව තරුණ පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් ව්‍යාප්ත කරලීමට තෝතැන්නක් නිර්මාණය කරමින් ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි පර්යේෂණ සමුළුව-2017 සාර්ථකව පවත්වන ලදී.

අදාළ වර්ෂය තුළදී ශාස්ත්‍ර පීඨය පහත සඳහන් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

අධ්‍යයන අංශය	අවබෝධතා ගිවිසුම	රට
භූගෝල විද්‍යා අ.අ	පේරාදෙණිය විශ්වවිද්‍යාල භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය හා ෂුරිච් විශ්ව විද්‍යාලයීය භූගෝල විද්‍යා අධ්‍යයන අංශය (ශිෂ්‍ය හුවමාරුව, පර්යේෂණ හා ඒකාබද්ධ ශාස්ත්‍රීය ප්‍රකාශන)	ස්විස්ටර්ලන්තය
නීති	පෙන්සෙල්වේනියා රාජ්‍ය විශ්වවිද්‍යාලයීය ඩකිස්සන් නීති විද්‍යාලය (කාර්ය මණ්ඩල ඇ.ඒ.ජ. ශිෂ්‍ය හුවමාරු වැඩසටහන)	ඇ.ඒ.ජ.

යටිතල සංවර්ධන ව්‍යාපෘති යටතේ පහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කොට ඇත.

1. වසර 75ක් පැරණි කලාගාරය හා ශාස්ත්‍ර පීඨ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය.
2. ශාස්ත්‍ර පීඨ ප්‍රධාන ගොඩනැගිල්ලේ වැසිකිලි සංකීරණය ප්‍රතිසංස්කරණය.

ශිෂ්‍යත්ව/සහෘදත්ව

පහත සඳහන් විදෙස් විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ ඇතිකරගත් සම්බන්ධිත වැඩ සටහන් යටතේ පීඨය විසින් සිසුන් වෙත ශිෂ්‍යත්ව කිහිපයක් පිරිනමන්නට විය.

විශ්වවිද්‍යාලයේ නම	ශිෂ්‍යත්ව සංඛ්‍යාව	කාලය
සගා විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - ජපානය	01	වසරකි
ෂුකුඩකා කාන්තා විශ්ව විද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - ජපානය	05	වසරකි
දොන්ගුක් විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - කොරියාව	03	
හොකයිඩො විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - ජපානය		එක් සමාසිකයක්

අනාගත සැලසුම්

ශාස්ත්‍ර පීඨය ක්‍රියාදාමයන් රාශියක් හරහා කලා උපාධි වැඩසටහන්, පර්යේෂණ, සංවර්ධන ක්‍රියාකාරකම් හා ප්‍රජා සේවා කටයුතු සංවර්ධනය කිරීමට තීරණය කොට ඇත. පවතින උපාධි වැඩසටහන් සමාලෝචනය, නව උපාධි හඳුන්වාදීම ප්‍රායෝගික හා ක්ෂේත්‍ර පුහුණු අංග ඇතුළත් කිරීම මෙන්ම අන්තේවාසිකන්වයන් ඇතුළත් කිරීම මෙම ක්‍රියාදාමයන්ට ඇතුළත් වේ. එමෙන්ම කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ ඉංග්‍රිසි භාෂා නිපුණතාවන් දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමුකොට ඇත. පංතිකාමර හා සාකච්ඡා කාමර ඇතුළු භෞතික යටිතල පහසුකම් පුළුල්කොට වැඩිදියුණු කිරීම සඳහා ද සැලසුම් සකස් කරමින් පවතී. ජාත්‍යන්තර සමුළු හා ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සැසි වාර්ෂික කර්තව්‍යයන් ලෙස පැවැත්වීම තුළින් පීඨයේ පර්යේෂණ වැඩිදියුණු කිරීම හා ඒවා ව්‍යාප්ත කරලීමට තීරණය කොට ඇත. මෙරට කලාව සහ සාහිත්‍ය වැඩි දියුණු කිරීම සඳහා ශාස්ත්‍ර පීඨයේ දායකත්වය අඛණ්ඩවම ලබාදෙනු ඇත.

ඉදිරි වර්ෂ පහක කාලය තුළ කලා උපාධිධාරීන් රැකියාවන්හි නියුක්ත කළ හැකි පරිදි ශාස්ත්‍රයේ දී උපාධි වැඩසටහන් වෙනස් කිරීම අපගේ ප්‍රධාන අරමුණයි. ඒ සඳහා පහත සඳහන් පියවර ගනු ඇත.

- ❖ විශේෂ උපාධිවලට නිපුණතා හා හැකියාවන් මුල්කරගත් පාඨමාලා ඇතුළත් කිරීම හා විශේෂ උපාධි සඳහා ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව අඩුකොට එම උපාධිවලට වඩාත් ශාස්ත්‍රීය බවක් ලබාදීම
- ❖ සම්ප්‍රදායිකව පැවැත එන විෂයන් තුනක් ඇතුළත් සාමාන්‍ය උපාධි ක්‍රමයෙන් බැහැරව රැකියා මුල්කරගත් විශේෂ හා සාමාන්‍ය උපාධි වැඩි ප්‍රමාණයක් හඳුන්වාදීම, දේශන ප්‍රමාණය අඩුකොට නිපුණතා හා හැකියාවන් කෙරෙහි වැඩි වටිනාකමක් ලබාදීම තුළින් මෙම කාර්යය සිදුකරණු ඇත.

කලා උපාධි දියුණු කිරීම සඳහා අවශ්‍ය මුදල් හා වෙනත් සම්පත් ලබාදෙනු ඇතැයි පීඨයේ අපේක්ෂාවයි.

පහත සඳහන් සුවිශේෂී ක්‍රියාකාරකම් 2018 වසර තුළදී සිදුකරීමට සැලසුම් කොට ඇත.

1. පීඨ තත්ත්වාරක්ෂණ සංසදය හරහා අධ්‍යයන වැඩසටහන්වලට සම්බන්ධ සියලු තත්ත්වාරක්ෂණ කටයුතු බාරගැනීම සහ පීඨ තත්ත්වාරක්ෂණ සංසදයේ රැස්වීම් නිරතුරුව පැවැත්වීම.
2. පීඨය මගින් පවත්වනු ලබන පාඨමාලාවල විෂයමාලා සංවර්ධනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන ලබාදීම.
3. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.
4. විෂයමාලා සමාලෝචනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
5. විෂයමාලා සමාලෝචනය හා සංශෝධනය.
6. පීඨය විසින් පිරිනමනු ලබන පාඨමාලාවල විෂයමාලා සමාලෝචනය හා සංශෝධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
7. වර්තමානය වනවිට භාවිතයේ පවතින ඉගැන්වීමේ ක්‍රමවේදයන් ඇගයීමට ලක් කිරීම.
8. අදාළ පාඨමාලා සඳහා නව ඉගැන්වීමේ ක්‍රමවේදයන් හඳුනාගැනීම.
9. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමයක් වෙනුවෙන් නව ඉගැන්වීමේ ක්‍රමවේදයන් එකතු කිරීම හා පවතින ක්‍රමවේදයන් නවීකරණය කිරීම.
10. මලලසේකර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට පුළුල් කිරීම.
11. යෝජිත සත්මහල් (7) ගොඩනැගිල්ල ඉදිකිරීම
12. භූගෝල විද්‍යා ගොඩනැගිල්ලේ දිගුවක් ඉදිකිරීම
13. අධ්‍යාපන අධ්‍යයන අංශය වෙනුවෙන් ආදර්ශ පංතිකාමර ඉදිකිරීම
14. මනෝවිද්‍යා අධ්‍යයන අංශය සඳහා විද්‍යාගාරයක් ඉදිකිරීම
15. පුරාවිද්‍යා විද්‍යාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු
16. GIS විද්‍යාගාරය වැඩිදියුණු කිරීම
17. භාෂා විද්‍යාගාරය ඉදිකිරීම
18. පීඨයට ඉගැන්වීමට උපකාරවන ද්‍රව්‍යයන්, උපකරණ හා ලී බඩු මිලදී ගැනීම.
19. පීඨාධිපති සඳහා අළුත් මෝටර් රථයක් මිලදී ගැනීම.
20. සමස්ත පීඨයම ජාලකරණය කිරීම.
21. Wi-Fi ජාලයක් ස්ථාපිත කිරීම.
22. අධ්‍යයන අංශවල පුස්තකාල පුළුල්කිරීම.
23. අදාළ පොත් සහ වාර සඟරා මිලදී ගැනීම.
24. නව අධ්‍යයන හා අනධ්‍යයන සේවක තනතුරු පීඨයට ඉල්ලා සිටීම.
25. සියලුම පාඨමාලා/අධ්‍යයන වැඩසටහන්වල ඉගැන්වීම් සිසුන් විසින් ඇගයීමට ලක් කිරීම.
26. සියලුම පාඨමාලා / අධ්‍යයන වැඩසටහන්වල ඉගැන්වීම පිළිබඳ සම ඇගයීම් හඳුන්වා දීම.
27. ඉගැන්වීමේ විශිෂ්ටතා සම්මානය හඳුන්වාදීම.
28. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාර්යවරුන් ඇගයීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

29. අදාළ පාර්ශවකරුවන් සමඟ සිසුන් වෙනුවෙන් එළිමහන් දිනයන් පැවැත්වීම.
30. අන්තේවාසික වැඩසටහන් සංවිධානය කිරීම.
31. වාර්ෂික විෂයමාලාවට පුහුණුව අනිවාර්ය අංගයක් බවට පත්කොට එම පුහුණුව මත පදනම්ව සිසුන් ඇගයීමට ලක් කිරීම.
32. පීඨ සේවා උපදේශන සංසඳය හරහා යෝග්‍ය පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම.
33. විෂයමාලාවට අදාළ කර්මාන්ත පුහුණු වැඩසටහන් එකතු කිරීම.
34. ඒකාබද්ධ උපාධි, කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරුව සඳහා විදෙස් විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම.
35. ප්‍රමාණාත්මක ආර්ථික විද්‍යාව පිළිබඳ නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම.
36. අධ්‍යාපනය ඉගැන්වීමේ විද්‍යාවේදී උපාධිය හඳුන්වාදීම.
37. තුලනාත්මක ආගම පිළිබඳ උපාධියක් හඳුන්වාදීම.
38. උපදේශනය පිළිබඳ උපාධියක් හඳුන්වාදීම.
39. බහු-සංස්කෘතික අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හඳුන්වාදීම.
40. තුලනාත්මක සාහිත්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් හඳුන්වාදීම.
41. පරිවර්තන අධ්‍යයනය පිළිබඳ කලා උපාධියක් හඳුන්වාදීම.
42. පාසැල්වලට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය.
43. ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය.
44. ගණිත විෂය ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය.
45. සංවර්ධන සැලසුම් හා පුහුණුව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
46. බැංකු අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය.
47. ඩිප්ලෝමා පාඨමාලා හා සහතික පත්‍ර පාඨමාලා.
48. මෘදු කුසලතා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.
49. ප්‍රංශ භාෂා අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීම.
50. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
51. චීන භාෂාව ඉගැන්වීමේ ඒකකයක් ස්ථාපිත කිරීම.
52. බැංකුකරණය පිළිබඳ අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීම
53. කලා සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වාදීම.
54. සියලුම පංති කාමර තොරතුරු තාක්ෂණ ආදී පහසුකම්වලින් සමන්විතව වැඩි දියුණු කිරීම.
55. සියලුම අධ්‍යයන අංශ සඳහා මොඩලයක් හඳුන්වාදීම.
56. කියවීම/ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය හඳුන්වාදීම.
57. ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව - 2018
58. ක්ෂේත්‍ර පුහුණුව හා සමාජ ක්‍රියාකාරකම් සියලුම අධ්‍යයන වැඩසටහන් වලට ඇතුළත් කිරීම
59. පීඨ වෙබ් සංවර්ධන ඒකකයක් සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකයක් ස්ථාපිත කිරීම.
60. ඒ ඒ විෂයට අදාළ සංගම් විසින් සංවිධානය කරනු ලබන තරඟ හැකියාවන් එළිදැක්වෙන සංදර්ශන පැවැත්වීම.
61. පීඨාධිපති ලැයිස්තුව හඳුන්වාදීම
62. සිව්වන වසර අවසානයේ දී වෘත්තීය පොළක් සංවිධානය කිරීම.
63. වාර්ෂික පර්යේෂණ ප්‍රදාන ජාතික අවශ්‍යතා මත බෙදාහැරීම.
64. පීඨයේ ප්‍රමුඛ ප්‍රකාශන සඳහා වාර්ෂික පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ කිරීම.
65. පීඨ පර්යේෂණ කමිටුවේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම.
66. පර්යේෂණ පහසු කරවීම සඳහා හඳුනාගත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් සංවර්ධනය කිරීම.
67. අවබෝධතා ගිවිසුම්වලට අනුව සම්බන්ධිත වැඩසටහන් සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
68. ඉහළ ශ්‍රේණිගත විදෙස් විශ්වවිද්‍යාලවල ආගන්තුක විද්වතුන්ට ආරාධනා කිරීම.
69. පුරෝගාමී පුද්ගලයන්ගේ සහභාගිත්වයෙන් යුතුව මාසික මහජන සම්මන්ත්‍රණ මාලා පැවැත්වීම.

70. අධ්‍යයන වැඩසටහන් සඳහා කීර්තිමත් පුද්ගලයන්ට අමුත්තන් හා ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස ආරාධනා කිරීම.
71. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන් පිළිබඳ ජාත්‍යයන්තර පර්යේෂණ වැඩසටහන් සංවර්ධනය කිරීම.
72. ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති පහසුකරවීම සඳහා පීඨ ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් සංවර්ධනය කිරීම.
73. පර්යේෂණ වෙනුවෙන් මෙරට වෙනත් විශ්වවිද්‍යාලවල කලා පීඨ අතර අන්තර් විශ්ව විද්‍යාල සහයෝගිතාවන් ගොඩනැගීම.
74. ජාතික අවශ්‍යතා පදනම මත පීඨය සමඟ හෝ ඒ ඒ අධ්‍යයන අංශ සමඟ බහුක්ෂෙත්‍ර පර්යේෂණ වැඩසටහන් පැවැත්වීමට අදාළවන හා ඒ පිළිබඳ රුචිකත්වයක් දක්වන සංවිධාන හා පර්යේෂකයන් ප්‍රවර්ධනය කිරීම.
75. යෝජනා ලිවීම හා පර්යේෂණ පිළිබඳ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම.
76. IELTS, TOFEL හා GRE වැනි පාඨමාලා හැදෑරීම සඳහා පරිවාස කථිකාචාර්යවරුන් දිරිගැන්වීම.
77. තරුණ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හරහා පශ්චාත් උපාධි හැදෑරීමේ අවස්ථාවන් සොයා ගැනීම පිණිස වෘත්තීය උපදේශන සේවාවක් පැවැත්වීම.
78. පීඨ උපදේශන ඒකකයක් ස්ථාපිත කිරීම
79. පීඨ ශිෂ්‍ය සුබසාධන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම.
80. විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම.
81. ප්‍රථම උපාධි විෂයමාලාවට ශාරීරික අධ්‍යාපන මොඩියුලයක් හඳුන්වාදීම.
82. පීඨයේ නිත්‍ය ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීම.
83. පීඨයේ කලා සභාව හරහා සංගීතය, කලාව හා නාට්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් හඳුන්වාදීම.
84. දෙපාර්තමේන්තු/සංගම්/මධ්‍යස්ථාන ආදිය හරහා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති CSR ව්‍යාපෘති බාරගැනීම
85. පීඨ සාමාජිකයන් සඳහා පීඨ සුරක්ෂා කමිටුවක් ස්ථාපිත කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
86. ගිනි ගැනීම් ඇතිවිය හැකි ස්ථාන හඳුනා ගැනීම හා ගිණි නිවීමේ පද්ධතියක් සවිකිරීම.
87. පරිගණක විද්‍යාගාර, සර්වර් කාමර වැනි හඳුනාගත් සුවිශේෂී ස්ථානවල CCTV කැමරා/ආරක්ෂක පද්ධති සවිකිරීම.

3.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න)

හැඳින්වීම

ඉගැන්වීම, පර්යේෂණ හා රෝගී සත්කාරක කාර්යයන්වලට සහාය වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨය හා දන්ත (ශික්ෂණ) රෝහල ගොඩනැගිලි සමුදායකින් හා සැලකිය යුතු පහසුකම්වලින් යුක්ත වේ. අධ්‍යයන අංශ හතකින් සම්ප්‍රයුක්ත වන මෙම දන්ත වෛද්‍ය පීඨය මෙරටට අවශ්‍ය කරන දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කරන මෙරට එකම ආයතනය වේ. දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බවට පත්වීම සඳහා වාර්ෂික දන්ත වෛද්‍ය සිසුන් 80කට පුහුණුව ලබාදෙනු ලබයි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගයෙන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් පුහුණු කිරීම හා දන්ත වෛද්‍ය වෘත්තියට අදාළ වෙනත් වෘත්තිකයන් පුහුණු කිරීම මෙම පීඨයේ වෙනත් කර්තව්‍යයන් වේ. එපමණක් නොව මෙම දන්ත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල රෝගි සත්කාරය සඳහා තෘතියික යොමු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාකරන අතර ඒවායේ පහසුකම් වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා සිසුන් ඔවුන්ගේ පුහුණුව සඳහා ද යොදා ගනී.

ඉහත සඳහන් ඉගැන්වීමේ හා සේවා කෘත්‍යයන්ට අමතරව දේශීය හා විදේශීය සහයෝගිතා ව්‍යාපෘති සමඟ එක්ව සැලකිය යුතු මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාවක් කරගෙන යනු ලබයි. ප්‍රථම උපාධි විෂයමාලාව 2016 වසරේදී සමාලෝචනය කොට වර්ෂ පහක් දක්වා දීර්ඝ කරනු ලැබූ අතර එය 2017 වසරේදී ආරම්භ කරනු ලැබීය.

ජයග්‍රහණ

- ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ සුවිශේෂී සළකුණක් සටහන් කරමින් පස් අවුරුදු දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධියේ විෂයමාලාව සඳහා ලියාපදිංචි ප්‍රථම සිසු කණ්ඩායම (2017/18) 2017 ජනවාරි 30 දින ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලාව ආරම්භ කළහ.
- මූලික විද්‍යා අධ්‍යයන අංශය නව පස් අවුරුදු දන්ත වෛද්‍ය විෂයමාලාවේ පළමු හා දෙවන සමාසික සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එහි පසුවිපරම් සඳහා වැඩමුළුවක් ද පවත්වන ලදී.
- අධිකරණ දන්ත විද්‍යාව පිළිබඳ විද්‍යාපති වැඩසටහන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. මුඛ වෛද්‍ය විද්‍යාව හා මුඛ විකිරණ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කාරක සභාවේ හා තත්ත්වාරක්ෂණ ඒකකයේ අනුමැතිය ලබා දී ඇත. මුඛ විද්‍යාවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කොට ඇති අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යවනු ඇත.
- සුළු මුඛ ශල්‍ය වෛද්‍ය විද්‍යා පාඨමාලාව පිළිබඳ විද්‍යාපති උපාධිය 2017-11-22 දින පවත්වන ලද සනාතන සභා රැස්වීමේදී අනුමත කරන ලදී.
- පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රොටරි ඉන්ටනැෂනල් වෙතින් රුපියල් මිලියන පහක මුදලක් පිළිකා සත්කාරක සේවා වැඩසටහනට ලබා දෙන ලදී.
- ප්‍රථම උපාධි අපේක්ෂකයන් හා දන්ත තාක්ෂණඥයන් යන දෙපාර්ශවය සඳහාම විද්‍යාගාර තාක්ෂණවේදය ඉගැන්වීම පිණිස වීඩියෝ හතකින් යුක්ත වූ අධ්‍යාපන වීඩියෝ පට මාලාවක් නිපදවීමට පරිදන්ත වෛද්‍ය අධ්‍යයන අංශයට හැකිවිය.
- 2017 වසරේදී සංරක්ෂණ දන්ත වෛද්‍ය අධ්‍යයන අංශය රෝගි ගාස්තු වශයෙන් රුපියල් 5020729.33 ක මුදලක් උපයන ලදී. විශේෂ ප්‍රතිකාර සඳහා වැයවන වියදම් මේ මඟින් ආවරණය කෙරේ.
- DELU අන්තර්ජාල පිටුව සැලසුම් කොට දන්ත වෛද්‍ය පීඨ අන්තර්ජාල පිටුවෙහි පළ කරන ලදී. (weblink:http://dental.pdn.ac.lk/e-learn1.php) දන්ත වෛද්‍ය පීඨයේ පීඨාධිපතිගේ

- මාර්ගෝපදේශකත්වය යටතේ හා එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික වෛද්‍ය හා දන්ත වෛද්‍ය සංගමයේ මෙන්ම මහාචාර්ය ඩී. වයි. ඩී. සමරවික්‍රම යන අයගේ පරිත්‍යාගශීලි සහයෝගයෙන් නව පරිගණක විද්‍යාගාරය සඳහා ඩෙස්ක්ටොප් පරිගණක 15ක් (රු. මිලියන 1.3 වටිනා) ලබා ගන්නා ලදී. සිසුන් 60 දෙනෙකු සඳහා පරිගණක මේස මිලදී ගැනීමට පියවර ගෙන ඇත.

සෞඛ්‍ය අධ්‍යාපන වීඩියෝ කිහිපයක් DELU අංශය විසින් නිෂ්පාදනය කොට ඇත.

වීඩියෝ වැඩසටහන	කර්තෘ
මුඛ පිළිකා සහ පුවක්	මහාචාර්ය ඩබ්. එම්. තිලකරත්න
හකු සන්ධි ආශ්‍රිත රෝග	මහාචාර්ය ආර්. ජයසිංහ
කිරි දත්	වෛද්‍ය චන්ද්‍රා හේරත්
කෘතිම දත් සහ භාවිතයට උපදෙස්	වෛද්‍ය වජිර ජයසිංහ වෛද්‍ය ඉන්දික තිලකුමාර
අහිමි වූ දත් කෘතිමව සැකසීම	වෛද්‍ය වජිර ජයසිංහ වෛද්‍ය ඉන්දික තිලකුමාර
දන්ත සංරක්ෂණය	වෛද්‍ය මනිල් ෆොන්සේකා වෛද්‍ය ගිෂාන් එදිරිසිංහ

- දන්ත වෛද්‍ය අධ්‍යයන වැඩසටහන්වලදී විද්‍යුත් - ඉගෙනුම යොදා ගැනීම ඉහළනැංවීම ඉලක්ක කොට ගෙන දන්ත වෛද්‍ය පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා “DENTMOODLE” භාවිතය පිළිබඳ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.
- 2017-01-01 දින සිට 2017-12-20 දින දක්වා රෝගීන්ගේ පැළුණු තොල් හා හනුක සඳහා සිදුකළ ශල්‍යකර්ම සාමාන්‍ය ප්‍රමාණය 200කි.

වෙනත් ආයතන සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම්

- සිද්ධාලේප හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨය අතර ගිවිසුම- 2017-01-23.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ ටෙම්පල් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම 2017-12-11.
- ඉන්දියාවේ කුෂ් දන්ත වෛද්‍ය විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම 2018-07-28.
- දන්ත වෛද්‍ය පීඨයේ මුඛ හනුක ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය හා වෛද්‍ය පීඨයේ නිර්වින්දන හා දැඩි සත්කාර අධ්‍යයන අංශය අතර 2017-12-28 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම.

පර්යේෂණ හා ජයග්‍රහණ

- මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න හා මහාචාර්ය ආර්. ඩී. ජයසිංහ 2017 ජනාධිපති පර්යේෂණ සම්මානය හිමිකර ගන්නට විය.
- මහාචාර්ය ඩබ්. එම්. තිලකරත්න ජාතික විද්‍යා ඇකඩමියේ සාමාජිකයෙකු ලෙස නම් කරන ලදි.

අධ්‍යයන ජයග්‍රහණ

පහත සඳහන් පීඨ සාමාජිකයන් මහාචාර්ය තනතුරට උසස් කරන ලදී.

- වෛද්‍ය ජේ. ඒ. එම්. එස්. ජයතිලක ක්ෂුද්‍ර ජීව විද්‍යා මහාචාර්ය ලෙසද, වෛද්‍ය එච්. ආර්. ඩී. පීරිස් කාය ව්‍යච්ඡේද මහාචාර්ය ලෙස හා වෛද්‍ය ආර්. ඩබ්. පල්ලේගම භෞතික විද්‍යා මහාචාර්ය ලෙස උසස් කරන ලදී.
- අධ්‍යයන කාර්ය මණ්ඩලයට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස නව බඳවා ගැනීම් කිහිපයක් සිදු කරන ලදී. වෛද්‍ය කේ. එස්. එන්. ඩී. ගුණවර්ධන (මූලික විද්‍යා අධ්‍යයන අංශය, ජෛව රසායන විද්‍යා අංශය) වෛද්‍ය ඩී. ජේ. ඈපාසිංහ (ප්‍රජා දන්ත සෞඛ්‍ය අධ්‍යයන අංශය, ප්‍රජා දන්ත වෛද්‍ය අංශය) සහ වෛද්‍ය ආර්. එම්. ජී. එස්. කේ. රස්නායක පරිවාස කථිකාචාර්ය ලෙස බඳවා ගන්නා ලදී.
- තාවකාලික කථිකාචාර්ය වෛද්‍ය ඩබ්. එම්. යූ. එල්. අබේසිංහ දකුණු කොරියාවේ සෝල් නුවර යොන්සෙයි දන්ත වෛද්‍ය විද්‍යාලයේ මුඛ පිළිකා පර්යේෂණ ආයතනයේ පිළිකා පර්යේෂණ සඳහා අණුක ජීව විද්‍යා පුහුණු වැඩසටහනකට 2017-10-20 සිට 2017-11-20 දින දක්වා වූ මසක කාලයක් සහභාගී වී සිටියේය.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය අයි. පී. තිලකුමාර 2017 වසරේ දන්ත උපස්ථම්භක පුහුණු පාසලේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
- ඉන්දියාවෙන් පැමිණි වෛද්‍ය රවි සංකර් නූටලාපති දන්ත වෛද්‍ය පීඨයේ මුඛ හා හනු ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයෙන් මුඛ පිළිකා කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව අවසන් කරන ලදී.
- පහත සඳහන් අධ්‍යයන අංශවලට කාර්මික නිලධාරීන් කිහිපදෙනෙකු බඳවා ගන්නා ලදී.

ඒ. එම්. එස්. අලහකෝන් මයා	-	මූලික විද්‍යා අංශය
එස්. ජී. එස්. ඩී. බණ්ඩාර මයා	-	මුඛ ව්‍යාධිවේදී අංශය
ජී. එම්. ඕපනායක මයා	-	මුඛ ව්‍යාධිවේදී අංශය
බී. ජී. එස්. සී. ගුණතිලක මයා	-	පරිදන්ත අංශය
පී. එම්. කේ. සුනේත්‍රා මිය	-	පරිදන්ත අංශය
බී. එච්. එම්. ගුණතිලක මිය	-	පරිදන්ත අංශය
වයි. ඩී. එස්. විජේරත්න මිය	-	පරිදන්ත අංශය
බී. එම්. එස්. ටී. කුමාර මයා	-	දන්ත සංරක්ෂණ අංශය

අලුතින් ලඝුලේඛිකාවන් දෙදෙනෙකු බඳවා ගෙන පහත අධ්‍යයන අංශවලට අනුයුක්ත කරන ලදී.

රිසානි ජුනයිඩීන් මිය	-	පීඨාධිපති කාර්යාලය
සචිනි ගුණතිලක මිය	-	මුඛ ව්‍යාධවේද අධ්‍යයන අංශය

- පහත දැක්වෙන කාර්මික නිලධාරීන් පහත පරිදි උසස් කරන ලදී.

එම්. ආර්. ඩී. එම්. සේනානායක මිය	- ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල කාර්මික නිලධාරී 2010 ජූනි සිට
ටී. එම්. පී. බී. තෙන්නකෝන් මයා	- කාර්ය මණ්ඩල කාර්මික නිලධාරී I ශ්‍රේණිය -2015 අප්‍රේල් සිට
එස්. එම්. කේ. වීරසේකර මිය	- කාර්මික නිලධාරී කොටස -2016 සිට

එම වසරේදී උසස් වීම් ලද ලිපිකාර කාර්ය මණ්ඩල සාමාජිකයන් පහතින් දැක්වේ.

ඒ. එම්. ටී. විජේරත්න මයා	- ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල ලිපිකාර සේවා 2016 මාර්තු 1 සිට හා
කේ. ඒ. එස්. එන්. ඩී. ගුණවර්ධන මිය	- කාර්ය මණ්ඩල ලිපිකාර සේවා 2016.10.01 සිට

ග්‍රන්ථ ප්‍රකාශන

- වෛද්‍ය එච්. එම්. ටී. ඩී. කේ. හේරත් "සුබ කැකුළු" නමින් පොතක් ප්‍රකාශයට පත්කොට ඇත.
- මහාචාර්ය ඩබ්. එම්. තිලකරත්න වැදගත් කෘතියක් පරිත්‍යාග කළේය.
- පංති පොතක් පළකරන ලදී. දන්ත චිකිත්සක රෝග හඳුනාගැනීම- දෙවන සංස්කරණය
- වෛද්‍ය ඊ. එම්. යූ. සී. කේ. හේරත් "දතක් ගැලවුනා" නමින් පොතක් ප්‍රකාශයට පත් කරන ලදී.

පරිත්‍යාග

පහත සඳහන් පොත්/වාර සඟරා දන්ත වෛද්‍ය පුස්තකාලයට පරිත්‍යාග කරන ලදී.

අංක	නම	පරිත්‍යාග කළ අය
1	ඩෙන්ටිස්ට් ඔන් ද වෝඩ් (හත් වැනි සංස්කරණය)	වෛද්‍ය ඇන්ඩෘ සැඩ්ලර්
2	මෙඩිසින් මේඩ් ඊසි	වෛද්‍ය යූ. රලපනාව
3	ඩෙන්ටිස්ට්‍රි - ඇන් ඉලස්ට්‍රේටඩ් හිස්ටරි	වෛද්‍ය ශිවානි විජේරත්න
4	ඩෙන්ටල් අප්ඩේට් (වාර සඟරා 5ක්) (2016 සැප්, ඔක්, නොවැ හා 2017 ජන, පෙබරවාරි)	වෛද්‍ය ඩී. නන්නසෝම (එ.රාජධානිය) 1965 කණ්ඩායම එක්සත් රාජධානිය
5	ජාත්‍යන්තර වාර සඟරාව	වෛද්‍ය කේ. එම්. විජේරත්න
6	විද්‍යුත් -ඉගෙනුම් ඒකකයට පරිගණක 15ක් ලැබිණ	එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික වෛද්‍යවරුන්ගේ සංගමයෙන් පරිගණක 13ක් හා මහාචාර්ය ඩී. වයි. ඩී. සමරවික්‍රමගෙන් පරිගණක දෙකක්.
7	කායව්‍යවච්ඡේද විෂයට අදාළ උපකරණ කට්ටලයක් මූලික විද්‍යා අධ්‍යයන අංශයේ ව්‍යවච්ඡේද අංශයට පරිත්‍යාග කරන ලදී.	මහාචාර්ය ඉකුඹ කගේයාමා, ව්‍යවච්ඡේද අංශ ප්‍රධානි, නිගාටා විශ්වවිදයාලය, ජපානය
8	දන්ත වෛද්‍ය පුස්තකාලය සඳහා විද්‍යාත්මක පර්යේෂණ පත්‍රයක් ලියා ප්‍රකාශයට පත් කරන්නේ කෙසේද?	වෛද්‍ය බාබරා ගැස්ටල්
9	"ඩෙන්ටිස්ට් ඔන් ද වෝඩ්" නම් ග්‍රන්ථය, දන්ත වෛද්‍ය පුස්තකාලයට ලබාදුනි.	වෛද්‍ය ඇන්ඩ්‍රෘ සැඩ්ලර්
10	රුපියල් 750,000,00ක් වටිනා දන්ත වෛද්‍ය උපකරණ කට්ටලයක්	වෛද්‍ය සර්පිල් ජෙමාල් කිංග්ස් කොලේජ් රෝහල ඒ. රාජධානිය
11	"දත කට ගැන දතයුතු දේ" කෘතිය, දන්ත වෛද්‍ය පුස්තකාලය	වෛද්‍ය රත්නකුමාර දිසානායක, විශේෂඥ දන්ත චිකිත්සක

වජ්‍ර ජයන්ති සැමරුම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වජ්‍ර ජයන්ති සැමරුමට සමගාමීව දන්ත වෛද්‍ය පීඨය විසින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය කරන ලදී. නව ගොඩනැගිල්ලට මුල්ගල තැබීමේ උත්සවය 2017 ජනවාරි 10වැනි දින පවත්වන ලද අතර ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, දන්ත වෛද්‍ය පීඨාධිපති මහාචාර්ය ඩබ්. එම්. තිලකරත්න, මහාචාර්ය රුවන් ජයසිංහ, වෙනත් පීඨවල පීඨාධිපතීන් සහ පීඨයේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් ද මෙම සුවිශේෂී අවස්ථාවට සහභාගි වූහ.

- එමෙන්ම ඉහත වජ්‍ර ජයන්ති සැමරුමට සමගාමීව ලෝක මුඛ සෞඛ්‍ය දිනය 2017 මාර්තු 20 දින පීඨ පරිශ්‍රයේදී පවත්වන්නට යෙදුන අතර එහි ආගන්තුක දේශනය "ශ්‍රී ලංකාවේ මුඛ සෞඛ්‍ය තත්ත්වය පවතින්නේ කොතැනද?" යන තේමාව යටතේ මහාචාර්ය රුවන් ජයසිංහයන් විසින් පවත්වන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වජ්‍ර ජයන්ති සැමරුම් උත්සවය සඳහා වූ පීඨ කමිටුව විසින් මෙම කාර්යය සංවිධානය කරන ලදී.

- වප්‍ර ජයන්ති සැමරුමට අදාළ උපකුලපතිතුමාගේ සම්භාවනීය දේශන මාලාවේ දන්ත වෛද්‍ය පීඨ දේශනය 2017 මැයි 16 දින කලාගාරයේදී පවත්වන ලද අතර එම දේශන සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය දිලීප් ද සිල්වා විසින් සිදු කරන ලදී.

සමුළු, වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

- ප්‍රථම උපාධි අපේක්ෂක දන්ත වෛද්‍ය සිසුන්ගේ අවසන් එක හා දෙක කොටස් සඳහා වන සායනික වැඩසටහන් මූලාරම්භක උත්සවය 2017-01-30 දින දන්ත වෛද්‍ය පීඨ CPC ශාලාවේදී පවත්වන්නට යෙදුන අතර ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ආර්. එල්. විජයවීර, දන්ත වෛද්‍ය පීඨාධිපති මහාචාර්ය ඩබ්. එම්. තිලකරත්න, අධ්‍යයන අංශ ප්‍රධානීන්, අධ්‍යයන සහ පරිපාලන කාර්ය මාණ්ඩලික නිලධාරීන් හා සායනික සිසුන් මෙම අවස්ථාවට සහභාගි වූහ.
- ශ්‍රී ලංකා-ජපන් දෙවන මැක්ක්‍රොස්කොපික් ව්‍යවච්ඡේද වැඩමුළුව 2017 පෙබරවාරී 13-15 යන දිනවල මූලික විද්‍යා අධ්‍යයන අංශයේ ව්‍යවච්ඡේද අංශයේදී පවත්වන ලදී. ජපානයේ ව්‍යවච්ඡේද විශේෂඥයන් සිව්දෙනෙකු විසින් වැඩමුළුව පවත්වන ලද අතර ඒ සඳහා සායනිකයන් විසිදෙනෙකු (20) හා පශ්චාත් උපාධි සිසුන් සහභාගි වූහ.
- දන්ත වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017 මාර්තු 30 දින පවත්වන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය උමා කුමාරස්වාමී, කැළණිය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අංශයේ මහාචාර්ය බී. ඩී. නන්දදේව මෙම වැඩසටහනේ සම්පත්දායකයන් ලෙස සහභාගි වූහ.
- ආචාර ධර්ම සමාලෝචන කමිටුව විසින් සංවිධානය කළ සායනික පරීක්ෂණ පිළිබඳ වැඩමුළුව 2017 අප්‍රේල් 25 දින පෙ.ව. 11.00ට පවත්වන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය පී.වී.ආර්. කුමාරසිරි එහි සම්පත්දායකයා විය.
- පීඨ, උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් දන්ත වෛද්‍ය සිසුන් සඳහා පහත සඳහන් කටයුතු සංවිධානය කරන ලදී.
    - අවසන් වසර එක හා දෙක කොටස්වල සිසුන් සඳහා කාල කලමනාකරණ වැඩසටහන- ආචාර්ය ජයලත් එදිරිසිංහ.
    - අවසන් වසර එක හා තුන කොටස්වල දන්ත වෛද්‍ය සිසුන් සඳහා ආචාර්ය මෙත්සිරි හේරත් විසින් පැවැත්වූ වැඩසටහන.
    - සියලුම දන්ත වෛද්‍ය සිසුන් සඳහා සිබිල් පද්මසිරි විසින් පැවැත්වූ "ජීවිතය සුභවාදීව දැකීම" පිළිබඳ වැඩසටහන.

- උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සියලුම ශිෂ්‍ය උපදේශකවරුන්ගේ සහයෝගයෙන් යුතුව වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදී. (ශිෂ්‍ය උපදේශකවරුන් ලෙස වෛද්‍ය එච්. එම්. ටී. ඩී. කේ. හේරත්, වෛද්‍ය බී. එම්. එච්. එස්. කේ. බන්නැහැක, වෛද්‍ය වී. එස්. එන්. විතානාරච්චි, වෛද්‍ය ආර්. එම්. ජයසිංහ, වෛද්‍ය එන්. සී. වනිගසූරිය හා මහාචාර්ය ජේ. ඒ. එම්. එස්. ජයතිලක ඇතුළත් වූහ.)
- උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සම්මා සතිය පිළිබඳ වැඩමුළු මාලාවක් පවත්වන ලදී. මෙහි සම්පත් දායකයන් ලෙස වෛද්‍ය එච්. එම්. ටී. ඩී. කේ. හේරත් හා චාන්දනී කුරේ මිය කටයුතු කරන්නට විය.
- විද්‍යුත් - ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම පිණිස "DENTMOODLE" පිළිබඳ පිළිවෙළින් වැඩමුළු හතරක් (4) දන්ත වෛද්‍ය පීඨයේදී පවත්වන්නට විය. දන්ත වෛද්‍ය පීඨයේ සියලුම අධ්‍යයන අංශ ආවරණය කරමින් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 13 දෙනෙකු මෙම වැඩමුළුවලදී පීඨයේ LMS (MOODLE) යෙදීම පිළිබඳ පුහුණුව ලබාගත්හ. පීඨාධිපති ඩබ්. එම්. තිලකරත්න විසින් සහභාගිවූවන්ට සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී. විද්‍යුත්-ඉගෙනුම් කැඳවුම්කරු, මහාචාර්ය චන්ත

ජයවර්ධන හා දන්ත වෛද්‍ය පීඨ පුස්තකාල කමිටුව විසින් මෙම වැඩමුළු සංවිධානය කළ අතර ධම්මික ඉහළගෙදර එහි සම්පත්දායකයා විය.

- "එළිමහන් දිනය හා දන්ත වෛද්‍ය ප්‍රදර්ශනය" 2017 ජූලි 22 හා 23 යන දිනවල පවත්වන ලද අතර වෛද්‍ය බී. ජී. ටී. එල්. නන්දසේනගේ මූලිකත්වයෙන් පීඨ ජුබිලි කමිටුවේ සාමාජිකයන් විසින් මෙය සංවිධානය කරන ලදී.
- පර්යේෂණ ආචාරධර්ම, ප්‍රකාශන ආචාර ධර්ම හා දත්ත කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් පීඨ පර්යේෂණ හා උසස් උපාධි කමිටුව විසින් සංවිධානය කරනු ලැබ 2017-10-31 දින දන්ත වෛද්‍ය පීඨයේදී පවත්වන ලදී. කෘෂිවිද්‍යා පීඨයේ බෝග විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එස්. සමීත, දන්ත වෛද්‍ය පීඨයේ මහාචාර්යවරුන් වන එල්. ඒකනායක සහ ඩබ්. එම්. තිලකරත්න සම්පත්දායකයන් ලෙස කටයුතු කළහ. මෙම වැඩමුළුවට පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ, තාවකාලික කථිකාචාර්යවරුන් හා පශ්චාත් උපාධි සිසුන් සහභාගි වූහ.
- මහාචාර්ය ප්‍රසාද් සේතුංග විසින් "අධ්‍යයන වැඩසටහන් සමාලෝචන ක්‍රියාවලිය සඳහා හේතුවන තත්ත්වාරක්ෂණ කරුණු හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දායකත්වය" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017-11-09 දින පවත්වන ලදී.
- 2016/2017 නවක සිසු කණ්ඩායම පිළිගැනීමේ උත්සවය 2017-11-14 දින දන්ත වෛද්‍ය පීඨ CPC ශාලාවේදී පැවැත්විණි. මෙම අවස්ථාවට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතීහු, පරිපාලන නිලධාරීහු, මෙම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, නවක සිසුන් හා ඔවුන්ගේ දෙමාපියෝ සහභාගි වූහ.
- මහාචාර්ය ඩී. වයි. ඩී. සමරවික්‍රම විසින් 2017-11-07 දින හා 09 යන දිනවල වැඩමුළු දෙකක් පවත්වන ලදී.
- මූලික විද්‍යා අංශය විසින් සංවිධානය කරන ලද විෂයමාලා වැඩමුළුව 2017-11-23 දින දන්ත වෛද්‍ය පීඨයේ දී පවත්වන ලදී.

බාධක සහ පිළියම්

- ශ්‍රව්‍ය-දෘශ්‍ය චිත්‍රාගාරයේ කටයුතු සාර්ථක නොවීය. තාවකාලික අයවැයක් සහිත යෝජනාවක් දන්ත වෛද්‍ය පීඨ පීඨාධිපති හරහා උපකුලපති කාර්යාලයට බාරදුන්න ද එය සාර්ථක නොවීය.
- DELU අන්තර්ජාල පිටුව මූලිකව සැලසුම් කළ ද ඒ සඳහා වැඩිදියුණු කිරීමක් අත්‍යවශ්‍ය වේ.
- පර්යේෂණ ප්‍රතිඵල ප්‍රමාණවත් නොවීය.
- දත්ත Moodle පරිහරණය සතුටුදායක නැත.

අනාගත සැලසුම්

- නිත්‍ය පදනම මත පස් අවුරුදු විෂයමාලාව සංශෝධනය කිරීම
- වත්මන් විෂයමාලාවේ ඒකාබද්ධතාවය දියුණු කිරීම
- පීඨයේ පරිපාලන ක්‍රියාපටිපාටි සංවිදිත කිරීම
- ශිෂ්‍ය හා රෝගීන්ගේ දත්ත ගබඩා තවදුරටත් සංවර්ධනය කිරීම
- නිපුණතා විද්‍යාගාරය වැඩිදියුණු කිරීම විද්‍යුත්-ඉගෙනුම් විද්‍යාගාරය හා පුස්තකාලය ස්ථාපිත කිරීම
- මුඛ පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම
- විද්‍යාපති වැඩසටහන් හැකි විගස ආරම්භ කිරීම
- CROC අවබෝධතා ගිවිසුම් හා සහයෝගිතා මගින් පීඨයේ පර්යේෂණ ඵලදායිතාවය වැඩි කිරීම
- ශිෂ්‍ය ආපනශාලාව පුළුල් කිරීම
- DATS" ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කිරීම

- ශ්‍රවණාගාර ව්‍යාපෘතිය අවසන් කිරීම
- ළමා දන්ත වෛද්‍ය අංශය සමඟ සහයෝගයෙන් ළමා රෝගීන් සඳහා ඖෂධ මගින් නිදිකරවන ඒකකයක් ආරම්භ කිරීම
- සුළු ශල්‍යාගාරයේදී සාමාන්‍ය නිර්විින්දනය යටතේ සුළු ශල්‍යකර්ම ආරම්භ කිරීම
- දන්ත වාට්ටුවේ ඇදන් වැඩිදියුණු කිරීම
- නිසි "නිර්විින්දන සායනයක්" ආරම්භ කිරීම
- දෙවන දන්ත වෛද්‍යවේදී සිසුන්ගේ සායනික කටයුතු සඳහා අත්පොතක් සංවර්ධනය කිරීම
- ශරීර අවයව බද්ධ කිරීම හා සම්බන්ධ ප්‍රතිකාර තවදුරටත් ව්‍යාප්ත කිරීමට සැලසුම් කෙරේ
- Endodontics පිළිබඳ විද්‍යාපති වැඩසටහනක් සැකසීම
- DELU ප්‍රකාශන ක්‍රියාවලිය සංවිධිත කිරීම
- DELU ඩිජිටල් ගබඩාව සැලසුම් කොට එය දන්ත වෛද්‍ය පීඨ අන්තර්ජාල පිටුවේ පළ කිරීම
- පරිගණක විද්‍යාගාරය, ශ්‍රව්‍ය-දෘශ්‍ය කාමරය හා DELU කාර්යාලය වැඩිදියුණු කිරීම
- ස්මයිල් පුහුණු ව්‍යාපෘතිය හා භාෂණ චිකිත්සක ඒකකය සඳහා කාර්යාල සංකීර්ණයක් සැලසුම් කොට ඉදිකිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. ඊට අමතරව 2017 වසරේ සිදුකළ ශල්‍යකර්ම සංඛ්‍යාවට වඩා වැඩි ශල්‍යකර්ම ප්‍රමාණයක් සිදුකිරීම ද මෙම ව්‍යාපෘතියේ ඉලක්කයකි
- "පුළුල් සත්කාරක ඒකකයක්" ස්ථාපිත කිරීම

3.5 ඉංජිනේරු පීඨය

(පීඨාධිපති - මහාචාර්ය එල්. රාජපක්ෂ)

හැඳින්වීම

ඉංජිනේරු පීඨය විසින් එහි නිත්‍ය අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කොට සිවිල් ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු, පරිගණක ඉංජිනේරු, නිෂ්පාදන ඉංජිනේරු, යාන්ත්‍රික ඉංජිනේරු, රසායනික හා සැකසුම් ඉංජිනේරු යන ඉංජිනේරු ක්ෂේත්‍රයන්වලට තවත් ඉංජිනේරුවන් 400කට වැඩි පිරිසක් බිහිකරන ලදි. ප්‍රථම උපාධි අධ්‍යාපනයට අමතරව පශ්චාත් උපාධි කිහිපයක් හඳුන්වා දුන් අතර පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් 12ක් ද පවත්වන ලදි.මෙරට පවතින ඉංජිනේරු පීඨ අතරින් බඳවා ගත් නවක සිසුන්ගේ අධ්‍යයන වැඩසටහන් ප්‍රථමයෙන්ම ආරම්භ කළේ මෙම පීඨයයි. සිසුන් 415 දෙනෙකු E116 සිසු කණ්ඩායමට අයත් වූ අතර, එම සංඛ්‍යාව පෙර වසරේ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවට සමාන වේ.

ජයග්‍රහණ

පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන දෙපාර්තමේන්තු හතරක් හරහා ප්‍රදානය කරනු ලබන විද්‍යාවේදී ඉංජිනේරු උපාධියට වොෂිංටන් සම්මුතියේ පිළිගැනීම ලැබීමත් සමග මෙම උපාධි ගෝලීය වශයෙන් පිළිගත් උපාධි බව තහවුරු වේ. ප්‍රථම උපාධි වැඩසටහන් සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව රසායනික හා සැකසුම් ඉංජිනේරු, යාන්ත්‍රික ඉංජිනේරු, පරිගණක ඉංජිනේරු සහ සිවිල් ඉංජිනේරු යන අධ්‍යයන අංශ හතරට මෙම පිළිගැනීම ලැබිණ. මීට පෙර නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයන අංශය ලෙස හැඳින්වූ වර්තමානයේදී නිෂ්පාදන හා කර්මාන්ත ඉංජිනේරු අංශය ලෙස හැඳින්වෙන අධ්‍යයන අංශය එම පිළිගැනීම අපේක්ෂාවෙන් පසු වේ.

යෝජිත ජල පර්යේෂණ විද්‍යාගාරය සඳහා ඉදිකෙරෙන ගොඩනැගිලිවලට මුල්ගල තැබීම සිදුවිය. චීන විද්‍යා ඇකඩමිය, නගර සැලසුම් හා ජල සැපයුම් අමාත්‍යාංශය සමග සහයෝගිතාවයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙනු ඇත. පීඨය විසින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට සලසන විවිධ සේවාවන් තුළින් පීඨය හා කර්මාන්ත ක්ෂේත්‍ර සබඳතා ගොඩනගා ගන්නා ලදි. මෙම සේවාවන් අතරට ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය හා ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ සහයෝගයෙන් පැවැත්වූ CPD වැඩසටහන් හා සම්මන්ත්‍රණ ඇතුළත් විය. රාජ්‍ය සේවයේ නියුතු කාර්මික නිලධාරීන් සඳහා පැවැත්වෙන TOT වැඩසටහන හා අ.පො.ස. (උ/පෙළ) විභාගයට අදාළ තාක්ෂණවේදී විෂයධාරාව සඳහා ගුරුවරුන් පුහුණු කිරීම ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය මගින් පවත්වන වැදගත්ම වැඩසටහන් දෙක ලෙස සැලකිය හැකිය.

කර්මාන්ත ක්ෂේත්‍රය සමග පර්යේෂණ සහයෝගිතා ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව පීඨය විසින් පහත සඳහන් සංවිධාන සමග මෙන්ම විදේශ විශ්වවිද්‍යාල / ආයතන සමඟ ද අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදි.

i. ශ්‍රී ලංකා ටෙලිකොම්
ii. එල්. ටී. එල්. හෝල්ඩිං (පුද්) සමාගම
iii. කොරියන් මෙරිටයිම් සහ සාගර විශ්වවිද්‍යාලය - කොරියාව
iv. පින්ලන්තයේ ඔයුලු සංවිධානය
v. රොමේනියාවේ ට්‍රාන්සිල්වේනියා බ්‍රාසොව් විශ්වවිද්‍යාලය හා නන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුම

උසස් ප්‍රතිඵල පදනම් කරගත් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පීඨය වෙර දරන අතර, මේ සඳහා දීර්ඝ කාලයක සිට නොවිසඳී පැවති ඉගෙනුම් පරිසරයක් හා සේවා දියුණු කිරීමේ ව්‍යාපෘති රාශියක් පසුගිය වසර 5-6ක කාලය තුළ අවසන් කරන ලදි. මෙම කාර්යයන් ගුණාත්මක හා උසස් තත්ත්වයේ අධ්‍යයන පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා සෘජුව හා වක්‍රව දායක වේ. මෙම සැලසුමේ කොටසක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන සැලසුමට අනුව පහත විස්තර වන ආකාරයට වැදගත් සිව්මහල් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම ආරම්භ කරන ලදි.

I. පීඨයේ පශ්චාත් උපාධි හස්තය, ගණනන මධ්‍යස්ථානය, කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශන අංශය/ ඒකකය, ඉංජිනේරු ගණිත අධ්‍යයන අංශය සහ ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයන අංශය පිහිටුවීම සඳහා වන සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

II. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය පිහිටි ස්ථානයේ ගොඩනැගිල්ල පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශයේ ගොඩනැගිලි දිගුව ඉදිකිරීම අවසන් කොට එය බාර දීමට සූදානම්ව ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලැබෙන ප්‍රතිපෝෂණය මත පදනම්ව සිසුන්ගේ පුද්ගල සංවර්ධනය හා වෘත්තීය මාර්ගෝපදේශන අංශ කෙරෙහි 2017 වසරේදී වැඩි අවධානයක් යොමු කරන ලදි. එමෙන්ම වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ TOT වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලය සූදානම් කරවීම ද කරන ලදි. තෝරාගත් සිසුන් කිහිපදෙනෙකු විදෙස් රටවල කර්මාන්ත පුහුණුව සඳහා යොමු කරවීමට හැකිවීම පීඨය හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය අත්කර ගත් වැදගත් ජයග්‍රහණ ලෙස සැලකිය හැකිය.

ඉගෙනුම් පරිසරයේ වැඩිදියුණුවීම් හා කාර්ය මණ්ඩලයේ දිරිගැන්වීමත් සමග බොහෝ සිසුන් පිරිසක් ඔවුන්ගේ අවසන් වසරේ හා පශ්චාත් උපාධි පර්යේෂණවලට අදාළව ප්‍රායෝගිකව වැදගත් පර්යේෂණ ව්‍යාපෘති මත පදනම්ව විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශය එක් දින ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් කොළඹදී පැවැත් වූ අතර, රසායන හා සැකසුම් ඉංජිනේරු අධ්‍යයන අංශය මෙන්ම සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය ද එක් දින ව්‍යාපෘති ප්‍රදර්ශනයක් හා සමුළුවක් මහනුවරදී පවත්වන්නට විය. මෙම කාර්යයන් තුළින් සිසුන්ට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සමාජයට විවෘත කරලීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙන අතර, එමගින් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ඒ සඳහා ප්‍රශංසනීය ඉල්ලුමක් උදා කරගන්නට හැකි විය.

ලෝකය පුරා පිළිගත් ජාත්‍යන්තර සමුළු/සම්මන්ත්‍රණ/වැඩමුළු තුනක් පීඨය විසින් පවත්වන ලදි. ඒවා නම්,

I. ජපානයේ තර්මල් ෆ්ලූයිඩ් ඉංජිනේරු විද්‍යාව සඳහා වන පැසිපික් මධ්‍යස්ථානය් සත්කාරකත්වය දැරූ "ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය"

II. ඉන්දියාවේ අලහබාද් IIIT සමඟ ඒකාබද්ධව සංවිධානය කළ "ප්‍රබල දත්ත විශ්ලේෂණයේ මෑතකාලීන ප්‍රවණතා හා යෙදුම්"

III. IEEE සමග සහයෝගිතාවෙන් පැවැත්වූ කර්මාන්ත හා තොරතුරු පද්ධති පිළිබඳ 12වැනි ජාත්‍යන්තර සමුළුව

ඉහත කාර්යයන් සියල්ලේම මූලික ඉලක්කය වූයේ පර්යේෂණ සොයාගැනීම්වලට වඩා යහපත් වූ ජාත්‍යන්තර අන්තර් ක්‍රියාකාරිත්වයක් හා ව්‍යාප්තියක් ලබාදීමයි.

අනාගත සැලසුම්

පසුගිය අවුරුදු පහක කාලය පුරාවට රුපියල් බිලියන 1.2ක් ඉක්මවූ ආයෝජන මුදලක් භාවිත කොට ප්‍රධාන සම්පත් අවශ්‍යතාවන් සම්පූර්ණ කොට ගෙන ප්‍රතිඵල පදනම් කොට ගත් සතුටුදායක මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීමට පීඨය මේ වනවිට සූදානමින් සිටී. වොෂින්ටන් සම්මුතියෙන් ඉදිරිපත් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලපෑ එක් බාධකයක් වූ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ද සුදුසුකම් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් 30 දෙනෙකු බඳවා ගැනීම තුළින් නිරාකරණය කර ගත හැකි විය. සේවාවන් හා මානව සම්පත්වල මෙවැනි වර්ධනයන් සම එක් එක් අධ්‍යයන අංශ ඒවායේ විෂයමාලාවන් දැඩිව හා පුළුල්ව සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස පීඨය අපගේ අධ්‍යයන වැඩසටහන් හා සම්පත් තක්සේරු කිරීම සඳහා පැමිණි වොෂින්ටන් සම්මුතියට හා ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයට අනුබද්ධ විශේෂඥයන්ගේ යෝජනාවලට සමගාමීව සමස්ත විෂයමාලාවම සංශෝධනය කිරීම සඳහා කටයුතු ආරම්භ කොට ඇත.මෙම කාර්යයේදී සාමාන්‍ය අධ්‍යයන වැඩසටහනේ අධ්‍යයන මණ්ඩලය පීඨ මණ්ඩලයේ අනුමැතිය සහිතව විශේෂ මණ්ඩලයක් පිහිටුවන ලදී. සිසුන්ගේ කාර්ය සාධනය මෙන්ම ගුරු/ශිෂ්‍ය ප්‍රතිපෝෂණය සැලකිල්ලට ගනිමින් ප්‍රථම වසර විෂය මාලාව, අධ්‍යාපන විද්‍යාව හා අධ්‍යයන පාඨමාලාව ලබාදෙන ආකාරය පිළිබඳ සොයා බැලීම සඳහා මෙම මණ්ඩලය පත් කළ අතර, එය ප්‍රථම උපාධි පාඨමාලාවේ ප්‍රථම වසර අධ්‍යයන පාඨමාලාවේ ප්‍රමිතිය 2017 වසරේදී සීඝ්‍රයෙන් දියුණුවීමට උපකාරී විය. මේ අතර සාමාන්‍ය අධ්‍යයන වැඩසටහනේ අධ්‍යයන මණ්ඩලය කර්මාන්ත ක්ෂේත්‍රයේ හා වොෂිංටන් සම්මුති මණ්ඩල කණ්ඩායමේ ප්‍රතිපෝෂණයට සමගාමීව 2018 වසරේදී ප්‍රථම වසර අධ්‍යයන වැඩසටහන සම්පූර්ණයෙන් සංශෝධනය කිරීමට සැලසුම් කරයි.තවද, මෑතකදී අධ්‍යයන කාර්ය මණ්ඩලයට සාමාජිකයන් බඳවා ගැනීමත් සමගම ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයන අංශය පසුගිය වසරේ සැලසුම් කළ පරිදි විවිධ විශේෂිකරණයන් යටතේ පොදුවේ අවශ්‍ය කරන විෂයයන් හඳුන්වාදීමට ද සැලසුම් සකස් කරයි. එමෙන්ම සමස්ත පීඨය විසින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය හර විෂයයන් පිළිබඳ පූර්ණ සංශෝධනයක් සිදුකිරීමට ද මේ වනවිට සැලසුම් කෙරෙමින් පවතී. එපමණක් නොව මෙම අධ්‍යයන අංශය ඉංජිනේරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට ද සැලසුම් කරයි.

3.6 කළමනාකරණ පීඨය

(පීඨාධිපති - ආචාර්ය එම්. ඇල්ප්‍රඩ්)

හැඳින්වීම

පීඨය ස්ථාපිත කිරීම

2014 ඔක්තෝබර් 20වැනි දින නිකුත් කරන ලද රජයේ ගැසට් නිවේදනයේ අනුමැතියට අනුව 2015 මාර්තු 24වැනි දින කළමනාකරණ පීඨයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදි. එම ගැසට් නිවේදනයෙන් අධ්‍යයන අංශ අටක් (08) හා ඒකක පහක් (05) සහිත කළමනාකරණ පුස්තකාලයක් කළමනාකරණ පීඨයේ ස්ථාපිත කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අවසර ලබා දී ඇත. ආරම්භයේදී මෙම පීඨයේ, ව්‍යාපාර මුදල්, කළමනාකරණ අධ්‍යයන, මානව සම්පත් කළමනාකරණ, වෙළඳ කළමනාකරණ හා මෙහෙයුම් කළමනාකරණ යන අධ්‍යයන අංශවලින් සමන්විත අධ්‍යයන අංශ පහක් ස්ථාපිත කරන ලදි. කළමනාකරණ පීඨයේ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය වීමත් සමග ගිණුම්කරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර තොරතුරු තාක්ෂණවේදය යන අධ්‍යයන අංශ තුන (03) පීඨයට එකතු වීමට නියමිතය.

අධ්‍යයන වැඩසටහන්

කළමනාකරණ පීඨය සිසුන් 1500කට පමණ ප්‍රථම උපාධි වැඩසටහන් රාශියක් පිරිනමයි. මෙම පීඨයේ ලියාපදිංචි වූ සිසුන්ට ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ උපාධිය ප්‍රදානය කරනු ලබයි. මෙම උපාධිය සඳහා වාර්ෂිකව සිසුන් 175 දෙනෙකු, සංවිධාන කළමනාකරණ , ගිණුම් හා මුදල්, වෙළඳ කළමනාකරණ හා මෙහෙයුම් කළමනාකරණ යන විශේෂිතකරණ විෂයයන් හැදෑරීම සඳහා බඳවා ගනු ලබයි. වාණිජවේදී හා විද්‍යාවේදී (ගණනය හා කළමනාකරණ) යන උපාධි පාඨමාලා දෙක ශාස්ත්‍ර පීඨය හා විද්‍යා පීඨය සමග සහයෝගිතාවයෙන් ප්‍රදානය කරනු ලබන අතර, එම එක් එක් පාඨමාලාව සඳහා වාර්ෂිකව සිසුන් 60 දෙනෙකු ඇතුළත් කර ගනු ලැබේ. ඊට අමතරව අතුරු විෂයන් රාශියක් ද කලා සිසුන් වෙත උගන්වනු ලබයි. ඉහත සඳහන් අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්වලට අමතරව මෙම පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) උපාධි පාඨමාලාව හා කළමනාකරණ හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව ද ප්‍රදානය කරන අතර. ඒ සඳහා වාර්ෂිකව පිළිවෙළින් සිසුන් 200ක් හා 100ක් ඇතුළත් කර ගනියි. තවද, කළමනාකරණ පීඨය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමග එක්ව ගිණුම් හා මුදල් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව මෙන්ම දර්ශනශූරි උපාධිය ද ප්‍රදානය කරයි.

මානව හා භෞතික සම්පත්

පීඨයට ලබාදී ඇති මුළු සේවක තනතුරු සංඛ්‍යාව 59ක් වන අතර, ඉන් 38 දෙනෙකු මේ වනවිටත් බඳවා ගෙන ඇත. මේ අතර, අනධ්‍යයන හා පරිපාලන සේවක පුරප්පාඩු සියල්ලම පුරවා ඇත.

පීඨයේ පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා වර්ග අඩි 30,000ක භූමි ප්‍රමාණයකින් යුතු ගොඩනැගිලි දෙකක් පවතී. මෙම පීඨයට පරිගණක විද්‍යාගාරයක් නොමැති අතර, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පහසුකම් මත යැපීමට සිදුව ඇත. මෙම වසර තුළදී වර්ග අඩි 60,000ක භූමි ප්‍රමාණයකින් යුතු මහල් හයකින් යුක්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.

ජයග්‍රහණ

- පීඨයේ පවතින ඉඩ ප්‍රමාණය දෙගුණ කරමින් වර්ග අඩි 15,000ක භූමි ප්‍රමාණයකින් යුතු දෙවන ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කරන ලදි.
- මෙම වර්ෂයේදී පරිවාස කථිකාචාර්යවරුන් හය දෙනෙකු බඳවා ගන්නා ලද, අනධ්‍යයන සේවක තනතුරු සියල්ල පුරවා අවසන් කරන ලදි.
- දර්ශනශූරි උපාධි හැදෑරීම සඳහා ලියාපදිංචි වූ තිදෙනාගෙන් (විදේශිකයන් දෙදෙනෙකු හා මෙරට එක් අයෙකු) එක් අයෙක් එම උපාධිය අවසන් කොට අධ්‍යයන අංශයට සම්බන්ධ විය.
- සාමාජිකයෝ දෙදෙනෙක් ඔවුන්ගේ පශ්චාත් උපාධි අවසන් කළහ.
- පරිවාස කථිකාචාර්යවරුන් දෙදෙනෙකු ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කරනු ලැබීය.
- එක් ස්ථිර කථිකාචාර්යවරයෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරට උසස් කරන ලදි.
- පීඨයේ සම්මන්ත්‍රණවලට අමතරව අධ්‍යයන අංශ මට්ටමින් මාසික සම්මන්ත්‍රණ ආරම්භ කරන්නට විය.

- අධ්‍යයන අංශ සාමාජිකයන් ග්‍රන්ථ පහක් ප්‍රකාශයට පත් කළ අතර, ශ්‍රී ලංකාවේ පැවැත්වූ ජාත්‍යන්තර සමුළුවලදී පර්යේෂණ පත්‍ර 15ක් ඉදිරිපත් කරන්නට විය.
- අදාළ අධ්‍යයන අංශ විසින් සංවර්ධනය කළ සහතික පත්‍ර පාඨමාලා හයක් හා ඩිප්ලෝමා වැඩසටහන් පහක් සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.
- තත්ත්වාරක්ෂණ සංසදයක් පීඨයේ ස්ථාපිත කරන ලදි.
- රන් පදක්කම් දෙකක් ප්‍රදානය කිරීම සඳහා පාලක සභාවෙන් අනුමැතිය ලබා ගන්නා ලදි. ඉන් එකක් බ්‍රැන්ඩික්ස් ආයතනයෙන් වන අතර, අනෙක් රන් පදක්කම ශ්‍රී ලංකා ගණකාධිකාරීන්ගේ ආයතනයෙනි.

බාධක සහ පිළියම්

- අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන්වල අයදුම්කරුවන් නොමැතිවීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට පීඨයට නොහැකි විය.
- ව්‍යාපාර පරිපාලනපති හා විද්‍යාපති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ක්‍රියාපටිපාටින්ගේ පවතින ප්‍රමාදයන් නිසා ප්‍රමාද විය. එම යෝජනාව තවමත් මූලික මට්ටමේ පවතී.
- එදිනෙදා පවතින වැඩ ප්‍රමාණය ආවරණය කිරීම සඳහා වැඩි කාලයක් යෙදවීමට සිදුවීම හේතුවෙන් ශාස්ත්‍රීය කටයුතුවල අඩුවක් පෙනෙන්නට විය. මෙම පීඨය අළුතෙන් ආරම්භ කළ හෙයින් සීමිත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් පැවතීම මෙයට හේතුවයි.

අනාගත සැලසුම්

- 2018 වසරේදී ගිණුම් අධ්‍යයන අංශයක් හා ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයක් ආරම්භ කිරීමට සැලසුම් සකස් විය.
- ගිණුම් හා පාලනය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී, මුදල් පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී සහ ජාත්‍යන්තර ව්‍යාපාර හා භාණ්ඩ පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී යන නව උපාධි තුන 2018 වසරේදී ආරම්භ කිරීමට නියමිතය.
- සංශෝධනය කළ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාවේ විෂයමාලාව 2018/19 අධ්‍යයන වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ඇත.
- පීඨය මගින් පළ කරනු ලබන "පේරාදෙණිය කළමනාකරණ සමාලෝචනය" සහ " කළමනාකරණ පාඨකයා" යන ප්‍රකාශන දෙක 2018 වසරේදී ප්‍රකාශයට පත් කරනු ඇත.
- පරිගණක විද්‍යාගාරය, ශිෂ්‍ය ආපන ශාලාව, ශිෂ්‍ය පොදු කාමරය, කාර්ය මණ්ඩල පොදු කාමරය, සම්මන්ත්‍රණ ශාලාව හා දේශන ශාලා වැනි වර්තමානයේ පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත් විගස පීඨයේ තෙවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ඇත.
- අනුමත වූ සහතික පත්‍ර වැඩසටහන් හය (06) සහ ඩිප්ලෝමා වැඩසටහන් පහ (05) අතුරෙන් ඩිප්ලෝමා වැඩසටහන් තුනක් දියත් කරනු ඇත.
- වාණිජවේදී උපාධියේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම 2018 වසරේදී ආරම්භ වනු ඇත.

3.7 වෛද්‍ය පීඨය

(පීඨාධිපති - මහාචාර්ය වී. එස්. වීරසිංහ)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වජ්‍ර ජයන්ති වර්ෂය මෙම වසර වූ හෙයින් විශ්වවිද්‍යාලය සංවිධානය කළ සැමරුම් මාලාව වෙනුවෙන් පීඨ සාමාජිකයෝ ක්‍රියාශීලි ප්‍රබල දායකත්වයක් දක්වන්නට වූහ. කුලපතිතුමාගේ අනුග්‍රහය යටතේ කලාගාරයේදී පැවැත්වූ උපහාර උත්සවය සඳහා පීඨයේ වඩාත් සම්භාවනීය විද්‍යාර්ථියෙකු ලෙස මහාචාර්ය චන්න රත්නතුංග වෛද්‍ය පීඨය විසින් නම් කරන ලදි. පීඨය වෙනුවෙන් නියමිතව පැවති ශාස්ත්‍රීය දෙසුම විශ්‍රාමලත් විශේෂඥ වෛද්‍ය තිලක් අබේසේකර විසින් පවත්වන ලදි. වෛද්‍ය පීඨයේ විද්‍යාර්ථීකයන්ගේ සංගමය විසින් 13වැනි ජාත්‍යන්තර වෛද්‍ය සමුළුව ජනවාරි මස 10වන දින පවත්වනු ලබන්නට විය. වෛද්‍ය පීඨය 2016 උපාධි ප්‍රදානෝත්සවය සාර්ථකව සංවිධානය කොට මැයි මස 25වන දින විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි. ළමා රෝග අධ්‍යයන අංශය ළමා රෝග පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් සංවිධානය කොට සැප්තැම්බර් මාසයේදී පවත්වන්නට විය. වෛද්‍ය අධ්‍යයන අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන වැඩිහිටි සත්කාරක ඒකකයක් පේරාදෙණිය ශීක්ෂණ රෝහලේදී විවෘත කරන ලදි. නිවර්තන වෛද්‍ය විද්‍යා පර්යේෂණ ආයතනය සංවිධානය කළ නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ දෙවැනි ජාත්‍යන්තර සමුළුව දෙසැම්බර් මාසයේදී පවත්වන ලදි.
විද්‍යාත්මක ප්‍රකාශන ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර නෙට්වර්ක් ආයතනය වෙතින් රුපියල් මිලියන 1.6ක ප්‍රදානයක් පර්යේෂණ හා සංවර්ධන අංශයට ලැබිණ. පීඨ සාමාජිකයන් සිව්දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කරන ලද අතර, ඩී. එස්. සී. පී. කුමාරි මිය ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි තනතුරට උසස් කරන ලදි. 2016/17 නවක වෛද්‍ය සිසු කණ්ඩායම පිළිගැනීමේ උත්සවය දෙසැම්බර් 04වන දින පැවැත්වූ අතර, එහිදී සමාරම්භක දේශකයා ලෙස මහාචාර්ය චන්ද්‍ර අබේසේකර ප්‍රබෝධමත් දේශනයක් පවත්වන්නට විය.

ජයග්‍රහණ

2010/11 සිසු කණ්ඩායමේ වෛද්‍ය විද්‍යාවේදී උපාධි පරීක්ෂණයේ දක්ෂතා ලැයිස්තුවේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන අප පීඨයේ සිසුන් විසින් දිනාගන්නා ලදි. යාවජීව මහාචාර්ය නිමල් සේනානායකයන් හට සම්භාවනීය ජනාධිපති සම්මානය වන "විද්‍යා ජෝති" සම්මානය පිරිනමන ලද අතර, විශ්‍රාමලත් විශේෂඥ වෛද්‍ය මෙන්ම පීඨයේ කාර්ය මණ්ඩලයේ සේවා දීර්ඝ ලබා සිටින වෛද්‍ය තිලක් අබේසේකරයන් හට සම්භාවනීය ජනාධිපති සම්මානයක් වන "විද්‍යා නිධි" සම්මානය පිරිනමන ලදි. එමෙන්ම පීඨයේ මහාචාර්ය අර්ජුන මැදගම, මහාචාර්ය ආර්. සිවකානේසන් හා වෛද්‍ය කළණ මාඩුවගේ යන විද්වතුන්ට ද පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන හිමි විය. මහාචාර්ය එස්. ඩී. ධර්මරත්න, ගූගල් විද්වත් උපුටන සංඛ්‍යාවේ 26645 සීමාව කරා එළඹීය. තවද, වෛද්‍ය කළණ මාඩුවගේ හට වඩාත් කීර්තිමත් සම්මානයක් වන කේ. එස්. එම්. සෞඛ්‍ය පර්යේෂණ ත්‍යාගය 2017 වසරේදී ප්‍රදානය කරනු ලැබීය.
වෛද්‍ය තිළිණී රාජපක්ෂ හා වෛද්‍ය දේවාස්මික ආරියසිංහ විසින් ඔක්තෝබර් මාසයේදී බර්ලින් නුවර පැවැත්වූ 17වැනි ලෝක මනෝ වෛද්‍ය සමුළුවේදී "ශ්‍රී ලංකාවේ මාතෘ දිවිනසා ගැනීම්" යන තේමාව යටතේ පර්යේෂණ පත්‍රයක් ඉදිරිපත් කරන ලදි. පීඨ සාමාජිකයන් විසින් ප්‍රබල බලපෑමක් සහිත ප්‍රසිද්ධ ජාත්‍යන්තර වාර සඟරාවල පර්යේෂණ පත්‍ර 21ක් පළ කරන ලදි. මේ අතර, "අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය විසින් අධිකරණ වෛද්‍ය, විද්‍යා හා නීතිය පිළිබඳ ශ්‍රී ලංකා වාර සඟරාවේ" හත් වැනි වෙළුම ප්‍රකාශයට පත් කරන ලදි. තවද පීඨ සාමාජිකයන් විසින් කෘති අටක් ප්‍රකාශයට පත් කරන ලද, පීඨ සාමාජිකයන් අට දෙනෙක ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ දේශන පැවැත්වූහ. ප්‍රසව හා නාරීවේද අංශයට රුපියල් මිලියන 4.0ක හා රුපියල් මිලියන 5.0ක වටිනාකමින් යුතු ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදාන දෙකක් ලැබිණි. මේ අතර පීඨ සාමාජිකයන් තිදෙනෙකු මහාචාර්ය තනතුරට උසස් කරන ලදි.

බාධක සහ පිළියම්

පීඨයට පරිබාහිර වූ ගැටලු හේතුවෙන් පීඨාධිපති කාර්යාලයේ සහ වෙනත් අධ්‍යයන අංශවල හා ඒකකවල යටිතල වැඩකටයුතු ප්‍රමාද විය. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උසස් බලධාරීන්ට හා අදාළ ඒකකවලට සිහිකැඳවීම් කළ ද අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගත නොහැකි විය. පරිපාලනමය අඩුපාඩු හා මූල්‍යමය බාධක හේතු කොට ගෙන පාරා සායනික ගොඩනැගිල්ලේ II අදියරේ කටයුතු ඇණහිට ඇත.

අනාගත සැලසුම්

- යෝජිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීම
- පීඨයේ ගොඩනැගිලි වැඩසටහනේ කටයුතු කඩිනම් කිරීම
- සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

3.8 විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය එස්. ආර්. කොඩිතුවක්කු)

හැඳින්වීම

නව නිපැයුම් පර්යේෂණ හා අධ්‍යාපනය වෙනුවෙන් අග්‍රගණ්‍ය අවස්ථාවන් උදාකර දෙනු ලබන විද්‍යා පීඨය 1942 වසරේදී ආරම්භ කොට එය මේ වනවිට පිහිටා තිබෙන ස්ථානයට 1961 වසරේදී රැගෙන ඒමත් සමඟ අවුරුදු 70ක කාලයක් පුරාවට මෙරට විද්‍යා අධ්‍යාපනයේ මූලිකත්වය ගෙන ක්‍රියා කොට ඇත. අධ්‍යාපනය වඩාත් ඉහළ ස්ථානයකට ඔසවා තැබීම, විශාල සිසුන් සංඛ්‍යාවකට ඉඩ ප්‍රස්ථාවන් සලසා දීම යන අවශ්‍යතාවයන් තුළින් ප්‍රේරණය ලද විද්‍යා පීඨය විසින් මෙම කාලය පුරාවට පීඨ අධ්‍යයන අංශ හා මධ්‍යස්ථාන ස්ථාපිත කොට, පවතින පහසුකම් පුළුල් කරන ලදි. වර්තමානය වනවිට මෙම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 100 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් 1800ක් හා පශ්චාත් උපාධි සිසුන් 200 දෙනෙක් ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නියැලී සිටිති. එමෙන්ම මෙම පීඨය සතුව විද්‍යා අධ්‍යාපන ඒකකයක්, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයක් සහ විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා සංසදයක් ද ඇත.

විද්‍යා පීඨය වාර්ෂිකව සිසුන් 530 දෙනෙකු ඇතුළත් කරගනිමින් ප්‍රථම උපාධි පාඨමාලා 15ක් පවත්වයි. මේ අතරට ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, භූගර්භ විද්‍යාව, ගණිතය, අණුක ජීව විද්‍යාව හා ජෛව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිසර විද්‍යාව, සත්ත්ව විද්‍යාව, සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ, ගණනය හා කළමනාකරණය (ශාස්ත්‍ර පීඨය සමඟ එක්ව) යන විෂයන් ඇතුළත් සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි ප්‍රදානය කරනු ලබයි. තවද මෙම විද්‍යා පීඨය විසින් තුන් අවුරුදු (සාමාන්‍ය) විද්‍යාවේදී උපාධිය ද ප්‍රදානය කරනු ලබයි. මෙහිදී ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී උපාධිය හැදෑරීමේ විකල්පයක් ලෙස කර්මාන්ත ක්ෂේත්‍රය හා සම්බන්ධ පාඨමාලා හැදෑරීම සඳහා අමතර වර්ෂයක කාලයක් ගත කිරීමට සිසුන්ට සිදුවේ. මීට අමතරව එම ක්ෂේත්‍රය තුළ උචිත ස්ථානගත කිරීම් ද ඇතුළත්ය. සියලුම උපාධි පාඨමාලා හදාරන, විශේෂයෙන්ම ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවේ සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නිසි ස්ථානවල යෙදවීමත් සමඟ පවත්වන සබඳතාවන් ශක්තිමත් කරන ලදි.

ප්‍රථම උපාධි ඉගැන්වීමේ වැඩසටහන සඳහා සිසුන් පෙළඹවීම හා දැනුම ලබාදීම සඳහාත් රටේ සංවර්ධනය උදෙසාත් පශ්චාත් උපාධි පර්යේෂණ කාර්යභාරයේ වැදගත්කම අවබෝධ කරගත් මෙම පීඨය පශ්චාත් උපාධි ඉගැන්වීම සහ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම පිණිස විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සමීපව කටයුතු කරයි. මූලික විද්‍යාවන් මෙන්ම ව්‍යවහාරික විද්‍යාවන් පිළිබඳ උසස් ගුණාත්මක බවින් යුතු පර්යේෂණ සිදුකිරීම සඳහා අති නවීන උපකරණ කිහිපයක් හා වෙනත් භෞතික සම්පත් පීඨය සතුව පවතී. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ බොහෝ දෙනෙක් ජාතික හා ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් සහිත සම්මාන හිමි කර ගන්නට සමත් වුහ. පීඨය ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පළ කළ ප්‍රකාශන හා ලබාගත් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවෙන් මෙම කරුණ තවදුරටත් තහවුරු වේ.

ජයග්‍රහණ

විද්‍යා පීඨය 2017 වසර තුළදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හත් දෙනෙකු ද එක් කථිකාචාර්යවරයෙකු හා පරිවාස කථිකාචාර්යවරුන් සිව් දෙනෙකු බඳවා ගැනීමට සමත් විය. කාර්ය මණ්ඩල සාමාජිකයන් පස් දෙනෙකු මහාචාර්ය තනතුරටත් දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරටත් උසස් කරන ලදි. එමෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියටත් දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියටත් උසස් කරන ලදි. තවද, එම කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කිහිපදෙනෙක් විශේෂ පුහුණු වැඩසටහන්, වැඩමුළු, සමුළු සහ සහයෝගිතා පර්යේෂණ සඳහා විදෙස් විශ්වවිද්‍යාල හා විද්‍යාගාරවලට ගියහ.

2017 වසර තුළදී සිසු කණ්ඩායම් දෙකක් (2016/17 සහ 2017/18) ඇතුළත් කර ගැනීමට මෙම පීඨයට හැකි විය. මෙම පීඨය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වන 508 දෙනෙකු ලියාපදිංචි කිරීමට ද හැකි විය.

විද්‍යා පීඨයෙන් විද්‍යාත්මක පර්යේෂණ 2015 සඳහා ජනාධිපති සම්මාන දිනාගත් සංඛ්‍යාව දහ හතකි. (17). විද්‍යාත්මක වාර සඟරාවල තම කාර්යයන් පළ කරන විද්‍යාඥයන් මෙම ජනාධිපති සම්මානයට හිමිකම් කියයි.

අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන් 1000කට පමණ එක් දින පාසල් විද්‍යා වැඩසටහන් 16ක් විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වනීනට පීඨය සමත් විය. මෙම වැඩසටහන්වලට ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන් ඇතුළත් විය. පීඨයේ විද්‍යා අධ්‍යාපන ඒකකය රසායන විද්‍යා අධ්‍යයන අංශය සමග සහයෝගිතාවයෙන් යුතුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වප්‍ර ජයන්ති උළෙල සමරනු පිණිස ක්‍රියාකාරකමක් ලෙස "විද්‍යාවේ ආශ්චර්යයන්" යන තේමාව යටතේ වැඩ සටහන් තුනක් සංවිධානය කළේය. මෙම වැඩසටහන්වලට උසස් පෙළ සිසුන් දහසක් පමණ සහභාගි වූහ. මෙරට අඩු වරප්‍රසාද සහිත පාසල්වල උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන් සඳහා විද්‍යා කඳවුරු දෙකක් පැවැත්වීමට ද මෙම පීඨයට හැකි විය. දේශන, ඉදිරිපත් කිරීම්, සාකච්ඡා ප්‍රායෝගික සැසි සහා ජනප්‍රියම වැඩසටහන වන "රසායන විද්‍යාවේ ආශ්චර්යයන්" යන වැඩසටහන ද ඇතුළත් වූ මෙම විද්‍යා කඳවුරුවලට සිසුහු 1000ක් පමණ සහභාගි වූහ.

පීඨය විසින් අවසන් වසර සිසුන්ගේ හා මෑතකදී උපාධි ලබාගත් උපාධිධාරීන්ගේ යහපත පිණිස කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවායන්ට ද ආරාධනා කොට පිළිවෙළින් සිව් වෙනි වතාවටත් "කර්මාන්ත දිනය" සාර්ථකව පවත්වන ලදි.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිපදෙනෙක් රටේ වෙනත් ජාතික ආයතනවල අධ්‍යක්ෂ, සභාපති හා කණ්ඩායම් නායකයන් ලෙස ද තවත් කිහිපදෙනෙක් ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතිවලට ද සේවය ලබා දෙන්නට වූහ.

මෙම වර්ෂය තුළ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් උසස් වාර සඟරාවල පර්යේෂණ ලිපි 97ක් ද, විමර්ශන නොවූ වාර සඟරාවල 19ක් ද, උපුටන 200ක් ද, ග්‍රන්ථ පහකට පරිච්ඡේද පළ කරන්නට වූ අතර, ජාතික පේටන්ට් බලපත්‍ර හතරක් පීඨය විසින් ලබා ගන්නා ලදි.

යන්ත්‍රාගාරය ඉදිකිරීම අවසන් කළ අතර, සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සඳහා ඉදිකෙරෙන නව සිව්මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සහ භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු ද සිදුකෙරෙමින් පවතී.

පීඨ පරිපාලන ගොඩනැගිල්ලට සහ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණ විද්‍යා ගොඩනැගිල්ල සඳහා ඉදි කෙරෙන ගොඩනැගිලි දිගුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. එක් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක කටයුතු අවසන් කළ අතර. එවැනි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති දෙකක කටයුතු ආරම්භ කරන ලදි.

බාධක සහ පිළියම්

පෞද්ගලික හේතූන් මත පුරෝගාමී කීර්තිමත් මහාචාර්යවරයෙක් විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස්විය. විශාල සිසුන් පිරිසකගේ ඉල්ලුමට සරිලන පරිදි පවතින විද්‍යාගාර, පුස්තකාලය, යටිතල සහ සුබසාධන පහසුකම් ප්‍රමාණවත් නොවේ.

අනාගත සැලසුම්

සමාජයේ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සියලුම පාර්ශවකරුවන්ගේ මැදිහත් වීමෙන් ප්‍රථම උපාධි විෂයමාලාව සංශෝධනය කිරීමට පීඨය අදහස් කරයි.

3.9 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය එච්. බී. එස්. ආරියරත්න)

හැඳින්වීම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පශු වෛද්‍ය විද්‍යා උපාධිය පිරිනැමීමේ බලය හිමි එකම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පශු වෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨයයි. සිව් අවුරුදු අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා වසරකට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් 80කි. පීඨයේ අධ්‍යයන අංශ පහක් අතරේ බෙදී යන විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නිපුණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 41දෙනෙකුගෙන් සමන්විත වේ. ඉහළ ගුණාත්මක භාවයකින් හෙබි අධ්‍යයන හා පරිපාලන ව්‍යුහයක් අත්කර ගැනීම පිණිස පීඨාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව පීඨ මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටු 15ක් වෙත වගකීම් විමධ්‍යගත කොට ඇත. පශු ශීක්ෂණ රෝහල, ගිලන් සායනය, පශු ශීක්ෂණ ගොවිපල, පශු වෛද්‍ය පුස්තකාලය, පරිගණක ඒකකය, ජලජ සත්ව රෝග හඳුනා ගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානය සහ ආදර්ශ කිරිහල මෙන්ම පිස්සු බලු රෝගය හඳුනා ගැනීමේ ඒකකය ඇතුළත් සේවා ඒකක රාශියක් මගින් පීඨයේ අධ්‍යයන පරිසරය සුපෝෂණය කොට ඇත. සමාසික අටකින් යුතු අධ්‍යයන වැඩසටහන මුළු විෂය ධාරාවන් 23කින් සමන්විත වන අතර, ඉන් එක් විෂයයක් සත්ව සෞඛ්‍ය හෝ නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ සහිතව සමාසික එකක හෝ දෙකක කාලයක් පුරා උගන්වනු ලබයි. ඒ අනුව පීඨය පාඨමාලා ඇගයීම, සමාසික අවසාන ඇගයීම හා වාර්ෂික අවසාන පරීක්ෂණ ඇගයීම් ක්‍රම පීඨය විසින් පවත්වනු ලබයි.

ජයග්‍රහණ

පීඨයට වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සියය (100) දක්වා ඉහළ දැමීමේ අරමුණින් යුතුව පීඨයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු රාශියක් අවසන් කරන ලදි. මෙම කටයුතුවලට මූලික විද්‍යා ගොඩනැගිල්ලේ පංති කාමර හා විද්‍යාගාර, ජෛව රසායන විද්‍යා ගොඩනැගිල්ල, ව්‍යාධජීව විද්‍යා ගොඩනැගිල්ල සහ ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කටයුතු ද ඇතුළත් වේ. විභාග පවත්වන ගොඩනැගිල්ලේ දෙවන මහලේ කටයුතු අවසන් කොට ඇති අතර, විභාග පැවැත්වීමට මෙන්ම කුඩා කණ්ඩායම්වලට ඉගැන්වීම සඳහා අමතර ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ද අදහස් කෙරේ. නවීන පහසුකම්වලින් යුක්ත වන විශාල සත්ව ගොඩනැගිල්ලක් ලෙස පුළුල් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතරම එහි කොන්ත්‍රාත්තුව ද ප්‍රදානය කොට ඇත. මේ සඳහා වැයවන වියදම රුපියල් මිලියන 139කි.

පශු සායනික විද්‍යා අධ්‍යයන අංශය නව පරිශ්‍රය තුළ සාර්ථකව ක්‍රියාත්මක වන අතර, පශු ශීක්ෂණ රෝහල නවීනතම උපකරණවලින් සන්නද්ධ කොට සුරතල් සතුන්ගේ මෙන්ම වනජීවීන්ගේ සෞඛ්‍ය සත්කාරය සඳහා පැය 24 පුරාම විවෘතව පවතී. HETC වින්ඩෝ 2 ව්‍යාපෘතියේ මුදල් භාවිත කරමින් පශු ශීක්ෂණ ගොවිපලෙහි ප්‍රතිසංස්කරණ හා ඉහළ නැංවීමේ කටයුතු අවසන් කොට ඇති අතර, ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම, කුකුළ් කොටුවල තත්ත්වය ඉහළනැංවීම සඳහා පශු සම්පත් හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය රුපියල් මිලියන 20ක් ලබා දුන් අතර, එම මුදල් භාවිත කොට නව සූකර ඒකකයක් ඉදිකොට ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු නිම කොට ආපසු පැමිණීමත් සමග පීඨයේ අධ්‍යයන වැඩසටහන වැඩිදියුණු කොට ඇත. නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලය සමග පවත්වාගෙන යන OIE ට්විනිං වැඩසටහනට නවසීලන්ත රජයේ දේශීය කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය වර්ෂ පහක කාලයක් සඳහා මුදල් ලබා දෙමින් සිටී. පශු වෛද්‍ය විද්‍යා විෂයමාලාව සංශෝධන කිරීම හා කලාපීය ආයතන මෙන්ම ඕස්ට්‍රේලියාවේ තත්ත්වාරක්ෂණ සහතික ලබා ගැනීම සඳහා මැසේ විශ්වවිද්‍යාලයේ සහයෝගය ලබා ගැනීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කරයි. තෙවන වසරටත් සාර්ථකව ක්‍රියාත්මක වන එම ව්‍යාපෘතිය තුළින් පස් අවුරුදු විෂයමාලාව සකස් කිරීම අවසන් කොට ඇත. තෙරියජෙනෝලොජි පිළිබඳ විද්‍යාපති උපාධියේ දෙවන කොටස අවසන් කොට එම උපාධියේ තෙවන කොටස උපාධි සිසුන් 25 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. පශු මහජන සෞඛ්‍ය, ව්‍යාධජීව විද්‍යාව පිළිබඳ පශු විද්‍යාපති වැඩ සටහන් හා සත්ව සෞඛ්‍ය කළමනාකරණ පාඨමාලා ආරම්භ කිරීම සඳහා කටයුතු සැකසෙමින් පවතී.

පහතින් දක්වෙනුයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් අත්කර ගන්නා සුවිශේෂී ජයග්‍රහණයන් කිහිපයකි:

- ශ්‍රී ලංකාවේ වනජීවී සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කොටස්කරුවෙකු වන පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය විසින් සම්බන්ධීකරණය කරන ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ව්‍යාපෘතිය මෙම වසර තුළදී සාර්ථකව අවසන් කරන ලදි. මෙය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය හා කැනඩාවේ IDRC ආයතනය අතර, කෙරෙන සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියක් වන අතර, එහි ප්‍රධාන අරමුණ වනුයේ "ශ්‍රී ලංකාවේ වන ජීවීන් හා මානව සෞඛ්‍යයේ පර්යේෂණ විශිෂ්ටතා ගොඩනැගීමයි " මෙම වැඩසටහන යටතේ පශ්චාත් උපාධි පහක් (05) පිරිනමන ලදි.
- මහාචාර්ය ප්‍රීති අබේනායක, වෛද්‍ය මධුර මුණසිංහ, වෛද්‍ය නිරෝමි ජයසේකර, වෛද්‍ය අනෝජා වනිගසේකර සහ වෛද්‍ය රුවනි කළුපහන ඇතුළු පර්යේෂක කණ්ඩායමකට කෘෂිකර්ම පර්යේෂණ විශිෂ්ටතාවය වෙනුවෙන් ප්‍රසිද්ධ SLCARP ජාතික සම්මානය පිරිනමන ලදි.
- මහාචාර්ය ආර්. පී. වී. ජේ. රාජපක්ෂ වෙත IAEA වෙතින් පර්යේෂණ ප්‍රදානයක් හිමි විය.
- වෛද්‍ය නිල්මිණී ජයසේන, වෛද්‍ය ඩිලාන් සතරසිංහ සහ වෛද්‍ය ෆසිකා ජිනදාස ඔවුන්ගේ පර්යේෂණ යෝජනා වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවෙන් පර්යේෂණ ප්‍රදාන ලබා ගත්හ.
- දර්ශනශූරි උපාධියෙන් අනතුරුව වෛද්‍ය රුචිකා ප්‍රනාන්දු ඇයගේ පර්යේෂණ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අඛණ්ඩව පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමට සමත් විය.
- වෛද්‍ය සදු කොට්ටවත්ත 2015 වසරේදි සිදුකළ පර්යේෂණ දායකත්වය සඳහා ජනාධිපති පර්යේෂණ සම්මානය හිමිකර ගත්තාය.
- මහාචාර්ය බැසිල් ඇලෙක්සැන්ඩර් ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය දියුණු කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රදානයක් ලබා ගත්තේය.

බාධක සහ පිළියම්

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් විශාල සත්ව ශික්ෂණ රෝහලක් ඉදිකිරීම ප්‍රමාද විය. සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් නොමැතිවීම හේතු කොට ගෙන සමහර අධ්‍යයන අංශවල පවතින අධ්‍යයන පුරප්පාඩු පිරවීමට නොහැකි විය.

අනාගත සැලසුම්

අධ්‍යයන වැඩසටහන :

- OIE ට්විනිං ව්‍යාපෘතිය යටතේ නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව විෂයමාලා සංශෝධනය සිදුවෙමින් පවතී. මෙතුළින් වත්මන් විෂය මාලාව අවුරුදු පහක කාලයකින් යුතු ප්‍රතිඵල පදනම් කර ගත්, ශිෂ්‍ය කේන්ද්‍රීය විෂය මාලාවක් බවට පරිවර්තනය කරනු ඇත.
- පශු වෛද්‍ය විද්‍යාපති වැඩසටහනේ විෂයමාලාව සංශෝධනය වෙමින් පවතින අතර, එතුළින් ඩිප්ලෝමා, විද්‍යාපති, පශු වෛද්‍ය විද්‍යාපති හෝ දර්ශනපති ලෙස සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන් අවසන් කිරීමේ අවස්ථාව උදාවේ. පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය සහ කළමනාකරණය පිළිබඳ පශු වෛද්‍ය විද්‍යාපති උපාධි පාඨමාලාව වැඩිකල් නොගොස් ආරම්භ කරනු ඇත.

යටිතල සංවර්ධනය

ප්‍රධාන සැලසුමෙන් යෝජනා කොට ඇති ආකාරයට කුඩා සත්ව ශික්ෂණ රෝහල පුළුල් කිරීම සහ වනජීවී සත්ව රෝහලකට නව පහසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යෝජනාවක් සකස් කොට බාර දී ඇත.

- පශු වෛද්‍ය ශික්ෂණ රෝහල ආසන්නයේ ව්‍යාධ ජීව විද්‍යා අධ්‍යයන අංශය ස්ථාපනය කිරීම සඳහා මහල් පහකින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යෝජනාවක් බාරදී ඇත.

3.10 පශ්චාත් උපාධි ආයතන

3.10.1 කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව)

හැඳින්වීම

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 1 දරන පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරන ව්‍යවස්ථාව මගින් 1975 වසරේදී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී. 1978 අංක 6 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යවස්ථාව ආඥා පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 09 දරන පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරී පළමු දින සිට ක්‍රියාත්මක තත්ත්වයට පත් වී ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා නීතිමය පදනම සකස් කරදෙනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් සංවර්ධනය කිරීම හා මෙරට සීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතීය ආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණ විය. කළමනාකරණ මණ්ඩලයේ මඟපෙන්වීම යටතේ ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවතී.

අධ්‍යයන වැඩසටහන්

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වත්මන් වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. රටේ පවතින ඉල්ලුමට උචිතවන පරිදි විෂයමාලාවන් ද සංශෝධනය කොට ඇති අතර වර්තමානය වනවිට මෙම ආයතනය දර්ශනශූරී උපාධි, ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා, දර්ශනපති උපාධි සහ විද්‍යාපති උපාධි පාඨමාලාවන් 31ක් පිරිනමනු ලබයි. මෙම විද්‍යාපති උපාධිවලට, පාඨමාලා වැඩ හා පර්යේෂණ ඇතුළත් වේ. මෙම පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වලදී පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. මෙතුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට සහ පර්යේෂණ වැඩසටහන්වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට වැඩිකාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයන්හි වැඩි ප්‍රාගුණ්‍යයක් අත්කර ගැනීමට කැපවූ විනයගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහිකරන ප්‍රබල අභියෝගයට කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටී. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරීන් තුළ ඔවුන්ගේ චරිතවලට ඒකාත්මක වූ කොටසක් බවට පත්වන ප්‍රබල වැඩ ආචාරධර්ම සමූදායක් සංවර්ධනය කිරීමට මෙම ආයතනය අපේක්ෂා කරයි.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පවතින රෙගුලාසි ශ්‍රී ලංකා සුදුසුකම් සැකැස්මට සමානවන ආකාරයෙන් සංශෝධනය කරන ලදී. මෙම මාර්ගෝපදේශන 2017 වසරේ සිට බලපැවැත්වෙන අතර ඒ අනුව සිසුන් ඇතුළත් කරගනු ලබයි. එහි උපාධි වැඩසටහන් පහත පරිදි වේ.

විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - සම්මාන 5ක් ඉලක්කගත අධ්‍යයන/ව්‍යාපෘති ඇතුළත් පාඨමාලා වැඩ.

විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - එක් අවුරුදු පර්යේෂණයක් ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණය.

දර්ශනපති/දර්ශනශූරී/ ව්‍යාපාර පරිපාලනපති - පර්යේෂණ පමණි.

විද්‍යාපති උපාධි අපේක්ෂකයන්ට අදාළ සම්මාන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමින් ඉවත්විය හැකිය. සම්මාන 25ක් ලබාගෙන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සම්මාන 20ක් ලබාගෙන පශ්චාත් උපාධි සහතික පත්‍ර ද ලබාගත හැකිය. ආයතනය විසින් පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලා හදුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙය වන අතර එතුළින් පශ්චාත් උපාධි සුදුසුකම් අත්කර ගැනීමට අපේක්ෂා කරන අපේක්ෂකයන්ට ඉතා කෙටි කාලයක් තුළදී එම සුදුසුකම සපුරාගත හැකි වී ඇත.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්

ඉගැන්වීමේ හා පර්යේෂණයෙහි පෘථුල අත්දැකීම් සමුදායකින් හෙබි අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයන් 300 දෙනෙකුගෙන් යුක්ත වන අතර ඔවුන්ගෙන් බහුතරය පේරාදෙණිය කෘෂිවිද්‍යා පීඨයෙන් වන අතරම අනෙකුත් ආචාර්යවරුන් විශ්වවිද්‍යාල පද්ධතියේ පීඨවලින්ද, රජයේ දෙපාර්තමේන්තු වලින්, පර්යේෂණ ආයතන, සංස්ථා, පුද්ගලික අංශයේ ගොවිපළ, ජාත්‍යන්තර ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත් වේ.

සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 328 දෙනෙකු ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

විද්‍යාපති- 271 ව්‍යාපාර පරිපාලනපති -43

දර්ශනපති හා දර්ශනශූරී -14

2017 වසරේ උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රදානය කළ උපාධි පහත දැක්වේ.

දර්ශනශූරී -08

දර්ශනපති -24

විද්‍යාපති -240

ව්‍යාපාර පරිපාලනපති -23

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කොළඹ ශාඛාව විවෘත කිරීම.

ආයතනයේ තවත් සුවිශේෂී සලකුණක් ලෙස කොළඹ ශාඛාව විවෘත කිරීම සඳහන් කළ හැකි අතර එය පෙබරවාරි 09වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. කොළඹ අගනගරය තුළ කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත ශාලාවල සුදුසුකම් සහිත බොහෝ සිසුන් ප්‍රමාණයක් සිටින අතර ඔවුන්ට එම පාඨමාලා හැදෑරීම පහසුවන අතරම ආයතනයේ උපාධි පාඨමාලා ප්‍රදානය කිරීම එතුළින් පුළුල්වනු ඇත. ආරම්භයේදී ව්‍යවහාරික සංඛ්‍යානය, ජෛව සංඛ්‍යානය, ආහාර විද්‍යා හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාපති උපාධි තුනක් ආරම්භ කරන ලදී. පසුව එය කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත මාරු කරනු ලැබීමෙන් පසුව මේ වනවිට පාඨමාලා එහිදි ප්‍රදානය කෙරේ.

ක්වින්ස්ලැන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ උපාධි වැඩසටහන් ප්‍රදානය කිරීම

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හා ක්වින්ස්ලැන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පුරෝගාමී විද්වතුන්ගේ අධීක්ෂණය යටතේ ශිෂ්‍යත්වලාභීන් ලෙස සිසුහු කිහිපදෙනෙක් අවුරුද්දක කාලයක් සඳහා ඔවුන්ගේ පර්යේෂණ කටයුතු අඛණ්ඩව කරගෙන ගියහ. එම උපාධිවලට අවශ්‍ය සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය එම උපාධි ප්‍රදානය කරනු ඇත.

පර්යේෂණ පහසුකරවීමේ අරමුදල

ජාතික වැදගත්කමින් යුතු අංශවල පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2010 වසරේදී ස්ථාපිත කළ ඉහත පර්යේෂණ පහසුකරවීමේ අරමුදල යටතේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය දර්ශනපති හා දර්ශනශූරී උපාධි පර්යේෂණ සඳහා රුපියල් මිලියන හයක් (6) 2017 වසරේ දී වෙන්කර දෙන්නට විය.

පර්යේෂණ ප්‍රකාශන පහසු කරවීමේ අරමුදල

විදෙස් රටවල පවැත්වූ ජාත්‍යන්තර සමුළුවලදී සිසුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ වාචික ඉදිරිපත් කිරීම සඳහා සිසුන් අටදෙනෙකු තෝරා ගන්නා ලදී. මෙම සිසුන්ට ආයතනය විසින් අනුග්‍රහය දක්වමින් එක් සිසුවෙකුට ගමන් ගාස්තු/ ලියාපදිංචිය ගාස්තු ආදි වශයෙන් රුපියල් 50,000ක මුදලක් ප්‍රදානය කරන ලදී.

පශ්චාත් උපාධි කෘෂි විද්‍යා ශිෂ්‍ය සංගමය

"කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනික දිනය" අප්‍රේල් අට (8) වැනි දින ඉහත සංගමය විසින් සංවිධානය කොට පවත්වන ලදී. මුළු දවස පුරාම පැවති මෙම සැමරුමේ පෙරවරු සැසිය විශ්වවිද්‍යාල

ක්‍රීඩාපිටියේදී පැවැත් වූ අතර එහි සමාරම්භය සටහන් කරමින් ජාතික ධජය උපකුලපතිතුමන් විසින් ඔසවන ලදී. සිසුභූ, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය මේ සඳහා සහභාගි වූහ. එම සංගමය විනෝදජනක ක්‍රියාකරකම් රැසක් සංවිධානය කර තිබූ අතර අලංකාරවත් පස්වරු සැසිය ආයතනයේ ඉහළ මහලේ දී පවත්වන ලදී.
ඉහත කර්තව්‍යයට අමතරව එම සංගමය විසින් 2017 වසරේදී පහත සඳහන් කාර්යයන් ද සංවිධානය කරන ලදී.

- "උපකාරක හස්තය" ලෙස හැඳින්වෙන පාසල් සංවර්ධන ව්‍යාපෘතිය උඩපේරාදෙණිය ආනන්ද විද්‍යාලයේදී පවත්වන ලදී. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්, කාර්ය මණ්ඩලය හා සුබසාධන සංගමයේ සහයෝගයෙන් පැවැත් වූ මෙම කාර්යයයේ ප්‍රධාන ක්‍රියාකාරකම් දෙක වූයේ ළමා උද්‍යානය විවෘත කිරීම හා සිසුන්ට ත්‍යාග පිරිනැමීමයි.
- පේරාදෙණිය ශීක්ෂණ රෝහලේ රුධිර ඒකකයේ සහයෝගයෙන් ලේ දන්දීමේ කඳවුරක් ජූනි මාසයේදී පැවැත්වූ අතර මේ සඳහා මෙම ආයතනය අනුග්‍රහය දක්වන ල. එහිදි පුද්ගලයන් 92ක් ලේ පරිත්‍යාග කරන්නට විය.
- කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් හා කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් යුතුව ඉහත සංගමය විසින් භාණ්ඩ එක්රැස් කොට නිවිතිගල නගර සභාවේ සහයෝගිතාවයෙන් නිවිතිගල ප්‍රදේශයේ ගංවතුරෙන් අනාථ වූවන් සඳහා පොසොන් පොහෝ දින පරිත්‍යාග කරන ලදී. එමෙන්ම මෙම සංගමය විසින් විශ්වවිද්‍යාලයේ කලා සහ වෛද්‍ය පීඨ සිසුන්ගේ සහයෝගය ඇතිව නිවිතිගල වටපොත විද්‍යාලයේදී මනෝවෛද්‍ය වැඩසටහන් හා වෛද්‍ය සායනයක් ද දවස පුරා පවත්වන ලදී.
- ගංවතුරෙන් හානි සිදු වූ කෘෂිවිද්‍යා පීඨයේ ප්‍රථම උපාධි හදාරන සිසුන් 16 දෙනෙකුට ද මෙම සංගමය විසින් පරිත්‍යාග ලබා දෙන ලදී.
- ඇමෙරිකාවේ ෆුල් බ්‍රයිට් (Full Bright) කොමිෂමේ සහයෝගයෙන් යුතුව පශ්චාත් උපාධි සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. එම කොමිෂමේ ශිෂ්‍ය උපදේශකයන් සම්පත්දායකයන් ලෙස සහභාගි විය. එමෙන්ම PASA සංගමය ප්‍රථම උපාධි හදාරන සිසුන් සඳහා ද තවත් වැඩසටහනක් සංවිධානය කොට සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද අතර ඒ සඳහා විශාල සිසුන් පිරිසක් සහභාගි වූහ. මෙහි සම්පත්දායකයන් ලෙස ඇමෙරිකානු කොමිෂමේ තරුණ සම්බන්ධීකරණ සංසදය සහභාගි විය.

වාර්ෂික සමුළුව

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 29වැනි වාර්ෂික සමුළුව නොවැම්බර් 16-17 යන දිනවල මහනුවර අමායා හිල්ස් හෝටලයේදී පවත්වන ලදී. සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එස්. එම්. සී. හිමාලි මිය මෙම සමුළුවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන්නට විය. දේශීය සහ ඉන්දියාව, නේපාලය, ඉතියෝපියාව හා නයිජීරියාව වැනි ජාත්‍යන්තර ආයතනවලට අයත් පර්යේෂණ සිසුන්ගෙන් පර්යේෂණ පත්‍ර 60ක් ලැබී තිබුණි. සමාලෝචනය කිරීමෙන් පසු තාක්ෂණික සැසි හතක් යටතේ පර්යේෂණ පත්‍ර 31ක් සමුළුවේදී ඉදිරිපත් කරන ලදී. ඔවුන් අතරින් විශිෂ්ට ඉදිරිපත් කිරීම් කළ දසදෙනෙකුට සම්මාන 10ක් පිරිනමන ලදී.
එමෙන්ම මෙම සමුළුවේ විශිෂ්ටතම ඉදිරිපත් කිරීමට හා හොඳම පර්යේෂණ පත්‍රය සඳහා විද්‍යාර්ථීන්ගේ සංගමය මුදල් ත්‍යාගයක් ද ප්‍රදානය කරන්නට විය.

ජොඇච්ම් අනුස්මරණ ත්‍යාගය

2016 වසරේ දී ඉහළම සාමාන්‍ය අගයක් (GPA) ලබා ගත් ශිෂ්‍යයාට ඉහත ත්‍යාගය (මුදල්) වාර්ෂික සමුළුවේදී ප්‍රදානය කරන ලද අතර 2017 වසරේදී එය කෘෂි ඉංජිනේරු ශිෂ්‍යාවක වූ එම්. ජේ. ජී. පී. එන්. ජයසිරි ශිෂ්‍යාවට ප්‍රදානය කරන ලදී.

ජයග්‍රහණ

ශිෂ්‍ය ජයග්‍රහණ

සිසුන් කිහිපදෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ ලිපි විදෙස් රටවල පැවැත්වූ ජාත්‍යන්තර සමුළුවලට ඉදිරිපත් කළහ. ඉන් පර්යේෂණ පත්‍ර කිහිපයක් ආයතනයේ නිවර්තන කෘෂිකර්ම පර්යේෂණ වාර සඟරාවේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ iPURSE වාර සඟරාවේ පළකිරීම සඳහා තෝරා ගන්නා ලදී.

පරිසර පද්ධති පර්යේෂණ ආයතනයේ ජාත්‍යන්තර පරිශීලක සමුළුව

GIS වැඩසටහනේ සම්බන්ධීකාරක සමග භූ තොරතුරු උපාධි වැඩසටහනේ සිසුන් නව දෙනෙකු ඉහත සමුළුවට සහභාගි වූහ. මෙම සමුළුව ඇමෙරිකාවේ කැලිෆෝනියාවේ සැන්ඩීගෝහිදී ජූලි මාසයේදී පවත්වන ලදී.

එරස්මස් මුන්දූස් ශිෂ්‍ය හුවමාරු වැඩසටහන

කෘෂි ආර්ථික අධ්‍යයන මණ්ඩලයේ විද්‍යාපති උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍යයෙකු එරස්මස් මුන්දූස් ශිෂ්‍ය හුවමාරු වැඩසටහනෙන් ත්‍යාගයක් ලබා තුර්කියේ අන්කාරාහි මිඩ්ල්ඊස්ට් තාක්ෂණික විශ්වවිද්‍යාලයේ එක් සමාසිකයක කාලයක් සඳහා අධ්‍යයන කටයුතුවල නිරතව සිටී.

එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය

ශාක ආරක්ෂණ අධ්‍යයන මණ්ඩලයේ ශිෂ්‍යයෙකුට කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ජෝන් පර්යේෂණ කණ්ඩායමේදී පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථාවක් උදාවිය.

ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා විදෙස් සිසුන් ආකර්ෂණය කරගැනීමේ අදහසින් පහත සඳහන් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම පිණිස කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාව තුළ SAC ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික සහයෝගීතාවන් හා මෙම ආයතනයේ දර්ශනගුරී උපාධි වැඩසටහන් සඳහා සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතර අවබෝධතා ගිවිසුම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා කැනඩාවේ නිව්ෆවුන්ලෑන්ඩ් අනුස්මරණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා බංගලාදේශයේ සිල්හර්ට් කෘෂිකර්ම විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

කැප්නෙට් ලංකා ව්‍යාපෘතිය

කැප්නෙට් ලංකා ව්‍යාපෘති කාලසීමාව තවත් අවුරුද්දකින් දීර්ඝ කරගැනීම සඳහා කැප්නෙට් ලේකම් කාර්යාලය හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතර ගිවිසුමක් අත්සන් කරන ලදී.

බාධක හා පිළියම්

සමාලෝචිත වර්ෂයේදී සැලකිය යුතු බාධක කිසිවකට මුහුණපැමට සිදුනොවීය. නේවාසික පහසුකම් නොමැති වීම විදෙස් සිසුන් උපාධි පාඨමාලා සඳහා අයදුම් නොකිරීමට බලපෑ බාධකයක් බව පෙනී ගියේය.

ප්‍රචාරණ කටයුතු හා දැන්වීම් කිහිපයක් ක්‍රියාත්මක කළ ද පෙර වසර හා සංසන්දනය කිරීමේදී නව බඳවා ගැනීමේ සුළු අඩුවීමක් දක්නට විය. මෙයට ප්‍රධාන හේතුව වනුයේ මෙම ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවලට සමාන පාඨමාලා වෙනත් විශ්වවිද්‍යාල විසින් ආරම්භ කිරීම නිසා අදාළ අයදුම්කරුවන් ඒ කරා ඇදී යෑමයි.

ව්‍යාපෘති සඳහා නිසි උපදේශකවරුන් නිසිකලට සොයා ගැනීමේ දුෂ්කරතාව හේතුවෙන් ආයතනයේ නව ව්‍යාපෘති අටක ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය.

උපාධිධාරීන් බිහිවීමේ ප්‍රමාණය අඩුවීම උපාධි වැඩසටහන් පර්යේෂණ කාර්යයන් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිට පැමිණෙන සිසුන්ට පර්යේෂණ කරගෙන යෑමට කාලය ප්‍රමාණවත් නොවීමත් නිසා උපාධිධාරීන් බිහිවීමේ ප්‍රමාණය පහත වැටී ඇත. මෙනිසා පාඨමාලා කාර්යයක් හෝ පර්යේෂණයකින් යුක්ත උපාධි පාඨමාලා හඳුන්වා දෙමින් මෙම ක්‍රමය වෙනස් කොට ඇත.

පර්යේෂණ සිසුන් විසින් පර්යේෂණ පහසු කරවීමේ අරමුදල ඌණ උපයෝජනය කිරීම මෙම අරමුදල හා පර්යේෂණ ප්‍රකාශන අරමුදල උපයෝගි කරගැනීම දියුණු කිරීම පිණිස මාර්ගෝපදේශන හා එහි යෙදුම් ක්‍රියාවලිය වර්ෂාවසානයේදී සමාලෝචනය කරන ලදී.

අනාගත සැලසුම්

- සමාජ මාධ්‍ය කාර්යක්ෂමව යොදා ගනිමින් සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම
- පර්යේෂණ සිසුන් වැඩි කිරීම: පර්යේෂණ සිසුන්ට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු පහසුවෙන් කරගෙන යෑම පිණිස පර්යේෂණ පහසුකරවීමේ අරමුදලට මුදල් වැඩියෙන් වෙන් කිරීමටත් එම අරමුදල පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද ආයතනය සැලසුම් සකස් කොට ඇත.
- සහයෝගිතා ගිවිසුම් හරහා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විවිධ උපාධි පාඨමාලා සඳහා විදෙස් සිසුන් වැඩිපුර ඇතුළත් කරගැනීම ඉදිරියේදී විදෙස් සිසුන් කිහිපදෙනෙකු එවීමට FAO ද එකඟ වී ඇත.
- වඩා වැඩි වැඩසටහන් හා වැඩමුළු ප්‍රමාණයක් කොළඹ ශාඛාවෙන් ලබාදීම
- අධ්‍යයන සැසි හා සහයෝගිතා පර්යේෂණ සඳහා විදෙස් ආගන්තුක මහාචාර්යවරුන්ට ආරාධනා කිරීම හා පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වඩා වැඩි ජාත්‍යන්තර අරමුදල් ලබා ගැනීම
- බහු-ශ්‍රේණිගත මාර්ගගත (online) ආචාර්යවරුන් ඇගයීමේ පද්ධතියක් හඳුන්වාදීම
- අන්‍යෝන්‍ය වශයෙන් වාසිසහගත සහයෝගිතාවන් ගොඩනැගීම සඳහා විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම
- ත්‍යාග ක්‍රමයක් හඳුන්වාදීම තුළින් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් ආරම්භ කිරීම
- බාහිර විශේෂඥයෙකුගේ මාර්ගෝපදේශනය ලබාගෙන ආයතනයේ MIS ක්‍රමය ඉහළනැංවීම. එමගින් පුළුල් පරාසයක පවතින විවිධ අවශ්‍යතා ඉටුකරගැනීම. එමෙන්ම කඩදාසි පරිහරණය අවම වන, ශිෂ්‍ය /පරිශීලන හිතකාමී ඵලදායි කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම

ඉදිකිරීම් කටයුතු- මූලධන

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සැලසුම් කළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම අනුමත කළ අතර එතුළින් සිසුන්ට හා කාර්ය මණ්ඩලයට වඩාත් සුවදායී පරිසරයක් නිර්මාණය වන ආකාරයෙන් ආයතනයේ යටිතල පහසුකම් දියුණු කිරීම, වත්මන් ආපනශාලාවට ගොඩනැගිලි දිගුවක් එකතු කිරීම, පද්ධතියට යෝග්‍ය පංති කාමර දියුණු කිරීම, ශ්‍රවණාගාරයේ තත්ත්වය ඉහළනැංවීම, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය ආදී කටයුතු 2018 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘතීන්ය.

3.10.2 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(වැඩබලන අධ්‍යක්ෂ - මහාචාර්ය එස්. ආර්. කොඩිතුවක්කු)

හැඳින්වීම

වර්තමානය වනවිට විද්‍යා ක්ෂේත්‍රයන්හි සිසුන් 2300කට පමණ සේවය සලසන පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. මෙම ආයතනය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පනතක් මගින් 1996 වසරේ දී ස්ථාපිත කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි විද්‍යා අධ්‍යාපනය, පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහායි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ උපාධිධාරී ශාස්ත්‍රීය අත්දැකීම් ඉහළ නංවමින් විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට අදාළ උපදෙස්, පුහුණුව සහ පර්යේෂණ ලබාදීම හා එම ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කිරීමයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන කර්තව්‍යය වනුයේ රාජ්‍ය හා පුද්ගලික යන අංශ දෙකෙහි පවතින ඉල්ලුමට සරිලන පරිදි විද්‍යාපති, දර්ශනපති, දර්ශනශූරී උපාධි මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීමයි. බොහෝමයක් පර්යේෂණ වැඩසටහන් පවත්වනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ සමීප සහයෝගිතාවයෙන් යුතුවයි. ඊට අමතරව කෙටි පාඨමාලා සහ වැඩමුළු වැනි ව්‍යුහාත්මක හා විශේෂ කෙටි කාලීන වැඩසටහන් ද නිරන්තරයෙන්ම පවත්වනු ලබයි. නූ තොරතුරු පද්ධති හා එහි යෙදුම, විද්‍යාත්මක රචනය, දත්ත හැසිරවීම හා කළමනාකරණය යන කෙටි කාලීන වැඩසටහන් විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන ජනප්‍රිය වැඩසටහන් කිහිපයකි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම වැඩසටහන් අධ්‍යයන මණ්ඩල 11ක් හරහා පවත්වනු ලබන අතර ඒ තුළින් විද්‍යා අධ්‍යාපනයද ඇතුළත්ව සියලු විද්‍යාත්මක ක්ෂේත්‍රයන් ද ආවරණය කරනු ලබයි. ඉගැන්වීමේ කාර්යය සඳහා සාමාජිකයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨ නවයෙන් මෙන්ම වෙනත් විශ්වවිද්‍යාලවලින්ද, ආයතන හා කර්මාන්ත ක්ෂේත්‍රයෙන් තෝරාගනු ලබයි. එපමණක් ද නොව මෙම ආයතනය දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට, රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතන සඳහා උපදේශන සේවාවන් ද සපයයි. ජාත්‍යන්තර ආයතන සමග එක්ව විවිධ වැඩසටහන් හා සහයෝගිතා, පර්යේෂණ වැඩසටහන් ද දියත් කරනු ලබයි. ERASMS ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ විදෙස් රටවලට ගොස් සිසුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යෑම සඳහා තෝරාගත් සිසුන් පිරිසකට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙනත් ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ දෙස් විදෙස් දෙපාර්ශවයටම අයත් පුද්ගලයන්ගේ අධ්‍යයන සහයෝගිතාවයෙන් යුතුව විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමූළුව, අධ්‍යයන මණ්ඩල හරහා පවත්වනු ලබන වෙනත් සම්මන්ත්‍රණ හා වැඩමුළු ලෙස හැඳින්වෙන පර්යේෂණ සමුළු හා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පැවැත්වීමයි. 2017 වසරේ පැවැත්වූ පර්යේෂණ සමුළුවේදී නව පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ ඉදිරිපත් කිරීම් 200කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් කරන ලදී. රසායන විද්‍යා අධ්‍යයන මණ්ඩලය හා ජෛව විද්‍යා අධ්‍යයන මණ්ඩලය විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමග එක්ව පර්යේෂණ සමුළුවට සමගාමීව නැනෝ තාක්ෂණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. තවද විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි මහත්සේ කැපවූ, මනා ලෙස පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලය හරහා එහි පාර්ශවකරුවන් වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් සපයනු ලබයි.
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි දැක්ම වන විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි හා පර්යේෂණ කාර්යයෙහි ආසියාවේ හොඳම පශ්චාත් උපාධි ආයතනය බවට පත්වීම නුදුරු අනාගතයේදී සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාර සංවර්ධනය

සිසුන්ට අවශ්‍ය පහසුකම් සපයන විද්‍යාගාර රාශියක් මෙම ආයතනය සතුව ඇත. මෙම විද්‍යාගාර තවදුරටත් සංවර්ධනය කිරීම තුළින් ඒවා ලංකාවේ පවතින හොඳම විද්‍යාගාර බවට පත්වනු ඇත. මෙලෙස මෙම විද්‍යාගාර සංවර්ධනය කිරීමට අප ගත් පියවර පහතින් දැක්වේ.

- උපකරණ විද්‍යාගාරය I:
  මෙම විද්‍යාගාරය සතුව ඇටමික් එම්සන් ස්පේක්ට්‍රොපොටොමිටර්, ගෑස් ක්‍රොමටොගාප් වැනි උපකරණ රාශියක් මේ වනවිට මෙහි ඇත. උපයාගත් මුදල් භාවිත කොට නව එක්ස්රේ යන්ත්‍රයක් මිලදී ගෙන සවිකරනු ඇත.
- උපකරණ විද්‍යාගාරය II:
  2016 වසරේ අවසාන කාර්තුවේ මෙම විද්‍යාගාරය ආරම්භ කරන ලදි. ප්‍රෙව රසායන විද්‍යාව, ප්‍රෙව තාක්ෂණය හා අණුක ජීව විද්‍යා අංශවල පර්යේෂණ ශක්තිමත් කිරීම මෙය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණයි. මේ වනවිටත් උපකරණ රාශියකින් සමන්විත මෙම විද්‍යාගාරයට තවත් වැදගත් උපකරණ කිහිපයක් මිලදී ගැනීමට නියමිතය.
- භූ තොරතුරු පද්ධති විද්‍යාගාරය :
  පසුගිය කාලයේ මෙම විද්‍යාගාරයේ පහසුකම් ශක්තිමත් කොට ඇත. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ භූ තොරතුරු පද්ධති හා දුරස්ථ සන්නිවේදකය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා විශාල සිසුහු පිරිසක් ලියාපදිංචි වූහ. පරිගණක පදනම් කරගත් භූ තොරතුරු සැකසුම හා සංඛ්‍යාත්මක මොඩලිංවල පුහුණුව සඳහා මෙම විද්‍යාගාරය පරිහරණය කරනු ලබයි.
- පරිගණක විද්‍යාගාරය I:
  සිසුන් 80 දෙනෙකුට එකවර පහසුකම් සැපයීමේ හැකියාව මෙම විද්‍යාගාරය සතු වේ.
- පරිගණක පර්යේෂණ විද්‍යාගාරය:
  සිසුන් 06 දෙනෙකුට පරිගණක විද්‍යාව පිළිබඳ පර්යේෂණ කරගෙන යෑම සඳහා මෙම විද්‍යාගාරය සංවර්ධනය කරන ලදි.
- දත්ත විද්‍යා ඒකකය:
  විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 20වැනි සංවත්සර සැමරුම වෙනුවෙන් මෙම ඒකකය 2016 ඔක්තෝම්බර් 09වැනි දින විවෘත කරන ලදී. පරිගණක 15කින් සමන්විත මෙම ඒකකයට ඉහළ ධාරිතාවකින් යුතු පරිගණක මිලදී ගැනීමට කටයුතු යොදා ඇත.
- රසායනික විද්‍යාගාරය:
  විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව, පරිසර විද්‍යාව හා විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාවේ රසායනික පංති මනා ලෙස පවත්වා ගෙන යෑම පිණිස අවශ්‍ය විදුරු භාණ්ඩ හා පරිහරණ ද්‍රව්‍ය මිලදී ගෙන ඇත.
- පාෂාණ හා පාංශු යාන්ත්‍රික විද්‍යාගාරය:
  වර්තමානය වනවිට මෙම විද්‍යාගාරය සංවර්ධනය කෙරෙමින් පවතින අතර එය එලෙස සංවර්ධනය වූ පසු විද්‍යාපති උපාධි සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා මෙන්ම ජනතා සේවාවන් සඳහා ද යොදා ගනු ඇත.
- තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය:
  සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර එහි කටයුතු අවසන් වූ පසු සිසුන් 75කට එකවර පහසුකම් සැපයිය හැකිවේ. තොරතුරු තාක්ෂණ විද්‍යාපති හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා හදාරණ සිසුන්ගේ පරිහරණය සඳහා මෙය භාවිත කෙරේ.

අනාගත සැලසුම්

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැක්ම සහ මෙහෙවරට අනුගතවන පරිදි ඉදිරි වර්ෂ කිහිපය සඳහා කටයුතු සැලසුම් කොට ඇත. නොවැම්බර් 11වැනි දින පැවැත් වූ කළමනාකරණ මණ්ඩලයේ 138වැනි රැස්වීමේදී, වැඩමුළු, සමුළු, විභාග, දේශන පැවැත්වීම සඳහා අවශ්‍ය කරන උපකරණ හා අනෙකුත් භාණ්ඩ 2018 වසරේදී මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද එම භාණ්ඩ ලැයිස්තුව පහත දැක්වේ.

අධ්‍යයන මණ්ඩලය	**ඉල්ලුම් කළ උපකරණ**
1 සංඛ්‍යාන හා පරිගණක විද්‍යා	පරිගණක
2 ජෛව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව	විද්‍යාගාර කොලරිමීටර්
3 රසායන විද්‍යාව	අල්ට්‍රාපියෝ ජල පද්ධතිය
4 භූතුවි විද්‍යා	භූ විදුලි රෙසිස්ටිවිටි උපකරණ
5 පරිසර විද්‍යා	එක්ස්රේ යන්ත්‍රය
6 ගණිත	මල්ටිමීඩියා හා ලැප්ටොප්
7 භෞතික විද්‍යා	ඔටෝලැබ්
8 ශාක විද්‍යා	ස්ටීරියෝ මයික්‍රස්කෝප්
9 විද්‍යා අධ්‍යාපනය	මල්ටිමීඩියා ඒකක (07) හා ලැප්ටොප් (06)
10 සත්ව විද්‍යා	බයිනෝක්‍යුලර් මයික්‍රස්කෝප්
11 පොදු උපකරණ ලැයිස්තුව	1 විඩියෝ කන්පැරන්සිං පද්ධතිය 2 ඉලෙක්ට්‍රිකල් හීටර් බ්‍රෆ්ට් සෙට් 3 මෘදුකාංග පැකේජය 4 ස්මාර්ට් වයිට්බෝඩ් (02) 5 ඩොකියුමන්ට් කැමරා (01) 6 ගිණුම් පැකේජය

පහත දැක්වෙන සුවිශේෂී ඉලක්ක ජයගැනීම සඳහා 2018 වසරේදී ක්‍රියාකරනු ඇත.

- ඉල්ලුමක් පවතින උපකරණ මිලදී ගෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන පරිදි උපකරණ විද්‍යාගාර පුළුල් කිරීම තුළින් ඒවා තවදුරටත් සංවර්ධනය කිරීම
- විද්‍යාගාර හතරක්, ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානයක්, ආපන ශාලාවක්, කාර්ය මණ්ඩල කාමර, සාකච්ඡා කාමර, පාඩම් කිරීමේ කාමර හා සමුළු කාමර ආදියෙන් යුත් නව ගොඩනැගිල්ලට අවශ්‍ය ලී බඩු සහ වෙනත් පහසුකම් ලබාගනු ඇත.
- විද්‍යාපති, දර්ශනපති, හා දර්ශනශූරී උපාධි සඳහා ලියාපදිංචි කරන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම
- ජාතික වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් මතුවන ඉල්ලුමට සරිලන පරිදි නව විද්‍යාපති වැඩසටහන් හඳුන්වාදීම
- අලුතෙන් ස්ථාපිත කළ දත්ත විද්‍යා ඒකකය හරහා ජාතියට සේවාවක් සැපයීම
- වඩා වැඩි විදෙස් වෘත්තිකයන්ගේ සහභාගිත්වයෙන් මෙම ආයතනයේ පර්යේෂණ සමුළුව හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම
- වෙනත් ජාතික හා ජාත්‍යන්තර ආයතන සමග අවබෝධතා ගිවිසුම් ස්ථාපිත කිරීම
- විදෙස් ආයතන/විශ්වවිද්‍යාල සමග තවදුරටත් සහයෝගිතාවන් ශක්තිමත් කරගැනීම
- ජාතික අවශ්‍යතා පරිදි පර්යේෂණ වැඩසටහන් පුළුල් කිරීම
- මෙම ආයතනයට නව සේවක තනතුරු නිර්මාණය කිරීම
- අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කරවීම
- පවතින පද්ධති සමාලෝචනය කිරීම හා ක්‍රියාපටිපාටියක් සැකසීම (SOP)
- ආයතනයේ ගිණුම් අංශය සඳහා උසස් ගිණුම් මෘදුකාංග පැකේජයක් ස්ථාපිත කිරීම

3.10.3 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ජේ. එම්. ආනන්ද ජයවික්‍රම)

හැඳින්වීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සකස් කළ පනතින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වසරේදී ස්ථාපිත කරන ලද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. මෙම ආයතනය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපනයේ පර්යේෂණ හා නිර්මාණශීලී චින්තනයේ සහ සමාජයට යම් මෙහෙවෙරක් ඉටුකිරීමේ මහඟු හැඟීමෙන් යුතු සාරගර්භ නිදහස් චින්තනයකින් හෙබි දැනුම වඩා වර්ධනය කර ගැනීම සඳහා කැපවූ උගතුන් බිහි කරන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉලක්කය වේ.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභිප්‍රාය වනුයේ,

- සමාජයේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අවශ්‍ය කරන වෙනත් කවර හෝ අධ්‍යයන ක්ෂේත්‍රයන් සමග සහයෝගිතාවයෙන් යුතුව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්ට උසස් අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ලබාදීම
- බුද්ධිමතුන්, වෘත්තිකයන්, සේවායන්, කර්මාන්තකරුවන්, ප්‍රතිපත්ති සැලසුම්කරුවන් සහ වෙනත් පාර්ශවකරුවන් අතර වඩා යහපත් වූ අන්තර් ක්‍රියාකාරිත්වයකින් යුතුව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්ට අදාළ උසස් අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ලබාදීම පහසු කරලීම
- ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් තුළින් පර්යේෂණවල ඵලදායිතාවය හා උසස් ගුණාත්මකභාවය පවත්වා ගනිමින් ආයතනයේ පශ්චාත් උපාධි හදාරණ සිසුන් හා වෙනත් පර්යේෂකයන් විසින් භාරගත් පර්යේෂණයන් කරගෙන යෑමට දිරිදීම සහ සහය දැක්වීම
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්ගේ සියලුම අංශයන් කෙරෙහි උනන්දුවන/ වගකීමක් සහිත දෙස් විදෙස් පුද්ගලයන්, කණ්ඩායම් හා සංවිධාන සමග උසස් අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් පිළිබඳ ඵලදායි සබඳතාවන් ස්ථාපිත කර ගැනීම
- සමාජයේ යහපත උදෙසා සමාලෝචන සැසි, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ, සමුළු පවත්වමින් සහ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශනය පහසුකරවීම තුළින් දැනුම ව්‍යාප්ත කරලීම සහ බෙදාහදා ගැනීම
- මෙම ආයතනය වර්තමානය වනවිට පහත සඳහන් උපාධි වැඩසටහන් පවත්වයි.
  පශ්චාත් උපාධි ඩිප්ලෝමා
  ශාස්ත්‍රපති උපාධිය
  ව්‍යවහාරික ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය
  අධ්‍යාපනපති
  සංවර්ධන භාවිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
  දර්ශනපති උපාධිය
  දර්ශනශූරී උපාධිය

  අරාබි, ගිණුම්කරණය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යාපනය, තුලනාත්මක ආගම්, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, ඉංග්‍රීසි, ලලිත කලා, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝමානු අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ජාත්‍යන්තර සබඳතා, ඉස්ලාම් ශිෂ්ටාචාරය, නීතිය, කළමනාකරණය, පාලි භාෂාව, දර්ශනය, දේශපාලන විද්‍යාව, මනෝවිද්‍යාව, සංස්කෘත භාෂාව, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, සංඛ්‍යානය හා දෙමළ භාෂාව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ලබාදෙනු ලබන පුහුණුවට ඇතුළත් වන ක්ෂේත්‍රයන්ය.

ජයග්‍රහන

ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා 2015 මැයි මස පත්කළ දා සිට මෙවන් ආයතනයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම පිළිඹිබු කරමින් අතිවිශාල වූ වර්ධනයක් පෙන්නුම් කොට ඇත. මෙම ආයතනය සඳහා කළමනාකරණ මණ්ඩලයක් හා අධ්‍යයන මණ්ඩල පිහිටුවා ඇති අතර මේ වනවිට ඒවා ක්‍රියාකාරීව පවති. 2015/2016 අධ්‍යයන වර්ෂයට පෙර පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ශාස්ත්‍ර පීඨයේ ලියාපදිංචිව සිටි ශාස්ත්‍ර පීඨයේ සිසුන් 2764 දෙනෙකු මෙම ආයතනය වෙත ඇඳබැඳ ගැනීමට හැකිවී ඇත. මෙම වසර තුළ සිසුන් 500 දෙනෙකු පමණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි අවසන් කොට ඇත.

නොර්වේ සවුත්ඊස්ට් විශ්වවිද්‍යාල පීඨය සමඟ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අරමුදල් ලබා ගැනීම සඳහා 2016 වසරේදී NORPART වෙත බාරදුන් යෝජනාවට ප්‍රතිචාර වශයෙන් බහු සංස්කෘතික සමාජයක මානව හිමිකම් හා සහජීවනය යන තේමාව යටතේ වන ව්‍යාපෘතියට මූල්‍ය සහයෝගය ලැබී ඇත. 2018 ජනවාරි මාසයේදී ආරම්භ කොට අවුරුදු පහක කාලයක් තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. ශිෂ්‍ය චලාතාව, කාර්ය මණ්ඩල චලාතාව, වැඩසටහන් සංවර්ධනය, පර්යේෂණ හා සමාජ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ. මෙම ආයතනය මේ වනවිටත් චිරස්ථායී සංචාරක ව්‍යාපාරය මෙන්ම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබාගෙන ඇත. වෙනත් වැඩසටහන් කිහිපයක් සංවර්ධනය කිරීම සඳහා ආයතනයේ අදාළ කමිටු ක්‍රියාත්මක වෙමින් පවතී.

අනාගත සැලසුම්

ආයතනය තුළ දැනට පවතින අධ්‍යයන පාඨමාලාවන්ට පහසුවෙන් පිවිසිය හැකි මාර්ග පුළුල් කරමින් හා අන්තර් ක්ෂේත්‍ර හා බහු ක්ෂේත්‍රයන් තුළ නව පාඨමාලා හඳුන්වාදෙමින්, ආයතනය එහි පශ්චාත් උපාධි පාඨමාලා පුළුල් කොට විවිධාංගිකරණයට සැලසුම් සකස් කරමින් සිටී. සමාජයේ සුවිශේෂී අංශයන්හි හා අර්ථිකයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නව උපාධි පාඨමාලා හඳුන්වාදෙනු ඇත. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2017 වසර තුළ චිරස්ථායී සංචාරක ව්‍යාපාරය, ජාත්‍යන්තර සබඳතා, සමාජ වැඩ, ප්‍රජා සංවර්ධනය, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අධ්‍යයනය, පරිසර කළමනාකරණ, කලාපීය සංවර්ධනය හා සැලසුම, භාෂා පරිවර්තන අධ්‍යයනය, තුලනාත්මක අධ්‍යයනය, රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති හා කළමනාකරණය, ප්‍රමාණාත්මක ආර්ථික විද්‍යාව, සෞඛ්‍යමය ආර්ථික විද්‍යාව ආදි මූලික පියවර ගෙන ඇත. ඉදිරි වර්ෂ 5ක කාලය තුළ මෙම පාඨමාලා හඳුන්වා දෙනු ඇත.

ආයතනයේ පශ්චාත් උපාධි හදාරන සිසුන් ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් හරහා ඉදිරිපත් කරන ඵලදායී හා උසස් ගුණාත්මකබවින් යුතු පර්යේෂණ සිදු කිරීම පිණිස ඔවුන් දිරිගැන්වීම සඳහා වඩ වඩාත් සම්පත් හා පහසුකම් සැපයීමට ආයතනය කැමැත්ත දක්වයි. ආයතනය වර්තමානය වනවිටත් පර්යේෂණයේ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලි සිටින ආකාරය අනුව මෙම උත්සාහය තුළින් එය තව තවත් පුළුල් වනු ඇත. සිසුන් හා කාර්ය මණ්ඩල විසින් සිදු කරන පශ්චාත් උපාධි හා පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිම්වළලු පුළුල් කිරීම සඳහා උනන්දු වන හෝ වගකීමෙන් කටයුතු කරන දෙස් /විදෙස් පුද්ගලයන් හෝ කණ්ඩායම් හා ප්‍රසිද්ධ සංවිධාන සමග උසස් අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සමග ඵලදායි සබඳතා ගොඩනගා ගැනීමට මෙම ආයතනය අභිරුචියක් දක්වයි. අපගේ උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය හා ඒවායේ බලපෑම ඉහළට ඔසවා තැබීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගලික අංශය, හා වෙනත් උසස් අධ්‍යාපන හා පුහුණු ආයතන සමග සබඳතා හා සහයෝගිතාවන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම විදෙස් ආයතන සමග සබඳතා හා සහයෝගිතාවන් ගොඩනගා ගැනීම තුළින් පිටරටවල අපගේ උපාධි පාඨමාලා අලෙවි කිරීමට හා අපගේ සිසුන්ට විදෙස් පුහුණුව හා අත්දැකීම් ලබාදීම සඳහා අවස්ථාව උදාවේ. ලබාගත් දැනුම හා නව නිපැයුම් විසරණය නොවූ කල එයින් සමාජයට අත් වන්නේ අල්ප වූ බලපෑමකි. මේ නිසා මෙම අඩුපාඩුව දුරු කරනු පිණිස සමාලෝචන සැසි, සම්මන්ත්‍රණ, සමුළු පවත්වමින් සමාජයේ යහපත පිණිස එවැනි දැනුම විසරණය හා හුවමාරු කර ගැනීමට අවශ්‍ය පියවර ආයතනය විසින් ගනු ලබනු ඇත.

3.11 පේරාදෙණිය විශ්වවිද්‍යාලීය පුස්තකාල ජාලය

(වැඩබලන පුස්තකාලයාධිපති - ආර්. මහේස්වරන්)

හැඳින්වීම

කොළඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යා පීඨ පුස්තකාලය ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය 1921 වසරේදී ආරම්භ කිරීමෙන් අනතුරුව 1952 වසරේදී එය දැනට පිහිටා තිබෙන පරිශ්‍රයට ගෙන එන ලදී. පේරාදෙණියට ගෙන ඒමෙන් අනතුරුව ප්‍රධාන පුස්තකාලය, කෘෂිවිද්‍යා, සම සෞඛ්‍ය, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨවල පිහිටා ඇති ශාඛා පුස්තකාලවලින් යුතු පුස්තකාල ජාලයක් බවට සංවර්ධනය වී ඇත. නවවන ශාඛා පුස්තකාලය කෘෂි විද්‍යා පීඨයේ මහඉලුප්පල්ලම උප මණ්ඩපයට අනුයුක්ත කොට ඇති අතර අනෙකුත් ශාඛා පුස්තකාල අදාළ පීඨයන්හිම පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ පැරණිම හා විශාලතම පුස්තකාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලයයි.

මෙම පුස්තකාලයේ දැක්වෙන මෙහෙවර සහ ඉලක්ක පිළිබඳ දැනගැනීම පිණිස කරුණාකර http://www.lib.pdn.ac.lk/aboutus/vision.mission.php.about වෙත පිවිසෙන්න.

ජයග්‍රහණ

විශ්වවිද්‍යාල පුස්තකාලයට ලැබෙන අතිවිශාල වූ පොත් ප්‍රමාණය තැන්පත් කිරීමත්, පාඨකයාට වඩා යහපත් වූ පහසුකම් හා සේවාවන් සැපයීම සඳහාත් එහි ධාරිතාවය පුළුල් කිරීම පිණිස ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ලට ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

එම ගොඩනැගිල්ලට මුල්ගල තැබීමේ උත්සවය උපකුලපති මහාචාර්ය උපුල් බී දිසානායකගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු 18දින සිදුකරන ලදී. එය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය වෙනුවෙන් පුස්තකාල ජාලය අත්කරගත් සුවිශේෂී වැදගත් ජයග්‍රහණයකි.

KOHA සංසරණ මොඩියුලය එහි පළමු පියවර වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මේ වසරේදී සාර්ථකව දියත් කරන ලදී. ඉන් අනතුරුව එය ප්‍රධාන පුස්තකාලයේ සේවාව ලබාගන්නා වූ පුස්තකාලය පරිහරණය කරන ඉතිරි පිරිස සඳහා ක්‍රියාත්මක වනු ඇත. උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක විසින් අගෝස්තු 10දින සංස්රණ මොඩියුලය ක්‍රියාත්මක කරන ලදී. ආයතනික කෝෂ්ඨාගාරය හෙවත් ඩිජිටල් පුස්තකාලය සාර්ථකව පවත්වාගෙන යන අතර D ස්පෙස් මෘදුකාංගය යොදාගනිමින් යාවත්කාලීන කරන අතර උපුටන 5700ක් එහි අඩංගුවේ. පේරාදෙණිය පුස්තකාල ජාලය ලංකාවේ අනෙකුත් පුස්තකාල අතුරින් ප්‍රථම ස්ථානයේ රැඳී සිටීමට මෙම ඩිජිටල් පුස්තකාල ජාලය ප්‍රධාන වශයෙන් දායක වූ සාධකය විය. පසුගිය වසරේ වාර්ෂික වාර්තාවේ සඳහන් කළ පරිදි මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ පුස්තකාලය ඇතුළු අනෙකුත් සියලුම පීඨ පුස්තකාලවල තොග හරි වැරදි බැලීම සාර්ථකව අවසන් කරන ලදී. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකා සුරේණී වීරසිංහ මිය කොළඹ විශ්ව විද්‍යාලයේ පුස්තකාලය හා තොරතුරු විද්‍යා ජාතික ආයතනය විසින් ප්‍රදානය කළ පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධිය සාර්ථකව අවසන් කළාය. ආචාර්ය සී. එන්. කේ.අලහකෝන් මහත්මිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ සභාපති ලෙස 2017/2018 වසර සඳහා තෝරාගෙන ඇති අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යයන පුස්තකාල කණ්ඩායම මෙහෙය වීමට හා සම්බන්ධීකරණය කිරීමට ද ඇයව තෝරාගෙන ඇත.

බාධක සහ පිළියම්

නව පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණයේ මූලික සැලසුම සම්බන්ධයෙන් හටගත් සමහර ප්‍රතිවිරෝධතාවයන් හේතුවෙන් එහි ගොඩනැගිල්ලේ කටයුතු ආරම්භ කිරීම සුළු වශයෙන් ප්‍රමාද විය.

ස්වයංක්‍රීය සංසරණ මොඩියුල් සේවාව වර්තමානය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පමණක් ක්‍රියාත්මක වන හෙයින් එම සේවාව විශ්වවිද්‍යාලයේ අනෙකුත් ප්‍රජාව වෙත විශේෂයෙන්ම සිසුන් වෙත ලබාදීම ඉදිරියේ ඇති කර්තව්‍යයයි. සංකේත යෙදූ පොදු හැඳුනුම්පත සකස්කළ වහාම එම පහසුකම් සිසුන්ට හා අනෙකුත් පාඨකයන් වෙත ද ලබාදීමට කටයුතු කෙරේ.
පුස්තකාලය ස්වයංක්‍රීයකරණය මුහුණු පෑමට සිදුවූ ප්‍රායෝගික ගැටලු කිහපයක් හේතුවෙක් ප්‍රමාද විය. දුම්බර කෘති එකතුව හැර අනෙකුත් සියලුම පරිහරණය සඳහා ලබාදෙන කෘතිවලට සංකේත අංක යෙදීම අවසන් කරන ලදී. දුම්බර කෘති එකතුවෙහි සංකේත අංක යෙදීම පේරාදෙණිය සංකේත අංක යෙදීමේ වර්ගීකරණයට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒ අනුව පේරාදෙණිය ක්‍රමයට අනුගත වන ආකාරයට දුම්බර කෘති එකතුව වර්ගීකරණය කිරීමට පුස්තකාල කළමනාකරණය තීරණය කොට ඇත. පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කරන ව්‍යාපෘතිය ප්‍රමාදවීමට මෙම කාරණය බලපා ඇත. දුම්බර කෘති එකතුව සංස්කරණය කිරීම හා සංකේත අංක යෙදීමේ ක්‍රියාවලිය සීඝ්‍රයෙන් සිදුවේ.

වෙබ් සේවාවන් අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලය ප්‍රථම ස්ථානයේ පසු වුවද ඩිජිටල් පුස්තකාල ජාලය එම ස්ථානය කරා ළඟාවීමට තවමත් වෙහෙස දරමින් සිටී. මෙම කාර්යය සාක්ෂාත් කරගනු වස් අපගේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හා පර්යේෂකයන්ගේ සහයෝගය ඇතිව තව තවත් පර්යේෂණ ප්‍රකාශන උත්පාදනය කළ යුතුව ඇත.

ප්‍රධාන පුස්තකාලයේ සහා ශාඛා පුස්තකාලවල (පීඨ) තොග ගණනය අවසන් කළ ද අස්ථානගතව පවතින ද්‍රව්‍යයන් නිවැරදි කිරීමට පුස්තකාල කළමනාකරණයට හා කාර්ය මණ්ඩලයට මෙතෙක් නොහැකි වී ඇත. අතීතයේ යම් යම් අවධීන්වල පරිග්‍රහණ ලේඛන පවත්වාගෙන නොයෑම මෙම කාරණයට බලපෑ ප්‍රධාන හේතුවයි. පරිග්‍රහණ ලේඛන හඳුන්වාදීමෙන් අනතුරුව මෙම ගැටලුව මෑත කාලයේදී නිවැරදි කොට ඇත.

4. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක

4.1 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - ආචාර්ය ජනක විජයකුලසූරිය)

හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 2014 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ප්‍රථම උපාධි සිසුන්ගේ සහ විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් අනෙකුත් සාමාජිකයන්ගේ තොරතුරු සන්නිවේදන කුසලතා දියුණු කර ගැනීම සඳහා අවස්ථාව උදාකරදීම මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණුවලින් එකකි. මෙම මධ්‍යස්ථානය විසින් සැලසුම් කොට පවත්වනු ලබන අර්ධ කාලීන හා නිත්‍ය පුහුණු වැඩසටහන් රාශියක් තුළින් මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිතයි.

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පරිගණක 320ක් ස්ථානගත කළ හැකි පරිදි සැලසුම් කොට ඇත. එම පරිගණක VLAN කිහිපයකට සම්බන්ධ වන්නේ තත්පරයට මෙගාබයිට්ස් 1000ක ධාරිතාවයකින් වන අතර එක් පරිගණකයනට තත්පරයට මෙගා බයිට්ස් 100 ලැබේ. වර්තමානය වන විට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පයිල් සර්වරයකින්, වෙබ් සර්වර්, මේල් සර්වර්, ප්‍රොක්සි සර්වර්, ඩේටා සර්වර්, කන්ටෙන්ට් මැනේජමන්ට් සර්වරයකින් යුක්තවේ. අන්තර්ජාල සම්බන්ධතාවය තත්පරයට මෙගාබයිට්ස් 20කි. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය හරහා අන්තර් ජාලය සඳහා තත්පරයට මෙගාබයිට් ධාරිතාව එකකි. අන්තර් ජාල සබඳතාවය සඳහා එක් ADLS රැහැනක් ද ඇත.

ජයග්‍රහණ

තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය විශ්ව විද්‍යාලයේ පාලක සභාව හා සනාතන සභාව විසින් අනුමත කොට ඇති අතර එම පාඨමාලාව 2018 වසරේ ජනවාරි මාසයේ සිට පැවැත්වීමට සැලසුම් කෙරේ.
ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට තොරතුරු සන්නිවේදන වැඩසටහන් හා සාමාන්‍ය ජනතාව වෙනුවෙන් කෙටි පාඨමාලා පැවැත්වීම අඛණ්ඩව කරගෙන යනු ලබයි. පෙර වසර සමග සංසන්දනය කර බලීමේ දී අභ්‍යන්තර සිසුන් වෙනුවෙන් කෙටි කාලීන පුහුණු වැඩසටහන් රාශියක් පවත්වා ඇත.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මාර්ගගත (Online) විසරණය සඳහා පහත සඳහන් පහසුකම් ස්ථාපිත කොට ඇත.

1. මල්ටිමීඩියා කාමරය
2. කලා දේශන කාමරය

බාධක සහ පිළියම්

අභ්‍යන්තර සිසුන් සඳහා පැවැත්වූ තොරතුරු සන්නිවේදන කුසලතා මූලික පාඨමාලාව නවතා දමන ලදී. කෙසේ වෙතත් ඒ වෙනුවෙන් යෝජිත තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන හඳුන්වා දෙනු ඇත.

අනාගත සැලසුම්

ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට මෙන්ම සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් ද මෙම මධ්‍යස්ථානයේ සේවාවන් පුළුල්ව ලබාදීමට අපේක්ෂිතයි.

4.2 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය

(අංශ ප්‍රධාන - ඒ. එන්. එම්. සල්ගාදු මහතා)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන සහායක අංශයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වනුයේ ප්‍රථම උපාධි සිසුන්ට අධ්‍යයන වෘත්තීමය හා සාමාන්‍ය කටයුතු සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමයි. මෙම ඒකකය පීඨ නවය වෙනුවෙන්ම ඉංග්‍රීසි පාඨමාලා පවත්වන අතර වර්තමානය වනවිට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය විවිධ මට්ටමින් පිරිනමනු ලබන ඉංග්‍රීසි පාඨමාලා සඳහා සිසුන් 15,000ක් පමණ ලියාපදිංචි වී ඇත. අදාළ පීඨවල අවශ්‍යතාවන්ට අනුව ප්‍රථම, දෙවන හා තෙවන වසරවලදී පාඨමාලා පවත්වනු ලබයි. මෙලෙස පවත්වනු ලබන ඉංග්‍රීසි පාඨමාලා දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි, විශේෂ කටයුතු සඳහා ඉංග්‍රීසි හා ශාස්ත්‍රීය කටයුතු සඳහා ඉංග්‍රීසි ලෙස හැඳින්වේ.

ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දෙමින් ප්‍රථම උපාධි අපේක්ෂකයන් බලගන්වනු ලබන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වේ. සිසුන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි හා අනාගත වෘත්තීන්හි නියැලීමේදී කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා දියුණු කිරීම අපගේ මෙහෙවර වේ. මුල්කාලීනව මෙම ඒකකය ප්‍රධාන ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ කොටසක් ලෙස සලකන්නට වූ අතර එය ස්වාධීන ඒකකයක් ලෙස 1987 වසරේ දී ස්ථාපිත කරන ලදී.

පාසැල් මට්ටමින් තම මව් භාෂාවෙන් අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තෘතීය මට්ටමේදී ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට හැකිවන පරිදී ඉංග්‍රීසි භාෂා පන්ති පැවැත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ වගකීම වේ. මෙම ඒකකය විසින් දෙයාකාරයක පාඨමාලා පවත්වනු ලබයි. විශ්වවිද්‍යාලයට ඇතුළත්වන අවස්ථාවේ කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව හදාරන සිසුන්ට ඔවුන්ගේ උපාධි පාඨමාලා ආරම්භ කළ විට එම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට අවශ්‍ය මූලික නිපුණතාව ලබාදෙයි. කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව අවසන් වීමෙන් අනතුරුව දෙවනුව අඛන්ඩ ඉංග්‍රීසි පාඨමාලාව ආරම්භ වේ. සාමාසික ක්‍රමය විශ්වවිද්‍යාලයට හඳුන්වාදීමෙන් අනතුරුව කඩිනම් යන වචනය භාවිත නොකෙරේ. ඒ කෙසේ වෙතත්, සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අවස්ථාවේ සිට ඉංග්‍රීසි භාෂා පාඨමාලා ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ පළමු කොටස සති 10ක කාලයක් පුරා පැවැත්වෙන අතර ඒ ඒ පීඨවල අවශ්‍යතා හා නිර්දේශයන්ට අනුව එම කාලය වෙනස් විය හැකිය. අඛණ්ඩ ඉංග්‍රීසි පාඨමාලාවන්ගේ කාල පරාසය අවුරුදු 1-3 දක්වා වෙනස් වේ.
පළමු සමාසික දෙක අවසානයේ පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සිසුන් ඉංග්‍රීසි භාෂා පංතිවලට සහභාගි වීම අනිවාර්ය වන අතර 80% ක පැමිණීමක් තිබිය යුතුය. ඉංග්‍රීසි පංතිවලට නොකඩවා පැමිණීම තුළින් මනා දැනුමක් ලබාගත හැකි අතර එම පංතිවලට සහභාගි වී සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුනතාව වැඩිදියුණු කර ගැනීමට දිරිගැන්වීම ද කරනු ලබයි. ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලට සහභාගිවීම සඳහා එම භාෂාවට “A” සාමාර්ථයක් ලබා ගැනීම අනිවාර්ය වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය කාර්ය මණ්ඩලය හා සිසුන් වෙනුවෙන් ඉංග්‍රීසි වැඩමුළු පැවැත්වීම සඳහාත් මෙම ඒකකයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහාත් ලෝක බැංකුව විසින් පිරිනමනු ලබන HETC ප්‍රදාන යොදා ගනු ලබයි.

ජයග්‍රහණ

HETC වැඩසටහන ක්‍රියාත්මක කිරීම

බාධක සහ පිළියම්

මෙම ඒකකයේ ආචාර්යවරුන්/උපදේශකයන් හට වෙනත් විශ්වවිද්‍යාලවලින් පරිවාස කථිකාචාර්ය තනතුරු ප්‍රදානය කිරීම හේතුවෙන් ගුරු හිඟය අප මුහුණ පා සිටින ප්‍රබල බාධකයකි.

අනාගත සැලසුම්

HETC වැඩසටහන සියලු පීඨවල පූර්ණ වශයෙන් දියත් කිරීම.

4.3 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ඩී. ඒ. එන්. ධර්මසේන)

හැඳින්වීම

දැනට වර්ෂ දොළහක් (12) වන වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය 2005 වසරේදී ස්ථාපිත කරන ලදී. සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකගේම සැඟවී තිබෙන හැකියාවන් ඉස්මතු කොට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සංවර්ධනය කිරීම මෙන්ම ජීවිතයේ සෑම පැතිකඩක්ම සහ අනාගතය ගොඩනැගීමට දායක වන ඉඩප්‍රස්ථාවන් උදාකර දීම, සමාජයට හා ජාතික වශයෙන් සෙත සැලසෙන්නා වූත් පුද්ගලික, අධ්‍යාපනික, ආර්ථික හා සමාජ ප්‍රගමනයට මංපෙත් විවර කිරීමට දායක වන්නටත් සිසුන්ගේ අත්‍යාවශ්‍ය කුසලතා සංවර්ධනය කරගැනීම පිණිස අවශ්‍ය වන නිසි ක්‍රියාමාර්ග සැලසුම් කරගැනීමට සිසුන්ව පුහුණු කිරීම හා ඔවුන්ගේ හැකියාවන් අවබෝධකර ගැනීමට සහාය වීම මෙම ඒකකයේ ප්‍රධාන කෘත්‍යයන් වෙයි. තවද, මෙම වර්ෂය තුළ ඉල්ලීම් ලැබෙන පරිදි සිසුන්ට හා විශ්වවිද්‍යාල සේවකයන්ට මනෝවිද්‍යා උපදේශනය ලබාදීම දක්වා මෙම ඒකකයේ සේවාවන් පුළුල්කොට ඇත. බාහිර වැඩ ලෝකයේ සහයෝගය ඇතිව පීඨ හා අධ්‍යයන දෙපාර්තමේන්තු සමග සහයෝගිතාවයෙන් යුතුව අපගේ දැක්ම කරා ළඟාවීම අපගේ වාර්ෂික සැලසුමේ විෂයපථය විය. සමාලෝචන වර්ෂයේදී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ සේවාවන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පැවති අතර ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු 27ක්, ස්වයං රැකියා දිශානුයෝජන ව්‍යාපෘති, සම්මන්ත්‍රණ හා දේශන පවත්වන ලදී. තවද, මෙම ඒකකය ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව උපාධිධාරීන් හා උපාධි අපේක්ෂකයන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති 13ක් ආරම්භ කරන ලදී. ඉහත කරුණුවලට අමතරව මෙම ඒකකය චිත්තවේගී කම්පනයක් නිසා මනෝවිද්‍යා උපදේශනය අවශ්‍ය කළ බොහෝ සිසුන් පිරිසකට එම සේවාවන් ලබාදීම සහ ඔවුන්ගේ අධ්‍යයන ක්‍රියාවලියට හා ජීවන අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය කරන නිපුණතාවයන් සංවර්ධනය කරදීමට පහසුකම් සැලසීම අතිසාර්ථකව සිදුකරන ලදි.

සියලුම පීඨවල සිසුන්ගේ සහභාගිත්වයෙන් යුතුව රොබරෝසියා නමින් ශිෂ්‍ය සංගමයක් ස්ථාපිත කිරීමට මෙම ඒකකයට හැකි වූ අතර එතුළින් ශිෂ්‍ය සුභසාධනය සඳහා සම සහායක නායකයන්ට කණ්ඩායමක් ලෙස සේවය ලබාදීමට හැකිවනු ඇත. මෙම ඒකකය යටතේ සමාජ සේවකයන් ලෙස කටයුතු කිරීමට එම සාමාජිකයන් පුහුණු කරන ලදී. තවද වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන ඒකකය විශ්වවිද්‍යාලය වෙනුවෙන් කර්මාන්ත ඉන්කියුබේටරයක් ස්ථාපිත කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ අතර ඒ පිළිබඳ යෝජනාවක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට බාරදී එහි කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවති.

එමෙන්ම වෘත්තීය මාර්ගෝපදේශන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ඉන්දු ශ්‍රී ලංකා පදනමෙන් ප්‍රදානයක් ලබා ගැනීමට තරම් මෙම ඒකකය වාසනාවන්ත විය. එම ප්‍රදාන යොදාගනිමින් එහි සාමාජිකයන් තිදෙනෙකුට ජාත්‍යන්තර පුහුණුව ලබාදුන් අතර ඔවුන් එම දැනුම සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව වෙනුවෙන් වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් ලබාදීමේ අදහසින් පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකයන් අතර හුවමාරු කරගන්නා ලදී.

උපකුලපති විසින් 2017 වසරේ දී වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කරන ලද අතර එතුළින් මෙම ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් විධිමත් කරනු ඇත. ඒමෙන්ම මෙම ඒකකය 2017 වසරේදී ප්‍රථම වතාවට වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක මණ්ඩලයේ අවසරය ඇතිව පීඨ සම්බන්ධීකාරක කමිටුවක් පිහිටුවීමට සමත්විය.

තවද මෙම ඒකකය 2017 වසරේ උපාධි ප්‍රදාන උත්සවය අවසන් වූ විගස රැකියා පොළක් පැවැත්වූ අතර ඒ සඳහා සිසුහු 600ක් සහභාගි වූහ.

ජයග්‍රහණ

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2017 වසරේදී ක්‍රියාකාරකම් 26ක් පැවැත්වූ අතර ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

- ඉංජිනේරු, කලා, කළමනාකරණ, කෘෂිවිද්‍යා, විද්‍යා හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල නවක සිසුන් සඳහා දිශානුයෝජන වැඩ සටහන
- විද්‍යා පීඨයේ ප්‍රතිරූප ගොඩනැගීමේ වැඩ සටහන
- CADD සේවර් ලංකා පුද්ගලික සමාගම සමඟ සහයෝගිතාවයෙන් කෘෂිවිද්‍යා පීඨයේ සිසුන් සඳහා පරිගණක ආධාරක සැලසුම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- විද්‍යා පීඨය වෙනුවෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ 2017 වසරේ තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වාදීමේ වැඩසටහන
- කෘෂිවිද්‍යා පීඨය වෙනුවෙන් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
- කෘෂිවිද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන
- කෘෂිවිද්‍යා පීඨයේ තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන
- ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා සම්මුඛ පරීක්ෂණ නිපුණතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව
- අනුරාධපුර IPHT පර්යේෂණ නිලධාරීන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන
- මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ ප්‍රථම වසර සිසුන් සඳහා සාර්ථක අනාගතයක් සඳහා උපදේශනය
- කම්කරු හා වෙළඳ සංගම් සබඳතා අමාත්‍යාංශයේ සහයෝගිතාවය ඇතිව ‘‘ඔබ අසිරිමත්ය’’ යන තේමාවෙන් මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ තෙදින වැඩමුළුව
- අවසන් වසර සිසුන් සඳහා ආවරණ ලිපි, ජීවදත්ත ලිවීම හා රැකියා සෙවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
- අවසන් වසර සිසුන් සඳහා ජීව දත්ත ලිවීම පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
- ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය සමග සහයෝගයෙන් ‘‘ඔබේම ව්‍යාපාරයක් අරඹන්න’’ යන මැයෙන් විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ හා උපාධිධාරීන්ගේ ව්‍යාවසායකත්ව සංවර්ධනය පිළිබඳ වැඩසටහන්
- කළමනාකරණ පීඨයේ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
- CADD සෙන්ටර් ලංකා (පුද්) සමාගම සමඟ සහයෝගයෙන් කෘෂිවිද්‍යා පීඨය සඳහා පරිගණක ආධාරක සැලසුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ජෝන් කීල්ස් සහයෝගයෙන් පීඨ පහක් ඉලක්ක කරගත් රැකියා පොළ
- ජීවදත්ත ලිවීම හා සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දෙන්නේ කෙසේද යන්න පිළිබඳ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන
- කළමනාකරණ පීඨයේ සහයෝගිතාවයෙන් වෘත්තීය සංවර්ධනය හා කාන්තා බලගැන්වීම පිළිබඳ වැඩමුළුව
- වෛද්‍ය පීඨය 2010/2011 සිසු කණ්ඩායම සඳහා සංවිධානය කළ වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණය පිළිබඳ සම්මන්ත්‍රණය
- සියලු පීඨ සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ විවෘත වැඩසටහන
- සියලුම පීඨවල සිසුන් සඳහා මනෝ වෛද්‍ය සමාජ උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන
- සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන් සඳහා උපදේශනය පිළිබඳ පුද්ගල සංවර්ධන වැඩසටහන
- ඉංජිනේරු කළමනාකරණ, සම සෞඛ්‍ය, විද්‍යා හා කලා පීඨ සඳහා දිශානුයෝජන වැඩසටහන
- බ්‍රිතාන්‍ය සභාවේ කණ්ඩායමක් සමග වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් සැලසුම්කරණය

බාධක සහ පිළියම්

වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විසින් පවත්වනු ලබන වැඩ සටහන්වල බලපෑම පිළිබඳ නියම තක්සේරුවක් මෙතෙක් සිදුකොට නොමැත. උපාධි ලබාගැනීමෙන් පසු කිසියම් සහන කාලයක් මේ කාර්යය සඳහා අවශ්‍ය වන අතර ඉදිරියේදී මෙම ක්‍රියාකාරකම ඇතුළත් කිරීමට සැලසුම් කෙරේ. තවද, මෙම ඒකකයේ වෙබ් අඩවිය අපේක්ෂා කළ පරිදි සංවර්ධනය කිරීමට නොහැකි වූ අතර එය 2018 වසරේ මුල් කාලසීමාව තුළ අවසන් කිරීමට අපේක්ෂිතයි. විවිධ පීඨවල උපාධිලාභීන් රැකියාවන්හි නියුක්ත කරලීම සම්බන්ධයෙන් මෙම ඒකකය ගත් උත්සහය අසාර්ථක විය.

අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයට ඇතුළත් වන නවක සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා ලබාගැනීමේ අවස්ථාවන් ඉහළ නැංවීම සඳහා සම්බන්ධවන මෘදු කුසලතා සංවර්ධනය කරගැනීම පිළිබඳව නවක සිසුන් දැනුවත් කිරීමේ විධිමත් හා නිත්‍ය වාර්ෂික ක්‍රියාකාරකම් මෙම ඒකකය සතුව පවතී. ඊට අමතරව වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගීතාවයකින් ස්වංරැකියා දිශානුයෝජන ව්‍යාපෘති ආරම්භ කොට ඇත.

මෙම ඒකකය ඉදිරියේ දී වඩාත් දියුණු කළ පහසුකම් හා සේවාවන් තුළින් පුළුල් වූ වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් ලබාදීමට සැලසුම් කරයි. සිසුන් දැනුවත් කිරීම හා වෘත්තීය හා සම්බන්ධ තොරතුරු සන්නිවේදනය කරගැනීම අන්තර්ජාලය හරහා සිදුවනු ඇත. මෙය පහසුකරලීම සඳහා මෙම ඒකකයේ වෙබ් අඩවිය වැඩිදියුණු කරනු ඇත. සිසුන් රැකියාවන්හි නියුක්ත කරලීම හා දත්ත මත පිහිටා වෘත්තීය සිතියම් සැකසීම පිළිබඳ පීඨ මට්ටමින් අධ්‍යයනයන් හදුන්වා දෙනු ඇත. ඒකකය ඉදිරි ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී ශිෂ්‍ය සංගම් සමග සාකච්ඡා කිරීමටත් එවැනි ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී හා වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් පැවැත්වීමේ දී ඔවුන් ඒ සඳහා ක්‍රියාකාරීව මැදිහත් කරගැනීමටත් සැලසුම් කරයි.
වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන ඒකකය ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ගේ සහයෝගය ඇතිව මානව සම්පත් පුහුණුව වැඩි දියුණු කිරීම කෙරෙහි ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය සමග සමීපව කටයුතු කරනු ඇත.

4.4 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ටෙරන්ස් මධුජිත්)

හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය 1979 වසරේ ස්ථාපිත කරන ලද බාහිර විභාග අංශය තෙක් ආපස්සට දිවයයි. සංවර්ධනයේ අදියර කිහිපයක් පසුකොට සහ විවිධ නම්වලින් හැඳින්වීමෙන් අනතුරුව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය යන නවතම නාමයෙන් යුතු වර්තමාන පරිපාලන ව්‍යුහය 2007 වසරේ අප්‍රේල් මාසයේදී ක්‍රියාත්මක වීම ආරම්භ විය. මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ඉලක්කය වනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සංයුක්ත සැලසුමෙහි සඳහන් ඉලක්ක අතුරින් එක් ඉලක්කයක් වන විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීමයි. තම වෘත්තීය ඉලක්කයන් කරා ළඟාවීමට අපේක්ෂා කරන්නන් හට සමාන අවස්ථාවන් සකසාදීම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ දැක්ම වේ. අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන්නන් හට කිසිදු බාධාවකින් තොරව එය ඉටුකර ගැනීම සඳහා අධ්‍යාපන අවස්ථාවන් සකසා දෙමින් සියලු දෙනාට අධ්‍යාපනය ලබාදීම මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර ලෙස හඳුනාගෙන ඇත.

ජයග්‍රහණ

අදාළ වර්ෂයේ දී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ඉටුකළ ප්‍රධාන ක්‍රියාකරකම් ලැයිස්තුව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය අදාළ වර්ෂයේ දී අත්කරගත් ජයග්‍රහණයන් පහත පරිදි ලැයිස්තු ගත කොට දැක්විය හැකිය.

- කළමනාකරණ හා සංවර්ධන වැඩසටහන්, ඩිප්ලෝමා, සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය- 2015/2016 මාර්තු මස 11වැනි දින සනාතන මන්දිරයේ දී පවත්වන ලද අතර එහිදී සිසුහු 75 දෙනෙක් ඩිප්ලෝමා සහතික පත්‍ර ලබාගත්හ.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (මාර්ගගත-2017) සඳහා ලියාපදිංචි වූ නවක සිසුන්ගේ දිශානුයෝජන වැඩසටහන මෙම මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේ දී සැප්තැම්බර් 24 දින පවත්වන ලදී.
- ශාස්ත්‍රවේදී උපාධියේ හා කලා යෝග්‍යතා පරීක්ෂණයේ විභාග සාර්ථකව පවත්වන ලදී.
- ශාස්ත්‍රවේදී උපාධියේ හා කලා යෝග්‍යතා පරීක්ෂණයේ අපේක්ෂකයන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී.
- බාහිර උපාධිලාභීන්ගේ අටවැනි උපාධි ප්‍රදානෝත්සවය 2016 මහනුවර, පොල්ගොල්ල සමුපකාර සංවර්ධන ජාතික ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරයේදී අතිඋත්කර්ෂවත් අන්දමින් පවත්වන ලද අතර එහිදී ශාස්ත්‍රවේදී හා ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරීන් 1222 දෙනෙක් උපාධි ලබාගත්හ. යාවජීව මහාචාර්ය කපිල ගුණසේකර එම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.

නව පාඨමාලා හඳුන්වාදීම

❖ කළමනාකරණ පීඨය සංවර්ධනය කළ ඩිප්ලෝමා වැඩසටහන් පහක් මෙම මධ්‍යස්ථානය හරහා පිරිනැමීම සඳහා ලබාගන්නා ලදී. එම වැඩසටහන්,

- ගිණුම් හා මුදල් පිළිබඳ ඩිප්ලෝමාව
- ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව
- ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව
- මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව
- වෙළඳපොළ කළමනාකරණ ඩිප්ලෝමාව ලෙස හැඳින්වේ.

- ❖ කළමනාකරණ පීඨය මගින් සංවර්ධනය කළ සහතික පත්‍ර පාඨමාලා හයක් මෙම මධ්‍යස්ථානය හරහා පිරිනැමීම සඳහා ලබාගත් අතර එම පාඨමාලා පහත නම්වලින් හැඳින්වේ.
    - පුද්ගලික අලෙවි සහතික පත්‍ර පාඨමාලාව
    - මානව සම්පත් කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව
    - ගිණුම් සහ මුදල් සහතික පත්‍ර පාඨමාලාව, ව්‍යවසායකත්ව හා ව්‍යාපාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව
    - ව්‍යාපාර කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව
    - ආගන්තුක සත්කාරය හා සංචාරක ව්‍යාපාර වෙළඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ❖ ඊට අමතරව මෙම මධ්‍යස්ථානය හරහා පිරිනැමීම සඳහා ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් හා ප්‍රමාණාත්මක සංගණක ඩිප්ලෝමාවක් ආරම්භ කිරීම සඳහා සාකච්ඡා පවත්වන ලදී.

නව අධ්‍යයන මණ්ඩලයක් ස්ථාපිත කිරීම

බාහිර විද්‍යාවේදී උපාධි පාඨමාලාව නවතා දැමීමත් සමඟ විද්‍යා පීඨය හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය අතර සබඳතාව මීට දශකයකට පෙර විඡේදනය විය. කළමනාකරණ හා ඉංජිනේරු වැනි වෙනත් පීඨ සමඟ ඒකාබද්ධව විද්‍යා පීඨයෙන් නව උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා හඳුන්වාදීම අරමුණු කොට ගෙන විද්‍යා අධ්‍යයන මණ්ඩලය නැවත ප්‍රතිව්‍යුහගත කරන ලදී.

2016-2020 කාල පරිච්ඡේදය සඳහා කලා සිසුන්ගේ අත්පොත් සහ ප්‍රකාශ පත්‍රය මුද්‍රණය කිරීම

- කලා සිසුන් සඳහා ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කොට සිසුන් අතර බෙදාහරින ලදී.
- මෙම මධ්‍යස්ථානය මගින් ප්‍රදානය කරනු ලබන පාඨමාලා ඉස්මතු කොට දැක්වෙන ප්‍රකාශ පත්‍රය ප්‍රථම වතාවට ප්‍රකාශයට පත්කොට අදාළ පුද්ගලයන් අතර බෙදාහරිනු ඇත.

භෞතික සම්පත් සංවර්ධනය

- බිම් මහලේ ප්‍රවේශ ශාලාව දුහුවිල්ලෙන්, කෘමීන්ගෙන් හා පලිබෝධවලින් ආරක්ෂා කරගැනීම පිණිස වීදුරු පැනල් යොදා සවිකරන ලදී. HETC ව්‍යාපෘතිය විසින් මේ සඳහා මූල්‍ය සහාය ලබාදෙන ලදී.
- LED සිග්නේජ් පැනලයක් සංවර්ධනය කොට කොළඹ-නුවර මහා මාර්ගයට මුහුණලා සවිකොට එහි මේ වනවිට මහජනතාවගේ දැනගැනීම සඳහා ආයතනයේ දැන්වීම් ප්‍රදර්ශනය කෙරේ.
- වාහන තුනක් ගාල්කළ හැකි රථගාලක් ඉදිකරන ලදී.
- HETC ව්‍යාපෘතියේ සහාය ඇතිව මෙම මධ්‍යස්ථානය විසින් වීඩියෝ කොන්ෆරන්ස් පද්ධතියක් අත්කර ගන්නා ලදී. මෙම පහසුකම් තුළින් ලෝකයේ විවිධ ස්ථාන සමඟ එක්ව එකවර රැස්වීම් සාකච්ඡා, දේශන, ඉදිරිපත් කිරීම් හා විභාග පැවැත්වීමේ හැකියාව ලැබේ.

බාධක සහ පිළියම්

- දුරස්ථ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා ඉදිකිරීමට සැලසුම් කළ යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොවීය.
- මෙම මධ්‍යස්ථානය සඳහා ගිණුම් මෘදුකාංගයක් මිලදී ගැනීමට කළ ඉල්ලීමට අනුමැතිය නොලැබිණ.

අනාගත සැලසුම්

- මෙම මධ්‍යස්ථානය සඳහා සියලු පහසුකම්වලින් සමන්විත කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට අදහස් කරන අතර ඒ තුළින් ශිෂ්‍ය බඳවා ගැනීම, පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම, සම්මන්ත්‍රණ හා විභාග, උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම ආදිය කළමනාකරණය කිරීමේ හැකියාව පවති. එමෙන්ම මෙතුළින් සිසුන්ට ඔවුන්ගේ තත්ත්වය දැනගැනීමට, ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට හා මධ්‍යස්ථානය සමග ඵලදායි සන්නිවේදනයක් පවත්වා ගැනීමට හැකියාව ලැබේ.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පවතින ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නව යෝජනාවක් සංවර්ධනය කිරීම සහ නව ශ්‍රවණාගාර පංති කාමර හා පරිගණක විද්‍යාගාර පිහිටුවීමේ අරමුණින් යුතුව ගොඩනැලි දිගුවක් අත්කර ගැනීම.

4.5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය එස්. පී. නිශ්ශංක)

හැඳින්වීම

ඵලදායිතාවයෙන් යුතු පාලනයක් තුළින් මෙරට පවතින උග්‍ර පාරිසරික ගැටළු විසඳීම සඳහා ජාතික වශයෙන් ගන්නා වූ වැයමට සහයෝගය දැක්වීමේ අරමුණින් යුතුව අන්තර්ක්ෂෙත්‍ර පරිසර හා සම්බන්ධ වූ පුහුණු උපදේශන හා පර්යේෂණ වැඩසටහන් ප්‍රදානය කිරීම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය 1992 වසරේ ස්ථාපිත කරන ලදී. නව නිපැයුම් හා අන්තර්ක්ෂේත්‍ර එළඹුම් කෙරෙහි අවධානය යොමු කරන පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය, අදාළ ක්ෂේත්‍රවල විද්වතුන්, මේ පිළිබඳ උනන්දුවන සිසුන්, ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් හා විශ්වවිද්‍යාලයට පරිබාහිර මහ සමාජයේ පුද්ගලයන් ඒකාත්මක කොට ගනිමින් මෙම ඉලක්කයන් සාක්ෂාත් කරගනිමින් සිටී. වර්තමානය වනවිට භූගෝල විද්‍යා ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය අධ්‍යක්ෂවරයෙකු හා පුහුණුව, පර්යේෂණ හා උපදේශන බාරව සිටින නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු විසින් මෙම මධ්‍යස්ථානය මෙහෙයවනු ලබයි. කළමනාකරණ කමිටුවක් විසින් මෙම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් පරිපාලනය කරනු ලබයි. උපකුලපතිතුමා ප්‍රධානත්වය දරන විශ්වවිද්‍යාල බලධාරීන් හා මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතනවලින් මෙම කමිටුව සමන්විත වේ. පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය මෙරට විශේෂයෙන්ම පරිසරය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පාරිසරික උපදේශන හා හැකියාවන් ගොඩනැගීමේ මධ්‍යස්ථානය විශේෂයෙන්ම චිරස්ථායි පරිසර කළමනාකරණය, පාරිසරික තක්සේරුව පිළිබඳ උසස් තත්ත්වයේ ව්‍යාත්තීමය උපදේශනය සමාජ තක්සේරුව සාධ්‍යතා අධ්‍යයන හා පරිසර නිරීක්ෂණය පිළිබඳ රාජ්‍ය, පුද්ගලික අංශය හා ජාත්‍යයන්තර සංවිධානවලට තරගකාරී මිලගණන්වලට කෙටි පාඨමාලා කිහිපයක් ප්‍රදානය කරනු ලබයි. මෙම පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය පරිසර හිතකාමී විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීම සඳහා ISO 14001 තත්ත්වය අත්කර ගැනීම උදෙසා ද කටයුතු කරමින් සිටී.

පැවැත්වූ ක්‍රියාකාරකම් ලැයිස්තුව

- නාඩිතලාව කාලගුණික සොදුරු ගම් වැඩසටහන් (හැකියාවන් ගොඩනැගීමේ වැඩසටහන් මාලාව ජනවාරි 26) සමාජ ආර්ථික සංගණනය (මැයි-ජූනි), සෞඛ්‍ය කඳවුර (සැප්. 16 දින)
- කර්මාන්ත ආරක්ෂණය, හදිසි අවස්ථාවන්ට සුදානම් වීම හා පරිසර කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව (2016 ඔක්තෝම්බර් ආරම්භ කොට 2017 අප්‍රේල් අවසන් විය)
- පීඨ මට්ටමින් පරිසර කළමනාකරණ කමිටුව විශ්වවිද්‍යාලයට ISO 14001 සහතිකය ලබාගැනීමට සූදානම් වීම සඳහා හැකියාවන් ගොඩනැගීමේ වැඩමුළු (පෙබ. 2, පෙබ. 13, පෙබ. 15, මාර්තු 10 දිනවල) පැවත්විය.
- ISO 14001 පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව දෙවරක් පවත්වන ලදී. (ජූලි 1-2 සහා, සැප් 16-17 පැවැත්වූ මෙම වැඩමුළු දෙකට විශ්ව විද්‍යාල කිහිපයකින් සිසුහු 266කට වැඩි පිරිසක් සහභාගි වූහ.)

බාධක සහ පිළියම්

- කෙටි පාඨමාලා කිහිපයක් සමහර පීඨවල විභාග පැවති හෙයින් සැලසුම් කළ පරිදි පාරිසරික දැනුවත් කිරීමේ පාඨමාලාව පැවැත්විය නොහැකි විය. මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව මෙම මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන පැමිණිය ද කළමනාකරණ පීඨය මගින් මතු කරන ලද ගැටලු පාදක කොටගෙන එම පාඨමාලාව පැවැත්විය නොහැකි විය. එනමුත් 2018 වසරේදී සහයෝගිතා මාර්ගයෙන් එම පාඨමාලාව පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය වෙනුවෙන් ISO 14001 සහතික අත්කර ගැනීමට සැලසුම් කළ ද අධිකව පවතින කාර්යභාරය හා වෙනත් අවශ්‍යතා හා පිළිවෙළ කර ගැනීමට බොහෝ කාලයක් ගතවීම නිසා එය ආරම්භයේ දී සැලසුම් කළ පරිදී අවසන් කිරීමට නොහැකි විය.

අනාගත සැලසුම්

- මෙම මධ්‍යස්ථානය විසින් නිත්‍ය වශයෙන් පවත්වා ගෙන එන ලද සියලු සහතික පත්‍ර පාඨමාලා කඩිනමින් පැවැත්වීම හා චිරස්ථායී ඉඩම් කළමනාකරණය, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ නව පාඨමාලා සංවර්ධනය කිරීම.
- මේ වනවිට පවත්වාගෙන යන කර්මාන්ත ආරක්ෂණය පිළිබඳ සිව් මාසික සහතික පත්‍ර පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාවක් දක්වා සංවර්ධනය කිරීම.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවයෙන් EIA පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය සමග සහයෝගිතාවයෙන් හන්තාන සංරක්ෂණ ප්‍රදේශය ආරක්ෂා කිරීම හා රුක්රෝපණ වැඩසටහන් පැවැත්වීම.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමග සහයෝගිතාවයෙන් චිරස්ථායී ඉඩම් සංරක්ෂණ සමුළුව සංවිධානය කොට 2018 වසරේ පැවැත්වීම.
- කාලගුණික සොඳුරු ගම්මාන සංවර්ධන සැලසුම් කටයුතු සැලසුම් කළ පරිදි කරගෙන යෑම පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යයන්තර පර්යේෂණ ආයතනය සමග සහයෝගිතාවයෙන් යුතුව පර්යේෂණ යෝජනාව බාහිර මුල්‍ය ආයතන වෙත බාරදීම.
- චිරස්ථායී පරිසර පද්ධති සංවර්ධන වැඩසටහන පිළිබඳ UNDP සමග ආරම්භ කළ උපදේශන වැඩ අඛණ්ඩව පවත්වාගෙන යෑම.
- වනජීව සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග නව උපදේශන කටයුතු කිහිපයක් ආරම්භ කරනු ඇත.

4.6 මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය අර්ජුන පරාක්‍රම)

හැඳින්වීම

විදෙස් අරමුදල් ලබන ව්‍යාපෘතියක් ලෙස වත්මන් මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමතිය සහිතව 2002 වසරේදී ස්ථාපිත කරන ලදී. 2008 වසරේ අවසන් වූ මානව හිමිකම් සහතික පත්‍ර පාඨමාලාව අන්තේවාසික වැඩසටහන ලෙස හැඳින්වෙන පාඨමාලා තුනක් එම ව්‍යාපෘති කාලය තුළ පවත්වන ලද අතර එම පාඨමාලාවලට පැවති යහපත් ඉල්ලුම හේතුවෙන් අඛණ්ඩව පවත්වන ලදී. මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් සම්බන්ධ කරුණුවලදී නිරවුල්ව, විචාරශීලිව හා ක්‍රියාශීලීව ක්‍රියාකරන සමාජයක් නිර්මාණය කිරීම මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ දැක්ම වේ. විශ්වවිද්‍යාල ප්‍රජාවට හා සාමාන්‍ය මහජනයාට බලපාන්නා වූ මානව හිමිකම් පිළිබඳ දැනුම බහු-ක්ෂේත්‍ර, අධ්‍යාපනික හා පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධන කිරීම. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන ඉලක්කයයි.
මෙම මධ්‍යස්ථානයේ ව්‍යුහය පහත පරිදි සංයුක්ත වේ.

- පාලන මණ්ඩලය
- අධ්‍යක්ෂ
- අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු
- පරිපාලන නිලධාරීන්

එවැනි නිලධාරීන් කලින් කලට පාලන මණ්ඩලය විසින් අවශ්‍ය පරිදි වෙනස් කරනු ලබයි.
මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයට මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති අය-වැය කළමනාකරණය හා මධ්‍යස්ථානයට අවශ්‍ය මානව සම්පත් ලබාගැනීම යන කටයුතු පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය හිමිවේ. පාලන මණ්ඩලය ශාස්ත්‍ර පීඨයේ (නිල සභාපති) දේශපාලන අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන (නිලලත් නිලධාරි) පීඨ කලා මණ්ඩලය විසින් නම් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකු, එම දෙදෙනා මානව හිමිකම් පාඨමාලා පවත්වනු ලබන අධ්‍යයන අංශ නියෝජනය කරන අතර, පීඨ නවය නියෝජනය කිරීම සඳහා සනාතන සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් යුක්ත වේ. මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (නිලලත් නිළධාරි) පාලන මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කරයි. එමෙන්ම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතුරෙන් අයදුම්පත් කැඳවා පාලන මණ්ඩලය විසින් තෝරාපත් කරගත් අධ්‍යක්ෂ විසින් මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු මෙහෙයවනු ලබයි. අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු හා පරිපාලන නිලධාරියකු විසින් අධ්‍යක්ෂකවරයාට සහාය ලබාදෙනු ලබයි. පේරාදෙණිය මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය කලා පීඨයේ කන්නන්ගර ගොඩනැගිල්ලේ අංක 04 කාමරයේ පිහිටුවා ඇත.

ජයග්‍රහණ

- 2004 වසරේ සිට 2011 කාලය තුළ මෙම මධ්‍යස්ථානය පාඨමාලා දෙකක ශාස්තුවලින් රුපියල් මිලියන 19ක් උපයා ඇති අතර ඉන් ආසන්න වශයෙන් රුපියල් මිලියන හයක් ඉතිරි කිරීමට සමත්ව ඇත. වර්තමානය වන විට මෙම පාඨමාලා දෙක සඳහා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගෙන්, උපාධිලාභීන්ගෙන්, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා යුධ හමුදාව, බන්ධනාගාර නිලධාරීන්, පාසල් ගුරුවරුන් මෙන්ම රාජ්‍ය නොවන ආයතනවල සාමාජිකයන්ගෙන් විශාල ඉල්ලුමක් පවතී. 2004-2011 අතර කාල පරාසය තුළ මෙම මධ්‍යස්ථානය සහතික පත්‍රලාභීන් 2718 දෙනෙකු හා ඩිප්ලෝමාධාරීන් 849 දෙනෙකු බිහිකොට ඇත.
- එක්සත් ජාතීන්ගේ විශ්ව කාලවර්තික සමාලෝචනය ජාතික වාර්තාවේ තෙවන වෙළුමේ කලාපීය රාජ්‍ය උපදේශන සංවිධානය හා සම්බන්ධීකරණය කොට 2017 ජූලි මස 07 දින ශාස්ත්‍ර පීඨ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර ඒ සඳහා සිවිල් සංවිධාන, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්වතුන් සහභාගි වූහ. මෙම අවස්ථාවට ආදීවාසී ජනතාවගේ සහභාගිත්වය ලබාගැනීමටද කටයුතු යොදා තිබීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

බාධක සහ පිළියම්

මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂවරයාගේ ධූර කාලය 2016 වසරේ මුල් කාලයේ අවසන් වීම හේතුකොට ගෙන 2016-2017 වසරවල පාඨමාලා පැවැත්වීමට නොහැකි විය. එම තනතුරු පුරවන තෙක් ඔහුගේ සේවාව මාස තුනෙන් තුනට 2017 වසර දක්වා දීර්ඝ කරන ලදී. අධ්‍යක්ෂවරයා පත්කිරීමට කල්ගතවීම නිසා සම්බන්ධීකාරකවරුන් පත්කිරීමට ද නොහැකි විය. මේනිසා පාඨමාලා ආරම්භ කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් පෙබරවාරි මස මැදහාගයේදී අධ්‍යක්ෂවරයා පත්කිරීමත් සමග සම්බන්ධීකාරක තනතුර පිරවීම සඳහා දෙවරක් අයදුම්පත් කැඳවන ලදී. පළමු කැඳවීමෙන් සුදුසුකම්වලින් සමන්විත අයදුම්කරුවන් නොමැතිවීම හේතුවෙන් සම්බන්ධීකාරකවරු තෝරා ගැනීමට නොහැකි විය. එනමුත් දෙවන කැඳවීමෙන් දෙදෙනෙකු තෝරාගෙන ඔවුන්ගේ පත්වීම් 2018 ජනවාරි පළමු දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී.
පාලන මණ්ඩල සාමාජියන්ගේ ධූරකාලය 2016 ජූලි මාසයෙන් අවසන් වූ අතර ඒ වෙනුවට නව සාමාජිකයන් පත්කිරීම 2016 අගෝස්තු මාසයේදී සිදු කිරීමට කටයුතු යොදා තිබිණි.
2015 සිංහල මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රතිඵල නිකුත් කිරීමට මෙතෙක් නොහැකි වී ඇත්තේ සමහර ආචාර්යවරුන් විදෙස් රටවල ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැලි සිටීම හේතුවෙන් වුවත් මෙම ප්‍රතිඵල ඉතා ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගනු ඇත.
පාඨමාලා හා වැඩසටහන් 2018 වසරේදී පහත පරිදි පැවැත්වීමට අපේක්ෂා කෙරේ. පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යෑම පහත පරිදි වේ.
1. සිංහල සහ දෙමළ මාධ්‍යවලින් ඩිප්ලෝමා පාඨමාලා දෙකක් - එකතුව 4 කි.
2. සිංහල හා දෙමළ මාධ්‍යවලින් සහතික පත්‍ර පාඨමාලා තුනකි එකතුව 6 කි.

අනාගත සැලසුම්

- මහජන අවශ්‍යතා හා ඉල්ලුමට සරිලන පරිදි පාඨමාලා සැලසුම් කිරීම.
- වාර්ගික සහජීවනය, මූලික වටිනාකම් හා අයිතීන් පිළිබඳ කෙටි පාඨමාලා.
- බන්ධනාගාර නිලධාරීන් සඳහා කෙටි පාඨමාලා (පෙර එකඟ වූ පරිදි) දැනුවත් කිරීමේ වැඩසටහන් හා මහජන සමාජ කටයුතු.
- එක්දින සම්මන්ත්‍රණ සැලසුම් කොට මධ්‍යම පළාතේ ක්‍රියාත්මක කිරීම - සේවා ස්ථානවල හිමිකම් පදනම් කරගත් එළඹුම් (සම්මන්ත්‍රණ 4ක්).
- ඉහළ උනන්දුවකින් හා වැදගත්කමින් යුතු තේමාවන් යටතේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය, සිසුන් හා සාමාන්‍ය මහජනතාව සඳහා නිත්‍ය මාසික සංසඳයක් පැවැත්වීම.
- මානව හිමිකම් සම්බන්ධ කරුණු හා ගැටලුවලට මෙම මධ්‍යස්ථානයෙන් උපකාර අපේක්ෂා කරන්නන්ට සහාය විය හැකි මාවත් විවර කිරීම.
- දැනුම හා පර්යේෂණ ව්‍යාප්ත කිරීම.
- සාමාන්‍ය මහජනතාව අතර පුළුල්ව සංසරණය වන අර්ධ-වාර්ෂික ත්‍රෛභාෂා වාර සඟරාවක වෙළුම් දෙකක් ප්‍රකාශයට පත්කිරීම.
- මානව හිමිකම් පිළිබඳ බහු ක්ෂේත්‍ර අංශ හා සංවර්ධනය සඳහා මානව හිමිකම් පදනම් කරගත් එළඹුම් පදනම් කරගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, උසස් ගුණාත්මක බවින් යුතු වාර්ෂික පර්යේෂණ වාර සඟරාවක් පළ කිරීමේ හැකියාව සොයා බැලීම.
- මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
- මෙම මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා විදෙස් ප්‍රදාන ලබාගැනීම.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් මානව හිමිකම් පාඨමාලාවක් හදුන්වා දීම.

4.7 ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - ආචාර්ය, බී. ජී. එල්. ටී. සමරනායක)

හැඳින්වීම

පොදු රාජ්‍ය මණ්ඩලයීය විද්‍යා සභාවේ සහයෙන් ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 1993 වසරේදී ස්ථාපිත කරන ලදී. ආරම්භයේදී මෙම මධ්‍යස්ථානයට අරමුදල් සපයන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුවේ මුදල් යටතේ විද්‍යා හා තාක්ෂණ පුද්ගල සංවර්ධන ව්‍යාපෘතිය විසිනි. එසේ වුවත් 2004 වසරේ සිට එය පූර්ණ වශයෙන් ස්වයං සහායක මධ්‍යස්ථානයක් ලෙස කළමනාකරණය කරගැනීමට හැකි විය. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ වාණිජ හස්තය වේ.

විශ්වවිද්‍යාලයට අදාළ නීති හා රෙගුලාසිවලින් මෙම මධ්‍යස්ථානය පාලනය වන අතර, එහි ප්‍රතිපත්ති තීරණ ගනු ලබන්නේ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව විසිනි. මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව පීඨ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් යුක්ත වන අතර ඊට අධ්‍යක්ෂවරයා හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සාමාජිකයෙකුද ඇතුළත් වේ.

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ඔහු අර්ධ කාලීන පදනම මත කටයුතු කරයි. කාර්ය මණ්ඩලයට ඉංජිනේරුවන් දෙදෙනෙකු සහ සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු ඇතුළත් වේ.

ජයග්‍රහණ

ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය 2017 වසරේදී ඉංජිනේරු ව්‍යාපෘති 147ක් බාරගත් අතර වැඩමුළු 30ක් පවත්වන ලදී. ක්‍රියාත්මක කරන ලද ඉංජිනේරු ව්‍යාපෘතිවලින් 60% පමණ ජාතික වැදගත්කමින් යුක්ත වන අතර එම ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරිය, ආහාර දෙපාර්තමේන්තුව පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සැපයුම් හා ජලාප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන්, මධ්‍යම පරිසර අධිකාරිය, මාතලේ මහ නගර සභාව, යාපනය මහ නගර සභාව වැනි විවිධ රාජ්‍ය සංවිධාන විසින් ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය වෙත භාරදෙන ලද ව්‍යාපෘතීන්ය.

සිංගප්පූරුවේ නන්‍යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් තාක්ෂණික විශ්වවිද්‍යාලය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වෘත්තීමය විශේෂඥ ඉංජිනේරු සේවාවන් සපයා දෙමින්, මෙම මධ්‍යස්ථානය සමග අත්වැල් බැඳගන්නට විය. ඊට අමතරව ජපානයේ කුරිටා පාරිසරික ජල පදනම ශ්‍රී ලංකාවේ ජලයේ ගුණාත්මකභාවය සම්බන්ධ ව්‍යාපෘතිවල අනුග්‍රහකයෙන් බවට පවත් වූ අතර එහිදී ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය වෘත්තීමය විශේෂඥ ඉංජිනේරු සේවාවන් සලසා දෙන ලදී.
මෙම වර්ෂයේ සිට ඉදිරියට විද්‍යාගාරවල කෙරෙන සියලු ඉංජිනේරු පරීක්ෂණ මෙම මධ්‍යස්ථානය හරහා පරිපාලනය වන අතර එතුළින් උපරිම විනිවිද භාවයක්, ගුණාත්මක සේවාවක් හා නිසිකලට වැඩ අවසන් කිරීමට යොමු වනු ඇත.

සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පළාත් සභා හා පළාත් පාලන ආයතන අමාත්‍යාංශය හා වාසෝ-ආසියා ව්‍යාපෘතිය වැනි රාජ්‍ය ආයතන සඳහා වැඩමුළු කිහිපයක් පවත්වා ඇත. ඊට අමතරව ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ කඳුරට පාර්ශවය හා ඉන්දියාවේ පූනේ ෆෙබස් මාර්ෂල් (පුද්) සමාගම සමග සහයෝගීතාවයෙන් නිත්‍ය වැඩමුළු පවත්වන ලදී.

ලෝක බැංකු ආධාර ලබන පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශයේ උතුරු නැගෙනහිර ප්‍රාදේශීය යටිතල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සාර්ථකව අවසන් කළ කාර්මික නිලධාරීන් 140 දෙනෙකුට පමණ සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.

2017 වසරේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 67කි. එම මුදලින් රුපියල් මිලියන 49 ඉංජිනේරු ව්‍යාපෘතිවලින් වන අතර මිලියන 18ක් වැඩමුළුවලිනි. 2016 වසරේ ඉහත පිරිවැටුම රුපියල් මිලියන 32ක් වූ අතර ඉන් මිලියන 22ක් ඉංජිනේරු ව්‍යාපෘතිවලින් හා රුපියල් මිලියන 10ක් වැඩමුළු පැවැත්වීම තුළිනි.

අනාගත සැලසුම්

ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇති පරිදි නව නිපැයුම් යනු ජාතික සංවර්ධනයේ ප්‍රධාන සාධකයයි. ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයද එම දැක්ම සමඟ සමාන්තරව ගමන් කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ඉන්කියුබේෂන් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් ඉදිරිපත් කළ යෝජනාව මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව විසින් අනුමත කොට ඇත. මෙම ඉන්කියුබේෂන් මධ්‍යස්ථානය සඳහා මුදල් සපයනු ලබන්නේ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය විසිනි. එබැවින් මෙම ඉංජිනේරු පීඨ ඉන්කියුබේෂන් මධ්‍යස්ථානය 2018 වසරේ දී මස්තකප්‍රාප්ත කර ගැනීමට අපේක්ෂා කරන අතර එතුළින් සාර්ථකව අවසන් කළ තෝරාගත් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ව්‍යාපෘති පුහුණු කොට වාණිජමය වටිනාකමින් යුක්ත ව්‍යාපෘති බවට පත්කොට ව්‍යාපාර සමාගම් ආරම්භ කිරීමේ තත්ත්වයට පත්කරනු ඇත.

4.8 හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය එම්. ඩී. ළමාවංශ)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය එහි සමාරම්භය වූ 2005 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ හදිසි සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ පුරෝගාමියා බවට පත්ව ඇත. මෙම මධ්‍යස්ථානය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය හා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමග එක්ව හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. මෙම පුහුණු වැඩසටහන් පවත්වනු ලබන්නේ සෞඛ්‍ය පරිපාලකයන්, තාක්ෂණඥයන්, අධ්‍යයන ආයතනවල ගුරු භවතුන්හට රාජ්‍ය පරිපාලකයන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට, වෙනත් අත්‍යාවශ්‍ය සේවාවන්ට අදාළ සාමාජිකයන් එනම් ජාතික ප්‍රතිපත්ති/මාර්ගෝපදේශන/පිළිගත් මෙහෙයුම් ක්‍රියාමාර්ග සකස් කිරීම හෝ ඉහළ නැංවීම හා සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් හෝ සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා ඉගැන්වීම පුහුණු කිරීමේ නිරත නිලධාරීන් උදෙසා මෙම පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. මේ දක්වා එවැනි පුහුණු වැඩසටහන් 11ක් පවත්වා ඇත. ඊට අමතරව හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ පාඨමාලා ඇගයීම හා විෂයමාලා සමාලෝචනය වැඩමුළු සහ එම පාඨමාලාවල විෂයමාලා සංවර්ධන වැඩමුළුද පවත්වා ඇත. එමෙන්ම මෙම මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමඟ එක්ව ගැටලුකාරී තත්ත්වයට මුහුණපා ඇති ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් පිළිබඳ ජාතික වැඩමුළු 11ක් ද සාර්ථකව පවත්වා ඇත. එමෙන්ම වෛද්‍යවරුන්, හෙදියන් හා පාසල් ළමුන් සඳහා පූර්ව-ආරෝග්‍යශාලා සත්කාරක වඩසටහන් 10ක් ද පවත්වා ඇත.

ජයග්‍රහණ

ඉහත සඳහන් කළ වැඩමුළුවලට සහභාගි වූ සම්පත්දායක පුද්ගලයන්ගේ හා ඒවාට සහභාගිවූවන්ගේ විස්තර මැපිං තාක්ෂණය යොදා ගනිමින් හඳුනා ගැනීමට මෙම මධ්‍යස්ථානයට හැකි විය. එම විස්තර මෙම මධ්‍යස්ථානයේ වෙබ් අඩවියේ දිස්වේ.

බාධක සහ පිළියම්

හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ 11 හා 12වැනි වැඩසටහන් 2017 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද එම වර්ෂයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් කිසිඳු වැඩමුළුවක් පැවැත්වීමට නොහැකි විය.

අනාගත සැලසුම්

- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට හා වෙනත් පීඨවල සිසුන් සඳහා පූර්ව-ආරෝග්‍ය ශාලා සත්කාරය පිළිබඳ මොඩියුල සංවර්ධනය කිරීම.
- බැංකුකරුවන් සඳහා විශේෂයෙන් සකස් කළ එක්දින වැඩසටහන් මාලාවක් පැවැත්වීම.
- මෙම මධ්‍යස්ථානය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි හදාරන සිසුන් සඳහා හදිසි මහජන සෞඛ්‍ය හා ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව ගිලන් රථ රියදුරන් සඳහා වාර්ෂික පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

4.9 අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය

(අධ්‍යක්ෂ - මහාචාර්ය, ප්‍රසාද් සේතුංග)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අලුතින් නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/04හි විස්තර කෙරෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව 2016 පෙබරවාරි 15 දින ප්‍රතිස්ථාපනය කරන ලදී. සැලසුම්කරණය, සංවිධානය, සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම, ක්‍රියාත්මත කිරීම, නිරීක්ෂණය හරහා විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කොට ආයතනගත කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ සභාවට සියලුම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් වාර්තා කිරීම හා එම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ පරමාර්ථය වේ. මෙම ඒකකයේ අධ්‍යක්ෂ හා විශ්වවිද්‍යාලයේ වෙනත් බලධාරීන් විසින් ප්‍රධානත්වය දරන සියලුම පීඨවල නියෝජිතයන්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් මෙම ඒකකයේ ක්‍රියාකාරකකම් පරිපාලනය කරනු ලබයි.

ජයග්‍රහණ

ඉහත පරමාර්ථය ළඟාකර ගැනීම පිණිස අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂ සහ අදාළ සාමාජිකයන් තත්ත්වාරක්ෂණ සභාව විසින් සංවිධානය කළ වැඩමුළු හතරකට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ ස්ථාවර කමිටුව විසින් පැවැත් වූ සියලුම රැස්වීම්වලට සහභාගි විය. තත්ත්වාරක්ෂණ සභාව විසින් ඉල්ලා සිටි තොරතුරු නිසි කලට ලබාදුන් අතරම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ ප්‍රගතිය සෑම මාස තුනකට වරක්ම තත්ත්වාරක්ෂණ ස්ථාවර කමිටුව වෙත වාර්තා කරණ ලදී. අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය ලද තොරතුරු හුවමාරු කරගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාකාරකම් සාකච්ඡා කිරීම පිණිස රැස්වීම් 12ක් පවත්වන ලදී. ඒ අනුව 2017 වසරේ දී ආරම්භ කොට ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් ලැයිස්තුව පහතින් දැක්වේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ සභාව විසින් හඳුන්වාදුන් කාර්ය සාධන ලකුණු කාඩ්පතට සමගාමීව යමින් විවිධ ක්‍රියාකාරකම් පවත්වන ලද අතර වසරක ඉලක්කය වූ 60% ඉක්මවා 70%ක ඉලක්කයක් සපුරා ගැනීමට අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයට හැකිවිය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ වෙබ් අඩවිය පවත්වාගෙන යෑම.
- අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීම හා විශ්වවිද්‍යාලයේ පීඨ, නියෝජ්‍ය උපකුලපති හා නීතිය පිළිබඳ නිලධාරිණිය විසින් ලබාදුන් අදහස් සහ යෝජනා ඊට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.
- ඉදිරි වර්ෂ තුනක කාලය සඳහා (2017-2019) අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ හා පීඨ තත්ත්වාරක්ෂණ සංසදවල ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස බලධාරීන් වෙත බාරදීම.
- කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/04හි සඳහන් කොට ඇති අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ කර්යයන් හා වගකීම් පිළිබඳ පීඨ මට්ටමින් දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.

සංවිධානය කළේ	වැඩසටහන	දිනය	ඉලක්ක ගත කණ්ඩායම	සහභාගි වූ සංඛ්‍යාව
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය ජී.ත.ආ.ඒ. දන්ත වෛද්‍ය පීඨය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම	2016.11.25 2017.03.28	අධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩලය	45 25
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය	තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.04.24	පීඨාධිපතීන්/පීඨ ත.ආ. සංසදයේ සභාපති හා සාමාජිකයන්	80
පීඨ ත.ආ.ස. ඉංජි පීඨය	ත.ආ.ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.06.07	අධ්‍යයන කාර්ය මණ්ඩලය	58
ත.ආ.ස/වි.වි. ප්‍ර.කො.ස./අ ත.ආ.ඒ./පේරා	සමාලෝචකයන්ගේ පුහුණු වැඩසටහනේ වැඩමුළුව	2017.06.07	රාජ්‍ය විශ්වවිද්‍යාලවල සියලු සමාලෝචකයන්	65
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය හා පීඨ ත.ආ.ස./ කලා පීඨය	සැකසීම සඳහා අවසන් උපදේශන වැඩමුළුව-කලා පීඨය	2017.06.12	SER ලේඛකයන් හා පීඨ ත.ආ. සංසදයේ සාමාජිකයන්	47
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය හා පීඨ ත.ආ. සං./සම සෞඛ්‍ය පීඨය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.06.20	සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය	32
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.08.11	විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය	62
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය පශු වෛද්‍ය පීඨය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.09.11	අධ්‍යයන කාර්ය මණ්ඩලය	38
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය හා පීඨ ත.ආ. සංසදය වෛද්‍ය පීඨය	තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.10.19	පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	220
පීඨ ත.ආ.සං දන්ත වෛද්‍ය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.10.09	පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	85
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය හා පී.ත.ආ. සංසදය කලා පීඨය	ස්වයං ඇගයීම් වාර්තා ලිවීම 2018	2017.11.16	කාර්ය මණ්ඩල සාමාජිකයන්	10
පීඨ. ත.ආ. සංසදය කළමනාකරණ පීඨය	තත්ත්වාරක්ෂණය හා වැඩසටහන් ඇගයීම පිළිබඳ වැඩමුළු	2017.11.29	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්	30
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.12.14	විශ්වවිද්‍යාලයේ අනධ්‍යන කාර්ය මණ්ඩලය (ලිපිකාර හා සම ශ්‍රේණි)	82
පීඨ.ත.ආ. සංසදය විද්‍යා පීඨය	තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2017.12.15	පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය	94

අනාගත සැලසුම්

- තත්ත්ව සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් අදාළ සාමාජිකයන් සඳහා සැලසුම් කළ තත්ත්වාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- පීඨ තත්ත්වාරක්ෂණ සංසදවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- පීඨ තත්ත්වාරක්ෂණ සංසදවල ස්වයං ඇගයීම් වාර්තා සැකසීම හා වැඩසටහන් සමාලෝචනය සඳහා සුදානම් කිරීම පිණිස මාර්ගෝපදේශ ලබාදීම.
- 2016 වසරේ පවත්වන ලද ආයතනික නියමු සමාලෝචන වාර්තාවෙන් පෙන්වාදෙන ලද අඩුපාඩු මඟ හරවා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුමක් සැකසීම පිණිස විශ්වවිද්‍යාලයේ අදාළ නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම හා අවශ්‍ය පියවර ගැනීම.
- තත්ත්වාරක්ෂණ හා පැවරුම් සභාව විසින් හඳුන්වාදෙන ලද අ.ත.ආ. ඒකකයේ ලකුණු කාඩ් පතේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 80% කට වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- අ.ත.ආ. ඒකකයේ අතුරු ව්‍යවස්ථා අවසන් කිරීම.
- සියලු ක්‍රියාකාරකම් සඳහා පිළිගත් මෙහෙයුම් ක්‍රියාමාර්ග පිළිවෙළ කිරීම.
- කළමනාකරණ කමිටුවේ හා පීඨ තත්ත්වාරක්ෂණ සංසදයේ සාමාජිකයන් සඳහා TOR පිළිවෙළ කිරීම.

4.10 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - ආචාර්ය නන්ද ගුණවර්ධන)

හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හයක් ලෝක විශ්වවිද්‍යාල මට්ටමට පරිවර්තනය කිරීම සඳහා යෝජනා කරන ලදී. ඒ අනුව මෙම වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එක් විශ්වවිද්‍යාලයකට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලද අතර එම තෝරාගත් විශ්වවිද්‍යාල හයෙන් යෝජනා කැඳවන ලදී. එවන් වූ අපේක්ෂාවක් ළඟාකර ගැනීමේ අදහසින් 2011 ජුනි 25 දින පැවැත්වූ 397 වැනි පාලක සභා රැස්වීමේදී බහු ක්ෂේත්‍ර මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා විය. එලෙස ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත විය.
ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ දැක්ම වනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ගෝලීය දෘෂ්‍යතාව පහසුකරලීම හා අධ්‍යයන ක්ෂේත්‍රයෙහි හා පර්යේෂණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ට ගණයේ මධ්‍යස්ථානයක් ලෙසට එහි අන්‍යන්‍යතාවය තහවුරු කිරීමයි.
මේ පිළිබඳ වැඩිදුර විස්තර හා තොරතුරු සඳහා http:/www/pdn.ac.lk/uop/inrc වෙත පිවිසෙන්න.

ජයග්‍රහණ

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය පසුගිය අවුරුදු හයක කාලය තුළ එහි පරමාර්ථයන් සාක්ෂාත් කරගනු වස් විවිධ ක්‍රියාකාරකම්වල නියැලි ඇති අතර එම වසරේදී ප්‍රධාන ක්‍රියාකාරකම්වල නියැලි ඇති අතර එම වසරේදී භාරගත් ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි විස්තර වේ.
1. ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් සංවිධාන විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් ආරම්භ කොට අත්සන් කරන ලදී.

I. රුමේනියාවේ ක්ලුජ් තාක්ෂණික විශ්වවිද්‍යාලය
II. ඉතාලියේ පෙෆියා විශ්වවිද්‍යාලය
III. සිංගප්පූරුවේ නන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය
IV. චීනයේ හුඅකියෝ විශ්වවිද්‍යාලය

2. පහත සඳහන් ආයතන සමඟ 2018 වසරේදී තවත් අවබෝධතා ගිවිසුම් හතරක් අත්සන් කිරීමට ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත.

1. චීනයේ ජී අඕ ටොං විශ්වවිද්‍යාලය
11. චීනයේ චෙන්ග්දු ජාතික විශ්වවිද්‍යාලය
111. නෝර්වේ සවුත් ඊස්ට් විද්‍යා පීඨය
IV. ඇමෙරිකාවේ සෑම් හොස්ටන් රාජ්‍ය විශ්වවිද්‍යාලය

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සහයෝගිතා ක්‍රියාකාරකම් හා හුවමාරු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පැමිණි දූත මණ්ඩල 10ක් පමණ සම්බන්ධීකරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අතිශයින්ම වාසිදායක වූ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් හා අධ්‍යයන වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන් අතරට දීර්ඝකාලීන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්ද ඇතුළත් විය. එම වැඩසටහන් ඇමෙරිකාවේ ඩී. පෝව් විශ්වවිද්‍යාලය, ඉතාලියේ බ්‍රෙසියා විශ්වවිද්‍යාලය, ජපානයේ හොකයිඩො විශ්වවිද්‍යාලය, ජපානයේ සේක්‍රඩ් හාර්ට් විශ්වවිද්‍යාලය සහ සවුත් වෙස්ට් මින්සු විශ්වවිද්‍යාලය අතර ක්‍රියාත්මක විය. එපමණක් නොව දීර්ඝ කාලීන වැඩසටහන් අභ්‍යන්තර හා බාහිර වශයෙන්ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

බ්‍රේසියා විශ්වවිද්‍යාලය, ෆෙගියා, තුර්කියේ මිඩිල් ඊස්ට් විශ්වවිද්‍යාලය සහ ජපානයේ සගා විශ්වවිද්‍යාලය බාහිර හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර ජපානයේ උටිසුනෝමියා විශ්වවිද්‍යාලය, ස්පාඤ්ඤයේ එක්ස්ට්‍රිමදුර විශ්වවිද්‍යාලය, ග්‍රීසියේ ක්‍රීට් විශ්වවිද්‍යාලය සහ ජපානයේ සගා විශ්වවිද්‍යාලය අභ්‍යන්තර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට විය.

ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේදී එරස්මස් වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනාවක් බාරදී ඇත. එමෙන්ම මෙම මධ්‍යස්ථානය ජපානයේ ටෝකියෝ ටෙක් විශ්වවිද්‍යාලය සමගද ශ්‍රී ලංකාවේ වැසිකිලි සඳහා විදුලි බලය රහිත ජලය අඩුවෙන් භාවිත කෙරෙන නව තාක්ෂණවේදයක් සංවර්ධනය කිරීම සඳහාද තවත් යෝජනාවක් සංවර්ධනය කරන ලදී.

බාධක සහ පිළියම්

ගුවන් බලපත්‍ර මිලදී ගැනීම සම්බන්ධයෙන් බලාත්මක වූ සමහර රෙගුලාසි හේතුවෙන් 2015 සහ 2016 වසරවලදී ගමන් ගාස්තු ප්‍රදාන ඵලදායි ලෙස යොදා ගැනීමට නොහැකි විය. එහ ප්‍රතිඵලයක් ලෙස විදෙස් විද්වතුන් සහභාගිවන්නන් ලෙස ආකර්ෂණය කර ගැනීමට මෙම මධ්‍යස්ථානයට දුෂ්කර විය. මෙලෙස ප්‍රමාණවත් ජාත්‍යන්තර සමුළු සංඛ්‍යාවක් සංවිධානය කිරීමට බාධා සිදුවිය.
පාලක සභාවේ අනුමැතිය සහිතව ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ නම ජාත්‍යන්තර කටයුතු සම්බන්ධ කාර්යාලය ලෙස වෙනස් කරන ලදී. ඒ අනුව එම කාර්යාලයට සේවක තනතුරු නිර්මාණය කිරීමේ ගැටලු මතු වූ හෙයින් කාර්යාලයේ කටයුතුවලට එය බලපෑම් කළේය. මේ නිසා සේවක තනතුරු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා අළුතින් ඉල්ලීම් ඉදිරිපත් කොට ඇත.

අනාගත සැලසුම්

ජාත්‍යන්තර කටයුතු කාර්යාලය යුරෝපා සංගමය සමඟ 2018 වසරේදී නව ප්‍රදාන තුනක් ආරම්භ කරනු ඇත. මෙම ප්‍රදාන යොදාගනිමින් යුරෝපා සංගමය සමඟ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශාස්ත්‍රඥයන්ගේ යහපත උදෙසා ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් ආරම්භ කරනු ඇත.

චීනයේ ෆුජියන් කෘෂිකර්ම හා වනජීවී විශ්වවිද්‍යාලය ශාස්ත්‍ර පීඨය සමග සහයෝගීතාවෙන් කොන්ෆ්‍යුසියස් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ඇත. එකී භාෂා හා අධ්‍යාපන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම 2018 වසරේදී ක්‍රියාත්මක කරනු ඇත. මේ සම්බන්ධ මූලික සාකච්ඡා චීනයේ විද්‍යා ඇකඩමිය සහ ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුව සමඟ සිදුකොට ඇත. මෙම ව්‍යාපෘතියට, භෞතික විද්‍යා, භූ ගර්භ විද්‍යා, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය හා විද්‍යා පීඨය සම්බන්ධ වීමට නියමිත අතර ඒ සඳහා අති නවීන රේඩා පද්ධතියක්ද මිලදී ගනු ඇත. සකුරා විද්‍යා වැඩසටහන 2018 වසරේදී ක්‍රියාත්මක වන අතර ජපන් ආයතන අතර සහයෝගිතා සංවර්ධනය කර ගැනීම සඳහා නව වැඩසටහන් දෙකක් ආරම්භ කරනු ඇත.

4.11 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - ආචාර්ය, රංජිත් පල්ලේගම)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 1999 වසරේදී ස්ථාපිත කරන ලදී. එක් එක් පීඨවල විවිධ ඒකකයන්ට ඒක චත්‍ර සංවිධානයක් වෙමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධනය ප්‍රවර්ධනය කිම උදෙසා මෙම මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

ජයග්‍රහණ

සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහත සඳහන් වැඩමුළු හා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

විද්‍යා පීඨයේ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තෙදින ප්‍රේරණ වැඩසටහන

විද්‍යා පීඨයේ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තෙදින ප්‍රේරණ වැඩසටහනක් ජනවාරි මස 17-19 යන දිනවල මෙම මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එහි සම්පාදකයන් ලෙස මහාචාර්ය එස්. ආර්. කොඩිතුවක්කු, ආචාර්ය රංජිත් පල්ලේගම, ආචාර්ය සංජීව මෛත්‍රීපාල, ආචාර්ය ජයලත් එදිරිසිංහ, ආචාර්ය චාලින්ද බෙනරගම, ආචාර්ය රුවන් නවරත්න, මහාචාර්ය මාධව මීගස්කුඹුර, මහාචාර්ය අනුර වික්‍රමසිංහ සහ ආචාර්ය ෂෙල්ටන් පෙරේරා සහභාගි වූහ. තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 18 දෙනෙකු මෙම වැඩසටහන සාර්ථකව අවසන් කළහ.

සම්පත්දායක පුද්ගලයන් අතර පැවැත් වූ ප්‍රතිචාරක ඉගෙනුම් සැසිය

වැඩසටහන්වල සම්පත්දායක පුද්ගලයන් අතර දින භාගයේ ප්‍රතිචාරක ඉගෙනුම් සැසියක් පවත්වන ලදී. සම්පත්දායකයන් ලෙස වඩාත් ඵලදායී ආකාරයෙන් වැඩසටහන්වලට සහභාගි වන විශේෂඥයන්ගේ පළපුරුද්දෙන් හා අත්දැකීම්වලින් නවක සම්පත්දායකයන් ඔපවත් කිරීම හා පෙර පැවැති පුහුණු වැඩසටහන්වලදී අත්විඳීමට සිදුවූ ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් සෙවීමත් මෙහි අරමුණක් විය. ජනවාරි මස 20 දින මෙම සැසිය පැවැත් වූ අතර ඒ සඳහා සම්පත්දායක පුදගලයන් 20 දෙනෙක් සහභාගි වූහ.

ලිපිකාර ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් ඵලදායිතාව හා ගුණාත්මක භාවය දියුණු කිරීම සඳහා සුබවාදී වැඩ සංස්කෘතියක් ගොඩනැගීම පිළිබඳ එක් දින වැඩමුළුව.

විශ්වවිද්‍යාලයේ ලඝුලේඛිකාවන් ලිපිකරුවන් හා ඒ හා සමාන ශ්‍රේණිවලට අයත් සේවකයන් සඳහා ඉහත වැඩමුළු පවත්වන ලදී. මාර්තු 13 දින ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයන අංශයේදී මෙම වැඩමුළුව පවත්වන්නට විය. සනාතන මන්දිරයේ විවිධ පරිපාලන අංශවලට හා පුස්තකාල සේවයට අයත් සේවකයන් 86 දෙනෙකු මේ සඳහා සහභාගි වූහ. ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය එම්. තිලකසිරි විසින් වැඩමුළුව පවත්වන ලදී.

.

ලිපිකාර හා සම ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය සඳහා දින දහයේ ප්‍රේරණ වැඩසටහන් මාලාව

ඉහත වැඩසටහන කණ්ඩායම් දෙකක් ලෙස පැවැත් වූ අතර එහි මුල් කණ්ඩායමට 33 දෙනෙකු සහභාගි වූහ. එය 2017 මාර්තු 17 අප්‍රේල් 7, 21, 28 හා මැයි 5 යන දිනවල පවත්වන ලදී. එහි දෙවන කණ්ඩායමට 34 දෙනෙකු සහභාගි වූ අතර එය පවත්වන ලද්දේ 2017 වසරේ ජූනි 21, 30 සහ ජූලි 28 හා අගෝස්තු 01 යන දිනවලදීය.

පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

තත්ත්වාරක්ෂණ ඒකකය සමඟ එක්ව ඉහත වැඩසටහන ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයනාංශයේදී අගෝස්තු 11 දින පවත්වන ලදී. මේ සඳහා පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරීන් 39 දෙනෙකු සහභාගි වූ අතර මහාචාර්ය නාරද වර්ණසූරිය, මහාචාර්ය දීප්ති බණ්ඩාර හා මහාචාර්ය ප්‍රසාද් සේතුංග සම්පත්දායකත්වය ලබා දෙන්නට වූහ.

විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර සහයකයන් සඳහා තෙදින පුහුණු වැඩ සටහන

මෙම වැඩසටහන අගෝස්තු 30 හා සැප්තැම්බර් 6 හා 19 දිනවල පැවැත් වූ අතර ඒ සඳහා එම කාණ්ඩයේ සේවකයන් 33 දෙනෙකු සහභාගි වූහ. මහාචාර්ය ආර්. එල්. විජයවීර, මහාචාර්ය ආර්. ඩබ්. පල්ලේගම, ආචාර්ය ඩබ්. ඩී. චන්ද්‍රසේන, ආචාර්ය ජයලත් එදිරිසිංහ, ආචාර්ය එස්. මෛත්‍රීපාල, ශ්‍යාමලී තිරකරත්න මිය හා ආචාර්ය එස්. බන්නැහැක එහි සම්පත්දායකයන් ලෙස සහභාගි වූහ.

විශ්වවිද්‍යාලයේ කාර්මික නිලධාරීන් හා සම ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය සඳහා දි න හයේ (6) ප්‍රේරණ වැඩසටහන

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේදී පැවැත් වූ මෙම වැඩසටහනට කාර්ය මණ්ඩල සාමාජිකයන් 34 දෙනෙකු සහභාගි වූ අතර එය අගෝස්තු 24 සැප්තැම්බර් 8, 12, 20, 27 හා ඔක්තෝම්බර් 4 යන දිනවලදී පවත්වන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැවැත් වූ 13 වැනි හා 14 වැනි ප්‍රේරණ වැඩසටහන්

2017 වසරේ පහත සඳහන් කාලය තුළ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ප්‍රේරණ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

කාණ්ඩය	13වැනි ප්‍රේරණ වැඩ සටහනේ කාලය හා දිනයන්	14වැනි ප්‍රේරණ වැඩසටහනේ කාලය හා දිනයන්
පළමු කාණ්ඩය	ජනවාරි 23 සිට 27 දක්වා හා ජනවාරි 30 සිට පෙබරවාරි 03	2017 ඔක්තෝම්බර් 16 සිට 20 දක්වා හා 2017 නොවැ. 23 සිට 27 දක්වා
දෙවන කාණ්ඩය	2017 පෙබරවාරි 27 සිට මාර්තු 03 දක්වා හා මාර්තු 6 සිට 10 දින දක්වා	2017 නොවැ. 13 සිට 17 දක්වා හා 2017 නොවැ. 20 සිට 24 දක්වා
තෙවැනි කාණ්ඩය	මාර්තු 20 සිට 24 දක්වා හා මාර්තු 27 සිට 31 දින දක්වා	2017 දෙසැ. 4 සිට 8 දින දක්වා හා 2017 දෙසැ. 11 සිට 15 දක්වා
සහභාගි වූ සංඛ්‍යාව	පේරාදෙණිය, කොළඹ හා ගිණිකොණ දිග යන විශ්වවිද්‍යාලවලින් 27 දෙනෙකු සහභාගි වූහ.	පේරාදෙණිය, ගිණිකොණ දිග, භික්ෂු, නැගෙනහිර යන විශ්වවිද්‍යාලවලින් හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයන් ඇතුලුව 27 දෙනෙකු සහභාගි වූහ.

බාධක සහ පිළියම්

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල කාණ්ඩ බොහොමයකට පුහුණුව ලබාදීමේ හැකියාව කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සතුව පවතින අතර ඉදිරි වසරේදී විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩල සේවක

කාණ්ඩවලට එම පුහුණුව ලබාදීමට අපේක්ෂා කරයි. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සේවකයන්ගේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව වැඩි කිරීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවන් සපිරිය යුතු වේ.

- ලිපිකාර ශ්‍රේණියේ එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු
- එක් කම්කරුවෙකු
- වැඩසටහන් කළමනාකරුවකු ලෙස අවම අර්ධ කාලීන සහකාර ලේඛකාධිකාරිවරයකුගේ සේවය
- යටිතල පහසුකම් සංවර්ධනය අවශ්‍ය වේ. (කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවට මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2018 වසරේදී බාරදෙනු ඇත.)

අනාගත සැලසුම්

මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම සේවක කාණ්ඩවලට අයත් සෑම සේවකයෙකුටම අවම තරමින් එක් පුහුණුවක් හෝ ලබාදීමට සැලසුම් කරන අතර මේ කටයුතු සියල්ල 2018-2020 කාල පරිච්ඡේදය තුළ සිදුකිරීමට නියමිතය.

5 සහායක සේවාවන්

5.1 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්

(ප්‍රධාන වෛද්‍ය නිලධාරී - වෛද්‍ය පී. එම්. ඒ. සමරක්කොඩි)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානය රජය විසින් පවත්වාගෙන යනු ලබන හෝ පුද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම ප්‍රමාණයේ රෝහලක් සමඟ සන්සන්දනය කිරීමේ දී එය අසම සම වේ. විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් සිසුන් සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් යුක්ත වන 20,000 කගේ පමණ සෞඛ්‍යමය අවශ්‍යතාවන් මෙම මධ්‍යස්ථානය මගින් සපුරාලනු ලබයි. එමෙන්ම මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානය ප්‍රජා සෞඛ්‍ය හා පාරිසරික සෞඛ්‍යයට අදාළ ක්‍රියාකාරකම්වල නියැලෙන අතර කසල බැහැර කිරීමේ ව්‍යාපෘතියක්ද කළමනාකරණය කරනු ලබයි.
මෙතරම් විශාල ජනකායකගේ සෞඛ්‍යමය අවශ්‍යතාවන් ඉටුකරනු පිණිස මනා ලෙස සංවිධානය කළ වැඩසටහනක් හදුන්වාදී ඇත. මෙම මධ්‍යස්ථානය කරා පැමිණෙන සෑම පුද්ගලයෙකු සඳහාම වෙන් වෙන් වූ ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබයි. සේවකයෙකු බඳවා ගැනීමේ යෝග්‍යතාවය පරීක්ෂණ වෛද්‍ය වාර්තාවෙන් එම ලිපිගොනුව ආරම්භ වන අතර සිසුන්ගේ ලිපි ගොනුව ආරම්භ වනුයේ මූලික වෛද්‍ය වාර්තා ඇතුළත් කිරීමත් සමඟයි. සේවකයෙකු විශ්‍රාම ලබාගන්නා තෙක්ම එම ලිපිගොනුව පවත්වාගෙන යන අතර සිසුන් ඔවුන්ගේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය අවසාන වනතෙක් එම ලිපිගොනු ආරක්ෂිතව පවතී.

මෙතරම් විශාල පිරිසකගෙන් සමන්විත වෛද්‍ය මධ්‍යස්ථානයක් ඒ සෑම කෙනෙක් වෙනුවෙන්ම වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යන එකම ආයතනය මෙය බව ඒ පිළිබඳ නිරීක්ෂණය කරන්නෙකුට පැහැදිලි වේ.

සිසුන් හා සේවකයන්ට අවශ්‍ය සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාරවලට අමතරව පහත සඳහන් සේවාවන් ද සපයා දෙනු ලබයි.

- දැඩි අවධානමකට ලක් වූ සිසුන්ට එන්නත් ලබාදීම (හෙපටයිටිස් බී/ARV/TT)
- ක්‍රීඩා යෝග්‍යතාවය සඳහා වෛද්‍ය පරීක්ෂණ
- රසායනික පරීක්ෂණ
- ප්‍රථමාධාර වැඩසටහන්
- සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල පැවැත්වීම
- විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය සත්කාරය පිළිබඳව නවක සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්
- සිසුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය
- මානසික සෞඛ්‍ය පිළිබඳ පසු විපරම් වැඩසටහන්
- අවශ්‍ය අවස්ථාවන්වලදී උපදේශනය ලබාදීම

පිළිගත් රෝහලකින් අපේක්ෂා කරනුයේ ඒ වෙත පැමිණෙන රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමයි. එසේ වුවත් විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය විශේෂ ස්ථානයක් හිමිකර ගනුයේ පහත සඳහන් ප්‍රජා සේවාවන්ද සලසා දෙන බැවිනි.

- විශ්වවිද්‍යාල අපද්‍රව්‍ය කළමනාකරණය
- පාරිසරික සනීපාරක්ෂාව
- ඩෙංගු රෝග පාලනය
- දඩාවතේ යන සුනඛයන් වඳභාවයට පත්කිරීම/එන්නත් කිරීම හා ජලභීතිකාව පාලනය
- නේවාසිකාගාර පරික්ෂාව සහ සනීපාරක්ෂාව අධීක්ෂණය කිරීම

- ආපන ශාලා පරීක්ෂාව හා ස්වස්ථතාව පවත්වා ගැනීම
- සියලුම විශ්වවිද්‍යාල ගොඩනැගිලිවල වේයන් පාලනය කිරීම
- ආහාර හා ජල සනීපාරක්ෂාව
- විවෘත ජලකාණු පද්ධතියක් පවත්වාගෙන යෑම

කාර්යක්ෂම ගිලන් රථ සේවාවක් 24 පැය පුරාම ක්‍රියාත්මක වන අතර කිසියම් ස්ථානයකින් දැනුම් දුන්විට ඉතා කෙටි කාලයක් තුළ එතනට පැමිණි රෝගියා රැගෙනවිත් ප්‍රතිකාර සඳහා යොමු කරයි. (විනාඩි පහක් තුළ කි. මී. 6ක් ආවරණය කරමින් මෙය සිදුවේ. මෙම කාර්ය සංවර්ධිත රටවල් සමඟ සංසන්දනය කළ හැකි වුවත් ශ්‍රී ලංකාව තුළ වෙන කිසිම ස්ථානයක මෙම ක්‍රමය දැකිය නොහැකිය. සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බාහිර රෝගී අංශයට දිනකට රෝගීන් 100ක් පමණ පැමිණෙන අතර ඒ සියල්ලන්ගේ වෛද්‍ය අවශ්‍යතා ඉටු කරනු ලබයි. මෙහිදී යම් රෝගීයෙකුට අවශ්‍ය ඖෂධයක් එම අවස්ථාවේ නොතිබුණහොත් කෙටි කාලයක් තුළ එය මිලදී ගෙන රෝගියාට ලැබෙන්නට සලස්වයි. මෙම කාර්යයද රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් ඉටු නොවන සේවාවකි.

විශ්වවිද්‍යාල සේවක වෛද්‍ය පරීක්ෂණ වැඩසටහනට අදාළව විශේෂ ක්‍රියාකාරකමක් වත්මන් වර්ෂය තුළ ආරම්භ කරන ලදී එම වැඩසටහනට අනුව විශ්වවිද්‍යාලයේ අවුරුදු 40ට වැඩි සියලුම සේවකයන් 900ක් පමණ වාර්ෂිකව හෝ ද්විවාර්ෂිකව පරීක්ෂාවට ලක්කොට අවශ්‍ය විමර්ශන ගාස්තු අය කිරීමකින් තොරව සිදුකරනු ලබයි.

සෑම විශ්වවිද්‍යාල සේවකයෙකුම මෙම වැඩසටහනට ඇතුළත් වන අතර ඔවුන්ට ඔවුන්ගේ විශ්‍රාම දිවිය දක්වාම අවශ්‍ය පරිදි වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කෙරේ. නීරෝගි පුද්ගලයෙකු ලෙස ඔවුන්ගේ විශ්‍රාම දිවිය ගත කිරීමේ අවස්ථාව උදාකරදීම මෙම වැඩසටහනේ අරමුණයි. අඩු වියදමකින් සිදුකෙරෙන මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහාද යෝග්‍ය වේ. එම කාර්යේදී මෙම විශ්වවිද්‍යාල වැඩසටහන අධ්‍යයන කොට නියමු ව්‍යාපෘතියක් ලෙස සැලකීම යෝග්‍ය වේ.

ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වර්ෂයකට වැය කරනු ලබන ප්‍රාග්ධනය රු.5500 පමණ වන අතර විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වැය කරනුයේ රු.3000කට අඩු මුදලකි.
මේ සියලු ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානය සතු කාර්ය මණ්ඩලය වෛද්‍ය නිලධාරීන් සිව්දෙනෙකු, හෙදියන් නවදෙනෙකු හා වෙනත් සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් 40 දෙනෙකුගෙන් යුක්ත වේ.

ඉහත නියමු කාර්යයන් ක්‍රියාත්මක කරන සෞඛ්‍ය මධ්‍යස්ථානය උඩුමහලක් සහිත පැරණි ගොඩනැගිල්ලකින් හා වර්ග අඩි 2000 කින් යුතු ප්‍රජා හා පරිසර ඒකකයකින් යුක්ත වේ. විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක සංරක්ෂණ වැඩසටහන ඵලදායී ජාතික සෞඛ්‍ය සංරක්ෂණ පුද්ගලයෙකු හෝ සෞඛ්‍ය ආර්ථික විද්‍යා කටයුතුවල නිරතව සිටින විශේෂඥයෙකු විසින් අධ්‍යයනය කරන්නේ නම් එය ඉතා යෝග්‍ය වනු ඇතැයි සඳහන් කළ යුතුවේ.

ජයග්‍රහණ

- විශ්වවිද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක වන අතර එහි සාර්ථකත්වය 75% කි.
- ඩෙංගු පාලන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වන අතර මෙවර විශ්වවිද්‍යාලයෙන් වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව 16 දෙනෙකි.
- ශිෂ්‍ය මානසික රෝග පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

- නේවාසිකාගාරවල පවතින මකුණු ගැටලුවට විසඳුම් ලබාදීම ක්‍රියාත්මක වේ. (දුම් ගැසීම)
- වේයන් පාලනය කිරීමේ නිසි වැඩසටහනක් අවසන් කරන ලදී. මේ නිසා විශ්වවිද්‍යාලයට වාර්ෂිකව ඉතිරිවන මුදල රුපියල් මිලියන 12 කි.
- විශ්වවිද්‍යාලය තුළ පවතින දඩාවතේ යන සුනඛයන් පාලනය කිරීම සඳහා සුරතල් සතුන්ගේ හිමිකාරීත්ව වැඩසටහනක් ආරම්භ කරන ලදී.

අනාගත සැලසුම්

- විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ගේ යහපත උදෙසා නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
- හරිත මෙට්‍රික් ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම සඳහා සුදානම් වීම.
- විශ්වවිද්‍යාල විද්‍යාගාරවලින් ඉවතලන හා විනාශකාරී අපද්‍රව්‍ය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.
- විශ්වවිද්‍යාල ආපනශාලා ප්‍රතිසංවිධානය කොට පිළිගත් ප්‍රමිතීන්ට අනුව ඒවා පවත්වාගෙන යෑම සහතික කිරීම
- නේවාසිකාගාරවල සානීපාරක්ෂක කටයුතුවල තත්ත්වය දියුණු කිරීම හා ඒ පිළිබඳ සිසුන් දැනුවත් කිරීම
- විශ්වවිද්‍යාලයට බරක් නොවන පරිදි සෞඛ්‍ය මධ්‍යස්ථානයේ යටිතල (ගොඩනැගිලි) වැඩිදියුණු කිරීම.
- සිසුන් වෙනුවෙන් සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම
- සේවකයන් වෘත්තීමය සෞඛ්‍ය උවදුරුවලින් වළක්වා ගැනීම සඳහා වැඩසටහනක් ස්ථාපිත කිරීම.

5.2 උද්‍යාන අංශය

(උද්‍යාන පාලක - ඩබ්. එම්. ආනන්ද)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 700කි ඉන් හෙක්ටයාර් 230ක් සංවර්ධනය කොට පීඨ, නේවාසිකාගාර, කාර්ය මණ්ඩල නිවාස හා අනෙකුත් පහසුකම් ස්ථාපිත කොට ඇත. විශ්වවිද්‍යාල උද්‍යානයේ විවිධ මල්ගස් වර්ග, විශාල තෘණ බිම් ප්‍රමාණයක සැලකිය යුතු මට්ටමේ උද්‍යාන අලංකාර සිදුකර ඇත. උද්‍යාන අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ ඉහත සඳහන් කළ උද්‍යාන කටයුතු උද්‍යාන මූලධර්මයන්ට අනුකූලව පවත්වා ගනිමින් තවදුරටත් ඒවා වැඩිදියුණු කිරීමයි.
උද්‍යාන අංශය ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම උසුලයි.

- විශ්වවිද්‍යාල භූමියේ පවතින උද්‍යාන රටා නඩත්තු කිරීම
- පැල තවාන් නඩත්තු කරමින් විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට මල් පෝච්චි සැපයීම
- විශ්වවිද්‍යාලයේ දේපලවලට හානි විය හැකි අනතුරුදායක ගස් සහ ගස්වල අතු ඉවත් කිරීම සහ සාමාන්‍ය සේවා අංශය සහ ආරක්ෂක අංශය සමඟ එක්ව දැව කඳන් ටෙන්ඩර්ගත කොට අලෙවි කිරීමට සහය වීම
- විශ්වවිද්‍යාල උද්‍යාන රටා ඉහළනංවා වැඩි දියුණු කිරීම
- නව උද්‍යාන සැලසුම් සකස් කිරීම, වියදම් ඇස්තමේන්තු සැකසීම හා නව උද්‍යාන සැලසුම් ක්‍රියාත්මක කිරීම

ජයග්‍රහණ

උද්‍යාන අංශය 2017 වසරේ දී ඉටු කළ කාර්යයන් සංක්ෂේපයෙන් පහත දැක්වේ

විශ්වවිද්‍යාලයේ උද්‍යාන අලංකරණ කටයුතු සතුටුදායක මට්ටමින් පවත්වාගෙන ගිය අතර දිරාගිය අධිවර්ධිත ගස් ඉවත්කොට අළුතෙන් රුක්රෝපනය කිරීම, හිස් වූ ස්ථානවල නව ගස්වර්ග රෝපනය කිරීම සහ විශ්වවිද්‍යාල දේපලවලට හානිවිය හැකි අනතුරුදායක ගස් සහ ශාක ඉවත් කිරීම වැනි කාර්යයන් එම කටයුතු අතරට ඇතුළත් විය.
විශ්වවිද්‍යාල භූමියේ පවතින බඩවැටි නිරන්තරව කප්පාදු කොට අඩිපාරවල් සහ පඩිපෙළවල්වල පැලෑටි ගලවා ඉවත්කොට නියමාකාරයෙන් නඩත්තු කරන ලදී.
ඉහළ හන්තාන පෙදෙසේ මාක්ස් කන්ද, මාවලවත්ත හා කදුගොඩැල්ල යන ප්‍රදේශවල ගිණිගැනීම් වළක්වා විශ්වවිද්‍යාල දේපල ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී.
අදාළ වර්ෂයේදී විශ්වවිද්‍යාලය තුළ පැවැත් වූ සියලුම විශේෂ අවස්ථාවන්ට උපරිම සහයෝගය දැක්වීමට උද්‍යාන අංශයට හැකිවිය. විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට මල්පොච්චි සැපයීම, නාට්‍ය උළෙල වෙනුවෙන් සරත්චන්ද්‍ර එළිමහන් රංග පීඨය සකස්කර දීම, වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ හා පේරාදෙණිය පර්යේෂණ සැසියේ කටයුතුවලට සහායවීම සිදුකළ කාර්යයන්වලින් කිහිපයකි.

විශේෂ වැඩි දියුණු කිරීම් හා ක්‍රියාකාරකම්

- කපන ලද තණකොළ, අතු, ගොම සහ වෙනත් යෝග්‍ය අපද්‍රව්‍ය යොදා ගනිමින් උද්‍යාන කටයුතු සඳහා කොම්පෝස්ට් පොහොර සකස් කරන ලදී.
- 75 වැනි වප්‍ර ජයන්ති සැමරුමේ විශේෂ කටයුතුවලට සහභාගි වූ අතර මෙම අවස්ථාව අනුස්මරණය කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් සනාතන මන්දිර පරිශ්‍රයේ ගසක් රෝපනය කිරීමේ අවස්ථාවට සම්බන්ධව කටයුතු කරන ලදී.

උද්‍යාන අලංකාර වැඩි දියුණු කිරීම හා නව උද්‍යාන සැලසුම්

- මා ඔය, සනාතන මන්දිර පරිශ්‍රය, පීඨ පොදු ස්ථාන, නේවාසිකාගාර හා හිල්ඩා උද්‍යානයේ උද්‍යාන අලංකරණ කටයුතු සිදුකරන ලදි.
- පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨ පරිශ්‍රයේ උද්‍යාන කටයුතු සිදු කිරීම.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨ පරිශ්‍රයේ උද්‍යාන කටයුතු සිදුකිරීම හා iPURSE කටයුතුවලට විශේෂයෙන් මැදිහත්ව කටයුතු කිරීම.
- නව කලා ගොඩනැගිල්ල හා අධ්‍යාපන ගොඩනැගිල්ල අතර ප්‍රදේශය වෙනුවෙන් උද්‍යාන සැලසුම් හා ඇස්තමේන්තු සකස් කොට ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් උද්‍යාන සැලසුම් සකස් කරන ලදී.

ප්‍රධාන ක්‍රියාකාරකම්

- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තෘණ බිම්වල තුඹස් ඉවත් කොට මනාලෙස සකස් කිරීම
- විශ්වවිද්‍යාලයේ මල් පාත්ති නඩත්තු කොට වැඩි දියුණු කිරීම

බාධක සහ පිළියම්

එදිනෙදා නඩත්තු කටයුතු පිළිගත් මට්ටමින් පවත්වාගෙන යෑමේදී මෙම අංශය මුහුණපාන ප්‍රධාන ගැටලුව වන්නේ කම්කරු හිඟයයි.
විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතින වැඩ කටයුතු ප්‍රමාණය පරීක්ෂාකර බැලීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණ හැකියාවක් නොමැති වීම.

අනාගත සැලසුම්

වැඩි දියුණුව සඳහා යෝජනා

- උද්‍යාන අංශයේ කටයුතු සඳහා කැබ් රථයක් ලබාගැනීම.
- අවම තරමින් උද්‍යාන අධීක්ෂකයන් දෙදෙනෙකු බඳවාගෙන අධීක්ෂණ බලය වැඩි කිරීම.
- මෙම අංශයේ කම්කරුවන් වෙනත් අංශවලින් කෙරෙන ඉල්ලීම්වලට අනුව මාරු නොකිරීම.
- යන්ත්‍ර ක්‍රියාකරු, බඩවැටි කප්පාදු කරන්නා, ගස් කැපුම් සහායක වැනි නව පුහුණු සේවක තනතුරු නිර්මාණය කොට සේවක සංඛ්‍යාව වැඩි කිරීම.
- සනාතන මන්දිර පරිශ්‍රය වැනි තෝරාගත් ස්ථානවල වැඩිදියුණු කිරීම් සිදුකිරීම.

5.3 විනයාරක්ෂක අංශය

(ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී - ඩබ්. ඒ. ඒ. වෙරහැර)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට, පර්යේෂකයන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට අධ්‍යයන, පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සිදුකර ගෙන යෑම පිණිස උචිත නිදහස් මෙන්ම සාමකාමී අධ්‍යයන හිතකාමී පරිසරයක් පවත්වා ගැනීමට දායක වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විනයාරක්ෂක අංශයේ ප්‍රධාන පරමාර්ථය වේ.
විනයාරක්ෂක අංශය ප්‍රධාන විනායරක්ෂක නිලධාරී පිරිමි විනයාරක්ෂක නිලධාරීන් පස් දෙනෙකුගෙන් හා කාන්තා විනයාරක්ෂක නිලධාරිණියෙකුගෙන් යුක්තවේ. මෙම අංශය නියෝජ්‍ය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණයට යටත් වේ. නියෝජ්‍ය උපකුලපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සිසුන්ගේ ක්‍රියාකාරකම් හා ඔවුන්ගේ චර්යාව පිළිබඳව සුපරීක්ෂාකාරී වෙමින් සිසු විනය පවත්වා ගැනීම විනයාරක්ෂක අංශයේ ප්‍රධාන කෘත්‍ය වේ.

ජයග්‍රහණ

විනයාරක්ෂක අංශය 2016 වසරේදී නීති කඩකිරීම් අවම කිරීම සඳහා නවක සිසුන් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා හා විනය ක්‍රියා මාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී.

උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, විනය පාලක හා ශිෂ්‍ය උපදේශකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ නවක වදය වැළැක්වීමේ වැඩසටහනක් හා සමාජ සහජීවන වැඩසටහනක් පවත්වන ලදී.

යාපනය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන් 12දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී.

විනයාරක්ෂක අංශය පාසැල් සිසුන් සඳහා නායකත්ව හා ධනාත්මක ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩමුළුවක් ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ අවසන් වසර සිසුන් වෙනුවෙන් ඇඳුම් රටාව, ආචාර ධර්ම හා භෝජන ගැනීමේ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ප්‍රායෝගික සැසියක් පවත්වන ලදී.

අදාළ වර්ෂයේදී සිදු වූ සිද්ධි 25ක් කෙරෙහි අවධානය යොමු කරමින් කරුණු සෙවීමේ මෙහෙයුම් සාර්ථකව අවසන් කරන ලදී.

විශ්වවිද්‍යාලය තුළ නවක වදය වැළැක්වීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉෂ්ට කළ අතර කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ ආරක්ෂාව සපයමින් විශ්වවිද්‍යාල ආරක්ෂක අංශයට සහයෝගය දක්වන ලදී. පීඨාධිපතින් විනයපාලක හා ශාලාධිපතීන් සමඟ පැවති ශිෂ්‍ය විනය කටයුතු සම්බන්ධ විනය පරීක්ෂණවලට පූර්ණ සහයෝගය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවය, ප්‍රදර්ශන, නාට්‍ය උළෙල, සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය ආදී විශේෂ අවස්ථාවලදී විනයාරක්ෂක අංශය නොමද සහයෝගයක් දක්වන ලදී. සිසුන් සමඟ කටයුතු කිරීමේදී ත්‍රී රෝද රථ රියදුරන්ගේ සේවය මහත් පිටුවහලක් වන බැවින් හිඳගල, ගලහ හංදිය, දංගොල්ල හංදිය, පේරාදෙණිය හා මහකන්ද බස් නැවතුම්පොල ආදී ස්ථානවල සිටින ත්‍රීරෝද රථ රියදුරන් සම්බන්ධීකරණ වැඩසටහනක් ස්ථාපිත කරන ලදී.

බාධක සහ පිළියම්

සිසුන් දොළොස් දහසකගේ පමණ විනය කටයුතු පවත්වාගෙන යෑමේදී විනයාරක්ෂක ඒකකය මුහුණුපාන ප්‍රධාන අභියෝගයක් වන්නේ ප්‍රමාණවත් විනයාරක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වීමයි.
පශ්චාත් උපාධි, රටේ නීතිය හා රෙගුලාසි හැදෑරීම, මානව හිමිකම් කළමනාකරණය හා උපදේශනය වැනි බාහිර පුහුණු හා සුදුසුකම් පිළිබඳ ඔවුන්ගේ දැනුම සංවර්ධනය කරගැනීම අත්‍යාවශ්‍ය වේ.

අනාගත සැලසුම්

විනයාරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 12 දක්වා වැඩි කොට නියෝජ්‍ය ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී තනතුරක් නිර්මාණය කිරීම, උපදේශනය, ගැටුම් නිරාකරණය, කළමනාකරණය හා විදෙස් පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම වැනි වෘත්තීය (පුහුණු) පාඨමාලා හැදෑරීම පිණිස විනයාරක්ෂකයන් මෙහෙවීම. මේ අතර මෙම අංශය වෙත ස්ථිර ලිපිකරුවෙකුගේ සේවය අවශ්‍ය කරයි.

5.4 ශාරීරික අධ්‍යාපන අංශය

(අධ්‍යක්ෂ - එම්. ඩී. පාලිත කුමාර)

හැඳින්වීම

විශ්වවිද්‍යාලය තුළ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩාව වෙනුවෙන් වගකිවයුතු අංශය වනුයේ ශාරීරික අධ්‍යාපන අංශයයි. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ කායික හා මානසික සුවතාවය ඉහළ නැංවීමට මෙම අංශය විශාල වෙහෙසක් දරයි. මෙම අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ ප්‍රථම උපාධි සිසුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා හා විනෝද ජනක අවස්ථාවන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ආයතන වෙනත් දෙස් විදෙස් විශ්වවිද්‍යාල විසින් සංවිධානය කරනු ලබන තරගකාරී ක්‍රීඩා ඉසව්වලට සහභාගි වීමේ අවස්ථා උදාකර දීම සහ ක්‍රීඩා ප්‍රවර්ධන වැඩමුළු හා න්‍යායාත්මක පංති කාලානුරූපව ක්‍රියාත්මක කිරීම ශාරීරික අධ්‍යාපන අංශයේ ප්‍රධාන කෘත්‍යයන් වේ. එවැනි වැඩසටහන් තුළින් සිසුන්ට ඔවුන්ගේ ගතසිත සංවර්ධනය කරගැනීමේ අවස්ථාව උදාකරදීම තුළින් ඔවුන්ගේ අධ්‍යාපනික කාර්යයන් මෙන්ම ජීවිතය ද සාර්ථක කරගත හැකිවනු ඇත. එබැවින් ශාරීරික අධ්‍යාපන අංශය ප්‍රධාන වශයෙන්ම එවැනි වැඩසටහන් පැවැත්වීම සැලසුම් කරනුයේ එතුළින් ශාරීරික ශක්‍යතාවය, නීරෝගිභාවය හා සම්බන්ධ යෝග්‍යතාවය, ස්වයං වගකීම හා ශාරීරික ක්‍රියාකාරකම්වලින් අත්කරගන්නා විනෝදය සියලුම සිසුන් තුළ ඉහළ නංවා ජීවිත කාලීනව ඔවුන් ශාරීරික වශයෙන් ක්‍රියාශීලි පිරිසක් බවට පත් කිරීමේ අටියෙනි.

මළල ක්‍රීඩා පිටියේ නව ක්‍රීඩාගාරය

දීර්ඝ කාලයක් තිස්සේ මෙම අංශයට දැනුණු අවශ්‍යතාවයක් වූ මළල ක්‍රීඩා පිටිය සඳහා ක්‍රීඩාගාර සංකීරණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 40ක මුදල් ප්‍රතිපාදනයක් ලැබිණ. මෙම දෙමහල් ගොඩනැගිල්ලේ කටයුතු අවසන් වීමට ආසන්නව පවති.

අභ්‍යාස හා ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යෑම

ශාරීරික අධ්‍යාපන අංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය සමඟ එක්ව ඉහත පාඨමාලාව සාර්ථකව පවත්වන ලදී. එම පාඨමාලාව නවවැනි කණ්ඩායම වෙනුවෙන් දෙසැම්බර් 09 දින ආරම්භ විය.

අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා ශූරතාවය

ඉහත ශූරතාවය සඳහා සහභාගි වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලය මල්ලව පොර, බර ඉසිලීම, රගර් හා පාපන්දු යන ඉසව්වල පිරිමි අංශයේ ශූරයන් බවට පත්විය. පිරිමි කණ්ඩායම යටතේ චෙස් ක්‍රීඩාවෙන් දෙවන ස්ථානයද ජවන හා පිටිය මළල ක්‍රීඩා අංශයෙන් (කාන්ත) තෙවන ස්ථානයද හිමිකර ගත්තේය.

කෙසේ වෙතත් පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙවර සමස්ත පිරිමි අංශයෙන් සිවුවන ස්ථානයත් සමස්ත කාන්තා අංශයෙන් පස්වැනි ස්ථානයත් පමණක් හිමිකර ගැනීමට සමත්විය. සමස්ත ශූරතාවය අවසානයේදී ලකුණු 243ක් ලබාගනිමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය පස්වැනි ස්ථානයට පත්විය.

අන්තර් පීඨ නවකයන්ගේ ශූරතාවය - 2017

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ නවක සිසුන්ට නැවුම් වූ ක්‍රීඩා අත්දැකීමක් ලබාදෙන මෙම ශූරතාවය 2017 මාර්තු 18 සිට 31 දින දක්වා ඉතා ඉහළින් පවත්වන ලදී. ශාරීරික අධ්‍යාපන අංශය විසින් සංවිධානය කළ මෙම තරඟාවලියට සියලුම පීඨ සහභාගි විය.

29 වැනි ලෝක විශ්වවිද්‍යාල සමර් ගේම්ස් - 2017

29 වැනි යුනිවසිඩ්ඩ් - 2017 ලෙස පොදුවේ හඳුන්වන මෙම තරගාවලිය 2017 අගෝස්තු 19 සිට 30 දින දක්වා තයිපෙහිදී අති උත්කර්ෂවත් ලෙස පවත්වන්නට විය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පිරිමි ළමුන් සිව් දෙනෙකු සහ ගැහැණු ළමුන් දෙදෙනෙකු මෙම තරගාවලියට සහභාගි වූහ.

බර ඉසිලීමේ කණ්ඩායමේ පුහුණුකරු ලෙස ශාරීරික අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ පාලිත කුමාර මහතා හා තයිවොන්ඩෝ කණ්ඩායමේ කණ්ඩායම් නායක ලෙස ඒ. එස්. පී. මල්ලවආරච්චි මහතා සහභාගි විය.

අධ්‍යාපන පුහුණු වැඩසටහන්

විශ්වවිද්‍යාලයීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉලක්ක කරගනිමින් ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා පුහුණු වැඩසටහන් වර්ෂය පුරා පවත්වන ලදී. ඒ හැරුණු විට විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම වෙනත් සාමාන්‍ය සේවකයන් සඳහාද සවි පුහුණු හා ශාරීරික සුවතා වැඩසටහන් නිරන්තරයෙන් පවත්වන ලදී. විශ්වවිද්‍යාලයේ පවතින සියලුම ක්‍රීඩා ඉසව් සඳහා පුහුණු සැසි සහ වැඩමුළු වර්ෂය පුරා පවත්වන ලදී. විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉලක්ක කරමින් එය රොබික්ස් සහ වෙනත් විනෝද ක්‍රීඩා ඉසව්ද පවත්වන ලදී. මීට පෙර ක්‍රීඩා හුරුවක් නොතිබී විශ්වවිද්‍යාල සිසුන් ඉලක්ක කොට ගෙන නව ව්‍යාපෘතියක් ලෙස ක්‍රීඩා පිළිබඳ කෙටි පාඨමාලාවක් එළි දක්වන ලදී. මාස තුනක පාඨමාලාවක් වූ මෙම පාඨමාලාවට සිසුන් 30 දෙනෙකු පමණක් ඇතුළත් කරගනී. සිසුන් තුළ මහත් උනන්දුවක් ඇති කළ මෙම පාඨමාලාව ලබන වසරේදිත් පැවැත්වීමට ශාරීරික අධ්‍යාපන අංශය අදහස් කරයි.

වර්ණ ප්‍රදාන උත්සවය - 2016

ක්‍රීඩා ඉසව්වලදී විශිෂ්ටතා දැක්වූ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගය කරනු පිණිස පවත්වන වර්ණ ප්‍රදාන උත්සවය මාර්තු 16 දින ඊ. ඕ. ඊ. පෙරේරා ශ්‍රවණාගාරයේදී අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී. 2016 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් අන්තර් විශ්වවිද්‍යාල ජාතික හා ජාත්‍යන්තර තරගවලට සහභාගි වී විශිෂ්ටතා දැක්වූ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙම අතිඋත්කර්ෂවත් උත්සවයේදී වර්ණ ප්‍රදාන හා විශේෂ ත්‍යාග පිරිනමන ලදී. විශේෂ ත්‍යාග 17කට අමතරව ක්‍රීඩකයන් 143කු හා ක්‍රීඩිකාවන් 72 දෙනෙකු ඔවුන් දේශීය හා ජාත්‍යන්තර තරඟවලදී ලබාගත් ජයග්‍රහණ වෙනුවෙන් පූර්ණ වර්ණ ප්‍රදානයන්ගෙන් පිදුම් ලැබුහ.

ප්‍රධාන තරඟාවලි / ආරාධිත තරඟාවලි /විදෙස් සංචාර

ක්‍රීඩා අමාත්‍යාංශය හා පාපන්දු ලීගය විසින් සංවිධානය කළ ප්‍රධාන තරඟාවලි කිහිපයකට විශ්වවිද්‍යාලයීය කණ්ඩායම් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ මහත් උනන්දුවෙන් සහභාගි වූහ. ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල විසින් සංවිධානය කළ ආරාධිත තරඟාවලි කිහිපයකට පේරාදෙණිය විශ්වවිද්‍යාල කැරම්, පාපන්දු, රගර්, හොකි, ක්‍රිකට්, ටයිවොන්ඩෝ, චෙස් දැල්, පන්දු පැසිපන්දු හා ටේබල් ටෙනිස් කණ්ඩායම් සහභාගි වූහ.

ජාතික තරඟාවලි

පැසිපන්දු

51වැනි ජ්‍යෙෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලිය - 2016 පෙබරවාරි 02 දින සිට 05 දින දක්වා මහනුවරදී පැවත්විය. සී. දිසානායක (E/13/074) බී. ආර්. ඊ. ප්‍රේමවර්ධන (A/13/A1/780) ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල පැසිපන්දු පිරිමි කන්ඩායම නියෝජනය කළ අතර බී. ඒ. එම්. ජයසිංහ මෙනෙවිය (D/13/40) කාන්තා කණ්ඩායම නියෝජනය කළාය. මෙම තරඟාවලියේදී කාන්තා කණ්ඩායම දෙවැනි ස්ථානය හිමි කරගනු ලැබිය.

දැල් පන්දු

අන්තර් සංගම් දැල්පන්දු ශූරතාවලිය-2017 සඳහා ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල දැල්පන්දු කණ්ඩායම සහභාගි විය. මෙම තරඟාවලිය පෙබරවාරි 18 දින රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගණයේදී පැවැත්විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ඩී. එන්. ආර්. කොඩිතුවක්කු (A/12/BBA/017) වයි. ඕ. ජේ. සිල්වා (S/12/971) එස්. එම්. එන්. එස්. සමරකෝන් (S/13/172) සහ එස්. බී. ගෝමස් (A/13/A1/773) ඒ සඳහා සහභාගි වූ අතර ඩී. එන්. ආර්. කොඩිතුවක්කු කණ්ඩායම් නායිකාව ලෙස තෝරා ගන්නා ලදී.

කැරම්

49වැනි ජාතික කැරම් ශූරතාවය - 2017 පෙබරවාරි 11 දින සිට මාර්තු 5 දින දක්වා පවත්වන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩිකාවන් සිව්දෙනෙකු හා ක්‍රීඩකයන් 8 දෙනෙකු මෙම තරඟාවලිය සඳහා සහභාගි වුහ. ඒ. පී. එම්. පී. බණ්ඩාර (A/13/BBA/012) ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ ඉහළ ස්ථානය හිමිකර ගත්තේය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම දෙවන කාණ්ඩයට සුදුසුකම් ලබයි.
තෙවැනි කාන්ඩයේ රැදී සිටි මෙම විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම මේ වසරේ ක්‍රිකට් සැසිය අවසන් වනවිට දෙවන කාණ්ඩයට අතුළත් වීමට සුදුසුකම් ලැබීය. තෙවැනි කාණ්ඩයේ සිට දෙවැනි කාණ්ඩයට ප්‍රවිශ්ටවීමේ ගමන තරඟකාරීත්ව මත දුෂ්කර වුවත් අප ක්‍රීඩකයන්ගේ හැකියාව සහ ධෛර්යය නිසාවෙන් මේ තත්ත්වයට ළඟා වීමට හැකි විය.

12වැනි UITM ජාත්‍යන්තර ක්‍රීඩා ෆියස්ටාවට සහභාගිවීම - මැලේසියාව - 2017

මැලේසියාවේ තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ මෙම ක්‍රීඩා ඉසව්ව 2017 අගෝස්තු 2-6 දින දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විය. මෙම විශ්වවිද්‍යාලයීය ගැහැණු පිරිමි ටෙනිස් කණ්ඩායම්වල ක්‍රීඩකයන් හය දෙනෙකු සහ ක්‍රීඩිකාවන් දෙදෙනෙකු සහභාගි වූ අතර එහිදී ඔවුන් අවසන් පූර්ව වටය කරා ළඟාවිය.

UiTM ආරාධිත සුහද හොකී තරඟයට සහභාගිවීම මැලේසියාව - 2017

මැලේසියාවේ MARA තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සුහද හොකි තරඟයක් සඳහා ආරාධනාවක් ලැබුණ අතර, ඒ සඳහා මෙම විශ්වවිද්‍යාලයේ පිරිමි සිසුන් 10 දෙනෙකු සහභාගි වූහ. මෙම තරඟාවලිය මැලේසියාවේ MARA තාක්ෂණ විශ්වවිද්‍යාලයේදී නොවැම්බර් 22-26 දින දක්වා පවත්වනු ලැබිණ.

බාධක සහ පිළියම්

ශාරීරික අධ්‍යාපන අංශය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය හා සම්බන්ධ Non-credit විෂයන් පැවැත්වීමට සැළසුම් කළද එය අසාර්ථක විය. එසේ වුවත් මෙම ව්‍යාපෘතිය මේ වසරේ සිට ඉංජිනේරු, සම සෞඛ්‍ය හා කලා පීඨ සඳහා පැවැත්වීමට කටයුතු කරනු ඇත. දීර්ඝ කාලයක සිට පැවත එන ක්‍රීඩා පහසුකම් ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. මළල ක්‍රීඩා පිටිය, රගර්, පාපන්දු, ක්‍රිකට්, ක්‍රීඩාපිටි, පිහිණුම් තටාක හා ගෘහස්ත ක්‍රීඩාංගණය මෙලෙස ප්‍රතිසංස්කරනය කළ යුතුව පවති. මුල්‍යමය සීමාවන් හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවිය.

අනාගත සැලසුම්

ශාරීරික අධ්‍යාපන අංශය සියලුම පීඨවල ප්‍රථම උපාධි විෂයමාලාවන්ට ක්‍රීඩා විෂයන් non-credit පදනමින් ඇතුළත් කිරීමට අදහස් කරයි. තවද මෙම අංශය විශ්වවිද්‍යාලයට පරිබාහිර පුද්ගලයන් වෙනුවෙන් ක්‍රීඩා හා ශාරීරික සුවතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දීමටද අපේක්ෂා කරයි.

5.5 ආරක්ෂක සේවාවන්

(වැඩබලන ආරක්ෂක නිලධාරී - ආර්. එම්. ඩිනාල් රත්නායක)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 1795කින් යුක්ත වේ. මෙතරම් විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතින විශ්වවිද්‍යාලයට අයත් නිශ්චල හා චංචල දේපල ආරක්ෂා කිරීමේ කාර්ය භාරය විශ්වවිද්‍යාල ආරක්ෂක අංශ විසින් සිදුකරනු ලබයි. ප්‍රධාන ආරක්ෂක නිලධාරී නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී, ආරක්ෂක පරීක්ෂකවරු හා ආරක්ෂක නියාමකයන්ගෙන් මෙන්ම කාන්තා ආරක්ෂක නියාමකවරියන්ගෙන් ආරක්ෂක අංශය සමන්විත වේ. මේ වන විට ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. මෙම ආරක්ෂක අංශය සතු ආරක්ෂක පරීක්ෂකවරුන් 11ක් හා ආරක්ෂක නියාමකවරුන් 62 දෙනෙකු සිටින අතර එම සංඛ්‍යාව මුළු භූමි ප්‍රමාණය ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවේ. එබැවින් පුද්ගලික ආරක්ෂක සේවාවන්ගේ සේවය ලබාගැනීමට සිදුව ඇත.

ජයග්‍රහණ

- මුරකුටි හා ජංගම මුර සංචාර මඟින් සමස්ත විශ්වවිද්‍යාලයේ නිශ්චල චංචල දේපල ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක පියවර ගැනීම
- විශ්වවිද්‍යාලය තුළ නීති විරෝධී ක්‍රියාවන් වැළක්වීම හා ඒවා විමර්ශනය කොට, ඒ පිළිබඳ පරිපාලනය දැනුවත් කිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ වෙනත් සේවකයන් විසින් මුහුණ දෙන ගැටලු හඳුනාගෙන ඒ සැමට ආරක්ෂාව සැපයීම
- සොරකම් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම හා ගිණිගැනීම් වැළැක්වීමට හා පාලනය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- වැඩමුළුවලට හා ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂාව ලබාදීම
- විශ්වවිද්‍යාල නිවාසවල පදිංචිව සිටින සේවකයන් අතර ඇතිවන අර්බුධ විමර්ශනය කිරීමට සහායවීම.
- විශ්වවිද්‍යාලය තුළ ඇතිවිය හැකි ගැටලු හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවහොත් පොලීසිය සමග සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම
- ආගමික කටයුතු හා සමාජ සුබසාධන කටයුතුවල නියැලීම (ලේ දන්දීමේ කඳවුර)
- එදිනෙදා ලැබෙන පැමිණිලි හා සිද්ධීන් පිළිබඳ විමර්ශනය කොට පරිපාලනයට වාර්තා කිරීම

බාධක සහ පිළියම්

- ප්‍රමාණවත් මිනිස් බලයක් නොමැති වීම ආරක්ෂක රාජකාරී ඉටුකිරීමට බාධකයක් වී ඇත
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම
- සේවා ස්ථානවල භෞතික සම්පත් හිඟය
- විශ්වවිද්‍යාල ඉඩම වටා වැටවල් නොමැතිවීම
- විශ්වවිද්‍යාලය හරහා දිවෙන ප්‍රධාන මාර්ගය බාධාවකි
- ආරක්ෂක කටයුතු සඳහා නවීනතම තාක්ෂණික උපකරණ නොලැබීම

ආනාගත සැලසුම්

- මනා පුහුණුවක් ලද ගැහැණු පිරිමි ආරක්ෂක නියාමකවරුන් බඳවා ගැනීම - අට ශ්‍රේණිය සමත් පුද්ගලයන් වෙනුවට අ.පොෙ.ස.(සා.පෙ.) සමත් පුද්ගලයන්ට ප්‍රමුඛතාවය ලබාදීම
- ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා ගිණි නිවීම, ප්‍රථමාධාර, මහජන සම්බන්ධතා, අපරාධ නීතිය, සිවිල් නීතිය ආදී කරුණු පිළිබඳ වැඩමුළු පැවැත්වීම
- විද්‍යාත්මක ක්‍රමයන් යොදාගෙන සොරකම් වැළැක්වීම
- සෑම පීඨයකම උප ආරක්ෂක කාර්යාලයක් ස්ථාපිත කොට, එක් එක් කාර්යාලයේ වගකීම ආරක්ෂක නිලධාරියෙකු යටතට පත්කිරීම
- CCTV කැමරා සවිකොට විශේෂයෙන්ම විද්‍යාගාර, පුස්තකාල හා ගබඩා ආදී ස්ථානවල ආරක්ෂාව සැලසීම
- වැදගත් ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ආරක්ෂක මුරකුටි ඉදිකිරීම. (මීට විශ්වවිද්‍යාලයට ඇතුළත්වන ප්‍රධාන ප්‍රවේශ දොරටුවද ඇතුළත් විය යුතුය.)
- දිවා රාත්‍රී මුර සංචාර මඟින් තොරතුරු රැස්කිරීම. සියළුම වාහනවලට නිසි ආරක්ෂාවක් සැලසීම සඳහා සියලුම වාහන එක් ස්ථානයක ගාල් කර තැබීම පිණිස විශේෂ රථගාලක් ඉදිකිරීමට යෝජනාවක් ඉදිරිපත් කිරීම. එසේ නොමැති වූ විට එය විශ්වවිද්‍යාලයේ සුන්දරත්වයට බලපායි.

5.6 ශිෂ්‍ය නේවාසික අංශය

(අධ්‍යක්ෂ - ඒ. එන්. සිරිවර්ධන)

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය නේවාසික අංශය විශ්වවිද්‍යාලය තුළ පවතින 21කට අධික නේවාසිකාගාර පරිපාලනය කරමින් ඒවා සිසුන්ට වෙන් කර දෙමින්, විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට ඉතා පුළුල් සේවාවන් සලසා දෙනු ලබයි. කාර්යක්ෂම හා ඵලදායී නේවාසික සේවාවන් හා පහසුකම් සපයා දෙමින් සිසුන්ට සහායවීම මෙම අංශයේ ඉලක්කයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම, නේවාසික සිසුන්ගෙන් නේවාසිකාගාර ගාස්තු හා හානි පූර්ණ ගාස්තු අයකර ගැනීම, නේවාසිකාගාරවල අදාළ උපශාලාධිපතීන් විසින් කරන ඉල්ලීම්වලට අනුව එම නේවාසිකාගාරවලට ලී බඩු සපයා දීම මෙම අංශයේ ප්‍රධාන කෘත්‍යයන් වේ.

- නේවාසික අයදුම්පත් /නේවාසික පහසුකම් වෙන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි තොරතුරු හා උපදෙස් සැපයීම.
- අවශ්‍යතාවන්ට අනුව අයදුම්කරුවන් හඳුනාගැනීම (උදා-ආබාධිත සිසුන්)
- සියලුම ජාතීන්ට අයත් සිසුන් වෙත සමබරව ඵලදායී ආකාරයෙන් ශිෂ්‍ය නේවාසිකාගාර වෙන් කරදීම
- අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින්ට නිසි අයුරින් නේවාසික පහසුකම් සැපයීම
- ශිෂ්‍ය ගැටලුවලට හා අවශ්‍යතාවන්ට කාර්යක්ෂමව හා ඵලදායී ආකාරයෙන් ප්‍රතිචාර දැක්විය
- නේවාසික සිසුන්ට වඩාත් උසස් වූ සහයෝගයක් ලබාදීම සඳහා විශ්ව විද්‍යාලයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ මැදිහත් වී සම්බන්ධීකරණය කිරීම.
- සිසුන්ට සපයන පහසුකම් හා සේවාවන් පිළිබඳ පවතින තත්ත්වයන් විශ්ලේෂණය හා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ශිෂ්‍ය අදහස් ලබාගැනීම
- ශිෂ්‍ය නේවාසිකාගාරවල ආහාර ස්වස්ථතාව හා සනීපාරක්ෂක සේවාවන් අධීක්ෂණය කොට ප්‍රමිතිය පවත්වා ගැනීම

අපගේ ශිෂ්‍ය නේවාසික ප්‍රතිපත්තිය

සිසුන්ගේ නිවාසවල සිට විශ්වවිද්‍යාලයට පවතින දුර සැලකිල්ලට ගනිමින් නේවාසික පහසුකම් සපයනු ලබයි.

- ප්‍රථම වසර සිසුන් - කි. මී. 30 ට වැඩි
- දෙවන වසර සිසුන් - කි. මී. 40 ට වැඩි

(අදාළ අධ්‍යයන වසර තුළ නේවාසිකාගාරවල පවතින පුරප්පාඩුවලට අනුව)

- තෙවන වසර සිසුන් - කි. මී. 30 ට වැඩි
- සිව්වන වසර සිසුන් - කි. මී. 20 ට වැඩි
- පස්වන වසර සිසුන් - කි. මී. 10 ට වැඩි

- එපමණක් නොව මෙම අංශය මඟින් ක්‍රීඩා කණ්ඩායම්වල නායකයන් හා උපනායකයන් සඳහාද නේවාසිකාගාර පහසුකම් සපයනු ලබයි.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන්
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් වෛද්‍ය හේතූන් මත නිර්දේශ කරනු ලබන සිසුන්
- ග්‍රාමසේවා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා නියෝජ්‍ය උපකුලපති සහ අධ්‍යක්ෂ/නේවාසික යන අයගේ නිර්දේශය මත දැඩි ආර්ථික අපහසුතාවයන්ගෙන් පෙළෙන සිසුන් සඳහාද නේවාසික පහසුකම් සපයනු ලබයි.

- ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් වෙත නේවාසික පහසුකම් සැපයීමේ ප්‍රධාන සැලසුමක් විශ්වවිද්‍යාලය සතුව පවතින නමුත් මේ වනවිට එම පහසුකම් සැපයිය හැක්කේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 65% කට පමණි. විශ්වවිද්‍යාලය සතුව නේවාසිකාගාර 21ක් පවතින අතර ඒ එක් එක් ශාලාවට අර්ධ කාලීන අධ්‍යයන ශාලාධිපතිවරයෙකු, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපතිවරයෙකු, අධ්‍යයන උපශාලාධිපතිවරයෙකු හා පූර්ණ කාලීන උප ශාලාධිපතිවරයෙකුද සිටින අතර ඔහු නේවාසිකාගාරවල එදිනෙදා පවතින කටයුතුවලට සහයෝගය දක්වයි.

ජයග්‍රහණ

- නව සරසවි උයන හා සේනක බිබිලේ නේවාසිකාගාර සියලු පහසුකම්වලින් යුක්තව සිසුන් වෙත පවරා දෙන ලදී.
- මහකන්ද (අංක 05) හා ඇතුළත්මුදලි (අංක 06) නව නේවාසිකාගාරවල ඉදිකිරීම් කටයුතු අවසන් කොට ඇති අතර, ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙමින් පවතී. 2018 වසරේ සිට මෙම ශාලාවල සිසුන් 800 කට පහසුකම් සැපයිය හැකිය.
- 2017 වසරේදී සිසුන් 7086කට නේවාසික පහසුකම් ලබාදී ඇත.
- මේ වසරේ බඳවාගත් ගැහැණු සිසුන් සංඛ්‍යාව වැඩිවිමත් සමඟ සරසවි උපයන පිරිමි නේවාසිකාගාරය ගැහැණු ළමුන් සඳහා වෙන් කොට 150 දෙනෙකුට 2018 වසරේ දී පහසුකම් ලබාදිය හැකිය.
- සිසුන් 800 දෙනෙකුට නේවාසික පහසුකම් ලබාදිය හැකි නව නේවාසිකාගාර දෙකක් රාමනාදන් ශාලාව අසල ඉදි කෙරෙමින් පවතී.
- පැරණි නේවාසිකාගාර 2018 වසරේදී ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.
- නේවාසිකාගාරවල පැවති මකුණු ගැටලුව සාර්ථකව පාලනය කරන ලදී.

බාධක හා පිළියම්

- නේවාසික පහසුකම් ඉල්ලා අයදුම් කරන සියලුම සිසුන්ට එම පහසුකම් සැපයීමට ප්‍රමාණවත් නේවාසික පහසුකම් නොමැතිවීම.
- අංක 05 හා අංක 06 නේවාසිකාගාරවලට අවශ්‍ය මූලික අවශ්‍යතාවන් ලබාදීම ප්‍රමාද වීම.

අනාගත සැලසුම්

ගැහැණු සිසුන් 800 දෙනෙකුට පහසුකම් සැපයිය හැකි තවත් නව නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.

5.7 ශිෂ්‍ය සේවා අංශය

(ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - එම්.එස්.ඩි. මාරසිංහ මහත්මිය)

හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුභසාධන කටයුතු පාලනය කිරීම ශිෂ්‍ය සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. වඩා යහපත් වූ සුභ සාධන ක්‍රමයක් පවත්වා ගැනීම පිණිස මෙම අංශය පීඨ නවය, ඒකක හා අංශ සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි.
එමෙන්ම ශිෂ්‍ය සේවා අංශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිසුන් තෝරා ගැනීමෙන් අනතුරුව මහපොළ ශිෂ්‍යත්ව පරිපාලනයට සම්බන්ධ කටයුතු සඳහාද වගකිවයුතු වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව ලබාදෙන අතර විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමෙන් අනතුරුව ශිෂ්‍ය සේවා අංශයෙන් අයදුම්පත් ලබාගත යුතුවේ. ශිෂ්‍යාධාර ලබාදීමේ සමස්ත ක්‍රියාවලිය පාලනය කරනු ලබන්නේ මෙම අංශය මගිනි. නේවාසික නොවන සිසුන්ට මහජන ප්‍රවාහත පහසුකම් ලබා ගැනීම සඳහා සහන මිලට ප්‍රවේශපත්‍ර ලබාගැනීමේ අයදුම් කිරීමේ ලිපි නිකුත් කරනු ලබන්නේ ද මෙම අංශය විසිනි.

වර්තමානය වන විට විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංගම් සංඛ්‍යාව 84කි. ශිෂ්‍ය සංගම් මෙම අංශයේ ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය අලුත්කර ගැනීම මෙම අංශයෙන් සිදුකරගත යුතුය. එමෙන්ම මෙම අංශයේ තවත් එක් කටයුත්තක් වනුයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන්ගේ, විනය පාලක හා ජ්‍යෙෂ්ඨ විනය පාලකවරුන්ගේ ශාලාධිපතින්ගේ හා උප ශාලාධිපතින්ගේ කලා සභාවේ ශිෂ්‍යත්ව අනුකමිටුවේ, නවකවදය වැළැක්වීමේ කමිටුවේ, වෘත්තීය මාර්ගෝපදේශක උපදේශක කමිටුවේ, රැස්වීම් කැඳවීමයි. ශිෂ්‍යත්ව අනුකමිටුවේ ලේකම් ලෙස මෙම සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කටයුතු කරයි. එමෙන්ම කලා සභාවේ විධායක ලේකම් හා නවකවදය වැළැක්වීමේ කමිටුවේ විධායක ලේකම් ලෙසද කටයුතු කරන්නීය.

එපමණක්ද නොව ශිෂ්‍යාධාර කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, පදක්කම්, ත්‍යාග, ශිෂ්‍යත්ව හා ශිෂ්‍යභාවයට සම්බන්ධ ලිපිගොනු පවත්වාගෙන යෑමද මෙම අංශය සතු කාර්යයකි. එසේම පදක්කම්, ත්‍යාග හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කටයුතුවලට ද වගකිව යුතු වේ.

සියලුම පීඨවලට අදාළ ශිෂ්‍ය සංගම්වල ඡන්ද පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදුවන අතර එම සංගම්වල නිලධාරී මණ්ඩල තෝරාපත් ගැනීමේ කටයුතු සිදුකිරීමේ නිලධාරියා ලෙස මෙම අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා උපකුලපතිතුමා විසින් පත්කරනු ලබයි.

සිසුන් විසින් සංවිධානය කරනු ලබන කවර හෝ කටයුත්තක් සඳහා විශ්වවිද්‍යාලයෙන් අවසර ලබාගත යුතුය. එවැනි කටයුතු සඳහා අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ ශිෂ්‍ය සේවා අංශය මගිනි.

ඊට අමතරව විශ්වවිද්‍යාලයේ විනය පාලක, නියෝජ්‍ය විනය පාලකවරුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්, ශාලාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් ශාලාධිපතිවරුන් ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපතිවරුන් හා අධ්‍යයන උපශාලාධිපතිවරුන් තේරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කොට, ඒ සඳහා පහසුකම් සලසන්නේද මෙම අංශය විසිනි. තවද තාවකාලික කාර්ය මණ්ඩලයේ කාමර කුලී හා වගකීම් අඩුකිරීමේ කටයුතු ද සිදුකරනු ලබයි.
විශ්වවිද්‍යාලය තුළ සිසු විනය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් පියවර රාශියක් විශ්වවිද්‍යාලය විසින් ගනු ලබයි. ශිෂ්‍ය විනය සම්බන්ධයෙන් පියවර රාශියක් විශ්වවිද්‍යාලය විසින් ගනු ලබයි. ශිෂ්‍ය විනය සම්බන්ධයෙන් උපකුලපති වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විශ්වවිද්‍යාලයේ

විනයපාලක ලෙස උපකුලපති විසින් පත්කරනු ලබයි. එමෙන්ම ආදාළ පීඨ සමඟ සාකච්ඡා කොට සෑම පීඨයක් සඳහාම නියෝජ්‍ය විනයපාලකවරයෙකු පත්කරනු ලබන්නේද උපකුලපතිතුමා විසිනි.
විශ්වවිද්‍යාලයේ කලා සභාව විශ්වවිද්‍යාල ප්‍රජාවගේ යහපත වෙනුවෙන් චිත්‍රපට උත්සව, වාර්ෂික නාට්‍ය උළෙල, නාට්‍ය, චිත්‍ර, ඡායාරූප, කවි, කෙටිකථා තරඟ මෙන්ම සංස්කෘතික කටයුතුද සංවිධානය කරනු ලබයි. වාර්ෂික කලා උළෙල කලා සභාව වේ. වඩාත් වැදගත් කාර්යයන්වලින් එකකි.

ජයග්‍රහණ

1 ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව සිසුන්ගේ ගිණුම්වල තැන්පත් කරන අතර එම කටයුත්ත මනා ලෙස ක්‍රියාත්මක වේ.
2 මහපොළ ශිෂ්‍යත්ව අයදුම්පත් පීඨ විසින් එක්රැස් කොට මහපොළ භාරකාර අරමුදල වෙත යවනු ලබයි.
3 වාර්ෂික නාට්‍ය උළෙල සාර්ථකව පවත්වන ලදී.
4 අදාළ අධ්‍යයන වර්ෂයේදී නවකවද වැළැක්වීමේ කමිටුව හරහා නවකවද සිද්ධි අවම කරන ලදී.

අනාගත සැලසුම්

1 කාර්ය මණ්ඩල සඳහා විදෙස් පුහුණු වැඩසටහන්
2 සමාජ හා සංස්කෘතික වැඩසටහන් සඳහා පහසුකම් පුළුල් කිරීම
3 සිසුන්ට අදාළ විනය ක්‍රියාමාර්ග සංවිධානය කිරීම
4 සිසුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන්, විනයපාලක හා නියෝජ්‍ය විනය පාලකවරුන් සමග සම්බන්ධ කිරීමේ සංවිධාන ජාලයක් සංවර්ධනය කිරීම
5 නවකවදය වැළැක්වීමේ කමිටුව හරහා විශ්වවිද්‍යාලයෙන් නවකවදය තුරන් කිරීම සඳහා අදාළ වන නවකවද ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

6 පර්යේෂණ, ප්‍රකාශන හා සම්මාන

6.1 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිෂ්පාදන

පීඨය	විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිපැයුමේ නම	තත්ත්වය		
		සංවර්ධනය කළ	මාරුවීම් කළ	වාණිජකරණය කළ / ප්‍රකාශයට පත් කළ
	නව නිෂ්පාදන/ක්‍රියාවලීන් සංවර්ධනය			
ඉංජිනේරු	ජංගම උදුන	✓	✓	
වෛද්‍ය	OCB සංවර්ධනය			
	NMO-A2P4A6			
පශු වෛද්‍ය	සත්ව පෝෂණය හා කිරිවල තත්ත්වය තීරණය කිරීම සඳහා ක්‍රම සංවර්ධනය හා තහවුරු කිරීම			
	පවතින නිෂ්පාදන /ක්‍රියාවලින්වල තත්ත්වය වැඩි දියුණු කිරීම			
ඉංජිනේරු	සී. බී. එල්. ආයතනයේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම			
	ලංකා ඔක්ෂිජන් ආයතනයේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම			
	ඇන්සල් ලංකා ආයතනයේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම			
	සංවර්ධනය කළ සැලසුම් පේටෝටයිප්ස්			
ඉංජිනේරු	ට්‍රේලරය සහිත වාහන සඳහා අර්ධ ස්වයංක්‍රීය ආපස්සට ගැනීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම			
	Auto guider multi rotor UAV			
	වෙනත්			
වෛද්‍ය	සමාජ/අධ්‍යයන කටයුතු සඳහා කායව්‍යවච්ඡේදය කෞතුකාගාරයක් සංවර්ධනය කිරීම			

6.2 පේටන්ට් බලපත්‍ර

		තත්ත්වය			
අධ්‍යයන අංශය	**පේටන්ට් බලපත්‍රයේ නම**	**ලිපිගොනු ගත කළ**	**ලැබිම්**	**මාරු කළ**	**අලෙවි කළ/බලපත්‍ර**
විද්‍යා පීඨය					
1 ජාතික					
රසායන විද්‍යාව	ලෙලි ඉවත්කරන යන්ත්‍රය				
සංඛ්‍යාන හා පරිගණක විද්‍යා	මළල ක්‍රීඩකයන් සඳහා අඩු වියදම් ගමන් පටි විශ්ලේෂණ පද්ධතිය	✓ (යොමු අංක 17269)			
	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් අපරාධ පටිගත කිරීමේ හා විමර්ශනය කිරීම සඳහා මෘදුකාංග විසඳුමක්	✓ (යොමු අංක LK/P/1/18278)			
	2. ජාත්‍යන්තර				
අධ්‍යාපන	ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය හා සම්බන්ධ වූ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ බැටරිය				මෙම යෙදුම මේ වන විට ක්‍රියාත්මක වේ (ජාත්‍යන්තර දේපල 2003 අංක 36)

6.3 සාමාන්‍ය ජනතාව වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්

කාණ්ඩය (වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ඉදිරිපත් කිරීම්/මාධ්‍ය වැඩසටහන්)	**වැඩසටහන් තේමාව**	**සහභාගි වූ සංඛ්‍යාව**	**ඉලක්කගත කණ්ඩායම** (උදා-බිම්මල් ගොවින්/පාසල් ළමුන්)
	සම සෞඛ්‍ය විද්‍යා පීඨය		
වැඩමුළුව	පර්යේෂණ ක්‍රමවේද, පර්යේෂණ පැවැත්වීම, උපාධි නිබන්ධනයක් අවසන් කිරීම පිළිබඳ වැඩමුළුවක් සම-සංවිධානයෙන් පැවැත්වීම	සිසුන් 27 (4 වසර)	2012/2013 කණ්ඩායමේ සිවුවන වසර සිසුන්ගේ
	CBR සායනය	385 (වැඩසටහන් 9යි)	ආබාධිත පුද්ගලයන්
	ක්‍රීඩා කිරීමේදී තුවාලවීම් වැළැක්වීම හා කළමනාකරණ වැඩමුළුව	20	විශ්වවිද්‍යාල මළල ක්‍රීඩා කණ්ඩායම
	ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා ක්‍රීඩා භෞතචිකිත්සාව පිළිබඳ එක්දින වැඩමුළුව	50	ශ්‍රී ලංකා යුධ හමුදාවේ ක්‍රීඩා වෛද්‍ය බලගනය
	පස්බාග කෝරළේ ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය කඳවුර	30	පස්බාග කෝරලේ ජනතාව
	සන්ධි ඉදිමීම සම්බන්ධ (ආර්ත්‍රයිටිස්) තායි චි වැඩමුළුව	28	භෞතික චිකිත්සික අධ්‍යයන අංශයේ සිසුන්
	ටිෂු ඇදි සිදුවන තුවාලවලට වෙළුම්පටි යෙදීම පිළිබඳ හැඳින්වීම	380	පුහුණුවන ගුරුවරුන්
පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ඉදිරිපත් කිරීම්	CBR වැඩසටහන්	28	2012/2013 සිසු කණ්ඩායම
ප්‍රදර්ශන /මහජන කටයුතු/ගුවන්විදුලි/රූපවාහිනී/වෙනත් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගිවීම	ප්‍රදර්ශන	500	පාසල් ළමුන් දෙමාපියන් ගුරුවරුන් මළල ක්‍රීඩක ක්‍රීඩිකාවන්
වෙනත් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගි වීම			
	කලා		
වැඩමුළු පැවැත්වීම	මානව ශාස්ත්‍ර පර්යේෂණ ක්‍රමවේද, බෞද්ධ දර්ශන අධ්‍යායන අංශය බෞද්ධ අධ්‍යයන පීඨය, පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය හෝමාගම (ආචාර්ය ආර්. පී. සෙනෙවිරත්න)		ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන්
ඉංජිනේරු	362,064,811	160,361,530	273,786	14,493,363	1,940,214	4,231,954	9,741,440	-	-	553,107,098
කළමනාකරණ	72,975,384	11,802,717	628,334	2,869,261	149,207	2,632,597	2,788,949	-	-	93,846,448
වෛද්‍ය	294,640,760	168,744,734	1,484,811	9,921,304	2,133,773	9,901,989	7,404,787	-	-	494,232,157
විද්‍යා	324,680,961	89,391,350	121,782	20,760,833	2,314,350	4,074,501	6,946,480	-	-	448,290,257
පශු වෛද්‍ය	107,865,197	50,913,380	265,024	11,238,145	2,891,394	8,142,694	3,201,974	-	-	184,517,809
විභාග	-	-	-	200	-	-	11,977,074	-	-	11,977,274
දන්ත වෛද්‍ය	150,487,289	106,124,103	133,179	23,260,765	1,400,626	3,350,402	5,001,623	-	-	289,757,987
විද්‍යා අධ්‍යාපන	3,765,814	1,516,922	-	47,985	-	-	-	-	-	5,330,720
සම සෞඛ්‍ය විද්‍යා	97,125,435	33,680,745	516,112	10,639,923	793,615	8,064,097	8,758,927	-	-	159,578,854
ඉං.හා.ඉ. ඒකකය	8,432,074	10,385,802	-	307,025	-	-	-	-	-	19,124,901
තොරතුරු තාක්ෂණය	3,044,116	10,121,553	-	148,163	223,855	4,021,908	115,096	-	-	17,674,690
වැඩ සටහන - 03 ඉගැන්වීම් සම්පත්										
පුස්තකාල	39,134,200	92,268,305	20,202	1,158,016	215,376	457,111	274,038	-	-	133,527,248
වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය	144,811	1,575,175	3,048	126,293	-	11,588	171,851	-	-	2,032,766
වැඩසටහන 04 - සුඛ සාධන සේවාවන්										
සෞඛ්‍ය සේවය	139,258	58,300,973	14,829	4,357,312	801,462	6,859,616	231,696	-	-	70,705,147
ශාරීරික අධ්‍යාපන	847,831	20,466,818	106,237	5,491,343	-	336,414	5,606,741	-	-	32,855,384
ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුඛ සාධන	-	22,512,012	13,608	485,962	9,520	1,164,885	317,959	316,615,950	-	341,119,896

වගු අංක 8.5 හා සම්බන්ධ වේ.

අරමුණ / වැඩසටහන	පුද්ගල වේතන අධ්‍යයන	පුද්ගල වේතන අනධ්‍යයන	ගමන් වියදම්	සැපයුම්	කොන්ත්‍රාත් සේවකයන්	වෙනත් පුනරාවර්තන වියදම්	Other Recurrent Expenses	මහජනයා හා ශිෂ්‍යාගාර	අඩුවීම්	මුළු එකතුව
වැඩසටහන -1 සාමාන්‍ය පරිපාලනය										
වැඩසටහන - 05 නඩත්තු										
ඉඩම් සහ ගොඩනැගිලි	-	198,641,216	11,938	29,169,590	1,563,977	3,890,424	294,375	-	-	233,571,520
විදුලි බලය සැපයීම	-	22,289,940	6,150	11,030,242	-	112,448,686	-	-	-	145,775,018
ජල සැපයුම	-	492,646	-	4,701,804	-	26,415,024	-	-	-	31,609,474
වැඩසටහන - 06 දිගු සේවාවන්										
දුරස්ථ හා අඛන්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය	-	27,294,805	16,720	1,512,108	523,004	4,729,996	27,143,132	-	5,259,110	66,478,875
වැඩසටහන 07 - උපස්ථම්භක කටයුතු										
නේවාසිකාගාර	-	120,852,955	8,610	2,667,448	-	20,741,554	7,814,193	-	-	152,084,760
දොඩම්ගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය	-	33,352,552	59,375	1,149,961	53,715	147,927	-	-	-	34,763,531
මාවෙල පශු වෛද්‍ය ගොවිපල	-	2,387,767	-	6,213,975	-	1,805,259	-	-	-	10,407,001
මහඉලුප්පල්ලම ඉගැන්වීමේ ඒකකය	11,943,845	8,941,518	140,775	1,175,061	292,784	4,938,768	12,007	-	-	27,444,758
මී වතුර කෙෂ්ත්‍ර මධ්‍යස්ථානය	-	-	-	2,168	-	-	1,395	-	-	3,563
සත්ව ඒකකය	-	-	-	15,508	350	-	-	-	-	15,858
සූකර නිෂ්පාදන	-	-	-	14,891	-	-	-	-	-	14,891
මාවෙල පශු සම්පත් කෙෂ්ත්‍ර මධ්‍යස්ථානය	-	17,053,731	11,101	7,912,839	313,967	6,549,992	-	-	-	31,841,629
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	-	-	-	74,295	7,433	5,227	9,750	-	-	96,705
මුළු එකතුව	**2,239,522,270**	**1,761,117,389**	**10,293,331**	**208,751,691**	**28,014,567**	**377,337,106**	**272,336,966**	**316,615,950**	**797,461,513**	**6,011,450,784**

8.6 මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

විෂය	2017 වසරේ ප්‍රතිපාදන	2017 වසරේ වියදම (රුපියල්)	ඉතිරි කිරීම් / අතිරික්ත (රු)
අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන	4,665,915,950	5,109,197,605	(443,281,655)
ආ) ව්‍යාපෘති හැර මූලධන	831,700,000	1,148,003,622	(316,303,622)
ඇ) ව්‍යාපෘති			
ඈ) ව්‍යාපෘති			

8.7 මුදල් ප්‍රගතිය පිළිබඳ විස්තර (සාමාන්‍ය ආදායම)

ආදායම් මූලාශ්‍ර	2017 වසරේ ප්‍රතිපාදන (රු)	2017 වසරේ එකතු කිරීම් (රු)	හිඟය අතිරික්තය (රු)
අ) ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යයන	79,725,380.00	79,837,722.00	(112,342.00)
ආ) පශ්චාත් උපාධි අධ්‍යයන	50,000,000.00	47,186,053.00	2,813,947.00
ඇ) උපදේශන	14,000,000.00	12,243,935.00	1,756,065.00
ඈ) වෙනත්	135,761,500.00	187,296,818.00	(51,535,318.00)

8.8 2017 වසරේ මුදල් කාර්ය සාධන විශ්ලේෂණය

විෂය	සමීකරණය	එක් සිසුවෙකු වෙනුවෙන් වියදම රුපියල් (පීඨ මට්ටමින්)								
		කෘෂි විද්‍යාව	සම සෞඛ්‍ය	කලා	දන්ත	ඉංජිනේරු	වෛද්‍ය	විද්‍යා	පශු විද්‍යා	කළමනාකරණ
අ) එක් සිසුවකු සඳහා පුනරාවර්-තන වියදම	පු.වි./ ශිෂ්‍ය සංඛ්‍යාව	639,073	420,589	350,161	950,609	550,041	600,765	424,875	693,835	369,640
ආ) එක් සිසුවෙකු සඳහා මූලධන වියදම	මු.ධ.වි./ ශිෂ්‍ය සංඛ්‍යාව	296,540	97,112	24,333	128,292	137,057	90,862	108,183	98,795	31,231
එකතුව		**935,613**	**517,701**	**374,494**	**1,078,901**	**687,098**	**691,628**	**533,058**	**792,630**	**400,872**

8.9 මුදල් තත්ත්ව ප්‍රකාශන

දෙසැම්බර් 31 දිනට රුපියල්	සටහන	ද.හා.අ.අ.ම.	විශ්වවිද්‍යාලය	2017	2016
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් සහ මුදල් අගය	2	14,621,800.40	188,597,409.03	203,219,209.43	247,212,257.62
අත්තිකාරම් සැලසුම් සහ සේවාවන්	3	-	13,171,175.36	13,171,175.36	14,424,224.96
අත්තිකාරම් විවිධ	4	97,629.00	321,083,428.19	321,181,057.19	300,996,285.64
කාර්ය මණ්ඩල අත්තිකාරම්	5	1,297,925.00	801,474.13	2,099,399.13	303,014.35
වෙනත් විශ්වවිද්‍යාල /ආයතනවලින්	6	206,156,896.21	3,804,498.41	1,220,239.63	3,076,936.16
අයවිය යුතු මුදල්					
විවිධ ණය ගැතියෝ/අයවිය යුතු භාණ්ඩ	7	100,000.00	150,858,273.71	150,958,273.71	119,509,709.73
භාණ්ඩ	8	6,735,334.83	231,365,940.26	238,101,275.09	232,394,659.56
පෙර ගෙවීම්	9	-	1,813,299.04	1,813,299.04	5,604,390.70
තැන්පතු-ඉන්ධන	10	83,000.00	1,271,950.00	1,354,950.00	1,134,950.00
බැඳුම්කර කඩකිරීමෙන් අයවිය යුතු	11	-	87,717,052.19	87,717,052.19	116,469,011.32
බැඳුම්කර කඩ කරන්නන් සඳහා වැඩිපුර ගෙවූ වැටුප්	12	-	3,303,153.55	3,303,153.55	4,057,309.47
බැඳුම්කර කඩකරන්නන්ගෙන් විවිධ අයවීම්	13	-	788,157.85	788,157.85	958,554.52
කාර්ය මණ්ඩල ණය	14	932,728.40	50,109,235.76	51,041,964.16	42,343,532.20
මුළු ජංගම වත්කම්		**230,025,313.84**	**1,054,685,047.48**	**1,075,969,206.33**	**1,088,484,836.23**
ජංගම නොවන වත්කම්					
කාර්ය මණ්ඩල ණය	14	2,035,267.16	93,966,166.68	96,001,433.84	97,547,547.12
ආයෝජන සීමිත මුදල්	15	-	200,076,010.74	200,076,010.74	166,648,523.50
ආයෝජන වෙනත් මුදල්	16	-	964,541,198.04	964,541,198.04	1,128,344,678.98
ජීව විද්‍යාත්මක වත්කම්	17	-	10,133,345.00	10,133,345.00	9,345,390.00
කෙරීගෙන යන වැඩ	18	-	2,063,056,458.46	2,063,056,458.46	1,706,103,505.36
දේපල යන්ත්‍ර හා උපකරණ	19	-	21,272,642,301.39	21,272,642,301.39	19,688,493,858.54
මුළු ජංගම නොවන වත්කම්		**2,035,267.16**	**24,604,415,480.31**	**24,606,450,747.47**	**22,796,483,503.50**
මුළු වත්කම්		**232,060,581.00**	**25,659,100,527.79**	**25,682,419,953.80**	**23,884,968,339.73**
වගකීම්					
ජංගම වගකීම්					
විවිධ තැන්පතු	20	260,000.00	9,190,276.61	9,450,276.61	6,286,205.57
වෙනත් විශ්වවිද්‍යාල / ආයතන වලින් අයවිය යුතු මුදල්	21	-	5,817,358.25	-	-
විවිධ ගෙවිය යුතු හා පෙර ලැබීම්	22	18,441,648.55	460,801,720.43	278,893,009.09	129,122,769.32
උපචිත වියදම්	23	13,696,307.57	204,484,961.26	218,181,268.83	167,984,780.68
මුළු ජංගම වගකීම්		**32,397,956.12**	**680,294,316.55**	**506,524,554.53**	**303,393,755.57**
ජංගම නොවන වගකීම්					
විශ්‍රාම පාරිතෝෂික	24	8,068,693.50	983,472,240.50	991,540,934.00	877,636,842.00
බැඳුම්කර කඩ කිරීම	25	-	87,717,052.19	87,717,052.19	116,469,011.32
මුළු ජංගම නොවන වගකීම්		**8,068,693.50**	**1,071,189,292.69**	**1,079,257,986.19**	**994,105,853.32**
මුළු වගකීම්		**40,466,649.62**	**1,751,483,609.24**	**1,585,782,540.72**	**1,297,499,608.89**
ශුද්ධ වත්කම්/සමාන අගය					
මුළු වගකීම්		**191,593,931.38**	**23,907,616,918.55**	**24,096,637,413.08**	**22,587,468,729.89**

දෙසැම්බර් 31 දිනට රුපියල්	සටහන	දු.හා.අ.අ.මි.	විශ්වවිද්‍යාලය	2017	2016
ප්‍රාග්ධන මුදල්					
ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ	26	-	2,294,817,214.89	2,294,817,214.89	1,900,589,166.29
ප්‍රග්ධන ප්‍රදාන - කෙරීගෙනයන වැඩ	27	-	1,735,207,731.70	1,735,207,731.70	1,407,057,009.38
වෙනුවෙන් වියදම් කළ	28	-	(12,930,457.96)	(12,930,457.96)	76,784,131.02
ප්‍රාග්ධන ප්‍රදාන වියදම් නොකළ ගොඩනැගිලි	29	-	(33,591,858.31)	(33,591,858.31)	277,053.41
උපකරණ ලී බඩු, පුස්තකාල පොත්	30	-	327,848,726.76	327,848,726.76	299,046,495.98
පුනරුත්තාපන ප්‍රදාන - වියදම් නොකළ	31	-	(22,040,274.23)	(22,040,274.23)	322,177.41
පරිත්‍යාග ගොඩනැගිලි - දන්ත වෛද්‍ය පීඨය		-	1,225,101,020.00	1,225,101,020.00	1,225,101,020.00
පරිත්‍යාග වත්කම්	32	-	2,222,013,538.02	2,222,013,538.02	2,162,077,725.18
පරිත්‍යාග ගොඩනැගිලි-දෙස්/විදෙස්		-	1,241,883,489.47	1,241,883,489.47	1,241,883,489.47
පරිත්‍යාග වෙනත්		-	1,560,038.09	1,560,038.09	60,038.09
		-	**8,979,869,168.43**	**8,979,869,168.43**	**8,313,198,306.23**
සංචිත මුදල්					
ස්ථාවර වත්කම් ඇගයීම සංචිතය	33	-	12,529,620,000.19	12,529,620,000.19	10,804,507,068.06
සාමාන්‍ය සංචිත		191,593,931.38	1,075,945,086.22	1,267,539,017.60	2,164,245,106.85
		191,593,931.38	**13,605,565,086.41**	**13,797,159,017.79**	**12,968,752,174.91**
සමාන අගයේ වෙනත් කොටස්					
වෙනත් මුදල්	34	-	921,040,307.69	918,466,870.84	917,285,008.99
අනුරක්ෂණ මුදල්	35	-	191,003,729.57	191,003,729.57	170,837,126.10
පර්යේෂණ ප්‍රදාන	36	-	207,836,826.30	207,836,826.30	214,973,720.49
විශේෂ ප්‍රදාන	37	-	2,301,800.15	2,301,800.15	2,422,393.17
		-	**1,322,182,663.71**	**1,319,609,226.86**	**1,305,518,248.75**
මුළු ශුද්ධ වත්කම්/සමාන අගය		**191,593,931.38**	**23,907,616,918.55**	**24,096,637,413.08**	**22,587,468,729.89**

8.10 මුදල් කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල්	සටහන	දු.හා.අ.අ.ම.	විශ්වවිද්‍යාලය	2017	2016
ආදායම					
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		-	4,349,300,000.00	4,349,300,000.00	4,350,000,000.00
ශිෂ්‍යාධාර		-	24,902,300.00	24,902,300.00	25,858,600.00
මහපොළ ප්‍රදාන - වි.වි.ප්‍ර.කොා.ස.		-	147,392,000.00	147,392,000.00	165,398,600.00
මහපොළ ප්‍රදාන - භාරකාර අරමුදල		-	144,321,650.00	144,321,650.00	185,893,950.00
රජයේ ප්‍රදානවල හිලව් කිරීම්		-	306,056,609.66	306,056,609.66	224,316,400.63
		-	**4,971,972,559.66**	**4,971,972,559.66**	**4,951,467,550.63**
වෙනත් ආදායම්					
නඩත්තු සඳහා පුනරුත්තාපන ප්‍රදාන		-	87,984,930.95	87,984,930.95	126,300,746.20
ජාත්‍යන්තර මට්ටමට පත්වීම සඳහා රජයේ ප්‍රදාන		-	10,775,326.60	10,775,326.60	887,812.70
මිනිස් මූලධන සංවර්ධන		-	11,290,518.30	11,290,518.30	-
ආයෝජනවල පොළිය		-	109,827,895.90	109,827,895.90	60,194,253.03
කාර්ය මණ්ඩල ණයවල පොළිය		113,465.65	5,926,010.17	6,039,475.82	5,623,555.90
දේපලවලින් ලැබූ පොළිය		160,700.00	9,546,298.52	9,706,998.52	10,515,418.73
පැරණි වත්කම් අලෙවිය		-	180,800.00	180,800.00	-
විවිධ ආදායම්	38	871,126.39	17,907,273.00	18,778,399.39	17,873,591.67
ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි)		3,993,551.00	11,673,700.00	15,667,251.00	20,887,673.00
ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි)		-	20,000.00	20,000.00	-
උපකාරක පංති ගාස්තු (පශ්චාත් උපාධි)		-	-	-	20,000.00
විභාග ගාස්තු (ප්‍රථම උපාධි)		55,077,250.00	132,340.00	55,209,590.00	16,749,991.00
විභාග ගාස්තු (පශ්චාත් උපාධි)		-	-	-	695.00
ප්‍රකාශන අලෙවිය		46,215.00	-	46,215.00	61,505.00
පුස්තකාල දඩ		-	530,494.25	530,494.25	410,706.35
වෛද්‍ය ගාස්තු		-	2,288,550.00	2,288,550.00	1,940,935.00
විදෙස් ශිෂ්‍ය ආදායම්	39	-	8,960,880.97	8,960,880.97	31,648,391.18
සහාය ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාවය	40	22,762,337.50	16,335,496.56	39,097,834.06	53,579,647.24
පශු සම්පත්වල ලැබීම්		-	780,155.00	780,155.00	-
		83,024,645.54	**294,160,670.22**	**377,185,315.76**	**346,694,922.00**
		83,024,645.54	**5,266,133,229.88**	**5,349,157,875.42**	**5,298,162,471.63**
වියදම්					
පුද්ගල චේතන		27,294,804.54	3,973,344,854.60	4,000,639,659.14	3,746,278,164.87
ගමන් ගාස්තු		16,720.00	10,276,612.21	10,293,332.21	10,986,001.75
සැපයුම්		1,512,108.42	207,239,583.01	208,751,691.43	171,500,271.58
නඩත්තු	41	523,003.67	27,491,563.17	28,014,566.84	27,548,588.35
කොන්ත්‍රාත්සේවා		4,729,996.10	372,607,110.16	377,337,106.26	328,095,867.87
සිසුන්ට මුදල් සහය ලබාදීම්		-	316,615,950.00	316,615,950.00	377,151,150.00
ක්ෂයවීම්		5,259,110.00	792,202,402.96	797,461,512.96	548,585,611.09
වෙනත් වියදම්		27,143,132.49	245,193,833.89	272,336,966.38	278,405,843.08
		66,478,875.22	**5,944,971,910.00**	**6,011,450,785.22**	**5,488,551,498.59**
වර්ෂයේ ශුද්ධ අතිරික්තය (හිඟය)		**16,545,770.32**	**(678,838,680.12)**	**(662,292,909.80)**	**(190,389,025.96)**

8.11 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට රුපියල්	2016	2017
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වල අතිරික්තය/හිඟය	(662,292,909.80)	(76,929,780.03)
මුදල් නොවන ගනුදෙනු / ගැළපීම්		
ක්ෂය වීම	797,461,512.96	773,446,480.55
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	182,904,926.50	156,612,865.66
ආයෝජනවල පොළිය	(109,827,895.90)	(60,743,980.22)
විදෙස් ශිෂ්‍ය ආදායම	-	31,648,391.18
රජයේ ප්‍රදාන හිලව් කිරීම්	(306,056,609.66)	(622,660,855.33)
පශු සම්පත්වල ලැබීම්	(780,155.00)	734,346.00
නඩත්තු සඳහා පුනරුත්ථාපන ප්‍රදාන	(87,984,930.95)	(126,300,746.20)
ජාත්‍යන්තර මට්ටමට පත්වීම සඳහා ප්‍රදාන	(10,775,326.60)	(887,812.70)
මිනිස් මූලධන සංවර්ධනය සඳහා ප්‍රදාන	(11,290,518.30)	-
ණය ආපසු ගෙවීම්වල හිලව් කිරීම්	-	5,330,956.14
මූලධන වත්කම් මිලදී ගැනීම සඳහා යොදාගත් ආදායම	-	42,732,485.85
ජා.ප. මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා උපයාගත් ආදායම යොදා ගැනීම	7,243,168.22	16,000,000.00
වැඩ මූලධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/හිඟය	**(201,398,738.53)**	**138,982,350.90**
වැඩ මූලධන වෙනස්කම්		
අත්තිකාරම් - සැපයුම් හා සේවාවන් (වැඩිවීම්/අඩුවීම්)	1,253,049.60	(7,431,983.41)
අත්තිකාරම් - විවිධ (වැඩිවීම්/අඩුවීම්)	(20,184,771.55)	13,892,001.34
කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	(1,796,384.78)	35,020.50
වෙනත් විශ්වවිද්‍යාලවලින් අයවිය යුතු මුදල (වැඩිවීම්/අඩුවීම්)	1,856,696.53	(1,870,310.55)
විවිධ ණයගැතියෝ ලැබිය යුතු (වැඩිවීම්/අඩුවීම්)	(16,862,661.02)	(33,287,127.22)
භාණ්ඩ (වැඩිවීම්/අඩුවීම්)	(5,706,615.53)	6,596,237.69
පෙර ගෙවීම් (වැඩිවීම්/අඩුවීම්)	3,791,091.66	(851,139.95)
තැන්පතු (වැඩිවීම්/අඩුවීම්)	(220,000.00)	(175,000.00)
බැඳුම්කර කඩකිරීමෙන් ලැබිය යුතු (වැඩිවීම්/අඩුවීම්)	28,751,959.13	15,295,498.31
කාර්ය මණ්ඩල ණය (වැඩිවීම්/අඩුවීම්)	754,155.92	364,229.29
විවිධ තැන්පතු (වැඩිවීම්/අඩුවීම්)	170,396.67	(642,892.09)
උපචිත වියදම් (වැඩිවීම්/අඩුවීම්)	(7,152,318.68)	(2,095,839.70)
ශුද්ධ මූලධන වෙනස්වීම්වලින් පසු මෙහෙයුම් ක්‍රියා කාරකම්වල ශුද්ධ මුදල් ගලනය	3,164,071.04	(1,358,596.79)
පාරිතෝෂික ගෙවීම්	149,770,239.77	(105,806,904.86)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් පාලනය	50,196,488.15	31,931,523.54
ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ගලනය	**(13,613,341.62)**	**53,577,067.00**
ස්ථාවර වත්කම්වලට එකතු කිරීම	(68,943,729.50)	(56,108,668.66)
කෙරිගෙන යන වැඩ සඳහා එකතු කිරීම්	**(82,557,071.12)**	**(2,531,601.66)**
සීමාකළ මුදල් ආයෝජන		
ආයෝජන තැන්පත් කිරීම්	(398,000,510.89)	(489,608,804.99)

දෙසැම්බර් 31 දිනට රුපියල්	2016	2017
ආයෝජන ඉවත්කර ගැනීම්	(775,515,707.56)	(802,653,181.55)
ආයෝජනවල පොළිය	(33,427,487.24)	(10,478,826.24)
ජීව විද්‍යාත්මක වත්කම් මිලදී ගැනීම	(129,532,184.94)	(343,563,119.01)
ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය	326,859,857.63	2,005,000.00
මූල්‍යමය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය	50,334,347.53	33,465,027.76
මූලධන සඳහා රජයේ ප්‍රදාන	(7,800.00)	-
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන	**(959,289,485.47)**	**(1,610,833,904.03)**
අමාත්‍යාංශ ප්‍රදාන		
වෙනත් මුදල්	800,000,000.00	1,513,000,000.00
අනුරක්ෂණ මුදල්	25,000,000.00	53,733,690.64
බාහිර පර්යේෂණ ප්‍රදාන	6,100,000.00	
විශේෂ ප්‍රදාන	1,181,861.85	10,098,591.51
බැඳුම්කර කඩකිරීම	19,944,377.03	8,936,554.23
පරිත්‍යාග වෙනත්	(7,136,894.19)	(10,268,052.00)
පරිත්‍යාග වත්කම්	(120,593.02)	157,026.26
උපයාගත් ආදායම් යොදාගෙන මූලධන වත්කම් මිලදී ගැනීම	(28,751,959.13)	-
මූල්‍යමය ක්‍රියාකරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය	1,500,000.00	-
මුදල් හා මුදල්වල සමාන අගයේ ශුද්ධ වැඩිවීම	9,432,241.28	-
වර්ෂාරම්භයේදී මුදල් හා මුදල්වල සමාන අගය	170,704,474.58	-
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රදාන	**997,853,508.40**	**1,575,657,810.64**
අමාත්‍යාංශ ප්‍රදාන	(43,993,048.19)	(37,707,695.05)
වෙනත් මුදල්	247,212,257.62	284,919,953.00
අනුරක්ෂණ මුදල්	**203,219,209.43**	**247,212,257.95**

8.12 වර්ෂයේ විභර්ජන ගිණුම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල්වලින්	දු.හා.අ.අ.මි.	විශ්වවිද්‍යාලය	2017	2016
වර්ෂය සඳහා ශුද්ධ (අතිරික්තය/හිඟය)	16,545,770.32	(678,838,680.12)	(662,292,909.80)	(190,389,025.96)
පෙර වසරෙන් ඉදිරියට ගෙන ආ ශේෂය	175,048,161.06	1,989,196,945.79	2,164,245,106.85	(524,866,741.05)
	191,593,931.38	1,310,358,265.67	1,501,952,197.05	(715,255,767.01)
එකතු කිරීම්				
ප්‍රතිගණන සංචිතයේ හිලව් කිරීම්	-	-	-	2,866,426,008.66
පිහිනුම් තටාකය කළමනාකරණ මුදල හා ක්‍රිකට් පිටිය සඳහා ගැළපුම		1,200,698.08	1,200,698.08	-
විදෙස් ශිෂ්‍ය මුදල් සඳහා ගැළපුම	-	-	-	109,099,065.03
	191,593,931.38	1,311,558,963.75	1,503,152,895.13	2,260,269,306.68
අඩුකිරීම්				
විදෙස් ශිෂ්‍ය ආදායම හිලව් කිරීම	-	-	-	(31,648,391.18)
ණය ගෙවීම සඳහා හිලව් කලා	-	(5,743,954.86)	(5,743,954.86)	(5,330,956.14)
මූලධන වත්කම් මිලදී ගැනීම සඳහා ආදායම් යොදා ගැනීම	-	(170,704,474.58)	(170,704,474.58)	(42,732,485.85)
ප්‍රතිගණන සංචිතයේ හිලව් සඳහා ගැළපුම		(59,165,448.09)	(59,165,448.09)	-
වැටුප් අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් සඳහා ගැළපුම	-	-	-	(312,366.44)
ජා.ප. මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා ආදායම් යොදා ගැනීම	-	-	-	(16,000,000.00)
ශේෂය	191,593,931.38	1,075,945,086.22	1,267,539,017.60	2,164,245,106.85
ඉදිරියට ගෙන ආ ශේෂය	**191,593,931.38**	**1,075,945,086.22**	**1,267,539,017.60**	**2,164,245,106.85**

8.13 සමාන අගය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශන

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රුපියල්	මූලධන ප්‍රදාන	සාමාන්‍ය සංචිතය	ප්‍රතිගණන සංචිතය	සමාන අගයේ වෙනත් සංචරණ කොටස්	එකතුව
2015 දෙසැ .31 දිනට ශේෂය	**6,904,486,785.97**	**(524,866,741.05)**	**5,521,151,622.29**	**1,232,459,774.57**	**13,133,231,441.78**
මුදල් / මූලධන ප්‍රදානවල ශුද්ධ ගනුදෙනු	1,010,367,065.56			73,058,474.18	1,083,425,539.74
විදෙස් ශිෂ්‍ය ආදායමේ හිලව් කිරීම		(31,648,391.18)			(31,648,391.18)
ප්‍රතිගණන සංචිතයේ හිලව්		2,866,426,008.66	(2,866,426,008.66)		-
ප්‍රතිගණන අතිරික්ත			8,149,781,454.43		8,149,781,454.43
විදෙස් ශිෂ්‍ය මුදල් සඳහා ගැළපුම		109,099,065.03			109,099,065.03
ණය ගෙවීම සඳහා හිලව් කලා		(5,330,956.14)			(5,330,956.14)
මූලධන වත්කම් මිලදී ගැනීමට ආදායම යොදා ගැනීම		(42,732,485.85)			(42,732,485.85)
ජා.ප. මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා ආදායම යොදා ගැනීම		(16,000,000.00)			(16,000,000.00)
වැටුප් අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් සඳහා ගැළපුම		(312,366.44)			(312,366.44)
අදාළ කාලය සඳහා අතිරික්තය / හිඟය		(190,389,025.96)			(190,389,025.96)
2016 දෙසැ. 31 දිනට ශේෂය	**8,313,198,306.23**	**2,164,245,106.85**	**10,804,507,068.06**	**1,305,518,248.75**	**22,587,468,729.89**
මුදල් මූලධන ප්‍රදානවල ශුද්ධ ගනුදෙනු	1,065,015,316.90			13,005,154.06	1,078,020,470.96
විදෙස් මුදල් ලැබීම්				1,085,824.05	
ප්‍රතිගණන සංචිත හිලව් සඳහා ගැළපුම			376,852,943.76		376,852,943.76
පිහිනුම් තටාකය හා ක්‍රිකට් ක්‍රීඩා පිටිය සඳහා ගැළපුම		1,200,698.08			1,200,698.08
ප්‍රතිගණන සංචිත හිලව් සඳහා ගැළපුම		(59,165,448.09)			(59,165,448.09)
රජයේ ප්‍රදාන හිලව් සඳහා ගැළපුම	(398,344,454.70)				(398,344,454.70)
මූලධන වත්කම් මිලදී ගැනීම සඳහා ආදායම යොදාගැනීම		(170,704,474.58)			(170,704,474.58)
ප්‍රතිගණන අතිරික්ත			1,353,002,646.73		1,353,002,646.73
දු.හා.අ.අ.ම ප්‍රතිගණන සංචිත හිලව්			(4,742,658.36)		
කාලවකවානුව සඳහා අතිරික්ත/(හිඟය)		(5,743,954.86)			(5,743,954.86)
මුදල් මූලධන ප්‍රදානවල ශුද්ධ ගනුදෙනු		(662,292,909.80)			(662,292,909.80)
2017 දෙසැ. 31 දිනට ශේෂය	**8,979,869,168.43**	**1,267,539,017.60**	**12,529,620,000.19**	**1,319,609,226.86**	**24,096,637,413.08**

8.14 ගිණුම් සටහන් - 2017

8.14.1 දේපල, යන්ත්‍ර හා උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, රථ වාහන සහ වෙනත් දේපල, යන්ත්‍ර හා උපකරණ වර්ග
විශ්වවිද්‍යාලයේ සියලුම ඉඩම්, ගොඩනැගිලි හා රථ වාහන 2016 වසරේදී ප්‍රතිගණනය කොට එම වසරේදීම ගිණුම් ගත කරන ලදි. දේපල, යන්ත්‍ර හා උපකරණ වලට අයත් වෙනත් කාණ්ඩ (පුස්තකාල පොත් හා වාර සඟරා හැර) 2016 ජනවාරි පළමු දිනට (01) ප්‍රතිගණනය කොට එය 2017 වසරේ මුදල් ප්‍රකාශනයේ දක්වා ඇත.

මෙම ඉඩම්, යන්ත්‍ර හා උපකරණ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිගණනය කළ දිනට පවතින සාධාරණ වටිනාකමකින් ප්‍රතිගණනය කරන ලද අතර වෙනත් කාණ්ඩවලට අයත් වත්කම් ප්‍රතිගණනය කිරීමේ කටයුතු සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකුගේ අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාලය විසින් පත් කරන ලද කමිටුවක් විසින් සිදුකරන ලදි. එක් එක් වත්කම් කාණ්ඩ යටතේ ප්‍රතිගණනය කළ මුදල මුදල් තත්ත්ව ප්‍රකාශනයේ දැක්වේ.

කිසියම් දේපල, යන්ත්‍ර හා උපකරණයක ප්‍රතිගණන වටිනාකම බින්දුව (0) බවට පත්වන අවස්ථාවක එම ප්‍රතිගණනය සඳහා යොදා ගනු ලබන ප්‍රතිගණන මොඩලය විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලබයි.
අක්කර 35ක වපසරියකින් යුතු මහඉලුප්පල්ලම ඉඩමේ සහ අක්කර 35ක් හි පර්චස් 25කින් යුතු වෛද්‍ය පීඨ ඉඩමේ හිමිකාරිත්වය විශ්වවිද්‍යාලය වෙත පවරා නොමැති හෙයින් 2017.12.31 දිනට ප්‍රතිගණනය නොකරන ලදි.

කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය එම ඉඩම්වල හිමිකාරිත්වය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතර එය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ඉඩම්වල වටිනාකම ඇතුළත් කෙරෙනු ඇත.

ක්ෂයවීම් :

ප්‍රතිගණන මුදල් මත 2016 හා 2017 වර්ෂයන් සඳහා ක්ෂයවීම් ලබා දී ඇත. 2016 වසර සඳහා වන එවැනි වත්කම්වල වියදම මත සපයන ලද හා 2016 වසරේ මුදල් ප්‍රකාශනයේ ගිණුම්ගත කළ ක්ෂයවීම් ප්‍රතිවර්තනය කොට සාමාන්‍ය සංචිතයට ගලපා ඇත.

යම්කිසි වත්කමක අවශේෂ වටිනාකම සහ එම වත්කමේ පරිහරණ කාලය සමාලෝචනය කිරීම සඳහා අවම තරමින් සෑම වාර්ෂික වාර්තා කරන දිනයටවත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 ට ඒකකයක් අවශ්‍ය කරන අතර අපේක්ෂිතයන් පෙර වසරවල ඇස්තමේන්තුවලට වඩා වෙනස්වේනම් එම වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වල වෙනසක් ලෙස ගිණුම්ගත කළ හැකි අතර එම ගිණුම් ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03ට එනම් ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂයන්වලට අනුකූල ගිණුම් ඇස්තමේන්තුවක් ලෙස සැලකිය හැකිය.
දේපල, යන්ත්‍ර හා උපකරණ පරිහරණ රටාව හා කාල සීමාව පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන හෙයින් වත්කම්වල පරිහරණ කාල සීමාව වෙනස් නොකිරීමට අපේක්ෂිතයි.
සියලුම දේපල, යන්ත්‍ර හා උපකරණ, පොත් සහ වාර සඟරා හා ලෝගුවල වියදම හෝ ප්‍රතිගණන වටිනාකම මත පහත සඳහන් අනුපාතවලින් සරළ රේඛීය ක්‍රමය යොදා ගෙන ක්ෂයවීම ගණනය කෙරේ.

වත්කම් පංතිය	%
ගොඩනැගිලි	5%
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	10%
රථ වාහන	20%
ලී බඩු සහ මෙවලම්	10%
කාර්යාල සහ වෙනත් උපකරණ	20%
විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
ලෝගු	20%

දේපල, යන්ත්‍ර සූත්‍ර හා උපකරණවල ක්ෂයවීම් පිළිබඳ වැඩිදුර විස්තර 19 සටහනේ දැක්වේ.

8.14.2 <u>ජීව විද්‍යාත්මක වත්කම්</u>

ජීව විද්‍යාත්මක වත්කම් පරිහරණය ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට 27(IPSAS-27) අනුව සකස් කොට ඇත. විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යාත්මක වත්කම් IPSAS-27 ට අනුව මුදල් තත්ත්ව ප්‍රකාශනය වෙනම වත්කමක් ලෙස දැක්වේ.

ජීව විද්‍යාත්මක වත්කම් හෝ කෘෂිකාර්මික නිෂ්පාදන පිළිගනු ලබන්නේ අදාළ වත්කම අතීත සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස ව්‍යවසායකය විසින් පාලනය කරන්නේ නම් හා එහි ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායකය වෙත ඉදිරි කාලයේදී ලැබෙනු ඇතැයි සහ වත්කමේ සැබෑ වටිනාකම හෝ වියදම විශ්වාසවන්තව මිනිය හැකිනම් පමණි.

8.14.3 <u>කෙටි කාලීන ආයෝජන</u>

පර්යේෂණ ව්‍යාපෘති සහ අනෙකුත් සහයක ක්‍රියාකාරකම් සඳහා විශ්වවිද්‍යාලය වෙත ලද මුදල්වලින් ඌණ උපයෝජිත මුදල් තාවකාලිකව වාර තැන්පතු ලෙස රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ඇත. ඒ සඳහා ලද උපචිත පොළිය අදාළ ලෙජර් ගිණුම්වලට ගළපා මුදල් කාර්යය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස දක්වා ඇත. ශිෂ්‍යත්ව සඳහා ලද මුදල් ද එලෙසම රාජ්‍ය බැංකුවල තැන්පත් කර ඇත. තවද ආයෝජනවල ආයෝජන හා පොළී ආදායම පිළිබඳ විස්තර 15 හා 16 සටහන්වල දැක්වේ.

8.14.4 <u>තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ වත්කම්</u>

<u>මෘදුකාංග</u>

විශ්වවිද්‍යාලය විසින් මිළදී ගන්නා ලද මෘදුකාංග ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගෙන කාර්යාල උපකරණ වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇත.

<u>මෘදුකාංග බලපත්‍ර</u>

මෘදුකාංග බලපත්‍ර සඳහා යන වියදමද ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන කාර්යාල උපකරණ වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇත.

8.14.5 <u>භාණ්ඩලේඛන</u>

විශ්වවිද්‍යාලයේ භාණ්ඩ ලේඛන භෞතික වශයෙන් හරිවැරදි බලා 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනම මත ගණනය කොට ඇත. විශ්වවිද්‍යාලයේ භාණ්ඩ ලේඛන ප්‍රධාන වශයෙන් ලිපිද්‍රව්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ සහ වෙනත් භාණ්ඩ ලෙස වර්ගීකරණය කෙරේ.

පර්යේෂණ ප්‍රදානවලින් මිලදී ගත් රසායනික ද්‍රව්‍යවල හා වීදුරු භාණ්ඩවල වියදම ඒවා මිලදී ගත් අවස්ථාවේම වියදමක් ලෙස අදාළ පර්යේෂණ ප්‍රදානවලට යොමු කර ඇත. කෙසේ වෙතත් වර්ෂාවසානය වනවිට ද්‍රව්‍ය භාණ්ඩ ලේඛනවල ඉතිරිවූ ශේෂය භෞතික හරි වැරදි බැලීමේ වාර්තාවලට අනුව අදාළ ගිණුම්වලට ගලපා ඇත.

භාණ්ඩ ලේඛන පිළිබඳ වැඩිදුර විස්තර ගිණුම් සටහන් අංක 08 (අට) යටතේ දැක්වේ.

8.14.6 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ සහ වෙනත් ලැබීම් SLPSAS-01 ට අනුව ඇස්තමේන්තු ගත මුදලින් එනම් වාර්තා කරන දිනයෙන් පසු මාස 12ක් ඇතුළත ලැබීමට නියමිත ලෙසින් සඳහන් කොට ඇත. නුසුදුසු හා සැක සහිත ලැබීම් සඳහා ප්‍රතිපාදන සකස් වී නොමැත.

8.14.7 මුදල් සහ මුදලේ සමාන අගය

මුදල් සහ මුදලේ සමාන අගයන් මුදල් තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අතර මුදල් ගලන ප්‍රකාශනය ජංගම, නේවාසික විදෙස් මුදල්, ඉතිරිකිරීම් හා කෙටිකාලීන තැන්පතු ගිණුම්වල ශේෂයන්ගෙන් යුක්තවේ.

මුදල් සහ මුදලේ සමාන අගය පිළිබඳ වැඩිදුර විස්තර ගිණුම් ප්‍රකාශනයේ සටහන් අංක දෙක (2) යටතේ දැක්වේ.

8.14.8 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පණතේ විධිවිධානවලට අනුව මුදල් තත්ත්ව ප්‍රකාශන දිනට නිර්වචනය කළ වාසි බැදීම් ගණනය මුදල් තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් වගකීම්වල වර්තමාන අගය වේ.

8.14.9 විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

විශ්වවිද්‍යාල සේවකයන් අදාළ නායකත්වයන් හා රෙගුලාසිවලට සමගාමීව විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ දායකත්වයන්ට හා සේවක භාරකාර අරමුදලේ දායකත්වයන්ට හිමිකම් කියනු ලබයි. විශ්වවිද්‍යාලයෙන් 15% ක හා සේවක මුළු වේතනයෙන් 3% ක දායකත්වයක් මෙම බාහිරව ක්‍රියාත්මක වන අරමුදල් දෙකට පිළිවෙලින් දායක වේ.

8.14.10 රජයේ ප්‍රදාන

මූලධන හා ජංගම වියදම් සඳහා රජයේ ප්‍රදාන හඳුනාගනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 01හි ප්‍රතිපාදනවලට සමගාමීව විශ්වවිද්‍යාලය වෙත ඒවා ලැබීමෙන් පසුව පමණි. අදාළ වර්ෂය සඳහා ලැබෙන ජංගම ප්‍රදාන මුදල් කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගෙන ඇති අතර විශ්වවිද්‍යාලය විසින් ලබා ගත් මූලධන ප්‍රදාන හඳුනාගෙන මූලධන ප්‍රදාන වියදම් කළ හා වියදම් නොකළ ගිණුම් හරහා මූලධන ගිණුම්වල ගිණුම්ගත කොට ඒවා මුදල් තත්ත්ව ප්‍රකාශනයට ඍජුවම ඇතුළත් කොට ඇත.

8.14.11 අනියම් වගකීම් සඳහා ප්‍රතිපාදන

යටගිය කාර්යයක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේදී විශ්වවිද්‍යාලය බැඳීමකට මුහුණ දී සිටින විට ප්‍රතිපාදන හඳුන්වා දීම සහ එම බැඳීම් නිරවුල් කිරීම සඳහා ආර්ථික වාසි සලසන සම්පත් පිටත ගලායෑමක් අවශ්‍ය විය හැකි අතර එම බැඳීම් මුදල පිළිබඳ විශ්වාසනීන ඇස්තමේන්තුවක් සකස් කළ හැකිය. එබැවින් නීතිමය බැඳීම් නිසි ආකාරයෙන් ඇස්තමේන්තු කොට ඇති කාරණාවලදී පමණක් අනියම් වගකීම් සඳහා ප්‍රතිපාදන සකස් කොට ඇත. උපචිත වියදම් යටතේ ප්‍රතිපාදන දක්වා ඇත. පැහැදිලිව සහ නිවැරදිව ඇස්තමේන්තු කොට නොමැති මූල්‍යමය බැඳීම් ඇතුළත් නීතිමය කටයුතු හා සම්බන්ධ වෙනත් වගකීම් සටහන් වශයෙන් දැක්වෙන අතර සියලු ගැලපීම් හා අනාවරණය කිරීම් SLPSAS-08 හි විධිවිධානවලට අනුව සකස් කෙරේ.

8.14.12 අයභාර හඳුනා ගැනීම

පුනරාවර්ත්ථන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘති හා වෙනත් අධ්‍යයන පැවරුම්වල ආදායම ඒවා ලැබුණු විට අයභාර ලෙස හඳුනා ගෙන ඇති අතර සහ වෙනත් සියලු අයභාරයන් උපචිත පදනමින් හඳුනා ගැනේ.

8.14.13 වියදම් හඳුනා ගැනීම

ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ වියදම හඳුනා ගනු ලබන්නේ යොදවන ලද වියදම හා ආදායමේ සුවිශේෂී අංශවල ඉපයීම අතර පවතින සහ සම්බන්ධය පදනම් කර ගැනීමෙනි.

විශ්වවිද්‍යාලයේ කටයුතු කරගෙන යෑමේදී සහ එහි දේපල කාර්යක්ෂම ආකාරයෙන් පවත්වාගෙන යෑමේදී යොදවන ලද සියලු වියදම් ආදායම් හා වියදම් ප්‍රකාශනයට ආරෝපණය කොට ඇත.

8.14.14 ඒකකවල ගිණුම් තොරතුරු අනාවරණය

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආදායම, වියදම, වත්කම් හා වගකීම් විශ්වවිද්‍යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කොට ඇති අතර ඒවායේ විස්තර සටහන් යටතේ වෙනම දැක්වේ. මෙම මධ්‍යස්ථානය හා විශ්වවිද්‍යාලය අතර ගණුදෙනු විශ්වවිද්‍යාලය සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් හරහා සිදුවේ.

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සියලුම භෞතික වත්කම් විශ්වවිද්‍යාලයීය ගිණුම්වල දක්වා ඇති අතර එහි ආදායම් සහ වියදම් විශ්වවිද්‍යාලය විසින් මෙම මධ්‍යස්ථානය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන මුදල් ගිණුමක වෙනම වාර්තා කෙරේ.

8.14.15 අනියම් වගකීම්

2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයට එරෙහිව ඉදිරිපත් කොට ඇති නඩු 23කට අදාළ අනියම් වත්කම්වල වටිනාකම රුපියල් 118,553,223.00ක් වේ. කෙසේ වෙතත්, අවසන් ගිණුම්වලින් ප්‍රතිපාදන සලසා නොමැති හෙයින් වන්දි මුදල් සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් සකස් කළ නොහැකිය අනියම් වගකීම්වල විස්තර ඇමුණුම් 02හි දැක්වේ.

8.14.16 අනියම් වත්කම්

2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් පණවා ඇති නඩුවලට අදාළ අනියම් වත්කම්වල මුදල රුපියල් 12,439,417.64 කි (නඩු පහක) අනියම් වගකීම්වල විස්තර ඇමුණුම් 03හි දැක්වේ.

8.14.17 සාමාන්‍ය ලෙජරයේ ප්‍රතිපාදන

මුදල් තත්ත්ව ප්‍රකාශන දිනට අවසන් කොට ඇති නඩු කටයුතු වෙනුවෙන් SLPSAS-08 යටතේ අනියම් වගකීම් සඳහා වන ප්‍රතිපාදන සලසා ඇත. මෙම නඩුවල තීන්දු ප්‍රකාශයට පත් කොට ඇත.

8.15 විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. දිවිල්පි/කේඩි/ජේ/පියු/2018/28

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2018 ඔක්තෝබර් 23 දින.

09 NOV 2018
UNIVERSITY OF PERADENIYA

09 NOV 2018
274

උපකුලපති,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

උපකුලපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට සූදානම්වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් -
1. ලේකම් - උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එස්එස්පී/කේඩී/ජේ/පියු/2018/28 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2018 ඔක්තෝබර් 23 දින.

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5), 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකල යුතු වුවත් විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදල් 578 ක ආදායම රු.807,612,337 ක්වූ මුළු ආදායමෙන් වියදම රු.829,459,858 ක් හිලව්කර ශුද්ධ අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.652,890,045 ක් වූ පුස්තකාල පොත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අයිතිය හෝ පැවැත්ම තහවුරු කළ නොහැකි මහනුවර හා කුරුණෑගල රෝහල්වල ඉදිකිරීම් සඳහා 2017 දෙසැම්බර් 31 දින දක්වා විශ්වවිද්‍යාලය විසින් දරන ලද රු.3,899,479 ක වියදම 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල, පිරියත උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම් අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුන්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ශාස්ත්‍ර පීයයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ඉංග්‍රීසි භාෂා ඒකකය භාවිතා කරමින් තිබූ රු.377,240 ක් වටිනා පරිගණක 04 ක් ඇතුළුව අයිතම 06 කට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

\

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග ගිණුම්වල ශේෂ එකතුව රු.4,690,558,085 ක් වූ අතර එම පරිත්‍යාගවලට අදාල වත්කම් ක්ෂය කර තිබූ නමුත් පරිත්‍යාග ගිණුමේ ශේෂය ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායමට හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු රු.1,291,366 ක මුදලක් "පරිත්‍යාග අරමුදල්" යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල් ඉක්මවා විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබූ රු.308,669,345 ක් වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය එම වටිනාකම්වින් අඩුවෙන් සහ වැයකල ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

o..

(ඇ) වැය විෂයන් 05 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.258,744 ක බැර ශේෂ දක්වා තිබූ අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතුවකට අදාලව බැංකුවට සෘජුවම බැරවී තිබූ රු.371,290 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) විගණනයේදී සිදු කල ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම රු.110,112,139 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.109,827,896 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ආදායම රු.284,243 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ව්‍යාපෘති 04 කට අදාළව අතුරු ගෙවීම් බිල්පත්වලින් අඩුකර ගෙන තිබූ රු.6,282,494 ක අත්තිකාරම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගැලපුම් ගිණුමේ හර ශේෂය ලෙස රු.45,399 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් එම ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට වසර 03 ක කාලයක සිට කටයුතු කර නොතිබුණි.

(ඌ) විශ්ව විද්‍යාලය සතු ඉඩම් බදු දීම තුලින් 2017 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු එකතුව රු.18,366,000 ක් වූ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීමද සිදුකර නොතිබුණි.

2.2.4 පැහැදිළි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ලේඛනය අනුව ආපදාණය ශේෂය රු.1,020,003 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.1,459,900 ක් වූයෙන් රු.439,897 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂිය
		රු.	
(අ)	සැපයුම් සේවා හා වෙනත් අත්තිකාරම් ශේෂ	270,722	ශේෂ තහවුරු කිරීම් හෝ අත්තිකාරම් ලේඛන
(ආ)	ණයගැති ශේෂ	3,552,329	ශේෂ සනාථ කිරීම් හෝ ණයගැති ලේඛනය සහ කාලවිශ්ලේෂණය

(ඇ)	තොගය	3,509,033	භෞතික සමීක්ෂණ වාර්තා
(ඈ)	විශ්වවිද්‍යාලයට අනුබද්ධ මධ්‍යස්ථාන 07 ක වියදම්	103,375,169	ප්‍රගති වාර්තා
(ඉ)	නඩත්තු කටයුතු වෙනුවෙන් ලබා දුන් ද්‍රව්‍ය හා උපකරණ	39,082,787	පිරිවැය ඇස්තමේන්තු
		149,790,040	

(ඊ) 2016 වර්ෂයේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී පිරිවැය රු.228,844,650 ක් වූ ලෙජර් ගිණුම් 27 ක පැවති වත්කම් ශේෂ ප්‍රත්‍යාගණන ගිණුමට මාරුකර තිබූ නමුත් ප්‍රත්‍යාගණන වටිනාකම් නැවත එම ගිණුම්වල නොදක්වා වෙනත් වත්කම් ගිණුම්වලට හර කිරීම හේතුවෙන් එම වත්කම්වල නිවැරදි වටිනාකම් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී තිබූ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය සමග එළඹී ගිවිසුම් උල්ලංඝනය කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 127 දෙනෙකුගෙන්, රු.91,020,204 ක් අයවිය යුතුව තිබුණි. තවද, විගණන නියැදි පරීක්ෂාවට අනුව විදේශ අධ්‍යයන නිවාඩු අවසන් කර වසර 02 ක කාලයක් ගත වී තිබූ නමුත් නැවත සේවයට වාර්තා කර නොතිබූ ආචාර්යවරුන් 03 දෙනෙකුට අදාල බැඳුම්කර වටිනාකම වූ රු.22,746,557 ක මුදල 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ලෙස හඳුනාගෙන ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ ලැයිස්තුවට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් 07 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.27,069,573 ක් වසරකට අධික කාලයක් තිස්සේ, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යමණ්ඩලයේ 11 දෙනෙකු විසින් ලබා නොගත් වැටුප් හා දීමනා රු.1,295,973 ක් 2017 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 03 දක්වා කාලයක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ පීඨ 09 ක සිසුන්ගෙන් අයවිය යුතු රු.1,886,950 ක් වූ ශාලා ගාස්තු හා රු.5,519,602 ක් වූ දඩ මුදල් ලෙස එකතුව රු.7,406,552 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 36 දක්වා කාලයක් ගත වී තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වනවිට සැපයුම්, සේවා සහ වැටුප් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ ශේෂ 22 කට අයත් රු.2,130,641 ක මුදලක් වසර 01 සිට වසර 16 ක කාලයක් ගතවී තිබුණද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 189	විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුම් 2 ක තැන්පත් කරන ලද එහෙත් මාස 06 සිට වසර 05 ක කාලයක සිට උපලබ්ධි නොවී පැවති රු.178,343 ක් වටිනා චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 571 (ඇ)	වසර 02 සිට වසර 05 දක්වා කාලයක් පියවා නොතිබූ රු.3,943,797 ක අත රැඳවුම් ශේෂ 14 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 770	2016 දෙසැම්බර් 31 දිනට සිදු කළ භාණ්ඩ සම්ක්ෂණයේදී විනාශ කළ යුතු හා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු එකතුව රු.1,714,283 ක් වටිනා අයිතම් 38 ක් හා පිරිවැය හඳුනාගත නොහැකි අයිතම 39 කට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් මාස 18 ක කාලයක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ)	2009 නොවැම්බර් 13 දිනැති අංක පිඑග්/එෆ්එස්/BOARD OF SERVEY/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව විකිණීම සඳහා නිර්දේශ කර තිබූ විවිධ වර්ගයන්ට අයත් රු.16,355,290 ක් වටිනා අයිතම 340 ක් සහ පිරිවැය හඳුනා ගත නොහැකි අයිතම 337 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 79	නියදි පරීක්ෂාවේදී චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි රු.10 සිට රු.1,000 දක්වා වූ අයිතමයන් 99 ක් ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූලව 2016 වර්ෂයට අදාළව සිදුවී ඇති වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීමෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග දක්වා ඇති 2016 වර්ෂයේ ඌනතාවය රු.113,459,245 කින් වැඩිවීමක්ද, මුළු වගකීම් රු.21,945,236 කින් වැඩිවීමක්ද, ස්කන්ධය රු.284,881,302 කින් වැඩිවීමක්ද, දක්වා ඇතත්, එය නිවැරදි කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව සියලුම අතිරික්ත මුදල්, මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතු වුවත්, විශ්වවිද්‍යාලය මගින් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජිත රු.95,500,000 ක මුදල සඳහා ඒ අනුව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.662,292,910 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.190,389,026 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.471,903,884 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.50,995,404 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.254,361,495 කින් හා ස්ථාවර වත්කම් ක්ෂය රු.248,875,901 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2015 වර්ෂයේදී හැර අනෙකුත් සෑම වර්ෂයකම ඌනතාවයක් ඇති වී තිබූ අතර 2013 වර්ෂයේදී රු.655,872,586 ක්වූ එය 2016 වර්ෂයේදී රු.662,292,910 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.2,212,155,421 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.4,135,808,262 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයට අයත් විද්‍යා පීඨයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ උපාධිධාරී සේවා නියුක්තිය සියයට 64 සිට සියයට 70 දක්වා පරාසයක විය.

(ආ) විශ්වවිද්‍යාලයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, ශාස්ත්‍ර පීඨය සහ විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මකවන අධ්‍යාපන දෙපාර්තමේන්තු 27 ක ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන්ට ළඟා වීමට හැකි වන පරිදි උපාධි අපේක්ෂක පාඨමාලාවල ප්‍රමිතිය වැඩි දියුණු කිරීමේ කටයුතු 2018 අගෝස්තු 30 දින වන විටත් සම්පූර්ණකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ රු.74,663,524 ක මූල්‍ය අක්‍රමිකතාවයකට අදාළව 2017 ජූනි 20 දින හා 2017 ජූලි 18 දින නිකුත් කළ විගණන විමසුම් සම්බන්ධයෙන් 2017 ජූනි 31 දින උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක එච්ඊ/එස්අයිඑන්/12/06/පීඩීඑන් දරන ලිපිය මගින් ලබා දී තිබූ උපදෙස් පරිදි කටයුතුකර නොතිබුණි.

(ආ) විද්‍යා පීඨයේ ස්ථාන 14 ක ස්ථාපිත කර තිබූ ගිනි නිවීමේ උපකරණවල කල් පිරීමේ දිනය විගණන දිනය වූ 2018 පෙබරවාරි 10 දින වන විට වසර 10 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබූ නමුත් ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) වෛද්‍ය පීඨයේ මහාචාර්යවරියකගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෛද්‍යවරියක් ලෙස කටයුතු කර ඇති මෙම වෛද්‍යවරිය 2004 පෙබරවාරි 16 දින සෞඛ්‍ය සේවයෙන් මුදා හැර තිබූ අතර, 2004 ජනවාරි 01 දින විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කර තිබූ අතර පත්වීම් දිනය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 වැනි ඡේදයට අනුකූල නොවන පරිදි 2010 සැප්තැම්බර් 25 පැවති 390 වැනි පාලක මණ්ඩල රැස්වීමේදී වසර 03 ක කාලයක් සඳහා එකවර එම නිලධාරිනියගේ පරිවාස කාලය දිර්ඝ කර තිබුණි.

(iii) පත්වීම් ලිපිය ප්‍රකාරව මාස 06 ක කාලයක් තුළදී උප්පැන්න සහතිකය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් සමග සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දින වන විට වසර 14 කාලයක් ගත වී තිබුණද එම ලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර විශ්වවිද්‍යාලයද ඒවා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) මෙම මහාචාර්යවරිය රු.3,805,782 ක ඇප බැඳුම්කරයක් මත 2006 අප්‍රේල් 05 දින සිට 2009 ජූනි 04 දක්වා මාස 39 ක කාලයක් සඳහා එක්සත් ජනපදයේ MRC Psych විභාගය සඳහා සායනික පුහුණුව වෙනුවෙන් ගිවිසුම්ගත වී තිබුණද, අදාළ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබියදී ඒ සම්බන්ධයෙන් කිසිදු

ක්‍රියාමාර්ගයක් විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි. එහෙත් ඇය විසින් එක්සත් ජනපදයේ සිට කරන ලද ඉල්ලීමක් මත ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව වෙනුවෙන් උක්ත ගිවිසුම මාස 03 කුත් දින 09 ක කාලයක් දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාල පාලන අධිකාරිය 2008 ඔක්තෝබර් 10 දින කටයුතුකර තිබුණි.

(v) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2010 හා 2010 දෙසැම්බර් 10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 01(C) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලවල වසර 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාළ තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන් සඳහා බදු සහන මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබාගැනීම සඳහා හිමිකම් පවතින බව දක්වා තිබුණි. එහෙත් ඊට අනුකූල නොවන ලෙස 2011 ජූලි 05 දිනට වසර 07 ක සේවා කාලයක් පමණක් සම්පූර්ණ කර තිබියදී මෙම් වෛද්‍යවරිය වෙත මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබා දී තිබුණි.

4.3 අරමුණුවලට පටහැනි ගෙවීම්

විශ්වවිද්‍යාලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් මහනුවර හා කුරුණෑගල මහ රෝහල්වල සංවර්ධන කටයුතු සඳහා රු.7,421,683 ක් විශ්වවිද්‍යාලයේ අරමුණු හා කාර්යයන්ට පටහැනිව වැය කර තිබුණි.

4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වන නිර්නායකයට අනුව විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩිදියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය (Designing, Setting, Moderating, Marking, Grading, Monitoring and Reviewing) සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයන් සකස් කර විශ්වවිද්‍යාල සනාථන සභාවේ විධිමත් අනුමැතිය ලබා ගත යුතු අතර එය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාවගේ අවධානයට යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, ශාස්ත්‍ර පීඨය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් උත්තර පත්‍ර ඇගයීම සඳහා ආයතනයට බාහිර ප්‍රවීනයන් යොදා ගැනීම හෝ/සහ උත්තර පත්‍ර දෙවැනිවර හරි වැරදි බැලීමේ ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු වුවත්, ශාස්ත්‍ර පීඨය යටතේ ක්‍රියාත්මක සියලුම අධ්‍යයන දෙපාර්තමේන්තු විසින් බාහිර ප්‍රවීනයන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ආර්ථික විද්‍යා, නීති, සමාජ විද්‍යා, පුරා විද්‍යා යන අධ්‍යයන දෙපාර්තමේන්තු විසින් උත්තර පත්‍ර දෙවැනිවර ඇගයීමක් (Second Marking) සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයේදී අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ඇ) ඉහත (අ) හි සඳහන් අත්පොතට අනුව, ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන අධ්‍යයන කාර්යය මණ්ඩලය එකී වගකීම් දැරීම සඳහා ප්‍රවීනයන් වන බවට සහතික විය යුතු වුවත්, නියැදි පරීක්ෂාවන්වලදී අනාවරණය වූ පරිදි දෙපාර්තමේන්තු 03 ක සේවයේ නියුතුව සිටි තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, වැඩිදියුණු කිරීම, උත්තර පත්‍ර හරි වැරදි බැලීමේ කාර්යයන්හි නියුතුව ඇති බව අනාවරණය විය. කෙසේ වුවද, එකී ආචාර්යවරුන් විගණන දිනවූ 2018 සැපතැම්බර් 04 දිනට සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවද නිරීක්ෂණය විය.

4.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයේ වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව රු. 7,595,150 ක මුදලකට 2015 අගෝස්තු 20 දින මිලදී ගෙන තිබූ Urodynamic System with Accessories නැමැති උපකරණය මගින් 2017 පෙබරවාරි 10 වන විට රෝගීන් 07 දෙනෙකු පමණක් පරීක්ෂා කිරීමට භාවිතා කර තිබුණි. එක් රෝගියෙකුගෙන් රු. 12,000 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් අය කරන බව අනාවරණය වූ අතර, රු. 7,595,150 ක මුදලක් වැය කර මිලදී ගෙන තිබුණු මෙම උපකරණය වසර 02 කට වැඩි කාලයක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) විද්‍යා පීඨයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2000 වර්ෂයේදී ජපානයෙන් පරිත්‍යාග කරන JASCO FTIR Spectro Photometer උපකරණය, 2006 වර්ෂයේදී කාර්යාලයේ වායුසමීකරණ පද්ධතිය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් පාවිච්චියට ගත නොහැකි තත්ත්වයට පත්වී ඇති අතර, එය අලුත්වැඩියා කිරීමට කටයුතු

නොකර වසර 12 ක කාලයක් නිෂ්ක්‍රීයව තිබුණි. තවද එම උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව හා වාහන අළුත්වැඩියාව සඳහා පැවති වාහන නඩත්තු ඒකකය 2017 පෙබරවාරි 17 දින අහෝසි කර, එයට අනුයුක්තව සිටි සේවකයන් 06 දෙනෙකු කාර්යය පැවරුමක් රහිතව විවිධ පියවලට අනුයුක්ත කර තිබූ අතර වැඩ දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබූ රු.511,953 ක් වටිනා එකී උපකරණ හා ආම්පන්න මාස 10 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) ඉදිකිරීම් කටයුතු අවසන් කර 2016 සැප්තැම්බර් 18 සිට 2018 පෙබරවාරි 18 දින දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලය වෙත පවරා දී තිබුණු රු.875,752,824 ක් වටිනා ශිෂ්‍ය නේවාසිකාගාර 04 ක අවශ්‍ය යටිතල පහසුකම් සපයා දී නොතිබීම නිසා 2018 සැප්තැම්බර් 10 වන විටත් එම නේවාසිකාගාර සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීමට නොහැකි වී තිබුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ 2006 ජනවාරි 11 දිනැති අංක 871 දරන චක්‍රලේඛයට අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනා අදාළ කර නොගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.3,136,592 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) සම සෞඛ්‍ය පියයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් සහ කළමනාකරණ පියයේ කුළුණු (Colonode) ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් 2011 දෙසැම්බර් 15 දින හා 2016 දෙසැම්බර් 22 දින එකතුව රු.2,387,929 ක සවලීකරණ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. එහෙත් 2015 ජුනි 04 දින වනවිට සෞඛ්‍ය පියයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අත්හැර දමා තිබූ අතර කළමනාකරණ පියයේ කුළුණු ඉදිකිරීම ආරම්භ කිරීමකින් තොරවම අත්හැර දමා තිබුණි. එසේ වුවද එම කොන්ත්‍රාත්වලට අදාලව ලබාගෙන තිබුණු අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත් වීමට පෙර මුදල් කරවා නොගැනීම හේතුවෙන් එම වටිනාකමින් විශ්වවිද්‍යාලයට පාඩුවක් සිදු වී තිබුණි.

4.7 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊඩී/12 සහ 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛයේ 9.10 වගන්තිය පරිදි විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්ගේ නිහකම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට අපහසු අවස්ථාවලදී හැරුණු විට අනුමත කාර්ය මණ්ඩලයේ දිගින් දිගටම පවතින පුරප්පාඩු හැකි ඉක්මණින් පිරවීමට හෝ අහෝසි කර දැමිය යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විශේෂඥ ගණයට අයත් නොවන පුරප්පාඩු 249 ක් පිරවීමට හෝ අහෝසි කර දැමීමට කටයුතු නොකර පුරප්පාඩු වශයෙන් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 03 ක් සඳහා ස්ථිර පත්වීම් සිදු නොකර, කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තියට අනුකූල නොවන පරිදි, 1990 සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවා ගෙන 2017 දෙසැම්බර් 31 දින වන විට දීමනා වශයෙන් මාසිකව රු.16,000 සිට රු.175,000 ක් දක්වා ගෙවා තිබුණි.

(ඈ) අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/15/1528/713/010 හා 2015 දෙසැම්බර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 11 ඡේදයට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලය ස්ථිර කාර්ය මණ්ඩලයට ආරක්ෂක නිලධාරීන් 24 දෙනෙක් බඳවා ගෙන, 2016 ඔක්තෝබර් සිට වැටුප් හා දීමනා වශයෙන් රු.5,519,589 ක් හා විවිධ අරමුදල්වලට රු.704,226 ක් ගෙවා තිබුණි.තවද උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි අනුමත ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 82 සිට 114 ක් දක්වා වැඩි කිරීමට වැටුප් හා සේවක කොමිෂන් සභාවේ අංක ඩීඑම්එස්/0011/පීඩීඑන් හා 2017 මැයි 18 දිනැති ලිපිය මගින් කටයුතු කර තිබුණි

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය

දැනුවත් වී තිබූ නමුත් තම විෂයය පථයට වැටෙන තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු ආකාරය සහ ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

6. ශිෂ්‍යම්කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව, කාලීනව සහ උපරිම ආර්ථික වාසි අත්පත් කර ගැනීමේ අරමුණු ඇතිව, ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය ආරම්භයේ පිළියෙල කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඒ අනුව ක්‍රියාත්මක විය යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, 2017 ජූලි 19 දින සංශෝධනය කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන තිබුණේ 2017 අගෝස්තු 29 දින දීය.

(ආ) 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තියේ සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රමුඛතා අනුපිළිවෙලට හා නිශ්චිත කාලය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර තිබුණේද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඇ) 2017 අයවැය ලේඛනයට අනුව කාණ්ඩ 04 ක් සඳහා රු.1,170,000,000 ක මුදලක් වෙන් කර තිබුණද ප්‍රසම්පාදන සැලසුමට අනුව එම කාණ්ඩ 04 සඳහා රු.7,544,150,000 ක ඇස්තමේන්තු පිරිවැයක් ඇතුලත් කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම අයවැය ලේඛනයට අනුගතව පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කලා පීඨයේ ශිෂ්‍යයන් සඳහා පොදු කාමරයක් ඉදිකිරීම පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂය සඳහා උසාවි නියෝගයකට අනුව අමතර ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට සිදුවීම හේතුවෙන් ශිෂ්‍යයන් සඳහා පොදු කාමරයක් ඉදිකිරීම

වෙනුවෙන් පවතින අර්ධ ස්ථිර ගොඩනැගිල්ල රු.10,895,120 ක වියදමින් වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබූ නමුත්, අදාළ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු අවසන්කර වසර 02 ක කාලයක් ඉක්ම වන තෙක් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 වගන්තියට අනුකූලව ලැබී තිබුණු ලංසු විස්තරාත්මකව ඇගයීම් නොකිරීම හේතුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතමයන් 16 ක සියයට 100 සිට සියයට 900 දක්වා විචලනයන් පැවතියත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකර කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබුණි.

(ආ) නිෂ්පාදන ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ගිනිගත් රසායනාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ රු.13,622,900 ක්වූ කොන්ත්‍රාත්තුවට අදාළ ඇස්තමේන්තුවේ අයිතම 03 ක් පරීක්ෂා කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ සම්මත පිරිවිතරයන් භාවිතා නොකිරීම නිසා රු.145,535 ක මුදලක්ද මධ්‍යම පළාත් සභාවේ සම්මත මිල ගණන් (Building Schedule of Rate BSR) භාවිතා නොකිරීම නිසා රු.251,763 ක මුදලක්ද වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි. තවද මෙම ඉදිකිරීමට අදාළ ගිවිසුම්ගත ප්‍රමාණ පත්‍රයේ ඇතුළත් රු.3,264,125 ක් වටිනා අයිතම් 20 ක් විවිධ හේතු නිසා ඉවත් කර තිබුණි.

6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය සමග අනුගත වෙමින් ප්‍රමුඛතාවය අනුව පුනරුත්ථාපන ව්‍යාපෘතීන් සැලසුම් කර මනා අධීක්ෂණයක් සහ පාලනයක් යටතේ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ආරම්භ කර තිබුණු වටිනාකම රු.244,891,745 ක් වූ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් 37 ක ගිවිසුම්ගත කාලය 2017 දෙසැම්බර් 31 දින වන විට ඉක්ම ගොස් තිබුණද, වැඩ නිමකර නොතිබුණි. තවද ඉහත කාලපරිච්ඡේදය තුළ ප්‍රදානය කර තිබූ වටිනාකම රු.33,800,832 ක් වූ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් 11 ක වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ වැඩ අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දීමට නියමිත දිනය ඉක්මවා තිබුණු වටිනාකම රු.2,464,881,408 ක් වූ නව ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක වැඩ නිමකර 2017 දෙසැම්බර් 31 දින වන විටත් විශ්වවිද්‍යාලය වෙත භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට සැලසුම්කර තිබුණු රු.86,000,000 ක් ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් ප්‍රතිපාදන ලබාදී තිබූ නමුත් විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක කර නොතිබුණි.

6.2 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.1.3 ඡේදය ප්‍රකාරව, පාලක මණ්ඩලය අනුමත කරන ලද සංශෝධිත අයවැය අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ සංශෝධිත අයවැය සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණේ 2018 මැයි 03 දිනදීය.

6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලය විසින් පීඨ 03 ක් පවත්වාගෙන යන අක්කර 73 ක් හා පර්චස් 53.4 ක් වන ඉඩම් විධිමත් පරිදි විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අත්සන් ලේඛනයක හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම මගින් සේවයේ නියුක්ත බව තහවුරු කර නොගෙන 2017 වර්ෂයේදී නිලධාරීන් හා ආචාර්යවරුන් 849 ක් වෙත රු.2,287,733,499 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(iii) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සහ සේවකභාරකාර අරමුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනා අදාළ කර ගැනීම නිසා 2017 වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදලට සිදු වී ඇති පාඩුව රු.93,213,994 ක් විය.

6.4 සමාජ වගකීම් ඉටු කිරීම

2008 ඔක්තෝබර් 01 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවන ආකාරව අපද්‍රව්‍ය විමෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රයක් ලබාගෙන ඊට අදාළව කවයුතු නිදු කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතා කර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය හා දිරාපත් වෙමවන ද්‍රව්‍ය විශ්වවිද්‍යාල භූමියේ ඝනක් කරන ලද වලකට බැහැර කර තිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ තේවාසිකාගාර 03 හ මිළ අපවහන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අවිධිමත් ලෙස පරිසරයට මුදා හැර තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වලින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත යඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	මිණුම්කරණය	ඇතැම් ශ්‍රී ලංකා රජය අංශ නිසුම්කරණ ප්‍රතිපත්තිවලදී වලස ප්‍රගතිනය නොකිරීම.
(ආ)	ණයගැති හා ණයහිමි පාලනය	ලැබිය යුතු සහ ගෙවිය යුතු මිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.
(ඇ)	ප්‍රශ්නපාදනය	ඇතැම් ප්‍රපමපාදන වගවීම්පත්‍රයන් අනුගමනය නොකිරීම.
(ඈ)	වත්කම් පාලනය	නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.
(ඉ)	ගනුදෙනු පරිහාලනය	ඇතැම් ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2.	**මූල්‍ය ප්‍රකාශන**
2.1	**තත්වාගණනය කළ මතය**
2.2	**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
2.2.1	**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.**
(අ)	විගණනය විසින් පෙන්වා දී ඇති අරමුදල් ගිණුම්වලට අදාල සියලු ආදායම් හා වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන අතර පිළිවෙලින් 2018 හා 2019 වර්ෂයන් හි ගිණුම් සැකසීමට කටයුතු කරමි.
(ආ)	**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**
(i)	සම්පූර්ණයෙන්ම ක්ෂය කළ අගය ශූන්‍ය වී ඇති පුස්තකාල පොත් හා වාර සඟරා ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් වන කමිටු පත්කර, අදාල ප්‍රත්‍යාගණන කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර ඒ අනුව අදාල ගැළපීම් 2018 වර්ෂයේ අවසන් ගිණුම්වල සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
(ii)	අදාල අමාත්‍යංශ සමඟ සාකච්ඡා කොට ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කරමි.
(iii)	විගණන වාර්තාවේ පෙන්වා දී ඇති ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයේ දී දැනට භාවිතා කරනු ලබන වත්කම් කිහිපයක් ප්‍රත්‍යාගණනයේ දී මඟහැරීම, පවත්නා පද්ධතියට අනුකූල නොවීම හේතුවෙන් සිදු වී ඇති අතර, ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු මඟහැර අදාල කාර්යයන් සිදු කරන ලෙස වගකිව යුතු නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
2.2.2	**ගිණුම්කරණ ප්‍රතිපත්ති**
	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 12 හා 13 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි ආර්ථික තත්වය පෙන්නුම් කරන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කර, ඒ අනුව අදාළ ගැළපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම එකී ප්‍රතිපත්තිය ගිණුම්කරණ සටහන් ලෙස හෙලිදිරව් කිරීමටද කටයුතු කරනු ලැබේ.
2.2.3	**ගිණුම්කරණ අඩුපාඩු**
(අ)	මෙම වරද නිවැරදි කර ඇති අතර, ඉදිරියේදී ගිණුම්ගත කිරීම් නැවත පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයන් සකස් කර ඇත.
(ආ)	මහ භාණ්ඩාගාරයේ මුදල් ලැබෙන ආකරය අනුව ව්‍යාපෘතිවල වැඩකටයුතු බාධාවකින් තොරව සිදු කිරීම වෙනුවෙන් ව්‍යාපෘතීන් අතර මුදල් හුවමාරු කිරීමේදී මෙය සිදුවී ඇති අතර, ඉදිරියේදී මුදල් හුවමාරු කිරීම් නියමිත පරිදි ගිණුම්ගත කිරීමෙන් මෙය විසඳෙනු ඇත.
(ඇ)	දැනටමත් මෙහි නිවැරදි කිරීම් සිදුකර ඇති අතර ගිණුම් තැබීම් නිවැරදි ගිණුම් කේතයන් යටතේ සිදුකරනවාද යන්න නැවත පරීක්ෂා කිරීම තුළින් මෙකී ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කරමි.
(ඈ)	පරිත්‍යාග මුදලකට අයත් අංක 057600100144924 දරණ ස්ථිර තැන්පතුවේ පොලී ආදායමෙන් 50% ක් මුහුණත වටිනාකමට එකතු වන අතර, ඉතිරි 50% ක පොලී ආදායම ගිණුම් අංක 057 1001 0 1338024 දරණ ගිණුමට තැන්පත් කරනු ලැබේ. එම ආදායම් වශයෙන් ලැබෙන පොලිය පොලී ගිණුමට ගිණුම් ගත කර ඇත. මුහුණත වටිනාකමට එකතු විය යුතු 50% ක පොලිය වන රු. 371,290.47 ක මුදල ජනල වවුචර IA/04/18-A මඟින් මුහුණත වටිනාකමට එකතු කර පහත සඳහන් පරිදි 2018 වර්ෂයේ පරිත්‍යාග අරමුදල් ගිණුමේ මෙම වෙනස ගලපා නිවැරදි කර ඇත. මුහුණත වටිනාකම - 4,131,766.78 50% ක පොලී ආදායම - 371,290.47 2017/12/31 දිනට මුහුණත වටිනාකම - 4,503,057.25

(ඉ)	2017 වර්ෂයට අදාලව ලැබිය යුතු ඉල්ලුම් තැන්පතු ආයෝජන ආදායම් වටිනාකම රු. 110,112,135/- කි. නමුත් 11-01-03-21-03 ගිණුමට ගිණුම්ගත වූ රු.703,232.87 ක මුදල ස්ථාවර තැන්පතු ලේඛනයට ඇතුලත් කර ඇතත් වැරදීමකින් එම මුදල ආයෝජන ආදායම් ලෙස ගිණුම්ගත කොට ඇත. එය 2018 වර්ෂයේ දී ජ'නල් අංක I0028 මඟින් නිවැරදි කළ අතර ආදායම් ගිණුමෙහි අවසන් ශේෂය රු. 110,531,128.77 ක් විය.
(ඊ)	2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 04 ක අයවී තිබූ රු. 6,282,494/- මුදල අතපසු වීමකින් සංචලන අත්තිකාරම් ගිණුමට බැර කර නොමැත. එයට අදාල නිවරැදි කිරීම් 2018 වර්ෂයේදී ජනල් අංක A0002 මඟින් සිදුකර ඇත.
(උ)	පැරණි ප්‍රවාහන ණය ගිණුමේ 2014.12.31 වන දිනට ශේෂය රු. 50,746.65 ක් වූ අතර, ඉන් 2015 වර්ෂය තුළ අයකර ගන්නා ලද රු. 5,348.00 අගය හැර 2015.12.31 වන දිනට පැවති නොසැසඳු රු.45,398.65 ක් වූ ශේෂය මුදල් කමිටු 348.13 හි නිර්දේශය මත ජනල අංක L0011 මඟින් ණය ගැලපුම් ගිණුමට මාරු කර තිබූ ඉහත ශේෂය සම්බන්ධයෙන් ලිපි ලේඛණ පරීක්ෂා කළ නමුත් කිසිදු තොරතුරක් මේ වන විටත් සොයාගත නොහැකි විය.
(ඌ)	**<u>වපිරාරමය</u>** 2017.08.25 වන දිනැති වපිරාරාම ආරණ්‍ය සේනාසනයේ විහාරාධිකාරී හිමිගේ ලිපිය මඟින් අප විසින් ඉදිරිපත්කර ඇති බදු මුදල ගෙවීමට ආදායම් මාර්ග හෝ මුදල් නොමැති බව දැනුම් දී ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරියට ගතයුතු ක්‍රියා මාර්ග විමසීම උදෙසා 2018.07.04 දින විශ්වවිද්‍යාල ඉඩම් ගොඩනැඟිලි හා නඩත්තු කමිටුව වෙත යොමුකර ඇත. 2018.11.13 දින පැවති 326 වන විශ්වවිද්‍යාල ඉඩම් ගොඩනැඟිලි හා නඩත්තු කමිටුවේදී, මෙම ගිවිසුම 1986 දී වසර 99 කාලයක බදු ලබාදීම සඳහා අත්සන් කර ඇති බැවින් එම ගිවිසුම වෙනස් කිරීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳව සොයා බලමින් පවති. **<u>උඩරට ගැමි පුනුරුත්ථාපන දෙපාර්තමේන්තුව</u>** මෙම ඉඩම සඳහා ගිවිසුම් කොන්දේසි අනුව වසර 05කට වරක් බදු මුදල් සංශෝදනය කොට උඩරට ගැමි පුනුරුත්ථාපන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත අදාල නිඟ බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් විටින්විට දැනුවත් කලත්, බදු මුදල් ගෙවීමට ප්‍රතිපාදන නොමැති බවත්, එවැනි බදු මුදලක් ගෙවීමට හැකියාවක් නොමැති බවත් දන්වා ඇත. උඩරට ගැමි පුනුරුත්ථාපන දෙපර්තමේන්තුව සහ විශ්වවිද්‍යාලය අතර වූ ගිවිසුම 2017.12.30 වන දිනෙන් අවසන් වී ඇත. උඩරට ගැමි පුනුරුත්ථාපන දෙපාර්තමේන්තුව මඟින් නිසිපරිදි බදු නොගෙවා පැහැර හැරීම හේතුවෙන් අදාල ගොඩනැඟිලි පරිශ්‍රය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවති. ඒ අනුව ගොඩනැඟිලි වලින් භාගයක් පමණ මේ වන විට විශ්වවිද්‍යාලය වෙත භාරගෙන ඇත. ඉතිරි ගොඩනැඟිලි කොටස්වලද නිස් බුක්තිය විශ්වවිද්‍යාලය වෙත කඩිනමින් භාරදෙන ලෙස ඉල්ලීම් කලද මේ වනතුරුත් භාරදී නොමැත. 2018.12.19 දින පැවති ඉඩම් සම්බන්ධ පාලක සභා අනුකමිටුව මඟින් තීරණයකර ඇත්තේ නීති නිලධාරී මඟින් ඉවත්වීම සඳහා අවසන් දිනයක් ලබාදී එම දිනය වන විටත් ඉවත් නොවීමට කටයුතු නොකරන්නේනම් නීති මාර්ගයෙන් අදාල පාර්ශවයන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසටය. ඒ අනුව නීති නිලධාරීවෙත උපාදෙස් ලබාදී ඇත.

	<u>රත්මලේපොල භූමිය</u> පේරාදෙණිය නගරයේ රත්මලේ ඉඩමේ පොලභූමිය සඳහා ප්‍රාදේශීය සභාවට අදාල බදු මුදල් ගෙවීමට දැනුම්දී ඇති අතර එම ආයතනයට ආදායම් නොමැති හෙයින් එම ස්ථානයෙන් ඉවත් වී ඇත. ප්‍රාදේශීය සභාව විසින් කිසිදු ව්‍යාපාරික කටයුත්තක් හෝ නඩත්තු කටයුත්තක් මෙම ස්ථානයෙන් සිදු නොකරන බැවින් විශ්වවිද්‍යාලය මඟින් එම භූමියේ වැට ගසා විශ්වවිද්‍යාල ඉඩම ආරක්ෂා කිරීමට කටයුතු කර ඇත.
2.2.4	**පැහැදිලි නොකළ වෙනස්කම්**
	මේ වනවිටත් රු. 242,400/- අයකරගෙන ඇති අතර ඉතිරි මුදල නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.
2.2.5	**විගණනය සඳහා සාක්ෂි නොවීම**
(අ)	අත්තිකාරම් ලේඛන, ණයගැති ලේඛන හා කාල විශ්ලේෂණ යාවත්කාලින කොට තබා ගැනීමටත්, ඒවා විගණනයට නොපමාව ඉදිරිපත් කිරීමටත් අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
(ආ)	අත්තිකාරම් ලේඛන, ණයගැති ලේඛන හා කාල විශ්ලේෂණ යාවත්කාලින කොට තබා ගැනීමටත්, ඒවා විගණනයට නොපමාව ඉදිරිපත් කිරීමටත් අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
(ඇ)	නියමිත කාල වකවානුවට යටත්ව තොග සමීක්ෂණයන් අවසන් කිරීමටත්, තොග සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමටත් අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
(ඈ)	**<u>විශ්වවිද්‍යාලයට අනුබද්ධ මධ්‍යස්ථාන 07ක වියදම් රු. 103,375,169.00</u>** මෙම අනුබද්ධ මධ්‍යස්ථාන වලින් ප්‍රගති වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
(ඉ)	සියලුම අලුත්වැඩියා /නව ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
(ඊ)	විගණන වාර්තාවේ පෙන්වා දී ඇති ස්ථාවර වත්කම් ගිණුම් 27කට අදාලව, 2017 දෙසැම්බර් 31 දිනට වූ වටිනාකම, ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයට අදාල ගිණුම් තැබීමේ දී නව ගිණුම් කේතයන් යටතේ ගිණුම් ගත කර තිබූ බැවින්, ප්‍රත්‍යාගණනයට අදාල ගිණුම් තැබීමේ දී වරදක් සිදු වී නොමැත. එබැවින් නිවැරදි කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය නොවේ.
2.3	**ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්**
(අ)	2017.12.31 දිනට සිටි බැදුම්කර කඩ කළ ආචාර්යවරුන් 127 දෙනාගෙන් ආචාර්ය වරුන් 17 දෙනෙකු 2018 වර්ෂය තුල බැදුම්කර වටිනාකම් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර කොටස් වශයෙන් ගෙවමින් පවතින් වටිනාකම්ද ඇතුලත්ව රු.17,777,153.90ක මුදලක් 2018 වර්ෂය තුල විශ්වවිද්‍යාලය වෙත අයකරගෙන ඇත. මීට අමතරව නව ආචාර්යවරු 13 දෙනෙකුගේ බැදුම්කර වටිනාකම් 2018.10.22 සහ 2018.12.28 දිනැති ලිපි මඟින් ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ලේඛනයට ඇතුලත් කොට ඇත. මීට අමතරව තවත් එක් ආචාර්යවරයෙකුගේ නම 2018 වර්ෂය තුලදී ලේඛනයට ඇතුලත් වූ නමුදු ඔහුගේ බැදුම්කර වටිනාකම් මුදල අර්ථසාධක අරමුදලෙන් අයකරගෙන ඇත. ඒ අනුව 2018.12.31 දිනට ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ ගණන 124ක් වන අතර, ඔවුන්ගෙන් අය කර ගැනිමට ඇති මුලු බැඳුම්කර වටිනාකම සවිස්තරාත්මකව පහතින් දක්වා ඇත.

	අයකර ගන්නා ක්‍රමවේදය	**ආචාර්යවරුන් ගේ සංඛ්‍යාව**	**2018-12-31 දිනට අයකර ගැනිමට ඇති ශේෂය රුපියල්**
ක්‍රියාකාරී ගිවිසුම් කඩකල ආචාර්යවරුන්	අර්ථ සාධක අරමුදල් ප්‍රමාණවත්	18	16,204,709.76
	වාරික වශයෙන් ගෙවීම	09	9,209,723.77
	නීති ක්‍රියාමාර්ග	08	23,540,678.18

	බැඳුම්කර වටිනාකම් නිරවුල් කර ගැනීමට පවතින	06	12,864,007.18
	අලුතින් ඇතුලත් වූ බැඳුම්කර කඩකල ආචාර්යවරුන්	08	67,179,472.51
	මුළු එකතුව	49	128,998,591.40
පැරණි ගිවිසුම් කඩකල ආචාර්යවරුන්		75	33,961,115.13
මුළු එකතුව		**124**	**162,959,706.50**

විගණන වාර්තාවේ සඳහන් පහත සඳහන් ආචාර්යවරුන් සේවය අතහැර ගියාසේ සලකා ලිපි නිකුත් කර ඇත.

1. එස්.කේ.පී.එච්. තිලකරත්න මහත්මිය
2. වයි.එම්.ඒ.වයි. බණ්ඩාර මහතා සහ
3. එච්.ඩී. තම්පෝ මහතා

අදාල ආචාර්යවරුන්ගේ බැඳුම්කර වටිනාකම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 09/2010 පරිදි නැවත සංශෝධනයකර එම බැඳුම්කර වටිනාකම ගිනුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) ඡේදයේ දක්වා ඇති සැපයුම්කරුවන් හත් දෙදෙනකුගෙන් හය දෙනෙකු දේශීය සැපයුම් අංශයට අදාල වන අතර එයින් රු.26,405,463/- ක මුදල 2018.08.31 වන විට ගෙවා අවසන්කර ඇත.

Samsun Engineering (pvt) LTD වෙත ගෙවීමට ඇති රු. 529,000/- මුදල ඉංජිනේරු පීඨයේ මිළ දී ගැනීමකට අදාල රැඳවුම් මුදලක් වන අතර, රැඳවුම් කාලය අවසන් වූ විට ගෙවීමට නියමිතය. තවද රු.74,110/- ක මුදලට අදාල ගැලපීම් 2019 දී කිරීමට නියමිතය.

ශාස්ත්‍ර පීඨයේ සම්මන්ත්‍රණ කාමරය (Seminar room) සඳහා AV Projector Systerm (Pvt) Ltd ආයතනයෙන් මිලදී ගත් රු. 61 000/- ක යාන්ත්‍රිකව ක්‍රියාකරනු ලබන බහු මාධ්‍ය ප්‍රේෂණ තිර (Multimedia Projector Screens) 2ක දෝෂ සහිත බව නිවැරදි කරදෙන මෙන් සැපයුම්කරුගෙන් ඉල්ලා සිටින ලදි. නමුත් කිහිප අවස්ථාවක දී අදාළ සමාගම එම තත්වය නිවරුදි කිරීමට උත්සහ කළ ද සාර්ථක නොවිය.

තවද අදාල සමාගම විසින් මෙම සැපයුම සඳහා මේ වනතෙක් ගෙවීම් ඉන්වොයිසි ඉදිරිපත්කර නොමැත. එබැවින් මෙම ගෙවීම මේ වනතෙක් සිදුකර නොමැති අතර ගෙවිය යුතු වියදමක් වශයෙන් පොත්වල සටහන්කර ශේෂය ඉදිරියටගෙන ඇත.

කෙසේ නමුත් AV Projector(Pvt) Ltd ආයතනයට 12.09.2018 දිනැති ලිපිය මඟින් මෙම යාන්ත්‍රික තිරයන්හි පවතින දෝෂ සහිත බව නිවැරදි කර දෙන මෙන් හා 26.09.2018 දිනට පෙර එය නිවැරදි කර නොදෙන්නේනම් අපගේ ගිණුම් වලින් මෙම ශේෂයන් ඉවත් කරන බව දන්වා යවන ලද අතර, ඉදිරියේදී මෙවැනි දෝෂයන් ඇති නොවීමට කටයුතු කරමි.

(ඇ) නිළධාරීන් 07 දෙනෙකු සඳහා නොගෙවූ වැටුප් ලෙස පෙන්නුම් කරනුයේ සාමුහික රක්ෂණ ගිවිසුමක් යටතේ අදාල රක්ෂණ සමාගමට ගෙවීම සඳහා මාසික වැටුපෙන් වාරික මුදල් ලෙස අයකරගත් වාරික වටිනාකමයි. අදාල රක්ෂණ ගිවිසුම අවලංගු කිරීම මත 2014.12.31 දින මෙම මුදල් නැවත නොගෙවූ වැටුප් ගිණුමට බැර කර ඇත. මෙම මුදල මාසික වැටුපට එකතු කර ආපසු ගෙවිය යුතු වුවද මෙම සාමාජිකයන් මේ වන විටත් සේවයෙන් විශ්‍රාම ගොස්/ සේවයෙන් ඉල්ලා අස්වී/වැටුප් රහිත නිවාඩු ලබා සිටි බැවින් මාසික වැටුපට එකතුකර ගෙවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් මෙම මුදල 2018.09.18 දින අදාල සමාජිකයන් වෙත ආපසු ගෙවීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව අදාල

	ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

නම	මුදල රු
01 ඒ.එන් ජයකොඩි	2,664.00
02 ආර්.බී මාපා	666.00
03 එම්.එස්.එම් අනීෂ්	2,032.00
04 ඩබ්.පි.ආර්.පී.ඩී. සිල්වා	447.00
05 එස්.පි. ඉන්ද්‍රරත්න	4,416.00
06 කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු	1,104.00
07 එම්.ඒ.එස්.ජයකුමාර	894.00
එකතුව	12,223.00

එස්.ඒ. වීරසුරිය යන ආචාර්යවරයා වෙත ගෙවිය යුතු රු. 591,280.00 ක මුදල වැටුප් සහිත අධ්‍යයන නිවාඩු වෙනුවෙන් ගෙවිය යුතු වැටුප් සහ 2014 අප්‍රේල් සහ මැයි මස සඳහා ගෙවිය යුතු වැටුප් වන අතර, එම මුදල් ඉදිරියේ දී ගෙවීමට කටයුතු කරනු ලැබේ.

නොගෙවූ වැටුප් ගිණුමට බැර කළ දිනය	රු
2014.03.26	484,420.00
2014.06.10	53,430.00
2015.12.30	53,430.00
	591,280.00

එස්.කේ.පී.එච් නිලකරත්න අචාර්යවරිය වෙත ගෙවිය යුතු රු. 647,930.00 ක මුදල ඇය වෙත ගෙවීමට කටයුතු කර නොමැත්තේ මෙම අචාර්යවරිය ගිවිසුම් කඩකල ආචාර්යවරියක ලෙස හඳුනාගෙන ඇති බැවිනි. ඒ අනුව අදාල ආචාර්යවරියගෙන් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු ගිවිසුම්ගත බැඳුම්කර වටිනාකම ගිවිසුම් කමිටුවට යොමුකර කමිටුවේ අනුමැතිය මත අදාල ගෙවිය යුතු වැටුප් හා දිමනා ගිවිසුම් කඩකිරීම මත අයවිය යුතු වටිනාකමින් අඩුකර ගැනිමට කටයුතු කරනු ඇත.

එස්.පී.ඩී සිල්වා මයා විසින් ලබා නොගත් ශේෂ වැටුපක් රු. 110.00 ක් වන අතර මෙම මුදල 2018.09.18 දිනැති අංක 192278 දරන චෙක්පත මගින් නැවත ඔහු වෙත ගෙවීමට කටයුතු කර ඇත.

අයි.ආර්.එස්.බී ඉල්ලගොල්ල මයා විසින් ලබා නොගත් වැටුපක් ලෙස පෙන්වා දී ඇති මෙම රු. 44,430.00 ක වටිනාකම අදාල පුද්ගලයා වෙත ගෙවිය යුතු වැටුපක් නොවන බව හඳුනාගෙන ඇති අතර එම ශේෂය 2018.09.18 දිනැති අංක 35 දරන ප'නල් සටහන මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඈ)	සියළුම පීඨයන්හි 2017.12.31 දිනට රු. 7ල406ල552.00 ක් වූ ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල්වල එකතුවෙන් 2018.08.31 දින වන විට රු.1ල800ල048.00 ක් සිසුන් විසින් ගෙවා ඇත. ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයේ උපදෙස් පරිදි, ත්‍රිපුද්ගල විමර්ශන කමිටුවක් පත් කරන ලද අතර ඉදිරියේදී මෙම ගැටලු මගහරවා ගැනිම සඳහා විමර්ශන කමිටුවේ නිර්දේශ ලැබීමෙන් පසු ඒ අනුව කටයුතු කරනු ලැබේ. එසේම හිඟ ශාලා ගාස්තු හා දඩ මුදල් ගෙවන තෙක් එම සිසුන්ට තාවකාලික උපාධි සහතිකය නිකුත් නොකිරීමටත්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හා දන්ත වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා නාම ලේඛණ

	සකස් කිරීමේ දී එම සිසුන්ගේ නම් ඇතුලත් නොකිරීමටත් තීරණය කර ඇත.
(ඉ)	• සැපයුම් සේවා සහ අත්තිකාරම් යටතේ දක්වා ඇති රු.2,130,641 ක මුදලට අදාල ශේෂ 22 න් රු.62,078/- (2936/-,15912/-,42530/-, 680/-) ක වටිනාකමින් යුත් ශේෂ 4 ක් පුස්තකාල වාර සඟරා වෙනුවෙන් ගෙවන ලද අත්තිකාරම් වේ. මෙම අත්තිකාරම්වලට අදාල වාර සඟරා ප්‍රමාණය මේ වනතෙක් සම්පූර්ණ වී නොමැති බැවින් පියවීම් කටයුතු කිරීමට නොහැකි වී ඇත. • යන්ත්‍ර සේවා කිරීමට අදාලව ගෙවනු ලබන මුදල් අත්තිකාරමක් ලෙස දන්ත වෛද්‍ය පීඨය විසින් Gestetner of ceylon Plc ආයතනයට ගෙවූ රු. 15,284.00 ක මුදල අදාළ සේවා සහතිකය ගිණුම් අංශයට නොලැබීම මත නිරවුල් වී නොමැත. මේවන විට මෙම ලියවිල්ල ලැබී ඇති හෙයින් අදාල අත්තිකාරම නිරවුල් කිරමට කටයුතු කර ඇති බව දන්වමි. • රු.1,519,435.00 ට අදාල (EN/2016/EF/PROD/TM/19/230) දරණ ලිපි ගොනුව 2016 ආරම්භ කලත්, 2017 අවසන් වන තුරු එහි කටයුතු අවසන් වී නොමැති විමට හේතු වුයේ අදාල භාණ්ඩය (3D Printer) ආනයනයේ දී එම භාණ්ඩයේ කොටසකට සිදුවූ හානිය සම්බන්ධයෙන් රක්ෂන වන්දි ලබා ගැනිමට කටයුතු කිරීමට සිදුවීමයි. මේ වන විට අදාල කොටස ආනයනය කර ඇති අතර ඉන්වෙන්ට්‍රි සහතිකය 2018.09.05 දින ලැබී ඇත. ඒ අනුව Ceylon shipping corporation Ltd ආයතනයට අදාල ගාස්තු නිරවුල් කිරීමෙන් පසු ගොනුව අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. • ගොනු අංක UP/FS/LB/71/2015 ට අදාල ඇනවුම් අංක වන B/F/SC/PHY/2014/CL/12, UP/FS/LB/37/2014 වෙනුවෙන් ගෙවා ඇති රු. 3,465.00 ක මුදල සැපයුම්කරුවෙකු වෙත ගෙවූ මුදලක් නොවන අතර එය රක්ෂණ ගාස්තු වශයෙන් ගෙවූ මුදලක් බවත් දන්වා සිටිමී. ඇණවුම සම්පූර්ණ විමෙන් පසුව ගොනුව අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. • විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි Madu Freighters(pvt) Ltd ආයතනයෙන් අයකර ගැනීමට ඇති මුදල රු. 318,892.00 ක් නොව රු. 145,000.00 කි. එම මුදල අයකර ගැනීම සඳහා මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග සිදුවෙමින් පවති. අධිකරණ කටයුතු අවසන් විමෙන් පසු අධිකරණ තීන්දුව අනුව කටයුතු කරනු ලැබේ. • විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි පර්යේෂණ අත්තිකාරම් රු.45,000.00 ක් හා අරමුදල් අත්තිකාරම් රු. 161,486.95 ක මුදල ලබා ගත් ආචාර්ය ඩී.කේ. ගුණසේකර සහ ආචාර්ය බී.ආර්.කේ. ඔබේසේකර යන ආචාර්යවරුන් විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර එම ආචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදල් මේ වන විටත් නිදහස් කරගෙන නොමැති නිසා එම අරමුදල් නිදහස් කිරීමේදි මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම ආචාර්යවරුන් දෙදෙනාගේ අර්ථසාධක අරමුදල් ප්‍රමාදයකින් තොරව නිදහස් කිරීම සඳහා කටයුතු කරන ලෙස අධ්‍යයන ආයතන අංශය වෙත ලිඛිත ඉල්ලීමක්ද සිදු කර ඇත. • උත්සව අත්තිකාරම් වන රු. 5000ක මුදලට අදාල පුද්ගලයින් පුනරුත්තාපන ව්‍යාපෘති වල සේවය කර ඇති සේවකයන් ලෙසත්, ඔවුන් දැනට විශ්වවිද්‍යාල සේවයේ නොමැති බවත් හඳුනාගෙන ඇත. එසේම ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් මේ දක්වා නිදහස් කරගෙන නොමැත. එබැවින් ඔවුන්ගේ අර්ථසාධක නිදහස් වන අවස්ථාවේදි එම මුදල් අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ.
2.4	**<u>නීති,රීති ,රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>**
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**
(i).	**<u>මුදල් රෙගුලාසි 189</u>** බාහිර පාර්ශවයන්ගෙන් ලැබුණු, එහෙත් විවිධ හේතු මත උපලබ්ධි නොවූ චෙක්පත්, වව්චර්පතක් මගින්

	අවලංගු කොට නැවත ණයගැතියෙකු බවට පත් කොට, එකී ණයගැතියන්ගෙන් එකී මුදල් නැවත අයකර ගනිමින්, මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය නිළධාරීන් දැනුවත් කර ඇත.
(ii).	**<u>මුදල් රෙගුලාසි 571 (ඇ)</u>** මුදල් කමිටුවට ඉදිරිපත් කොට අවශ්‍ය කටයුතු කිරීමට කටයුතු කරමි.
(iii).	**<u>මුදල් රෙගුලාසි 770</u>** රුපියල් 1,714,283.00 වටිනාකමට මිලදී ගන්නා ලද අයිතම 38 ක් සහ වටිනාකම හඳුනා නොගත් අයිතම 39 අබලි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබූ අතර, අදාල අංශ මගින් බොහොමයක් මේවන විට අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගන්නා අතර, එසේ අළුත්වැඩියා නොකරන ලද භාණ්ඩ කඩිනම්ව අළුත්වැඩියා කරන ලෙසට ලිඛිතව දැනුම් දී ඇත. විනාශ කිරීම සඳහා නිර්දේශකර තිබූ භාණ්ඩ පාරිසරික හේතූන් මත විශ්වවිද්‍යාල භූමිය තුල විනාශ කිරීම කල නොහැකි බැවින් මෙම භාණ්ඩ විකිණීම සඳහා අබලි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය තීරණය කර ඇත. අයිතම 15 සිට 22 දක්වා අයිතම සියල්ල විනාශකර අවසන් කර ඇත.
(ආ)	**<u>2009 නොවැම්බර් 13 දිනැති අංක PF/FS/BOARD OF SERVAY/02 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය</u>**
	වටිනාකම රුපියල් 16,355,290.00 අයිතම 340 ක් සහ වටිනාකම හඳුනා නොගත් අයිතම 337 ක් විකිණීම සඳහා සුදුසු අබලි භාණ්ඩ ලෙස සමීක්ෂණ මණ්ඩලය තීරණය කල අතර, ඒ අනුව 2016/12/31 දිනට විකිණීම සඳහා නිර්දේශිත අබලි භාණ්ඩ සියල්ල එක්රැස් කර, ගබඩා 03 ක තොග 03 ක් ලෙස තැන්පත් කර තොග වශයෙන් ඇස්තමේන්තු කර මිල ගණන් කැඳවා ප්‍රසිද්ධියේ විකුණා අවසන් කර ඇත. අංක 01 තොගය රුපියල් 251,100.00 අංක 02 තොගය රුපියල් 521,100.00 අංක 03 තොගය රුපියල් 312,100.00
(ඇ)	විගණන වාර්තාවේ පෙන්වාදී ඇති ස්ථාවර වත්කම් ලෙස සැළකිය නොහැකි රු.930/- ක් වටිනා මේස සඳහා සවිකර තිබුනු අගුළු (Locks) ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීම, ප්‍රමාද දෝෂයන් නිසා සිදු වී ඇති අතර එය 2018 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර අදාල ගැළපීම් ස්ථාවර වත්කම් ලේඛනයේ සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
2.5	**ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**
(අ)	මෙහි සඳහන් වන 2016 වර්ෂයට අදාල සිදුවී ඇති වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇත. මෙය මුදල් කමිටුවේ 369.47 තීරණය මත අනුමත වී ඇති අතර මුදල් කමිටු තීරණය විශ්වවිද්‍යාලයේ පාලක සභාව මගින් අනුමත කර ඇත. කෙසේ වුවත් ඉදිරි වර්ෂ වලදී මේ සම්බන්ධ වාර්තා වලට පාලක සභාවේ වෙනමම අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ)	2017 වර්ෂයේ පරිත්‍යාග, බැදුම්කර කඩවුවන්ගෙන් ලද මුදල්, පර්යේෂණ හා වෙනත් ඉපැයීම් ප්‍රභවයන්ගෙන් ලද මුදලින් ආරම්භ කල රු. 94,000,000.00 ක් වූ නව ආයෝජන සඳහා විශ්වවිද්‍යාලය විසින් මුදල් අමාත්‍යංශයේ අනුමැතියට ඉදිරිපත් කරන ලද ලේඛණය 2018 සැප්තැම්බර් 14 දින උසස් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත. එසේම 2018 වර්ෂයේ මුල් භාගයේ සිදුකල නව ආයෝජනයන්ට අදාලව ද අනුමැතිය ලබාගැනීමට කටයුතු කොට ඇති අතර මින් ඉදිරියට පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි.
3.	**මූල්‍ය සමාලෝචනය**
3.1	**මූල්‍ය ප්‍රතිඵල**
4.	**මෙහෙයුම් සමාලෝචනය**
4.1	**කාර්ය සාධනය**
4.1.1	**ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**
(අ)	සේවා නියුක්තිය ගණනය කිරීම සම්බන්ධයෙන් උපාධි පාඨමාලා පිළිබඳ අනෙකුත් පාර්ශවකරුවන් (Stakehoders) සමඟ සාකච්ඡා කිරීම සිදුවන අතර, ඒ අනුව වෙළෙඳපොළ ඉල්ලුම ඉලක්ක කරගනිමින් හා උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය සැලකිල්ලට ගෙන නව උපාධි පාඨමාලා හඳුන්වා දීම හා පවතින උපාධි පාඨමාලා යාවත්කාලීන කරනු ලබයි. එමෙන්ම සේවා නියුක්තිය ගණනය කිරීම සිදු කරනු ලබන්නේ අවසන් වසර අවසන් සාමාසික පරීක්ෂණය පැවැත්වීමෙන් මාස 6කට පමණ පසුව නිසා එම දත්ත පිළිබඳ සෑහීමට පත්විය හැකි බව හා නිවැරදිභාවය පිළිබඳ ගැටලුවක් පවතී. එම නිසා දත්ත රැස් කිරීම පිළිබඳව සංඝණනය ඉදිරියේදී අවම වශයෙන් අවසන් වසර, අවසන් සාමාසික පරීක්ෂණය පවත්වා අවුරුද්දක පමණ කාලය ඇතුලත සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
(ආ)	**<u>විද්‍යා පීඨය</u>** උපාධි අපේක්ෂක පාඨමාලාවන්හි ප්‍රමිති තත්ත්වය වැඩි දියුණු කිරීම නියමිත දිනයකට සිදු කළ නොහැකි අතර, එය අඛණ්ඩව සිදුවන ක්‍රියාදාමයකි. **<u>ශාස්ත්‍ර පීඨය</u>** උපාධි පාඨමාලා වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් පීඨයේ දෙපාර්තමේන්තු 17ට අදාළව සංශෝධනය කරන ලද පාඨමාලා ව්‍යුහයන් (Course Structures) 2018.08.30 වන දින පීඨ මණ්ඩල නිර්දේශය සඳහා යොමු කර ඇත. එම නිර්දේශයන් 2018.09.14 වන දින සනාතන සභාවේ අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කිරීමේ කමිටුව (ADPC) වෙත ඉදිරිපත් කරන ලදී. එම කමිටුවේදී සංශෝධනයන් කිහිපයක් සහිතව යෝජිත පාඨමාලා ව්‍යුහයන් නිර්දේශ වී ඇති අතර එය ඔක්තෝබර් මාසයේ සනාතන සභාවේ අනුමැතියට යොමු කර ඇත.
4.2	**කළමනාකරණ ක්‍රියාකාරකම්**
(අ)	මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කරුණු 2017.06.24 වන දින පැවති අංක 464 වැනි විශ්වවිද්‍යාල පාලක සභාවටත්, 2017.08.05 වන දින පැවති 465 වැනි පාලක සභාවට හා 2017.10.28 දින පැවති 469 වැනි

පාලක සභාවටත් වාර්තා කිරීමෙන් අනතුරුව පාලක සභාව විසින් විද්වතුන් පස් දෙනකුගෙන් යුත් කමිටුවක් අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීම සඳහා පත් කරන ලදී. එකී විමර්ශන වාර්තා සලකා බැලූ පාලක සභාව එම විමර්ශන වාර්තා වල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට තීන්දු කරන ලදී.

ඒ වන විටත් මෙම ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අය බන්ධනාගාරගත වී සිටි බැවින් විනය පරීක්ෂණය ඔහු බන්ධනාගාරයෙන් නිදහස් වී පැමිණීමෙන් අනතුරුව පැවැත්වීමටත්, ඔහුට අදාල චෝදනා පත්‍රය නිකුත් කිරීම සඳහා එම මුල්‍ය වංචාවට අදාල නිත්‍ය වටිනාකම විගණන මතයකින් පසුව සිදු කළ යුතු බවත් සඳහන් කරන ලදී.

තවද මෙම මුල්‍ය වංචාව රු. 500,000 ට වඩා වැඩි බැවින් මුල්‍ය රෙගුලාසි 104 (3) යටතේ කමිටුවක් පත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

එකී විමර්ශන වාර්තා හා පාලක සභා තීරණ ලෙස ලකුණු කර ඇත.

එකී පාලක සභා නියෝග අනුව පහත සඳහන් පරිදි කටයුතු කළ බව දන්වා සිටිමී.

i. 2017.08.11 වන දිනැති හා 2017.12.07 දිනැති ලිපි මගින් ලේකම්, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය වෙත මෙම විමර්ශන වාර්තා යොමු කරන ලදී. තවද එහි පිටපත් සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතද ඉදිරිපත් කරන ලදී.

ii. අනිකුත් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක වෙත 2017.09.26, 2017.11.20, 2017.12.11 හා 2017.12.19 ලිපි මගින් දැනුම් දෙන ලදී.

iii. පාලක සභා නියමය අනුව කටයුතු කරමින් එවකට අධ්‍යක්ෂක ලෙස කටයුතු කර මහාචාර්ය එච්.එම්.ඩි. නාමල් ප්‍රියන්ත මහතාගෙන් මෙම මුල්‍ය වංචාව සිදුවීමට පාදක වූ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගිණුම් පරීක්ෂා කිරීම නොසලකා හැරීම, විධිමත් මූල්‍ය හා ගිණුම්කරණ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අපොහොසත් වීම ආදිය සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසූ අතර එකී නිදහසට කරුණු සම්බන්ධයෙන් එම මහාචාර්යවරයා විසින් පිළිතුරු ලබා දුනී.

මහාචාර්ය එච්.එම්.ඩි. නාමල් ප්‍රියන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු 2017.11.25 වන දින පැවති 470 වැනි පාලක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහිදී එම නිදහසට කරුණු සලකා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර එම කමිටු වාර්තාව 2018.05.26 වන දින පැවති 474 වැනි පාලක සභාවට ඉදිරිපත් කරන ලදී. එහිදි එම වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයට වූ අලාභය සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂකවරුන් වගකිව යුතු බවත් මහාචාර්ය එච්.එම්.ඩි. නාමල් ප්‍රියන්ත මහතා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු බවත් සඳහන් කර ඇත.

උක්ත සිදුවීම සම්බන්ධයෙන් 104 (4) යටතේ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම් විසින් කමිටුවක් පත් කළ අතර එම කමිටු වාර්තාව මේ වන විටත් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.

විශේෂ විගණන විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු අනුව විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල මහතා විසින් සිදුකර ඇති අලාභය රු. 50,338,160.00ක මුදලක් වන බවත් ඒ සඳහා ඔහු වගකිව යුතු බවත් දක්වා ඇත. ඒ අනුව එවකට රටින් බැහැරව සිටි ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල මහතාගේ නීතිඥ චමින්ද අතුකෝරල මහතා විසින් ඉද්දවෙල මහතාගෙන් යම් මුල්‍යමය අලාභයක් වී ඇත්නම් එම මුදල ගෙවන බව දන්වා 2017.07.07 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත ලිපියක් එවන ලදී. ඒ අනුව අදාල මුල්‍ය අලාභය විශ්වවිද්‍යාලයට ගෙවන මෙන් දන්වා 2017.07.20 වන දින ලිපියක් යවන ලදී.

ඒ අනුව චෝදනා පත්‍ර සැකසිම ඒ වන විට ආරම්භ කර තිබූ විශේෂ විගණන වාර්තාව ලැබෙන තෙක් ප්‍රමාද කර අතර ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අයට යොමු කළ යුතු චෝදනා පත්‍රයේ කෙටුම්පත, මහජන බැංකුවේ සභාපති වෙත ඔවුන්ගේ වගකීම් පැහැරහැරීම සම්බන්ධයෙන් දැනුම් දීමට නියමිත

	ලිපිය හා විශේෂ විගණන වාර්තාව 2018.09.29 වන දින පැවැත්වූ 479 වැනි පාලක සභාව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. එකී 479වැනි පාලක සභා තීරණය පරිදි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අයට සහ හිටපු අධ්‍යක්ෂක මහාචාර්ය එච්.එම්.ඩි. නාමල් ප්‍රියන්ත මහතා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කල හැකි විනයබලධාරියා කවරුන්ද යන්න තීරණය කිරීම සඳහා පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුව විසින් විමර්ශනයක් සිදුකර ලබා දෙන ලද තීරණය මත මෙන්ම උක්ත සිද්ධිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කරන ලද හානිවීම් පරීක්ෂණයෙන් අනාවරණය වූ පරිදි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අයට සහ හිටපු අධ්‍යක්ෂක මහාචාර්ය එච්.එම්.ඩි. නාමල් ප්‍රියන්ත මහතාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අයටත්, මහජන බැංකුවටත් සහ අදාල කාල වකවානු වලදී විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කල අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සිවිල් නඩු ගොනු කිරීමට සිද්ධිය සම්බන්ධව අපගේ අංක LD/PRE/124/2017 දරණ 2018.09.28 වන දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටින ලදී. තවද සිදුවීමට අදාල මෙම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි ඩබ්.එම්.එම්.එස්.එම්. ඉද්දවෙල යන අයට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර තිබූ නඩු අංක බී.43167/17 නඩුවට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවමත් විමර්ශණ කටයුතු පවත්වාගෙන යන බව වාර්තා වී ඇත.
(ආ)	මෙම ස්ථාන වෙත නව ගිනි නිවීමේ උපකරණ ස්ථාපිත කිරීමට අදාල කටයුතු 2017.02.20 වන දින සිදු කොට ඇත.
(ඇ)	
i.	පෞද්ගලික ලිපිගොනුවට අනුව මෙම වෛද්‍යවරිය විසින් 2004.01.01 දින සේවයට වාර්තාකර ඇත. ඒ අනුව මෙම නිලධාරිනිය 2004.01.01 දින සෞඛ්‍ය අමාත්‍යාංශ සේවයෙන් නිදහස් වී/ ඉවත් වී පැමිණ ඇත්දැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසිමට කටයුතු කර ඇත. මේ පිළිබඳව 2019.01.02 දින නැවත සිහි කැඳවීමක් ද කර ඇත. කෙසේ නමුත් මේ දක්වා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයෙන් පිළිතුරක් ලැබී නොමැත.
ii.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රයේ III පරිච්ඡේදයේ 21 වැනි ඡේදයේ ප්‍රතිපාදන අනුව මේ වන විට සියලුම අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන්ගේ පරිවාස කාලය වාර්ෂිකව සමාලෝචනයකර ගෙනයෑම සිදුකරන බව දන්වා සිටිමි.
iii.	මෙම මහාචාර්යවරියගේ උප්පැන්න සහතිකය පත්විම් ලබා පැමිණි මුල් අවධියේම ලබාදී ඇති අතර ඇගේ අධ්‍යයන සහතික වල පිටපත් සහතිකකර මේ වන විට පෞද්ගලික ලිපිගොනුවට ගොනුකර ඇත.
iv.	අධ්‍යන නිවාඩු ලබාදීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛන විධිවිධානයන්ට අනුකූලව මෙම අධ්‍යන නිවාඩු ලබාදී ඇත.
v.	මෙම මහාචාර්යවරියගේ සෞඛ්‍යය අමාත්‍යාංශයේ සේවා කාලය හා විශ්වවිද්‍යාලයේ සේවා කාලයේ එකතුව සලකා බලා මෙම වාහන බලපත්‍රය ලබාදීම නිර්දේශ කොට නැති නමුත් ඇයගේ ඉල්ලීම මත අයදුම් පත්‍රය ඉදිරිපත්කර යවා ඇත. කෙසේ වුවද මුදල් අමාත්‍යාංශය ඇයගේ සේවා කාලයන් දෙකම සලකා වාහන බලපත්‍රය නිකුත් කර ඇත.
4.3	**අරමුණුවලට පටහැනි ගෙවීම්**

	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කණ්ඩායම් 02 ට අයත් සිසුන් 400 - 430 කට ආසන්න ප්‍රමාණයක් මහනුවර මහරෝහලේ සායනික පුහුණුව සඳහා වාර්ෂිකව යොමු කරනු ලබයි. ඒ අනුව ශිෂ්‍යයන් සඳහා අපේක්ෂිත හා ප්‍රමාණවත් අයුරින් රෝහල තුල ආපනශාලාවක් සහ වැසිකිලි පහසුකම් නොමැති බව ශිෂ්‍ය සංගම් විසින් දිගින් දිගටම පරිපාලනය වෙත කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව වෛද්‍ය පීඨයේ පීඨාධිපති විසින් 2013.11.20 දිනැති ලිපිය මඟින් අදාල ආපනශාලාව හා වැසිකිලි ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා කර ඇති ඉල්ලීමට පිළිතුරු වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් විසින් එම වසරේ ප්‍රතිපාදන අවසන් වී ඇති බැවින් රෝහල් අධ්‍යක්ෂ වෙත ප්‍රතිපාදන ලබාදිය නොහැකි බව 2013.12.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. ඒ අනුව මෙම අවශ්‍යතාවයන් සැපයීම සම්බන්ධයෙන් ඇති කඩිනම් අවශ්‍යතාවය 425 වැනි පාලක සභාව වෙත ඉදිරිපත් කොට එහි අනුමැතිය ලබා ගෙන ඇති අතර අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා 284 වැනි ඉඩම්, ගොඩනැගිලි සහ නඩත්තු කමිටුවේ අනුමැතියද ලබාගෙන ඇත. මේ අනුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යන්ට අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම ඉදිකිරීම් සිදුකර ඇති බැවින්, විශ්වවිද්‍යාලයේ අරමුණු වලට පටහැනි වියදමක් ලෙස සැලකිය නොහැකි බව දන්වමි.
4.4	**මෙහෙයුම් ක්‍රියාකාරකම්**
(අ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7වන නිර්නායකයට අනුව කටයුතු කළ යුතු වුවත්, ශාස්ත්‍ර පීඨයේ පාඨමාලා සමාලෝචනය සිදු කර අවසන් කරනු ලැබුවේ 2017 වසරේ අග භාගයේ දීය. එම සමාලෝචන කමිටු මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 2018 වසරේ සිට පීඨයේ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති මෙහෙයුම් ක්‍රියාකාරකම් වල අඩුපාඩු රැසක් එමඟින් විසඳා ගැනීමට හැකි වනු ඇත.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7වන නිර්නායකයට අනුව කටයුතු කළ යුතු වුවත්, ශාස්ත්‍ර පීඨයේ පාඨමාලා සමාලෝචනය සිදු කර අවසන් කරනු ලැබුවේ 2017 වසරේ අග භාගයේ දීය. එම සමාලෝචන කමිටු මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 2018 වසරේ සිට පීඨයේ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති මෙහෙයුම් ක්‍රියාකාරකම් වල අඩුපාඩු රැසක් එමඟින් විසඳා ගැනීමට හැකි වනු ඇත.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7වන නිර්නායකයට අනුව කටයුතු කළ යුතු වුවත්, ශාස්ත්‍ර පීඨයේ පාඨමාලා සමාලෝචනය සිදු කර අවසන් කරනු ලැබුවේ 2017 වසරේ අග භාගයේ දීය. එම සමාලෝචන කමිටු මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 2018 වසරේ සිට පීඨයේ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති මෙහෙයුම් ක්‍රියාකාරකම් වල අඩුපාඩු රැසක් එමඟින් විසඳා ගැනීමට හැකි වනු ඇත.
4.5	**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ)	ශෛල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව වෙත Urodynamic උපකරණය මිළදී ගනු ලැබුවේ 2015.08.20 දින Urology Lab හි භාවිතය සඳහාය. Clinical Research ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු වල සිදුවූ ප්‍රමාදය නිසා එනම් ජල කාන්දුව. දිලිර බිහිවීම. විදුලි සැපයුම් ගැටළු. වායුසමනය කිරීමේ ප්‍රමාදය. සනීපාරක්ෂක ගැටළු (urodynamic test, uroflowmetry) සඳහා අත්‍යාවශ්‍ය වැසිකිළි පහසුකම් නොමැති වීම ආදීය හේතුවෙන් එම පරීක්ෂණාගාරයේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. 2017 වර්ෂයේ පෙබරවාරි මස Urology lab හි වැඩ ඇරඹීමෙන් අනතුරුව 2017 පෙබරවාරි 10 වන දින පළමු රෝගියා සඳහා urodynamic යන්ත්‍රය භාවිතා කරන ලදී. ප්‍රේරාදෙණිය රෝහලෙන් ශෛල්‍ය වෛද්‍ය දෙපාර්තමේතුව වෙත යොමු කරන ලද සියළුම රෝගීන් පරීක්ෂාවට ලක් කරන ලද අතර මේ සම්බන්ධ කිසිදු රෝගියකු යන්ත්‍රය භාවිතා කිරීමට නොහැකිව නැවත හරවා යවා නොමැත. වර්තමානය වන විට රෝහලෙන් රෝගීන් යොමු කරන ආකාරය අනුව යන්ත්‍රය භාවිතා කරනු ලබන අතර, 2018.07.31 දින වන විට රෝගීන් 09 දෙනෙකු පරීක්ෂාවට ලක් කර ඇත. ඉදිරියේදී ඉහත ගැටළු අවම කර ගැනීමෙන් යන්ත්‍රය පූර්ණ උපයෝජනයක් සහිතව භාවිතා කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
(ආ)	මෙම JASCOFTIR උපකරණය විද්‍යා පීඨයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ භාණ්ඩ ලේඛණයේ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩයක් නොවන අතර එය ආචාර්යවරයෙකු වෙත පර්යේෂණ කටයුතු සඳහා ලැබී ඇති ත්‍යාගයක් වේ. තවද මෙය දැනට අක්‍රීය තත්වයේ පවතින බැවින් පීඨයේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි තත්වයක පවතී. මෙම උපකරණය අලුත්වැඩියාව සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බවද නිරීක්ෂණය විය.
(ඇ)	විශ්වවිද්‍යාලයීය වාහන අළුත්වැඩියාව හා සේවා කිරීම දැනට බාහිර ආයතන මඟින් සිදු කරනු ලබන අතර, ඉතා ඉක්මණින් වාහන නඩත්තු ඒකකය විශ්වවිද්‍යාලයේ වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම සඳහා මේ වනවිට සැලසුම් කරමින් පවතී.
(ඈ)	**මහකන්ද නේවාසිකාගාරය සහ ලලිත් ඇතුලත්මුදලි නේවාසිකාගාර** මහකන්ද නේවාසිකාගාරය සහ ලලිත් ඇතුලත්මුදලි නේවාසිකාගාරය පිළිවෙලින් 2016 වර්ෂයේ අවසාන භාගය සහ 2017 වර්ෂයේ මුල් වකවානුවේ අදාල කොන්ත්‍රාත් සමාගම විසින් ගොඩනැගිලිවල කටයුතු පමණක් අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදුන්නද එහි යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි භාර ගත් දින සිට එම නේවාසිකාගාර සඳහා අවශ්‍ය මළ අපවහන පද්ධතිය සකස් කිරීමටත්, ආපන ශාලාව සකස් කිරීමටත්, අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමටත්, අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග විශ්වවිද්‍යාලය විසින් අරගෙන ඇත. මේ වන විට මළ අපවහන පද්ධතියේ කටයුතු අවසන් කර ඇති අතර අවශ්‍ය ආපනශාලාවන් ඉදි කෙරෙමින් පවතී. අවශ්‍ය කාර්ය මණ්ඩලය යම් ප්‍රමාණයක් ලබා දී ඇතත් ඉතිරි කාර්ය මණ්ඩලය ඉදිරියේදී අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වේ. අවශ්‍ය ගෘහ භාණ්ඩ සිංගර් ශ්‍රී ලංකා සමාගම, සුපිත් ෆර්නිචර් මැනුෆැක්චරස් ආයතනය, මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික සමාගම සහ කාගෝ සර්වි ෂිපිං සමාගම යන ආයතන මඟින් සැපයුම් කර ඇති අතර මේ වනවිට එම භාණ්ඩ, ඒ සඳහා සපයන ලද පිරිවිතරයන්ට අනුකූල නොවන තත්වයන් පවතින හෙයින් ඉදිරියේදී විශේෂිත කමිටුවක් වෙත මෙම භාණ්ඩ යොමු කර භාණ්ඩ භාර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු විශ්වවිද්‍යාලය මඟින් සිදු කරමින් පවතී. ඒ අනුව මෙම භාණ්ඩ ඉදිරියේදී විශ්වවිද්‍යාලය වෙත භාර ගැනීමේ කටයුතු සම්පූර්ණ වූ වහාම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට බලාපොරාත්තු වේ. **අංක 07,08 සරසවි මැදුර ශාලාව** අංක 07,08 සරසවි මැදුර ශාලාවන්ද අදාල කොන්ත්‍රාත් සමාගම විසින් ගොඩනැගිලිවල කටයුතු පමණක්

	අවසන් කර 2018 වර්ෂයේ මුල් කාර්තුවේ විශ්වවිද්‍යාලය වෙත භාරදුන්නද එහි යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි භාර ගත් දින සිට එම නේවාසිකාගාර සඳහා මළ අපවහන පද්ධතිය සකස් කිරීමටත්, ආපන ශාලා පහසුකම් සකස් කිරීමටත්, අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමටත්,අවශය කාර්ය මණ්ඩල ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. මේ වනවිට මළ අපවහන පද්ධතිය නිමකිරීම සඳහා ටෙන්ඩර් ලබාදුන් ආයතනය විසින් එම කටයුත්ත ඉටුකිරීමට අදාල ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද කිරීම නිසා 2018-09-11 දින පැවති විශ්වවිද්‍යාලයීය ඉඩම් හා ගොඩනැගිලි කමිටු රැස්වීම් එම සමාගම අපලේඛණ ගතකර නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කර ඇත. එසේම මෙම ශාලා දෙකට අවශ්‍ය ආපනශාලා පහසුකම් රාමනාදන් ශාලාවේ ආපනශාලාවෙන්ම ලබා ගැනීම සඳහා සරසවි මැදුර ශාලා දෙක අතර යා කරන පාලමක් සහිත ආවරණය කරන ලද අඩි පාරක් රාමනාදන් භෝජනාගාරය දක්වා ඉදිකිරීමට විශ්වවිද්‍යාලයීය ටෙන්ඩර් මණ්ඩලය අනුමත කර ඇති අතර 2018-09-11 දින පැවති විශ්වවිද්‍යාලයීය ඉඩම් හා ගොඩනැගිලි කමිටු රැස්වීම්දී ඊට අදාල සැලැස්මක් සකසන ලෙස ව්‍යාපෘති කළමණාකරු වෙත උපදෙස් ලබා දී ඇත. තවද මෙම ශාලා දෙක සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර අවශ්‍ය වන ගෘහභාණ්ඩ ලබා ගැනීම සඳහා මේ වනවිට සැපයුම් අංශය මඟින් ටෙන්ඩර් කැඳවා ඇත. ඒ අනුව අංක 07,08 සරසවි මැදුර නේවාසිකාගාර ශාලා දෙකහි මළ අපවහන පද්ධතිවල කටයුතු සහ ආපනශාලාව සඳහා වූ පාලම නිමකර අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් හා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීමෙන් පසු ශිෂ්‍යාවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව විගණන වාර්තාවෙන් පෙන්වා තිබෙන නේවාසිකාගාර 04 න් මහකන්ද නේවාසිකාගාරය සහ ලලිත් ඇතුලත්මුදලි නේවාසිකාගාරය සඳහා ගෘහ භාණ්ඩ ගැටළුව නිරාකරනය වූ වහාම ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ඇතුලත් කල හැකි අතර සරසවි මැදුර නේවාසිකාගාර ශාලා දෙක සඳහා සියළු යටිතල පහසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව ශිෂ්‍යාවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට හැකියාව ලැබෙනු ඇත.
4.6	**හඳුනාගන්නා ලද පාඩු**
(අ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011.07.19 දිනැති ආයතන චක්‍රලේඛ අංක 14/2011 සහ 2011.03.18 දිනැති අංක 952 දරණ චක්‍රලේඛ ප්‍රකාරව විශ්වවිද්‍යාල සේවක වැටුප් සමඟ ගෙවනු ලබන පිවන වියදම් දිමනාව සඳහාද සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් 2006.01.01 දින සිට ගණනය කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිටි සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි අදාල කාල සීමාවේ දායක මුදල් ගණනය කර 2013.05.22 දින අංක 255616 දරන චෙක්පත මඟින් රු. 15,241,909.83 ක මුදලක් මුල්‍යාධිකාරිගේ පැහැදිළි කිරීම් ලිපියද සමඟ අධිභාර නොගන්නා ලෙසද සඳහන් කරමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත ගෙවා ඇත. තවද 14/2011 චක්‍රලේඛයේ A(c) B(c) ඡේදයට අනුව අදාල හිඟ දායක මුදල් සඳහා ගෙවිය යුතු හිඟ පොලී ද ගෙවන ලෙස උපදෙස් ලබාදී ඇත. ඒ සඳහා වූ අදාල හිඟ පොලී මුදල ගණනය කර 2015.10.13 දින 256196 දරණ චෙක්පත මඟින් රු. 6,273,184.77ක මුදල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත ගෙවා ඇත. මේ අනුව අදාල පොලී මුදල් ගෙවීම සඳහා කාල ප්‍රමාදයක් සිදුවී ඇත්තේ හිඟ පොලිය ගණනය කිරීමට හා ඒ සඳහා අවශ්‍ය මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා ගැනීමේදී සිදුවූ ප්‍රමාදය නිසාවෙනි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උක්ත හිඟ පොලිය සඳහා අවශ්‍ය අතිරේක මුදල් විශ්වවිද්‍යාලය වෙත ලබාදී ඇත්තේ 2015.09.16 දින වේ. මෙම හිඟ මුදල ගණනය කලයුතු ආකාරය පිළිබඳව නිසි ක්‍රමවේදයක් අදාල චක්‍රලේඛයේ සඳහන් කර නොතිබූ බවත්, මේ පිළබඳව විමසුම් කර තුන්දහසකට අධික සේවක මණ්ඩලයක් සඳහා දායක මුදල් හා පොලී මුදල් ගණනය කිරීමට මෙම

	කාලය ගත වී ඇති බව දන්වා සිටිමි. ඉහත රු. 6.273.184.77 දායක මුදල ගෙවීමෙන් අනතුරුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙතින් 2006.01.01 සිට චෙක්පත් භාරදුන් දින වන 2015.10.20 දින දක්වා කාලයට නියමිත දිනට පෙර දායක මුදල් නොගෙවූ බව සලකා ගෙවූ මුදලට 50% අධි භාරයක් ගෙවිය යුතු බව සඳහන් වූ 2016.02.29 දින දරණ අධිභාර නිවේදන අංක EN 1621144 එවන ලදී. (මෙය 2016.03.08 දින ලැබුණි). ඊට පිළිතුරු වශයෙන් වැඩ බලන මුල්‍යාධිකාරී විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නීති අංශයේ සාමාන්‍යාධිකාරී වෙත පැහැදිලි කිරීමේ ලිපියක් 2016.09.20 දින යොමුකරන ලදී. මෙම ලිපියට පිළිතුරු වශයෙන් 2017.10.04 දිනැති ලිපිය මඟින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වැඩ බලන සාමාන්‍යාධිකාරී විසින් දන්වා සිටියේ පනතේ වගන්ති ප්‍රකාරව අදාල අධිභාර මුදල් ගෙවීම අනිවාර්යය බවයි. තවද 2017.11.20 දිනැති උපකුලපතිතුමාගේ ලිපිය මඟින්ද කරුණු පැහැදිලි කරමින් අධිභාරය ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටියද, නැවතත් ඉහත අධිභාරය ගෙවන ලෙස දන්වමින් 2018.01.04 දිනැති අංක PS 1621144 දරණ අධිභාර නිවේදනය අප වෙත එවන ලදී. ඒ වන විටත් උපකුලපතිතුමාගේ උක්ත ලිපියට පිළිතුරක් නොලැබී තිබුනු බැවින් වැටුප් අංශයේ නියෝජ්‍ය මුල්‍යාධිකාරී විසින් නිතිමය ක්‍රියාමාර්ග ගැනීම අත්හිටුවන ලෙස දන්වමින් 2018.01.10 දිනැති ලිපිය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී. කෙසේ වෙතත් අධිභාරය ඉවත් කල නොහැකි බව දන්වමින් රු. 3.,136,591.92 ක මුදල දින 14 ක් ඇතුලත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවන ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/රැස්කිරීම් හා සේවායෝජක සම්බන්ධතා විසින් අවසාන නිවේදනය 2018.01.25 දින අප වෙත එවන ලදී. (මෙය 2018.02.15 දින ලැබුණි) එබැවින් රු. 3,136,591.92 ක් වන අධිභාර මුදල 2018.02.15 දිනැති අංක 158081 චෙක්පත මඟින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවීමට කටයුතු කරන ලදී. කෙසේ නමුදු මෙම ගෙවීම් වලින් පසුවද විශ්වවිද්‍යාලය මඟින් සේවා නියුක්ත භාර අරමුදල වෙතින් දිගින් දිගටම කළ ඉල්ලම් සහ ඉදිරිපත් කිරීම් නිසා සේවා නියුක්ත භාර අරමුදල මඟින් එම මුදල විශ්වවිද්‍යාලය වෙත නැවත ගෙවීමට එකඟ වී ඇත. විශ්වවිද්‍යාලය දිගින් දිගටම කල ඉල්ලීම සලකා බලා සේවක භාරකාර අරමුදල මේවන විට මෙම රු.3,136,592.00 ක මුදල නැවත විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් සිදු වී නොමැති බව දන්වමි.
(ආ)	සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නව ගෙඩනැඟිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2011.12.15 දින වෝටර්මන් ඉංජිනියරින් පුද්ද සමාගම වෙත රු. 38,584,463.54 + Vat ට ලබා දී ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් 2013.06. 14 දින කාර්යය අවසන් කළ යුතුව තිබු අතර අන්තර් බිල්පත් 11 මඟින් රු. 22,090,721.61 ක් ගෙවා ඇත. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද සංචලන අත්තිකාරම් බැඳුම්කරය 2015.03. 03 දින අවසන් වී ඇති අතර එය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. මේ අතර කාලසීමාව තුල කොන්ත්‍රාත්කරු මෙම කාර්ය අතහැර ගොස් ඇති බව වාර්තා වීමෙන් අනතුරුව අදාල වැඩ බිමෙහි තිබූ කොන්ත්‍රාත් සමාගමට අයත් සියළු භාණ්ඩ හා උපකරණ වැඩ බිමෙන් පිටතට රැගෙන යාම ආරක්ෂක අංශය දැනුවත් කර නතර කරන ලදී. පසුව අදාල කොන්ත්‍රාත් කාර්යයේ පැවති තත්ත්වය පිළිබඳව 2015.10.28 දින පැවති විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවට වාර්තා කර එහි නිර්දේශය 159 වැනි ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර එහි අනුමැතිය සහ උපදෙස් පරිදි වැඩබිම විශ්වවිද්‍යාලයට භාරගෙන කොන්ත්‍රාත් සමාගමට අයත් අදාල භාණ්ඩ හා උපකරණ තක්සේරු කිරීම සඳහා උපකුලපති විසින් කමිටුවක් පත් කරන ලදී. එම කමිටු නිර්දේශය අනුව විශ්වවිද්‍යාලය භාරයට ගනු ලැබූ භාණ්ඩ හා උපකරණ වල වටිනාකම රු. 3,885,832 වශයෙන් තක්සේරු කරන ලදී. එම සියළු භාණ්ඩ හා උපකරණ

විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

ඒ අනුව විශ්වවිද්‍යාලය වෙත කොන්ත්‍රාත්කරුගෙන් අයවීමට ඇති රු 1,612,287 ක මුදල ඉහත මුදලින් පියවා ගැනීමට කටයුතු කර ඇත.

4.7 **කාර්යය මණ්ඩල පරිපාලනය**

(අ) **2018.12..31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තනතුරු පුරප්පාඩු හා ඒවා පිරවීමට ගත් ක්‍රියාමාර්ග**

තනතුර	අනුමත තනතුරු ගණන	තත්‍ය සේවක සංඛ්‍යාව	තනතුරු පුරප්පාඩු ගණන	විස්තරය
වැඩපළ ඉංජිනේරු	1	0	1	පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා ඇත.
ව්‍යාපෘති ඉංජිනේරු	1	0	1	බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.
විදුලි ඉංජිනේරු	2	0	2	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
විද්‍යුත් ඉංජිනේරු	2	1	1	පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමට නියමිතය.
ජාල ඉංජිනේරු	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
සහකාර ලේඛකාධිකාරී(නීති හා ලේඛන)	1	0	1	පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ සඳහා සුදානම්කර ඇත.
නියෝජ්‍ය විනයාරක්ෂක නිළධාරී	1	0	1	මෙම තනතුර උසස්වීම් තනතුරකි. මේ සඳහා අයදුම්පත් ලැබී නොමැත.
ගොවිපළ කළමණාකරු	3	2	1	සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. පත්වීම් ලබාදීමට නියමිතය.
ප්‍රධාන ආරක්ෂක නිළධාරී	1	0	1	මෙම තනතුර දැරූ නිලධාරියාගේ සේවය සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පවත්වා ඇති අතර එම තීරණයට විරුද්ධව ඔහු විසින් අධිකරණයේ නඩුවක් ගොනු කොට ඇති අතර එම අධිකරණ කටයුතු මේ දක්වා අවසන්ව නොමැති බැවින් මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ තාවකාලිකව අත්හිටුවා ඇත.
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිළධාරී/වෛද්‍ය නිළධාරී	5	3	2	පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමට නියමිතය.
දත්ත පාලක	3	0	3	බඳවා ගැනීමේ පරිපාටියේ ඇති කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසිම් කර ඇත.

	උපශාලාධිපති	20	17	3	බාහිර දැන්වීම් පලකර බඳවා ගැනීම සඳහා කටයුතු සිදුවෙමින් පවති.
	කැමරා ක්‍රියාකරු	1	0	1	මෙම තනතුර තාක්ෂණික නිළධාරී තනතුරක් බවට පරිවර්තනය කරන ලෙස ඉල්ලා ඇත.
	විනයාරක්ෂක	9	6	3	අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ නමුත් කිසිවෙක් තෝරා පත්නොවූ බැවින් බාහිර අයදුම්පත් කැඳවීමට නියමිතය.
	වැඩ අධිකාරී(වැඩපළ)	2	1	1	වාහන අළුත්වැඩියා අංශය දැනට ක්‍රියාත්මත නොවන හෙයින් මෙම තනතුර දැනට අවශ්‍ය නොවන බව දන්වා ඇත.
	වැඩ අධිකාරී(කාර්මික)	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	චිකිරණ ශිල්පී	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	දුරකථන ක්‍රියාකරු /පිළිගැනීමේ නිළධාරී	12	9	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	පරිපාලක (පිහිනුම් තටාක)	1	0	1	ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.
	පරිපාලන (ක්‍රීඩාගාර)	1	0	1	ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.
	විගණන සහකාර	10	5	5	අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමට නියමිත අතර දැනටමත් එක් අයදුම්පතක් ලැබී ඇත.
	කළමණාකරන සහකාර	389	360	29	ස්ථාන මාරු මඟින් පිරවීමට අනුමැතිය ලබා දී ඇත.
	කළමණාකරන සහකාර (පොත් තබන්නා)	14	6	8	බාහිරව අයදුම්පත් කැඳවූ අතර අයදුම්පත් පරීක්ෂා කිරීම අවසන් වී ඇති අතර විභාග පැවැත්වීමට නියමිතය.
	පුස්තකාල තොරතුරු සහකාර	56	53	3	ස්ථානමාරු අයදුම්පත් දෙකක් අනුමතකර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති අතර දැනට ලැබී ඇති ස්ථානමාරු අයදුම්පත් මඟින් ඉතිරි පුරප්පාඩුව පිරවීමට කටයුතු කරනු ලැබේ.
	රත්නකරු(Lapidarista)	1	0	1	මෙම තනතුරු තාක්ෂණික නිළධාරී තනතුරක් බවට පරිවර්තනය කරන ලෙස ඉල්ලා ඇත.

	විකිරණ ඖධධවේදි (Radio Pharmasist)	1	0	1	බඳවා ගැනීමේ පටිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	ඖෂධවේදී	7	6	1	දැන්වීමක් මඟින් අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමට සූදානම් කර ඇත.
	හෙද නිළධාරි	62	47	15	මේ සඳහා අමාත්‍යංශ නාමලේඛණ අනුව අයදුම්පත් ලැබී ඇති නමුත් මෙම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත.
	කාර්මික නිළධාරී(ශ්‍රව්‍ය දෘෂ්‍ය)	14	7	7	බඳවා ගැනීමේ පරිපාටියේ වැටුප්තල වල නොගැලපීම් ඇති හෙයින් ඒ පිළිබඳව පැහැදිලි කර දෙනමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	කාර්මික නිලධාරී(තොරතුරු තාක්ෂණ)	19	0	19	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	කාර්මික නිළධාරී(සිවිල්)	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	කාර්මික නිළධාරී(රසායන)	5	0	5	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	කාර්මික නිළධාරී(යාන්ත්‍රික)	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	කාර්මික නිළධාරී(දන්ත වෛද්‍ය පීඨ වැඩපළ)	6	0	6	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	පරිපාලක	3	2	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	පරිපාලක(යාන්ත්‍රික)	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	පරිපාලක(ඉඩම්)	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	පරිපාලක(උද්‍යාන)	4	3	1	ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

	පරිපාලක(නඩත්තු)	2	1	1	බඳවා ගැනීමේ පරිපාටියේ වැටුප්තල වල නොගැලපීම් ඇති හෙයින් ඒ පිළිබඳව පැහැදිලි කරනමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	ගොවිපල පරිපාලක	2	1	1	දැන්වීමක් මඟින් අභ්‍යාන්තර අයදුම්පත් කැඳවීමට සූදානම් කර ඇත.
	වඩු කාර්මික	52	51	1	ස්ථානමාරු අයදුම්පත් නිර්දේශ කර ඇත.
	රියදුරු	76	66	10	අමාත්‍යාංශ නාමලේඛණ ලැබී ඇති අතර බඳවා ගැනීම තාවකාලිකව නවතා ඇත.
	විදුලි කාර්මික	16	15	1	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය
	පෙදරේරු	33	26	7	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවා ඇති අතර දැනට එක් අයදුම්පතක් ලැබී ඇත.
	කාර්මික	21	13	8	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවා ඇත. වෘත්තීය පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.
	සංචාරක නිවාස භාරකරු /අරක්කැමි	5	4	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත. තවද ස්ථාන මාරු අයදුම්පත් දෙකක් ලැබී ඇත. ඒ පිළිබඳව සලකාබැලීමට නියමිතය.
	රියදුරු/ට්‍රැක්ටර් ක්‍රියාකරු	8	5	3	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවා වෘත්තීය පරීක්ෂණ පවත්වා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත් වීමට නියමිතව ඇත.
	ට්‍රැක්ටර් ක්‍රියාකරු	7	5	2	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවා ඇත.
	තවාන්කරු	2	1	1	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත.
	ගොවිපළ යන්ත්‍ර ක්‍රියාකරු	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	උපස්ථායක (සෞඛ්‍ය සේවා)	13	10	3	අභ්‍යන්තර අයදුම්පත් කැඳවා ඇත.
	සංචාරක නිවාස භාරකරු	1	0	1	ස්ථානමාරු අයදුම්පතක් නිර්දේශ කර යවා ඇත.
	විද්‍යාගාර සහකාර	195	189	6	ස්ථානමාරු අයදුම්පත් 06ක් නිර්දේශ කර යවා ඇත.
	නිර්දේශක එකතුකරන්නා	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්

					ඉල්ලා ඇත.
	උද්‍යානකරු	2	1	1	අභ්‍යන්තර අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටි බැවින් බාහිර අයදුම්පත් කැඳවීම සඳහා අනමැතිය ලබා ගන්නා ලදී.
	පුස්තකාල සහායක	45	22	23	අභ්‍යාන්තර අයදුම්පත් කැඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.
	වෙළඳ සේවක	2	1	1	වෘත්තිය පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.
	ගබඩාකරු	13	5	8	සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.
	රිය සහකාර	11	5	6	වෘත්තිය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.
	තනකොළ කපන ක්‍රියාකරු	11	10	1	ස්ථානමාරු අයදුම්පතක් නිර්දේශ කර ඇත.
	පලිබෝධ පාලිත කම්කරු	5	4	1	අමාත්‍යංශ නාමලේඛණ ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.
	පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරු	4	2	2	අභ්‍යන්තර අයදුම්පත් කැඳවා ඇත.
	ගස් කපන්නා	2	0	2	අභ්‍යන්තර අයදුම්පත් කැඳවා ඇත.
	මුරකරු	4	0	4	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	Aero Gas Operator	1	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	බම්කරු (රෝහල් සේවා)	5	0	5	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	වැඩ සහායක	635	578	57	ස්ථානමාරු අයදුම්පත් 06ක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර ඉතිරි පුරප්පාඩු 51න් 30ක් ස්ථානමාරු අයදුම්පත් මගින් පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ කැඳවා ඇත. ඉතිරිය ඉදිරි ස්ථානමාරු මගින් පිරවීමට නියමිතය.
	පිවිතාරක්ෂක (පිහිනුම් තටාක)	1 (කොන්ත්‍රාත්)	0	0	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
	එකතුව	**2583**	**2215**	**296**	
(ආ)	**2018.12..31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තනතුරු පුරප්පාඩු හා ඒවා පිරවීමට ගත් ක්‍රියාමාර්ග**				

	තනතුර	**අනුමත තනතුරු ගණන**	**තත්‍ය සේවක සංඛ්‍යාව**	**තනතුරු පුරප්පාඩු වූ ගණන**	**විස්තරය**
	වැඩ අධිකාරී (සිවිල්)	3	3	0	මෙම තනතුර සඳහා 2018.12.10 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා තනතුරු පුරප්පාඩු 03 පිරවීමට කටයුතු කරන ලදී. මෙම තනතුරෙහි කොන්ත්‍රාත් පදනම මත සේවයකල එච්.එම්.පී.එස්.බී.හේරත් මහතා සහ ඩබ්.ඒ.ඩී.රංගන මහතා 2019.01.01 දින සිට මෙම තනතුරේ ස්ථිර පත්වීම් ලබා ඇති අතර ස්ථිර පත්වීම් ලද අනෙක් තැනැත්තා සේවයට වාර්තා කිරීමට මසක කාලයක් ඉල්ලා ඇති හෙයින් ඔහු එම තනතුරට වාර්තා කරන තුරු ටී.පී.ඩබ් කුමාරතුංග නැමැති එම තනතුරෙහි කොන්ත්‍රාත් පදනම මත සේවය කල තැනැත්තා තවදුරටත් කොන්ත්‍රාත් පදනම මතම එම තනතුරේ රඳවා ගන්නා ලදී.
	ව්‍යාපෘති කළමණාකරු	1	1 (කොන්ත්‍රාත්)	1	2018.07.09 දින පලකරන ලද පුවත්පත් දැන්වීමට අනුව අයදුම්පත් ලැබී ඇති අතර මෙම තනතුරට බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම තනතුරට ස්ථිර පුද්ගලයෙකු බඳවා ගන්නාතුරු දැනට ව්‍යාපෘති කළමණාකරු ලෙස සේවයේ යෙදී සිටින ඩබ්.එම්.පේ. වීරසේකර මහතාගේ කොන්ත්‍රාත් කාලය 2019.05.02 දක්වා දීර්ඝ කර ඇත.
	පිවිතාරක්ෂක (පිහිනුම් තටාක)	1 (කොන්ත්‍රිත්)	0	1	බඳවා ගැනීමේ පරිපාටිය සපයා දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.
(ඇ)	1990 සිට 2017 වර්ෂය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද නිළධාරීන් 13 දෙනා අතුරින් (විගණන වාර්තාවේ සඳහන්ව ඇති නිළධාරීන් 14 දෙනා 13 දෙනෙකු ලෙස නිවරදි විය යුතුය) • පී.සී. වන්සේකර මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨ මණ්ඩලයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත 1992 වර්ෂයේ ස්ථාපිත කරන ලද				

	ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ සේවය කරන අතර එම තනතුරට ගෙවීම් කරනුයේ එම මධ්‍යස්ථානයේ ඉපැයීම් මඟිනි. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 4/2016 චක්‍රලේඛ ප්‍රකාරව අදාළ පත්වීම සිදු කර ඇත. එබැවින් මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ. • ආචාර්ය කේ.එන්. ගුණවර්ධන, ඒ.එම්.කේ. ඩබ්.ඩබ් අබේකෝන් මිය, එස්.ටී. නාගොඩ මයා, එස් එස්. උඩගේ මිය, ඒ.එච්.ඒ.එම් සෙනවිරත්න යන නිළධාරීන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ රාජකාරී කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති අතර, මෙම මධ්‍යස්ථානය පාලක සභාවේ අනුමැතියෙන් "ජාත්‍යාන්තර කටයුතු කාර්යාලය" ලෙස 2017 වර්ෂයේ ස්ථිර වශයෙන් ස්ථාපිත කර ඇති අතර එහි කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම ස්ථිර තනතුරු ලබා දීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ. • යූ. ඒ. එස්. ප්‍රේමතිලක මයා, කේ.එම්.පී.අයි. කෞශල්‍යා, බී.පේ.ඩබ්.කොඩිතුවක්කු මිය, කේ එන් පී පී කේ සුභසිංහ මිය යන නිළධාරීන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛණය පිළිඇගයුම් කිරීම සහ ප්‍රතිසම්පාදනය කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත කෙටි කාලීනව බඳවා ගෙන ඇත. ගෙවීම් කර ඇත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 53 වන විගණන කමිටු අනුමැතියෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉපැයුම් මඟිනි. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 4/2016 චක්‍රලේඛ ප්‍රකාරව අදාළ පත්වීම සිදු කර ඇති බැවින් මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ. • කපිල බණ්ඩාර මයා, ඩබ්.සී.ඩී ලලන්ත මයා යන නිළධාරීන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ Web Development Unit සහ ජාල සහ සංනිවේදන සේවා ඒකකයන් හි සේවා අවශ්‍යතාව මත අත්‍යාවශ්‍ය වැඩ කොටස් නිම කර ගැනීම වෙනුවෙන් එම ඒකකයන් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති අතර එම තනතුරු සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම තනතුරු විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට අත්‍යාවශ්‍ය හෙයින් දැනට පුරප්පාඩුව පවතින ස්ථිර තනතුරු දෙකකින් ගෙවන සේ බඳවා ගෙන ඇත. • එච්.එම්.එන්.සී සේනානයක මිය සේවා අවශ්‍යතාව මත අත්‍යාවශ්‍ය වැඩ කොටස් නිම කර ගැනීම වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ අංශය වෙත පැවරුම් පදනම මත බඳවා ගෙන ඇත. එම පුරප්පාඩු තනතුර අනධ්‍යන ආයතයෙන් පිරවීමට කටයුතු කොට ඇති බැවින් එම තනතුර තව දුරටත් කොන්ත්‍රාත් පදනම මත නොපවතී.
(ඈ)	අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශ විෂය පථය යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයට අලුතින් ආරක්ෂක සේවය සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකරන ලෙසට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශ ලේකම් වෙත නියම කර තිබුණ බැවි විගණන වාර්තාවේ සඳහන් වුවද, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම්වරයාගේ 2016.05.11 දිනැතිව එවන ලද නම් 21කින් යුත් නාමලේඛනයක් මඟින් 2013 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුරු සඳහා ආරක්ෂක නියාමකවරුන් තිදෙනෙකු 2016.10.04 දින සිට බලාත්මක වන පරිදිද, එසේම 2017.04.03 දින සිට බලාත්මක වන පරිදි තවත් ආරක්ෂක නියාමකවරුන් තිදෙනෙකු ද පමණක් අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි බඳවා ගන්නා ලදි. මෙම බඳවා ගැනීම කරනු ලැබුයේ හුදෙක්ම විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු වඩාත් ක්‍රමවත්ව හා මනා පාලනයකින් පවත්වා ගැනීමටත්, එවකට විශ්වවිද්‍යාලයයේ ආරක්ෂක අංශයේ පැවති දැඩි සේවක හිඟයත් සැළකිල්ලට ගැනීමෙනි. තවද එම සේවක හිඟය හේතුවෙන් 2017 විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සමාලෝචනය අනුව මෙම විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුර සඳහා පමණක් තනතුරු 101 ක් අනුමතකොට ඇති බැවි ද දන්වමි.

	2017 විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සමාලෝචනය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද අංක DMS/0011/PDN හා 2017.05.08 දිනැති ලිපිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත එවනු ලැබූ අංක UGC/HR/10/02/04 හා 2017.06.01 දිනැති ලිපිය අනුව මෙම විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුර සඳහා පමණක් තනතුරු 101ක් අනුමතකොට ඇත. (මෙම කාර්යමණ්ඩල සමාලෝචනය වාර්තාවට අනුව ආරක්ෂක අංශයේ ආරක්ෂක පරීක්ෂක,නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිළධාරි සහ ප්‍රධාන ආරක්ෂක නිළධාරි යන තනතුරු වල අනුමත තනතුරු සංඛ්‍යාවෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැත) එකී අනුමැතිය මත උක්ත තනතුරේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම් විසින් 2017.10.17 දිනැතිව එවන ලද අමාත්‍යංශ නාමලේඛන පදනම්කර ගනිමින් 2018 වසරේ ආරක්ෂක නියාමකවරුන් දහනවදෙනෙකු (19) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 876 ප්‍රකාරව සහ පාලක සභාවේ අනුමැතිය මත බඳවා ගැනීමට කටයුතු කරන ලදි. මේ අනුව 2016 ඔක්තෝබර් මස සිට 2018 මැයි මස දක්වා ආරක්ෂක නියාමක (පහළ ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව විගණන වාර්තාවේ සඳහන් ලෙස 24ක් නොව 25ක් ලෙස නිවැරදි විය යුතුය. මෙම සියලුම බඳවා ගැනීම ආරක්ෂක අංශයේ පැවති දැඩි සේවක හිඟය හා එමඟින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු ක්‍රමවත්ව පවත්වා ගැනීමට වූ අපහසුතාවය හේතු කොට ගෙන චක්‍රලේඛ උපදෙස් නිසි අයුරින් පිළිපදිමින් පාරිදෘශ්‍ය ලෙස විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ ද අනුමැතිය නිසිපිරිදි ලබා ගෙන සිදු කරනු ලැබූ බව සඳහන් කරමි.
5	**තිරසර සංවර්ධනය**
5.1	**තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**
	පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් තිරසර සංවර්ධනය උදෙසා දැනටමත් ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති අතර 2019 වර්ෂයෙන් ඔබ්බට ක්‍රියාත්මක කිරීම සඳහා ද තිරසර සංවර්ධන යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත. ඒ අතරින් පාරිසරික සංවර්ධනය උදෙසා සූර්ය බලශක්තිය නිපදවීම, පැළ සිටුවීමේ ව්‍යාපෘති, කොම්පෝස්ට් නිපදවීම, අපද්‍රව්‍ය කළමණාකරනය (ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ඇතුළුව) සහ ජල කළමණාකරන ව්‍යාපෘති සහ ඉවතලන රසායනික ද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘති දැනටමත් ආරම්භ කර ඇති අතර ඉදිරියේදී කඩදාසි ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනක් පිලිසරු ව්‍යාපෘතියේ ආධාර ඇතිව ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මෙම වැඩසටහන් හරිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරේ. තවද කාබන් පියසටහන් (Carbon Foot Print) අවම කිරීම සඳහා ඉන්ධන භාවිතය අවම කිරීමටත් විශ්වවිද්‍යාල සිසුන් අතර පාපැදි භාවිතය වැඩි කිරීම සඳහා පාපැදි ප්‍රදානය කිරීමටත් දැනටමත් පියවර ගෙන ඇත. එමෙන්ම සමාජ වගකීම් යටතේ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීමද ඒ පිළිබඳව සිදුකරන පර්යේෂණ වල ප්‍රතිඵල අනුව නව සොයාගැනීම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටද ක්‍රමවේද සකස්කර ඇත. තවද උක්ත සඳහන් ක්‍රියාමාර්ග 2019 විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මට (Action Plan) සහ ඉදිරි වසර 5 සඳහා සකසන ලද උපාය මාර්ගික සැලැස්මට (Strategic Plan) ඇතුලත් කිරීමටත් කටයුතු යොදා ඇත.
6	**ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**
6.1	**ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**
6.1.1	**ප්‍රසම්පාදනයන්**
(අ)	2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම සඳහා උසස් අධ්‍යාපන හා මහමාර්ග

	අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක HE/PR/Procume/Plan හා 2016.08.29 දිනැති ලිපියෙහි උපදෙස් අනුව ක්‍රියාකරන ලද අතර ඇස්තමේන්තුගත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී, ඇස්තමේන්තුගත අය වැය පමණක් සකස් කර තිබූ බැවින් එය පාදක කරගෙන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන ලදී. තව ද මෙයට විවිධ සංශෝධන කිරීමට අවශ්‍ය බැවින්, සංශෝධනය කර සකස් කළ පසු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා 2017 අගෝස්තු 29 වන දින පාලක සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. ඉදිරියේදී මෙවැනි මඟහැරීම් සිදු නොකිරීමට දැනුවත් කර ඇත.
(ආ)	උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක (ප්‍රසම්පාදන) ගේ, අංක HE/PR/Procume/Plan දරණ 2016.08.29 දිනැති ලිපියෙන් දන්වා ඇති ආකෘතියට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
(ඇ)	2017 වර්ෂයේ ස්ථාවර වත්තකම් අත්පත්කර ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වාර්ෂික අයවැය ලේඛණය මගින් ප්‍රතිපාදිත මුදල රු. මිලියන 342 ක් වුවද, විශ්වවිද්‍යාලයේ ඉල්ලීම මත 2018.06.19 දින 2017 වර්ෂයට අදාල බිල්පත් නිරවුල් කිරීම සඳහා අතිරේඛ ප්‍රතිපාදන ලෙස රු.මිලියන 535 ක් ලැබී ඇති බැවින් සහ එයින් 2017 වර්ෂයේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම හා පුනරුත්තාපනය සඳහා වන ප්‍රතිපාදනය රු. 272.46 ක් වන බැවින්, ඒ සඳහා වන මුළු ප්‍රතිපාදනය රු.මිලියන 614.46 ක් වේ. එමෙන්ම ස්ථාවර වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් අවශ්‍යතාවය මත රු. මිලියන 3,976.48 කට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබුනද, 2017 වර්ෂයට අදාලව දැරෑ ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම හා පුනරුත්තාපන වියදම රු.මිලියන 404.19 ක් වන බැවින් ප්‍රතිපාදිත මුදල ඉක්මවා වියදම් දරා නොමැති බව කාරුණිකව දන්වමි.
6.1.2	**කොන්ත්‍රාත් පරීපාලනයේ අඩුපාඩු**
(අ)	
i.	කලා පීඨය සඳහා අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාලව ලැබණු ඉල්ලීම අනුව පුවත්පත් දැන්වීමක් මගින් විවෘත තරඟකාරී ලන්සු කැඳවීමේ ක්‍රමය යටතේ ලන්සු කැඳවනු ලැබූ අතර ඒ සඳහා සුබසිංහ කන්ස්ට්‍රක්ෂන් සහ සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් යන ආයතන මිළ ගණන් ඉදිරිපත් කොට තිබුණි. ඒ අනුව සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් ආයතනය අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ බැවින් අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීම තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව 2015.01.22 දින රු. 10,895,120.00 + Vat ක මුදලකට අදාල කොන්ත්‍රාත්තුව සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් ආයතනයට පිරිනමා ඇති අතර 2016.03.28 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණූ අතර දෙවන හා තෙවන අන්තර් බිල්පත් ඉදිරිපත් කරන ලද කාලය වන විට ව්‍යාපෘතිය අවසන් කළ යුතු කාලය ඉක්මවා ඇති බැවින් හා එම කාලය ඉක්මවීමට හේතු දක්වමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කර අනුමැතිය ලබාගෙන නොතිබූ බැවින් කොන්ත්‍රාත් කාර්යයේ දෙවන හා තෙවන අන්තර් බිල්පත් සඳහා උපරිම ප්‍රමාණ කළ අලාභ *(Liquidity Damages)* වශයෙන් රු. 544,756.00 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. දැනට මෙම ව්‍යාපෘතියට අදාලව 90% ක පමණ සැලකිය යුතු භෞතික ප්‍රගතියක් ඇති අතර ගෙවීම්කර ඇත්තේ රු. මිලියන 4.6 ක් පමණ වේ. එය ව්‍යාපෘතියේ මුළු වටිනාකමින් 40% ක පමණ ප්‍රමාණයක් වන බව දැක්විය හැක. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය වහාම අවසන් කොට විශ්වවිද්‍යාලය වෙත භාරදෙන ලෙස සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ලිඛිතව දන්වා ඇත.
ii.	මෙම අර්ධ ස්ථිර ගොඩනැගිල්ල සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේ පුවත්පත් දැන්වීමක් (NCB Methods) මගිනි. මෙම ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් මිලියන 12.5 ක් වූ අතර, රුපියල්

	මිලියන 10.8 ක් හා රුපියල් 13.1 ක් වශයෙන් ටෙන්ඩර් ලංසු දෙකක් පමණක් ඉදිරිපත් විය. මෙහිදී ඉදිරිපත් වූ ලංසු දෙක අතරින් අවම මිළ ගණන ඉදිරිපත් කළ රුපියල් මිලියන 10.8 ක් වූ ද, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා පහලින් සිටියා වූ ද ලංසුකරු වෙත ව්‍යාපෘතිය ප්‍රධානය කිරීම නිර්දේශ කරන ලදි. මේ අවස්ථාවේදී ප්‍රමාණපත්‍රයේ සඳහන් අයිතම 87 ක් අතුරින් අයිතම 16 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක විගණන වාර්තාවේ සඳහන් විචලනය නිරීක්ෂණය කරන ලද අතර ඒවායේ බලපෑම සමස්ථයක් වශයෙන් ඉදිරි වෙර දැරුමක් (front loaded) ලෙස නිරීක්ෂණය නොවීය. එබැවින් ඉහත නිර්දේශ ලබා දෙන ලදි. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර්පත් කැඳවන ලද්දේ පුවත්පත් දැන්වීමක් මඟින් බවද, එනම් දිවයිනේ සියළු ඉදිකිරීම් ආයතන වලින් ලංසු ඉදිරිපත් කිරීමට හැකි අයුරින් බවද, ලබාදිය හැකි අනිකුත් නිර්දේශ වූ නැවත ටෙන්ඩර්පත් කැඳවීමට නිර්දේශයක් ලබාදීමේදී ගතවන කාලය පිළිබඳ සැළකූ විට නිරතුරුව ඉහල යන ද්‍රව්‍ය මිළ හේතුවෙන් මෙම ලංසුව වඩා වැඩි අගයක් ඉදිරිපත් වීමට ඇති හැකියාව ද, එමෙන්ම මෙම අර්ධ ස්ථිර ගොඩනැගිල්ල සඳහා ප්‍රතිපාදන වෙන් කරන අවස්ථාවේ සැලකිල්ලට ගන්නා ලද ''කෙටිකාලීන ඉදිකිරීමක්'' යන අවශ්‍යතාවය ද සැළකිල්ලට ගන්නා ලදි.
(ආ)	• 1:3:6(1 ½") කොන්ක්‍රීට් දැමීම වෙනුවෙන් රු. 145,535 ක වැඩිපුර මුදලක් ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇති බව සඳහන්වේ. එසේ සිදු වී ඇත්තේ අප විසින් ICTAD ආයතනයේ ප්‍රමිත ප්‍රමාණයන් භාවිත කරමින් පරීක්ෂා කරන ලද SSR අයිතමය වෙනුවෙනි. අප විසින් භාවිත කළ ICTAD ආයතනයේ ප්‍රමිත ප්‍රමාණයන්ට අනුකූල වේ. මෙම විගණන පේදයට අනුව කරුණු සොයා බැලීමේදී එම කොන්ක්‍රීට් අයිතමයට අදාළ ICTAD ආයතනයේ ප්‍රමිත ප්‍රමාණයන් සංශෙධනය කර ඇති බව දැන ගන්නට ලැබුණි. එම ප්‍රමිත ප්‍රමාණයන් අප විසින් සොයා ගෙන පාවිච්චි කරන නමුත් අප විශ්වවිද්‍යාලය මඟින් ආයතන මට්ටමෙන් ඒවා ලබා ගැනීමක් සිදු නොකරන නිසා එම සංශෙධන අප වෙත නොලැබී ඇති බව පෙනී යයි. නමුත් මේ වන විට අප විසින් සොයා ගත් එම සංශෙධනයන් ඉදිරියේදී භාවිත කෙරෙනු ඇත. • අයිතම 3 ක් සඳහා රු. 251,763 ක වැඩිපුර මුදලක් ඇස්තමේන්තු කර ඇත යන්නට අයත් වන SSR අයිතමයන් 3 පිළිබඳ වෙන වෙනම පහත පැහැදිලි කර ඇත. SSR -06 යටතේ එන 3/8"tk. Plastering to soffit of slab in cement sand 1:3……. යන අයිතමට ICTAD ප්‍රමිත ප්‍රමාණයන්හි පිටු අංක 91 හි දක්වා ඇත්තේ වැලි 0.03 නොව 0.05 කි. එසේම මෙම අයිතමය පරීක්ෂා කිරීමේදී පුහුණු හා නොපුහුණු කම්කරුවන්ගේ දිනක වැටුප ලෙස පිළිවෙළින් රු. 2,000.00 හා රු.1,500.00 ගෙන ඇත්තේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි ඇතුළත් මිළ ගණන්ය. කොන්ත්‍රාත් ගවිසුමේ පිටු අංක 62 හි එම මිළ ගණන් සඳහන් වේ. SSR -09 යටතේ එන ½" tk'rendering in cement sand 1:2 in floors……. යන අයිතමට ICTAD ප්‍රමිත ප්‍රමාණයන්හි පිටු අංක 93 පරිදි වේ. සිමෙනිති 1.5 යන ප්‍රමිත ප්‍රමාණය නිවැරදි වන අතර ඔබ විසින් දක්වා ඇත්තේ ½" tk'rendering in cement sand **1:3** in floors……..යන අයිතමයට අදාළ ප්‍රමිත ප්‍රමාණයයි. එම අයිතමය සඳහාද පුහුණු හා නොපුහුණු කම්රුවන්ගේ දිනක වැටුප ලෙස පිළිවෙළින් රු. 2,000.00 හා රු. 1,500.00 ගෙන ඇත්තේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි ඇතුළත් මිළ ගණන්ය. SSR -20 යටතේ එන Mixing concrete 1:3:6 (1 ½") ……. යන අයිතමට අදාළව ඉහත විස්තර කර ඇති පරිදි ICTAD ප්‍රමිත ප්‍රමාණයන්හි පිටු අංක 21හි ඇතුළත් කම්කරුවන් ගණනයි. අදාළ ICTAD ප්‍රමිත ප්‍රමාණයන්හි පසුව කරන ලද සංශෙධනය මෙම මිළ ගණන් පරීක්ෂාවේ දී අප විසින් යොදා ගෙන නැත්තේ ඒ වන විට අප විසින් ඒ පිළිබඳ දැනුවත්ව නොසිටි නිසායි. අදාළ පුහුණු හා නොපුහුණු කම්කරුවන්ගේ දිනක වැටුප ලෙස පිළිවෙළින් රු. 2,000.00 හා රු.1,500.00 ගෙන ඇත්තේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි ඇතුළත් මිළ ගණන්ය. • ඉවත් කරන ලද අයිතම සියල්ලම (අයිතම 20ක් නොව 19කි) නිෂ්පාදන ඉංජිනේරු

දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සිදු වූ අතර ව්‍යාපෘතිය සාර්ථකව නිම කරගැනීම සඳහා එම නිෂ්පාදන ඉංජිනේරු දෙපාර්තමේන්තුවේම උපදෙස් පරිදි SSR හා ISR අයිතම එකතු වී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ අසාමාන්‍ය තත්වයන් හේතුවෙන් (ගොඩනැගිල්ල ආපදාවකට ලක්ව තිබීම හා කලින් හඳුනා නොගත් තත්වයන් කොන්ත්‍රාත්තුව කර ගෙන යාමේ දී හඳුනා ගැනීම) අනිවාර්යයෙන් කළ යුතු ඇතැම් අයිතමයන් කොන්ත්‍රාත්තුවට එක් කරගත යුතු විය. උද්ගත වූ තත්වයන් මත ඇස්තමේන්තුවේ සඳහන් ඇතැම් අයිතමයන් ඉවත් කිරීමට ද සිදු විය.

ව්‍යාපෘතිය භාර ගන්නා ලද අවස්ථාවේ දී ඉවත් කරන ලද අයිතමයන්ට හේතු දක්වා ඇත.

සාමාන්‍යයෙන් කොන්ත්‍රාත්තුවකට අදාළ ඉදිකිරීම් කෙරෙන කාළය තුළ දී වෙනත් ඉදිකිරීම් එම වැඩ බිම තුළම සිදු නොකරන නමුත් මෙම ආපදාවට ලක් වූ ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ දී එය කඩිනම් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ අතර නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන්ගේ අවශ්‍යතාවය හා උපදෙස් පරිදි වෙනත් අරමුදල් භාවිත කරමින් වෙනත් ඉදිකිරීම් ද මෙම ගොඩනැගිල්ල තුළම එම කාළය තුළම ක්‍රියාත්මක විය.

- ඉහත ව්‍යාපෘතියට අදාළව සකස් කරන ලද දෙවැනි බිල්පත්‍රය තුළ අමතර වැඩ (SSR) ලෙස ඉදිරිපත් කර ඇති රුපියල් 2,451,845.00 ක් වූ කොන්ත්‍රාත් මිලෙන් 18% ඉක්මවූ අගය යනු SSR ම පමණක් නොවේ. එම මුදල යනු SSR හා ISR වල එකතුවයි. අමතර වැඩ එනම් SSR අයිතමයන්වල මුළු අගය කොන්ත්‍රාත් ගිවිසුම් ගත මුදලින් 8.54% පමණක් වේ. දෙවන බිල් පත්‍රය වන විට ගිවිසුම් ගත ඇස්තමේන්තුවෙහි තිබුණු එක් අයිතමයක් වෙනස් වී ඇත. ඒ සඳහා ඉදිරිපත් කරන ලද නව මිල ගණන එනම් ISR අයිතමය සඳහා වන මිළ ගණන රු. 1,287,419.25 කි. එය ගිවිසුම් ගත කේන්ත්‍රාත් මුදලින් 9.45% කි.

Amount of SSR Items	=	Rs. 1,164,426.42 -	8.54%
Amount of ISR Items	=	Rs. 1,287,419.25 -	9.45%

Total Amount	=	Rs. 2,451,845.67 -	17.99%
		==========	

දෙවන බිල් පත්‍රයෙහි Extra works ලෙස සඳහන්ව ඇත්තේ මෙම දෙකෙහි එකතුවයි.

මේ වන විට අවසාන බිල්පත ඉදිරිපත් කර ඇති අතර අතිරේක වැඩ සඳහා 10% නොඉක්මවා ගෙවීමට කටයුතු කරනු ඇත.

6.1.3 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

(අ) 2014 -2017 කාලපරිච්ඡේදයේ දී ආරම්භ කළ පුනරුත්ථාපන ව්‍යාපෘති 37 නිමකල යුතු ගිවිසුම් කාලය ඉක්මවීම සම්බන්ධයෙන් හඳුනාගත් හේතු සහ ගෙන ඇති පියවරවලට අදාල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

අංකය	ව්‍යාපෘතිය	වර්තමාන තත්ත්වය
01	Proposed Semi Permanent Building For Students Common Room, Faculty of Arts, University of Peradeniya. (CW/CON/2014/1057)	මෙම කාර්යය සඳහා ප්‍රමාද ගාස්තු අයකර, මේවන විට තුන්වන අන්තර් බිල්පත ගෙවා ඇත. 90% ක පමණ වැඩ අවසන් වී ඇති අතර, 40% ක පමණ ගෙවීම් කර ඇත. අදාල ව්‍යාපෘතියේ වැඩ නිම කොට, හැකි ඉක්මනින් විශ්වවිද්‍යාලයට භාර දී අවසන් බිල්පත ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත.

	02	Renovation Work to the Existing Toilet Unit for Seed Lab, University Experimental Station, Dodangolla, Kundasale (CW/CON/2014/1106)	මෙම කාර්යය අවසන් කර නොමැති බැවින් රු. 78,773/-ක කාර්ය සාධන ඇපකරය විශ්වවිද්‍යාලයට අයකරගෙන ඇති අතර නිමකර ඇති වැඩ වෙනුවෙන් ඉදිරිපත් කර ඇති පළමු අන්තර් බිල්පත සඳහා 10% ක රැඳවුම් මුදල් තබාගෙන ඇති අතර දෙවන අන්තර් බිල්පත සඳහා ගෙවීමට කටයුතු කර නොමැත.
	03	Renovation of Canteen, Faculty of AHS, University of Peradeniya. (CW/CON/2014/1114)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට අදාල ලිපිලේඛණ හා වාර්තා සැකෙසෙමින් පවති.
	04	Proposed Septic Tank and Drainage System new Hostel No 03 Project (Augusta Hill Premises) . (CW/CON/2015/1124)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇත. වැඩ බිමට ගලක් පෙරලී එය ඉවත් කරන තෙක් 2015.11.23 සිට 2016.12.12 දින දක්වා ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවී ඇත. ගල ඉවත් කිරීමෙන් අනතුරුව 2016.12.28 දින වැඩ අවසන් කර ඇති අතර ඒ දක්වා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. මේවන විට අවසන් බිල්පත අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යෙමු කර ඇත.
	05	Proposed Examination Hall for 150 Students, Faculty of Vet. Med. & Animal Science Stage II . (CW/CON/2014/1126)	මෙම කාර්යය 2016.12.16 දින නිම කිරීමට නියමිත වුවත් 2017.02.16 දින දක්වා කාලය දීර්ඝ කර ඇති අතර 2017.02.14 දින වැඩ අවසන් කර මේවන විට අවසන් බිල්පත ගෙවා ඇත.
	06	Proposed Balance Work for the Nuclear Medicine Unit, Faculty of Medicine. (CW/CON/2014/1129)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති නමුත් අවසන් බිල්පත මෙතෙක් ඉදිරිපත් කොට නොමැත.
	07	Refurbishment of East Lecture Theatre, Faculty of Medicine. (CW/CON/2014/1132)	මේවන විට අවසන් බිල්පත ගෙවා ඇත.
	08	Improvements to Drainage System for the Staff Quarters, Girls & Boys Hostels at MI Sub Campus.(CW/CON/2014/1134)	මෙම කාර්යය 2017.01.09 දින නිම කිරීමට නියමිතව තිබූ අතර 2017.01.06 දින වැඩ අවසන් කර ඇත. මේවන විට අවසන් බිල්පත ගෙවීමට කටයුතු කර ඇති අතර රැඳවුම් මුදල්ද නිදහස් කර ඇත.
	09	Renovation to the A-06 Building for International Research Centre, UoP. (CW/CON/2014/1137)	මෙම කාර්යය 2016. 07. 31 දින නිම කිරීමට නියමිත වුවත් 2017.01.31 දින දක්වා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කාලය දීර්ඝ කර ඇති අතර ඒදින වැඩ අවසන් කර ඇත. මේවන විට අවසන් බිල්පත සහ රැඳවුම් මුදල් ගෙවීමට කටයුතු කර

			ඇත.
	10	Proposed Female Toilet Unit at Faculty of Engineering, University of Peradeniya. (CW/CON/2015/1138)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා අවසන් කර ඇත.
	11	Proposed Mawalawatte Farm Internal Roads, Dept. of Animal Science, Faculty of Agriculture. (CW/CON/2015/1141)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති නමුත් අවසන් බිල්පත මෙතෙක් ඉදිරිපත් කොට නොමැත. ගෙවා ඇති අන්තර් බිල්පත් 2 න් ප්‍රමාද ගාස්තු අයකර ඇත.
	12	Modification to the Department of Basic Veterinary Science, Faculty of Vet. Medicine & Animal Science. (CW/CON/2015/1168)	මෙම කාර්යය 2016.12.30 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. අවසන් බිල්පත මේ වන විට ගෙවා අවසන් කර ඇත. රැඳවුම් මුදල රු. 511,000/කි.
	13	Supply Erecting & Installation of Security Lamp Posts for the Meewathura Hostel Premises. (CW/CON/2015/1176)	මෙම කාර්යය 2017.04. 07 දින නිම කිරීමට නියමිතව තිබූ අතර ඒදිනම වැඩ අවසන් කර ඇත. මේවන විට රැඳවුම් මුදල ද නිදහස් කර ඇත.
	14	Proposed Toilet Unit at New Laboratory Building Dept. of M L S , Faculty of A H S. (CW/CON/2015/1190)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත. රැඳවුම් මුදල රු. 224,000/-
	15	Modification of the Roof for New Chemistry Building, Faculty of Science (CW/CON/2015/1195)	මෙම කාර්යය 2016.09.14 දින නිම කිරීමට නියමිත වුවත් 2016.11.14 දින දක්වා කාලය දීර්ඝ කර ඇති අතර 2016.11.14 දින වැඩ අවසන් කර, මේවන විට අවසන් බිල්පත සහ රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇත.
	16	Proposed renovation Work for the Galbangalawa Guest House (CW/CON/2015/1201)	අදාල ව්‍යාපෘතිය ප්‍රායෝගිකව ඉදිකෙරෙමින් පවතින අවස්ථාවේදී විවිධ හේතූන් මත මුලික සැලසුමට බාහිරව ඉදිකිරීම් වෙනස් කිරීමට සිදුව ඇති අතර එහිදී අතිරේක වැඩ යෙදෙන අවස්ථාද තිබී ඇත. අවසන් බිල්පත මේවන විට ඉදිරිපත් කර ඇත.
	17	Renovation of the roof & celling Work of the Agriculture Old Biology Building, Faculty of Agriculture. (CW/CON/2015/1202)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර මේවන විට අවසන් බිල්පත ගෙවා ඇත.
	18	Proposed Renovation Work to the Toilet Unit in Medical Library, Faculty of Medicine, UOP. (CW/CON/2016/1207)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත.
	19	Proposed Access Road at Augusta Hill Hostel Premises (CW/CON/2016/1212)	මෙම කාර්යය අවසන් කර 2017.01.06 දින විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත ගෙවා ඇත.

	20	Erection of Fence at the New Administrative Building at the MI Sub-Campus (CW/CON/2016/1218)	මෙම කාර්යය අවසන් කර 2017.03.05 දින විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත ගෙවා ඇත.
	21	Proposed Access Road at Sarasaviuyana Hostel Premises (CW/CON/2016/1220)	මෙම කාර්යය අවසන් කර 2017.02.07 දින විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේ වන විට ගෙවා ඇත.
	22	Construction of Boundary Wall at Department Premises, Dept. of Farm Animal Production & Health , Faculty of Vet. Medicine & Animal Science. (CW/CON/2016/1223)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත. රැඳවුම් මුදල රු. 122,623/-
	23	Proposed Security Post for New Building at MI Sub Campus, Faculty of Agriculture(CW/CON/2016/1234)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත. රැඳවුම් මුදල රු. 73,614/-
	24	Improvement to Cycle Park at the Faculty of Arts main Building (CW/CON/2016/1236)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත විගණනයෙන් පසු අඩුපාඩුකම් ඇති බව දන්වා ඇත. එය අවශ්‍ය කටයුතු සඳහා වැඩ දෙපාර්තමේන්තුව යොමු කොට ඇත.
	25	Chain Link Fence along the Gampola Road (In front of the Faculty of Engineering) , UoP(CW/CON/2016/1237)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත.
	26	Proposed Fencing and Drainage of the Wildlife Section of Vet. Med. & Animal Science, University of Peradeniya.(CW/CON/2016/1242)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත ගෙවා ඇත.
	27	Construction of Broiler Shed at MI Sub-Campus, Faculty of Agriculture(CW/CON/2016/1243)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති නමුත් අවසන් බිල්පත මෙතෙක් ඉදිරිපත් කොට නොමැත.
	28	Renovation of the Laboratory Building, Dept. of Production Engineering, Faculty of Engineering (CW/CON/2016/1246)	මෙම කාර්යය අවසන් කර 2017.04.23 දින විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර මේවන විට රැඳවුම් මුදල් ද නිදහස් කොට ඇත.
	29	New Quarters for University Staff – Type 01 (CW/CON/2016/1247)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර මේවන විට අවසන් බිල්පත අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යෙමු කර ඇත.
	30	New Quarters for University Staff – Type 02(CW/CON/2016/1249)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට අදාල ලිපිලේඛණ හා වාර්තා සැකෙසෙමින්

			පවති.
	31	New Quarters for University Staff – Type 03(CW/CON/2016/1250)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමුකර ඇත.
	32	New Quarters for University Staff – Type 04(CW/CON/2016/1251)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේ වන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට අදාල ලිපිලේඛණ හා වාර්තා සැකෙසෙමින් පවති.
	33	New Quarters for University Staff – Type 05(CW/CON/2016/1252)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමුකර ඇත.
	34	New Quarters for University Staff – Type 06(CW/CON/2016/1253)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට අදාල ලිපිලේඛණ හා වාර්තා සැකෙසෙමින් පවති.
	35	Extension of Piggery Unit at Veterinary Teaching Farm. Faculty of Vet. Medicine & Animal Sc. (CW/CON/2016/1268)	මෙම කාර්යය 2017.05.05 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත ගෙවා ඇත.
	36	Dismantling of the Old Works Department Building, UoP. (CW/CON/2016/1271)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත.
	37	Proposed Renovation of Laboratory Building, Dept. of Production Engineering. (CW/CON/2016/1273)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමුකර ඇත.

2014 - 2017 කාලපරිච්ඡේදයේ දී කොන්ත්‍රාත් ප්‍රදානය කල පුනරුත්ථාපන ව්‍යාපෘති 11 ක වැඩ ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් හඳුනාගත් හේතු සහ ගෙන ඇති පියවරවලට අදාල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

01	Supply & Installation of Lightning Protection System for the New Hostel Building at Upper Hanthana, University	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත

		of Peradeniya (CW/CON/2016/1283)	අභ්‍යන්තර විගණනයෙන් අනතුරුව ගෙවීම් කිරීම සඳහා යොමුකර ඇත.
	02	Supply & Installation of Lightning Protection System for the New Hostel Building at Mahakanda, University of Peradeniya (CW/CON/2016/1284)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත අභ්‍යන්තර විගණනයෙන් අනතුරුව ගෙවීම් කිරීම සඳහා යොමුකර ඇත.
	03	Proposed Aluminium Partition Work for Staff Room, MI Sub Campus, Faculty of Agriculture, University of Peradeniya (CW/CON/2016/1291)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ගෙවා ඇත.
	04	Supply Fabrication & Installation Iron Grill for the Gymnasium, Dept. of Physical Education, UOP . (CW/CON/2016/1294)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත.
	05	Construction of an Earth Retaining Wall & Modification to the Roof of the Hostel No 05 at Mahakanda (CW/CON/2014/1097)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති නමුත් අවසන් බිල්පත මෙතෙක් ඉදිරිපත් කොට නොමැත.
	06	Proposed Modification for a Museum at the dept. of Anatomy, Faculty of Medicine (CW/CON/2015/1163	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති නමුත් අවසන් බිල්පත මෙතෙක් ඉදිරිපත් කොට නොමැත.
	07	Proposed Colonnade Work at Faculty of Management (CW/CON/2016/1224)	නියෝ කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ලබාගෙන ඇත. අත්තිකාරම් මුදල මේවන විට විශ්වවිද්‍යාලය වෙත නැවත ගෙවා ඇත.
	08	Renovation for Toilet Units at Main Arts Building and Arts Theatre. Faculty of Arts . (CW/CON/2016/1230)	මෙම කාර්යය අවසන් කිරීමට නියමත දිනය 2018.05.18 වේ. සෝල් ඉංජිනියරින් ආයතනය විසින් ලබාගෙන ඇත. අත්තිකාරම් මුදල මේවන විට විශ්වවිද්‍යාලය වෙත ගෙවීමට කටයුතු කර ඇති අතර, මේවන විට නිම කර ඇති වැඩ සඳහා අවසන් බිල්පතක් ඉදිරිපත් කිරීමටත් දෙපාර්ශවයේ එකඟතාවය මත ලිපිගොනුවෙහි කටයුතු අවසන් කිරීම සඳහා ගිවිසුමකට එළඹීමට නියමිත අතර ඒ සඳහා කටයුතු නීති අංශය මගින් සිදු කරමින් පවති.
	09	Proposed New Anatomy Lab for the dept. of Radiography / Radiotherapy, Faculty of Allied Health Science	මෙම කාර්යය ප්‍රදානය කරන ලද ප්‍රයතුංග කන්ස්ට්‍රක්ෂන් ඉදිකිරීම් ආරම්භ කර නොමැති අතර එම ආයතනයේ රු. 29,478.00 ක් වන ඇපකරය අවලංගු කර එම මුදල විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කර ඇත.

	10	Proposed Segregated Waster Collecting Terminals – Male Type Faculties of Engineering, Medicine & Veterinary Medicine) (CW/CON/2016/1244)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇත. මේවන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇති අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට අදාල ලිපිලේඛණ හා වාර්තා සැකෙසෙමින් පවති.
	11	Renovation for the New Lecture Theatre, Department of Botany, Faculty of Science, University of Peradeniya. (CW/CON/2016/1272)	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට ගෙවා ඇත.

(ආ) 2012 -2016 කාලපරිච්ඡේදයේ දී ගිවිසුම් අත්සන් කර වැඩ අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දීමට නියමිත දිනය ඉක්මවා ගොස් ඇති ව්‍යාපෘති 09 සම්බන්ධයෙන් හඳුනාගත් හේතු සහ ගෙන ඇති පියවරවලට අදාල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

01	Construction of Para Clinical Building (Stage II) CW/CON/2011/910	ව්‍යාපෘතියේ II වන අදියර සඳහා අමාත්‍යාංශය මඟින් නැවතත් අමාත්‍යමණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 2018.08.07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ස්ථාවර නාඤණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාල මිළ ප්‍රමාණ පත්‍ර ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉල්ලා ඇත. එම ලියකියවිලි ලැබුණු පසු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
02	Construction of an Administrative Building with Laboratories and Lecture Halls for the Faculty of A H S CW/CON/2015/1180	මෙම කාර්යය අවසන් කර ඇති අතර මේ වන විට අවසන් බිල්පත ඉදිරිපත් කර ඇත. අතිරේක වැඩ සඳහා උපදේශන සේවාවන් සපයන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසු අවසන් බිල්පත අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කිරීමට නියමිතය.
03	Construction of Chemical Engineering Building Stage-II, Faculty of Engineering CW/CON/2012/935	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කොට ඇත.
04	Design & Construction of Two Storied Building (Stage II) for the Department of Management Studies , Faculty of Arts CW/CON/2011/892	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කොට ඇත.

	05	Proposed Extension to the Surgical Ward, Faculty of Medicine. CW/CON/2013/964	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කොට ඇත.
	06	Master Plan Development of the Faculty of Agriculture – Phase I, Construction of Animal Science Building Complex & Extension to the Existing to the Administrative Building. *(Design & Build Contract)* CW/CON/2007/755	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර රැඳවුම් මුදල් ද නිදහස් කර ඇත.
	07	Proposed Five Storied Building for the Faculty of Dental Sciences. CW/CON/2011/898	මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත මේවන විට අභ්‍යන්තර විගණන කටයුතු සඳහා යොමු කොට ඇත.
	08	Design & Construction of Development of the Faculty of Agriculture According to the Master Plan of the(Phase II) University of Peradeniya. CW/CON/2013/1040	මෙම කාර්යය සඳහා 2018.10.05 දිනවන තෙක් කොන්ත්‍රාත් කාර්යය දීර්ඝ කිරීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර ඇත.
	09	Construction of Hockey and Athletic Pavilion for Physical Education Department. Uop CW/CON/2010/882	මෙම ව්‍යාපෘතිය අරම්භවීමෙන් අනතුරුව ඉදිකිරීම් භූමියෙහි අනපේක්ෂිත මඩ ස්ථර මතුවීම හා අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති පරිදි 2018.10.15 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම පාලක සභාව විසින් අනුමත කර ඇත.

(ඇ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මගින් යෝජනා කල ව්‍යාපෘති 05 ක් සඳහා ප්‍රතිපාදන සියල්ල නිදහස් කලද එම ව්‍යාපෘති විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් හඳුනාගත් හේතු සහ ගෙන ඇති පියවරවලට අදාල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

01	Construction to Upper Floor and Completion of Balance Work of Drawing Office II	මෙම කාර්යය අවසන් වී ඇති අතර මේවන විට විශ්වවිද්‍යාලයට භාර දී අවසන් බිල්පත් ඉදිරිපත් කර ඇත.
02	Expansion of the Student Hostel at Sarasaviuyana	මෙම කාර්යය අවසන් වී ඇති අතර මේවන විට අවසන් බිල්පත් ඉදිරිපත් කර ඇත.
03	Proposed Expansion to Animal Production & Health	මෙම කාර්යය ප්‍රදානය සඳහා අමාත්‍යාංශ අනුමැතිය ප්‍රමාද වී ඇති අතර මේවන විට ගිවිසුම් අත්සන් කර ඉදිකිරීම් නටයුතු ආරම්භ කර ඇත.

	04	Establishment of a Centre for Research in Oral Cancer, Faculty of Dental Sciences, University of Peradeniya.	වරින්වර සැලසුම් වෙනස් වීම හේතුවෙන් මෙම කාර්ය ප්‍රදානය ප්‍රමාද වී ඇති අතර මේවන විට ගිවිසුම් අත්සන් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
	05	Proposed Building for the Dept. of Geography, Faculty of Arts	ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව තාක්ෂණ ඇගයීම් කටයුතු සිදුකරන අතරතුර ව්‍යාපෘතිය ඉදිකිරීමට යෝජිත භූමිය ආසන්නව වෙනත් ව්‍යාපෘතියක් ඉදිකෙරෙන බැවින් ඉඩම්, ගොඩනැගිලි හා නඩත්තු කමිටුවේ තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

6.2 අයවැය ලේඛණමය පාලනය

2018 වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛණය 2018 දෙසැම්බර් මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන ඇති අතර අදාල ආයතන වෙත පිටපත් යැවීමට කටයුතු කරමි.

6.3 නොවිසිඳී ඇති විගණන ඡේද

i. <u>වෛද්‍ය පීඨයේ පිහිටි ඉඩම</u>

පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ වෛද්‍යපීඨය සඳහා මහ/257 පිඹුරෙහි දැනට බුක්ති විඳින ඉඩම් කොටස වන හෙක්ටයාර් 7.006 (අක්කර 17.31)ක් පිඹුරු අංක මහ/6289 මඟින් මැන පවරා ගැනීමට කටයුතු කරමින් පවති. මහනුවර දිස්ත්‍රික් ඉඩම් කොමසාරිස් විසින් මෙම ඉඩම විශ්වවිද්‍යාලය වෙත පැවරීමේ කටයුතු සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්, වෙත ලිපි යොමුකර ඇත. විශ්වවිද්‍යාලය මඟින් ද ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉඩම පවරා දෙන ලෙස සිහිකැඳවීම් ලිපියොමුකර ඇත. ඒ අනුව මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවති. ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන්වූ පසු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>පොල්ගොල්ල ඉඩම</u>

මෙම ඉඩමේ හිමිකාරීත්වය දැනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව පවතින අතර, අදාල ඉඩම් කොටස පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවති. කෙසේ නමුත්, අදාල ඉඩම් කොටසේ කැබලි අංක09 (හෙක්ටයාර් 01.153) විශ්වවිද්‍යාලය වෙත පවරා දීම සඳහා එම ඉඩමේ කැබලි අංක 10 නැවත පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීම සඳහා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයේ එකඟතාවය ඉල්ලා ඇත. මේ සඳහා 2017.06.09 දිනැතිව පිලිතුරු යොමුකර ඇති අතර, ඒ අනුව ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන්වූ පසු මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>මහඉලුප්පල්ලම කෘෂිකර්ම පීඨයට අයත් ඉඩම</u>

මෙම ඉඩම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ඉඩමක් වන අතර, එහි ඉඩම් කොටසක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් බුක්ති විඳිනු ලැබේ. අදාල ඉඩම් කොටස විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවති. ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම පැවරීමට අවශ්‍ය මූලික විස්තර විශ්වවිද්‍යාල පාලන අධිකාරිය වෙතින් ඉල්ලීම් කර ඇති අතර ඊට අවශ්‍ය තොරතුරු ලබාදී ඇත. ඒ අනුව ඉපලෝගම ප්‍රාදේශිය ලේකම් විසින් කැඩඅස්තර සිතියම් අංක 110189හි කැබලි අංක 70,80,82,89 (හෙක්ටයාර් 18.59/අක්කර 45.95) අදාල විස්තර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇත.

ii. විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සමස්ථ විශ්වවිද්‍යාලීය පද්ධතියේම

	ක්‍රියාත්මක වන පටිපාටිය අනුව පැමිණීමේ ලේඛන වල සටහන් කිරීමක් සිදු නොවන අතර මේ සම්බන්ධයෙන් 2017 මැයි 23 දින පැවති COPE කමිටුවේ දී ද සාකච්ඡා විය. ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය තීරණයත් මත නීතිරීති ලබාදිය යුතු බව සාකච්ඡා විය. ඒ අනුව ආචාර්යවරුන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ඇත. මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය යටතට ගැනෙන පූර්ණකාලීන උපශාලාධිපති තනතුර සඳහා පත්කරනු ලබන නිලධාරීන් නේවාසිකාගාරවල පූර්ණකාලීනව සේවයේ යෙදී සිටීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඔවුන්ට නේවාසිකාගාරවලම පදිංචි වී සිටීම අනිවාර්යය වන අතර ඒ සඳහා පහසුකම් ද සපයා ඇත. ඒ අනුව පූර්ණකාලීන උපශාලාධිපති තනතුරු දරන්නන්ට සේවයට පැමිණීම හා පිටවීම සම්බන්ධව අත්සන් තැබීම හෝ ඇඟිලි සළකුණු තැබීමේ අවශ්‍යතාවයක් මෙතෙක් පැන නොනැඟිනි. එසේ වුවත් මේ වන විට මෙම විශ්වවිද්‍යාලයේ විගණන කමිටුවේ උපදෙස් අනුව ඔවුන් සේවයේ රැඳී සිටීම සම්බන්ධව මාසික වාර්තා අදාල ශාලාවේ අධ්‍යයන ශාලාධිපති මගින් ආයතන, අනධ්‍යයන අංශය වෙත ලබා ගැනීම තුලින් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ ලේඛණ යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.
iii.	2016.01.21 දින සහ 2013.01.08 විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2016 සහ 1000 ප්‍රකාරව විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමන්ඩලය සඳහා අධ්‍යයන දීමනා ගෙවීමේදි විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමේදි අදාල කරගතයුතු බව දන්වා ඇති බැවින් ඒ අනුව කටයුතු කර ඇත.
6.4	**<u>සමාජ වගකීම් ඉටුකිරීම</u>**
	විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතාකර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය පිළිබඳව විශ්වවිද්‍යාල ආරක්ෂණ කමිටුව වෙත (University Safety Committee) කරුණු ඉදිරිපත් කරන ලද අතර එහිදී මෙම රසායනික ද්‍රව්‍ය පරිසරයට බැහැර නොකර විධිමත් හා නීත්‍යානුකූල ලෙස බාහිර පාර්ශ්වයකට ලබාදීම සුදුසු බව තීරණය විය. ඒ සඳහා දැනට ශ්‍රී ලංකාව තුළ InseeEcocycle සමාගම පමණක් කටයුතු කරන බවත් එම සමාගම සමඟ ගිවිසුම්ගතව මෙම රසායනික ද්‍රව්‍ය ලබාදිය හැකි බවත්, කමිටුවේ සාමාජිකයින් විසින් සොයා ගන්නා ලදුව, අදාල සමාගම සමඟ සාකච්ඡා කරන ලද අතර එම සමාගමේ නියෝජිතයින් විශ්වවිද්‍යාලයට පැමිණ අදාල රසායනික ද්‍රව්‍ය පිළිබඳව විශ්ලේෂණයක් කරන ලදි. ඒ සමඟම එක් එක් පීඨයෙන් වාර්ෂිකව බැහැර කරන රසායනික ද්‍රව්‍ය පිළිබඳව දළ ප්‍රමාණ පත්‍රිකා ද ලබාගන්නා ලදි. ඒ අනුව අදාල සමාගම සමඟ ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර ඇත.
7.	**පද්ධති හා පාලනයන්**
(අ)	ඉදිරියේ දී ගිණුම්කරණ ප්‍රමිති නිවැරදි ලෙස අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ)	ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් බොහෝ දුරට නිරවුල් කර ඇති අතර ඉතිරි ගිණුම් ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	ඉදිරියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පිළිපැඳීමට කටයුතු කරනු ලැබේ.
(ඈ)	වත්කම් උපරිම උපයෝජනය කිරීමට සඳහා අවශ්‍ය විධිවිධාන ගැනීමට කටයුතු කරමි.
(ඉ)	ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොකිරීම විශ්වවිද්‍යාලය විසින් පිරිනමා ඇති සෑම කොන්ත්‍රාත් කටයුත්තක් සඳහාම ගිවිසුම් අත්සන් කොට ඇති අතර පිළිගත හැකි විවිධ හේතූන් මත ව්‍යාපෘති නිසි වේලාවට නිම කිරීමට අපොහොසත් කොන්ත්‍රාත්

	කාර්යයන් සඳහා නියමිත විධිවිධාන පරිදි කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර දීමට කටයුතු කරනු ලබන අතර එසේ නොමැතිවුවහොත් නියමිත ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර ඇත. තවද ඇප බැඳුම්කර විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට හා කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛණගත කිරීමටද පියවර ගෙන ඇත.

උපකුලපති

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2017 වාර්ෂික වාර්තාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව

Statistics & Information Division
University of Peradeniya
Peradeniya
www.pdn.ac.lk